

වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2022

වැය ශීර්ෂ අංක - 118

කෘෂිකර්ම අමාත්‍යාංශය

නො.80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමඟ, බත්තරමුල්ල

වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2022

වැය ශීර්ෂ අංක - 118

කෘෂිකර්ම අමාත්‍යාංශය

(වර්තමාන අමාත්‍යවරු)

1. *ගරු කෘෂිකර්ම අමාත්‍ය - මහින්ද අමරවීර මැතිතුමා*
2. *ගරු රාජ්‍ය අමාත්‍යවරුන්*
    - *කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය - මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මැතිතුමා*
    - *පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය - ඩී.බී. හේරත් මැතිතුමා*
    - *ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍ය - කේ. කාදර් මස්තාන් මැතිතුමා*

අමාත්‍යාංශ ලේකම් - ගුණදාස සමරසිංහ මහතා

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති අංශ

- කෘෂිකර්ම අංශය - (වැය ශීර්ෂ අංක 118)
- පශු සම්පත් අංශය - (වැය ශීර්ෂ අංක 427)
- පොහොර අංශය - (වැය ශීර්ෂ අංක 426)
- ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය - (වැය ශීර්ෂ අංක 407)

දුරකථන	011-2034300
ෆැක්ස්	011-2868910
විද්‍යුත් තැපෑල	info@agrimin.gov.lk pmeagri@gmail.com
වෙබ් අඩවිය	www.agrimin.gov.lk

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

කෘෂිකර්ම අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංක - 118

අන්තර්ගතය		පිටු අංකය
පරිච්ඡේදය 01	ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	13-18
පරිච්ඡේදය 02	ප්‍රගතිය, ඉදිරි දැක්ම හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන	19-124
පරිච්ඡේදය 03	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	125-160
පරිච්ඡේදය 04	කාර්ය සාධන දර්ශක	161-162
පරිච්ඡේදය 05	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	163-167
පරිච්ඡේදය 06	මානව සම්පත් පැතිකඩ	168-178
පරිච්ඡේදය 07	අනුකූලතා වාර්තාව	179-188

කෙටි යෙදුම්

MOA	කෘෂිකර්ම අමාත්‍යාංශය
PPE	ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයුම් ඒකකය - කෘෂිකර්ම අමාත්‍යාංශය
DOA	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
HORDI	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
NRMC	ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය
FCRDI	ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
ETC	ව්‍යාප්ති හා පුහුණු ආයතනය
NPQS	ජාතික ශාක නිරෝධායන සේවය
RRDI	වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
NAICC	ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය
DAD	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
PDOA	පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
DS	දිස්ත්‍රික් ලේකම්
AI	කෘෂි උපදේශක
ARPAS	කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර
AAIB	කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
PMB	වී අලෙවි මණ්ඩලය
CARP	ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
NIPHM	ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය
CFC	සී/ස. ලංකා පොහොර සමාගම
CCF	කොළඹ කොමර්ෂල් පොහොර සමාගම
LPL	ලංකා පෝස්පේට් සමාගම
HARTI	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය
NFS	ජාතික පොහොර ලේකම් කාර්යාලය
ASMP	කෘෂි නව්‍යකරණ ව්‍යාපෘතිය
CSIAP	දේශගුණික සුහුරු වාරිකෘෂිකාර්මික ව්‍යාපෘතිය
SAPP	කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය
FTF	ගොවීන්ගේ භාරකාර අරමුදල
CERC	හදිසි තත්ත්ව මත ක්‍රියාත්මක වැඩසටහන් යටතේ ගබඩා පහසුකම් ඇති කිරීම
EU	යුරෝපානු සංගමය
FAO	එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය
AARDO	ආසියානු අප්‍රිකානු ග්‍රාමීය සංවර්ධන සංවිධානය
JICA	ජපාන අන්තර් ජාතික සහයෝගිතා ඒකකය
KOICA	කොරියා ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය
WFP	ලෝක ආහාර වැඩසටහන
KOPIA	ජාත්‍යන්තර කෘෂිකර්මය සඳහා වූ කොරියානු ව්‍යාපෘති
AFASI	ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගීතා මූලපිරුම
WB	ලෝක බැංකුව
GAP	යහපත් කෘෂිකාර්මික කටයුතු
UNDP	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
NARP/NUS	විශ්වවිද්‍යාල සමඟ සිදුකරන ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති සැලැස්ම පිළිබඳ පර්යේෂණ

කෘෂිකර්ම අමාත්‍යාංශය

- **හැඳින්වීම**

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පෙර පැවති කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ඖෂධ හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය; පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය සහ පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යන රාජ්‍ය අමාත්‍යාංශ සතුව පැවති ආයතන 2022 මැයි මස 27 වන දින අංක 2281/41 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට පවරා ඇත.

2022 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මගින් කෘෂිකර්ම, පොහොර, පශු සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන යන අංශ යටතේ සකස් කරන ලද වාර්ෂික කාර්ය සාධනයන් ඇතුළත් කර ඇත.

i.) කෘෂිකර්ම අංශය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ලංකා පොස්පේට් සමාගම, වී අලෙවි මණ්ඩලය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, ගොවීන්ගේ භාරකාර අරමුදල මගින් වාර්තා කරන ලද ප්‍රගතිය කෘෂිකර්ම අංශය යටතට ඇතුළත් කර ඇත.

ii.) පශු සම්පත් සංවර්ධන අංශය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්, සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම යන ආයතන කෘෂිකර්ම අමාත්‍යාංශයේ පශු සම්පත් සංවර්ධන අංශය යටතේ ඇති ආයතන වන අතර එම ආයතන විසින් 2022 වර්ෂයේ දී වාර්තා කරන ලද ප්‍රගතිය මෙම ප්‍රගති වාර්තාවේ ඇතුළත් කර ඇත.

iii.) පොහොර අංශය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික පොහොර ලේකම් කාර්යාලය, සී/ස ලංකා පොහොර සමාගම, සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය) සහ ජාතික පසු අස්වනු කළමණාකරණ ආයතනය යන ආයතන මගින් වාර්තා කරන ලද ප්‍රගතිය කෘෂිකර්ම අමාත්‍යාංශයේ පොහොර අංශය යටතේ ඇතුළත් කර ඇත.

iv.) ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය

ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණ හා ජනාවාස අධිකාරිය, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය යටතට ඇතුළත් කර ඇති අතර එම ආයතන විසින් 2022 වර්ෂයේ දී වාර්තා කරන ලද ප්‍රගතිය මෙම ප්‍රගති වාර්තාවේ ඇතුළත් කර ඇත.

- **අමාත්‍යාංශයේ දැක්ම**

ආහාර සුරක්ෂිතතාවය හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම, ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක් ඇති කිරීම.

- **මෙහෙවර**

ස්වභාවික සම්පත් තිරසාර කළමනාකරණය තුළින් සමාජීය වශයෙන් පිළිගත් හා වාණිජමය නැඹුරුවකින් යුතුව, ගෝලීය තරඟකාරී නිෂ්පාදනයක් බිහි කරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කර ගැනීම.

- **අරමුණු**

i.) දේශීය වශයෙන් නිෂ්පාදනය කළහැකි ආහාර සහ අතිරේක ආහාර සංචිත විධිමත්ව කළමනාකරණය මඟින් සුරක්ෂිතතාවය ඇති කිරීම.

ii.) ආහාර නිෂ්පාදනයේදී රසායනික පොහොර හා පළිබෝධනාශක හා විස අවම කර, ඉවතලන අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් වසවිසෙන් තොර, පරිසර හිතකාමී සහ සෞඛ්‍යාරක්ෂිත කෘෂි නිෂ්පාදන ජනතාව වෙත ලබා දීම. රසායනික පොහොර භාවිතය විධිමත් කිරීම.

iii.) යාන්ත්‍රීකරණය නව තාක්ෂණය, කාර්යක්ෂම ජල කළමනාකරණය, භෝග විවිධාංගීකරණය පාංශු සංරක්ෂණ ක්‍රම හඳුන්වාදීම මඟින් බෝගවල නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සහ නිෂ්පාදන පිරිවැය අවම කිරීම.

iv.) ඉහළ ගුණාත්මයෙන් යුත් ස්වයං බීජ නිෂ්පාදනය, අගය එකතු කළ නිෂ්පාදන ක්‍රමවේද ගොවීන් අතර ප්‍රචලිත කිරීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ යහපත් නිෂ්පාදන පිළිවෙත් හඳුන්වාදීම මඟින් දේශීය සහ විදේශීය වෙළඳපල සඳහා ප්‍රමිතියෙන් උසස් කෘෂි නිෂ්පාදන සඳහා නිෂ්පාදකයන් යොමු කිරීම.

v.) සියළු කැඩී බිඳී ගිය වැව් අමුණු සහ ඇළමාර්ග ප්‍රතිසංස්කරණය සහ පුරන් කුඹුරු අස්වැද්දීම මඟින් වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දායක වීම.

- **කාර්යයන් හා කර්තව්‍යයන්**

i.) රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කෘෂිකර්ම විෂයට අදාළ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.

ii.) අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂවම හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.

iii.) නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

iv.) ආහාර සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි ආහාර නිෂ්පාදනය.

v.) තොග පවත්වා ගැනීම හා සැපයුම් කටයුතු ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම.

vi.) භෝග විවිධාංගීකරණය මත පදනම් වූ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

vii.) දේශීය කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක අගය පාරිභෝගික ප්‍රජාව වෙත සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම.

viii.) සම්ප්‍රදායික ගොවීන්, තරුණ පරපුර සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නවීන තාක්ෂණය සහිත කෘෂි අධ්‍යාපන අවස්ථා වෙත යොමු කිරීම.

ix.) තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම දිරිගැන්වීම.

x.) රසායනික පළිබෝධ සහ වෙනත් රසායනික සංයෝග නිශ්චිත ප්‍රමිතියක් සහිතව යෙදීම නියාමනය කිරීම.

xi.) කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන්නන් සඳහා වගා රක්ෂණ ක්‍රම හා ගොවි විශ්‍රාම ක්‍රමවේදයන් පුළුල් කිරීම.

xii.) සෘජු නිෂ්පාදකයන් සැකසුම් ආයතන, තොග වෙළඳ සමාගම් සහ අපනයන සමාගම් අතර සැලසුම් සබඳතා ශක්තිමත් කිරීම මඟින් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා දීම.

xiii.) දේශගුණික වෙනස්කම්, කාලගුණයේ දෛනික තොරතුරු, ගොවි ජනතාවට සන්නිවේදනය කිරීම මඟින් ස්වභාවික ආපදාවන් අවම කර ගැනීම.

xiv.) ප්‍රමිතියෙන් යුතු බීජ හා පැළැටි ගොවි ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.

xv.) ජල කළමනාකරණය හා ගොවීන්ගේ වගා අවශ්‍යතා අනුව ජල සැපයුම කළමනාකරණය කිරීම.

xvi.) කෘෂිකාර්මික සංවර්ධන කලාප, කෘෂි ගම්මාන හා තිරසාර ගෙවතු වගා සංවර්ධන වැඩසටහන් ප්‍රචලිත කිරීම.

xvii.) ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය.

xviii.) කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හා සංවිධාන නඟා සිටුවීම හා ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xix.) කාබනික පොහොර භාවිතය සහ වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා ක්‍රමයෙන් නැඹුරු වීමේ වැඩසටහන් පුළුල් කිරීම හා දිරි ගැන්වීම.

xx.) ගුණාත්මක තත්ත්වයේ පොහොර ආනයනය කිරීම හා බෙදා හැරීම රජයේ සහනාධාර ප්‍රතිපත්තිය තුළ කාර්යක්ෂවම ක්‍රියාත්මක කිරීම.

xxi.) නියමිත ප්‍රමිතියෙන් යුතු රසායනික පොහොර හා පරිසර හිතකාමී කාබනික පොහොර නිසි කලට බෙදා හැරීම සඳහා ක්‍රමවේද සැකසීම.

xxii.) දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියකට අනුගතව කාබනික පොහොර නිෂ්පාදනය දිරි ගැන්වීම.

xxiii.) දේශීය ගොවියා සහ පාරිභෝගිකයා සෑහීමට පත්වන ආකාරයේ සාධාරණ මිළ ප්‍රතිපත්තියක් සහ බෝග විවිධාංගීකරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

xxiv.) ගෙවතු වගා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xxv.) අතිරික්ත නිෂ්පාදනය ගබඩා කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීම.

xxvi.) කෘෂි නිෂ්පාදන අගය එකතු කර අපනයනය කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම.

xxvii.) ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා දේශීය බීජ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.

xxviii.) ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම.

xxix.) රජයේ ගොවිපළ හා බීජ නිෂ්පාදන ගොවිපල සංවර්ධනය.

xxx.) දේශීය නිෂ්පාදනය වැඩි කිරීම තුළින් ආහාර භෝග ආනයනය අවම කිරීම.

xxxi.) පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම.

xxxii.) සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු.

xxxiii.) නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම.

xxxiv.) පශු කෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම හා එම සතුන් රෝග වලින් ආරක්ෂා කිරීම හා නිරෝධායනය කටයුතු.

xxxv.) විවිධ භූගෝලීය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපළ සංවර්ධනය දිරි ගැන්වීම.

xxxvi.) පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා අපනයනය සඳහා දිරිගැන්වීම.

xxxvii.) මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපලවල් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම.

xxxviii.) කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයන් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදනය හා පරිභෝජන අවස්ථා පුළුල් කිරීම.

xxxix.) ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය.

xl.) ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු.

xli.) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම.

- **කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, හා රාජ්‍ය සංස්ථා (2022.07.22 දිනට පසු ක්‍රියාත්මක වන පරිදි)**

i.) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ii.) ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

iii.) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

iv.) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

v.) වී අලෙවි මණ්ඩලය

vi.) හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය

vii.) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP)

viii.) ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම අධිකාරිය)

ix.) ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය (NIPHM)

x.) සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

xi.) ජාතික පොහොර ලේකම් කාර්යාලය

xii.) සීමාසහිත ලංකා පොහොර සමාගම

xiii.) කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

xiv.) ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)

xv.) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB)

xvi.) මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් (Milco)

xvii.) සීමාසහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම

- **ක්‍රියාත්මක කරන අණපනත්**

i.) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත (1999 අංක 20)

ii.) ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)

iii.) ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)

iv.) ගස් හෙලීම (පාලනය කිරීම) පනත (1951 අංක 9)

v.) බීජ වී පනත (2003 අංක 22)

vi.) පස් සංරක්ෂණ පනත (1996 අංක 24)

vii.) වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14)

viii.) ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන පනත (1972 අංක 5)

ix.) කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47)

x.) රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත (1972 අංක11)

xi.) පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත (1980 අංක 33)

xii.) පැළෑටි ආරක්ෂා කිරීමේ පනත (1999 අංක 35)

xiii.) පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)

xiv.) ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත (1973 අංක 18)

xv.) සත්ත්ව රෝග පනත (1992 අංක 59)

xvi.) සත්ත්ව ආහාර පනත (1986 අංක 15)
xvii.) සත්ත්ව පනත (1958 අංක 29)
xviii.) පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46)
xix.) වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති විෂය ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

- **අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ යුතු තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

i.) අරමුණ 2 - සාගිනි නිමවා, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්ත්වයක් සාක්ෂාත් කරගැනීම සඳහා තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.
ii.) අරමුණ 12 - තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය - සාරාංශය

2022 වසර තුළ කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංශ විසින් සිදුකරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් හා එම අංශවල මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය

- කෘෂිකර්ම අමාත්‍යාංශය මූල්‍ය ප්‍රගතිය - සාරාංශය

අ/අ	විස්තරය	ක්‍රියාත්මක ආයතනය	වෙන්කළ මුදල (රු.මී.)	වියදම් කළ මුදල (රු.මී.)	මූල්‍ය ප්‍රගතිය (%)
1.	සමස්ත අයවැය	MOA	123,052.38	95,151.01	77.33
1.1	ප්‍රාග්ධන		31,464.16	28,254.44	89.80
1.2	පුනරාවර්තන		91,588.21	66,896.57	73.04

01. කෘෂිකර්ම අංශය (වැය ශීර්ෂ අංක 118)

- සංවර්ධන වැඩසටහන්

අ/අ	සංවර්ධන වැඩසටහන	ක්‍රියාත්මක ආයතනය	වෙන්කළ මුදල (රු.මී.)	වියදම් කළ මුදල (රු.මී.)	මූල්‍ය ප්‍රගතිය (%)
1	කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	MOA	45.00	37.01	82.25
2	නව තාක්ෂණය හඳුන්වා දීම		610.00	483.78	80.63
3	කෘෂිකර්ම සහ සත්ත්ව නිෂ්පාදනය සඳහා තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන		50.00	-	-
4	JICA ව්‍යාපෘතිය		5.94	5.94	100
5	118-2-3-81-2202-0/13 යටතේ		0.04	0.04	100
උප එකතුව - i			**710.98**	**526.77**	**74.10**
1	දේශගුණික සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය (CSIAP) ලෝක බැංකු ණය		3,950.00	3,849.68	97.46
2	කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) - IFAD		2,000.00	1,522.99	76.15
3	කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය (ASMP) උපාංග t 2 - ලෝක බැංකු ණය		4,190.00	3,685.12	87.95
4.	කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා ඇති බාධක ඉවත් කිරීමේ ව්‍යාපෘතිය (SARP)		450.00	8.11	1.80
5	බඩල්ගම නව කිරි සැකසුම් කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය - ඩෙන්මාර්ක් ආධාර		215.00	72.81	33.87
6	කුඩා පරිමාණ කිරි නිෂ්පාදන සමූපකාර සමිති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (ප්‍රංශ ආධාර)		760.00	381.16	50.16
7	ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා උපකාර කිරීම (යුරෝපා සංගමය)		65.00	0.00	0.00

අ/අ	සංවර්ධන වැඩසටහන	ක්‍රියාත්මක ආයතනය	වෙන්කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
8	ජාතික ශාක නිරෝධායන සේවය සඳහා උපකරණ ලබා දීම (KOICA)		75.00	3.86	5.15
උප එකතුව -ii			**11,705.00**	**9,523.82**	**81.37**
1	ගොවීන් සඳහා දායකත්ව රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම	AAIB	600.00	600	100
2	කෘෂිකාර්මික හා කෘෂි රක්ෂණ මණ්ඩලය		10.00	-	-
උප එකතුව - iii			**610.00**	**600**	**82.99**
1	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය	HARTI	20.00	14	70.00
2	විශ්ව විද්‍යාල සමග ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කිරීම	SLCARP	20.00	8.10	40.50
3	වී අලෙවි මණ්ඩලය	PMB	3,150.00	2,928.99	92.98
උප එකතුව -iv			**3,190.00**	**2,951.09**	**92.51**
මුළු එකතුව - (i+ii+iii+iv)			**16,215.98**	**13,601.68**	**83.88**

02. පශු සම්පත් සංවර්ධන අංශය (වැය ශීර්ෂ අංක 427)

- මූල්‍ය ප්‍රගතිය - සාරාංශය

අ/අ	විස්තරය	2022 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
1.	**සමස්ත අයවැය**	728.65	523.20	71.80
1.1	**පුනරාවර්තන**	417.82	388.33	92.90
1.2	**ප්‍රාග්ධන**	310.83	134.88	43.40

- සංවර්ධන වැඩසටහන්

අ/අ	සංවර්ධන වැඩසටහන	2022 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
01.	දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම	25.00	14.29	57.16
02.	සතුන් අභිජනනය කිරීමේ ගොවිපොළවල් ස්ථාපනය කිරීම	25.00	4.37	17.48
03.	කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවි ව්‍යවසායකයන් සංවර්ධනය සහ කිරි පොකුරු ගම්මාන සංවර්ධනය	32.00	29.73	92.91
04.	පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන	40.00	13.21	33.03
05.	කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධනය	37.00	12.94	34.97

අ/අ	සංවර්ධන වැඩසටහන	2022 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
06.	සූකර කර්මාන්ත සංවර්ධන වැඩසටහන	30.00	4.72	15.73
07.	ඵලදායිතා වැඩිදියුණු කිරීම තුළින් මධ්‍යම හා කුඩා පරිමාණ කිරි ගොවිපොළ ප්‍රවර්ධනය කිරීම	98.00	48.73	49.72
08.	එළු පොකුරු ගම්මාන සංවර්ධන වැඩසටහන	15.00	4.99	33.27
	එකතුව	**302.00**	**132.98**	**44.03**

03. පොහොර අංශය (වැය ශීර්ෂ අංක 426)

- මූල්‍ය ප්‍රගතිය - සාරාංශය

අ/අ	විස්තරය	2022 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
1.	සමස්ත අයවැය	99,717.54	75,163.79	75
1.1	ප්‍රාග්ධන වියදම්	14,445.72	14,289.27	99
1.2	පුනරාවර්තන වියදම්	85,271.82	60,874.52	71
පුනරාවර්තන				
1	පොහොර සහනාධාර වැඩසටහන	98,400.00	74,039.41	75.24

- සංවර්ධන වැඩසටහන්

අ/අ	සංවර්ධන වැඩසටහන	2022 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
ප්‍රාග්ධන				
1.	ජාතික පොහොර කළමණාකරණ තොරතුරු පද්ධතිය	20.00	7.06	35.30
2.	ලංකා පොහොර සමාගමේ පොහොර පර්යේෂණාගාරය වැඩිදියුණු කිරීම	20.00*	-	-
3.	ආහාර සුරක්ෂිතතා වැඩසටහන	500.00	414.31	82.86
4.	ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය (ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය)	5.00	-	භාණ්ඩාගාරය විසින් අක්මුදල් ලබා දී නොමැත.
5.	පසු අස්වනු තාක්ෂණ ආයතනය	30.00	5.00	16.67
6.	ආර්ථික මධ්‍යස්ථාන	25.00**	-	-
	එකතුව	**600.00**	**426.37**	**71.06**

* පොහොර පර්යේෂණාගාරය වැඩිදියුණු කිරීම සඳහා මිල දී ගත් උපකරණ සඳහා ඉන්වොයිස් ඉදිරිපත් කර ඇති නමුත් 2022.12.31 දින වන තෙක් ගෙවීම් සිදු කර නැත.

** වෙළඳ අමාත්‍යාංශය වෙත පවරා ඇත.

04. ග්‍රාමීය ආර්ථික භෝග වගා ප්‍රවර්ධන අංශය (වැය ශීර්ෂ අංක 407)

- මූල්‍ය ප්‍රගතිය - සාරාංශය

අ/අ	සංවර්ධන වැඩසටහන	**2022 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මී.)**	**වියදම් කළ මුදල (රු.මී.)**	**මූල්‍ය ප්‍රගතිය (%)**
1	ප්‍රාග්ධන	253.36	211.93	83.65
2	පුනරාවර්තන	223.84	199.11	88.95

- සංවර්ධන වැඩසටහන්

අ/අ	සංවර්ධන වැඩසටහන	**2022 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මී.)**	**වියදම් කළ මුදල (රු.මී.)**	**මූල්‍ය ප්‍රගතිය (%)**
01	භෝග වගා ව්‍යාපෘතිය	100.00	91.65	91.65
02	එළු පාලන ව්‍යාපෘතිය	40.00	39.05	97.63
ශ්‍රී ලංකා හදබිම අධිකාරිය		100.00	76.70	76.70
මුළු එකතුව		**240.000**	**207.40**	**86.00**

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

i.) කෘෂිකර්ම අංශය

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය අනුව ගෝලීය සංවර්ධන අභිමතාර්ථ (තිරසර සංවර්ධන අරමුණු) සාක්ෂාත් කරගැනීම සහ ජාතික ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කෘෂිකර්ම අංශය විසින් සංවර්ධන අරමුණු මෙහෙයවා ඇත.

ඒ අනුව, 2022 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් අතර කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන සඳහා රු. මි. 45.00 ක් ද , නව තාක්ෂණික යෙදවුම් සඳහා රු.මි. 610.00 ක් සහ කෘෂිකර්ම සත්ත්ව නිෂ්පාදනය සඳහා වන තරුණ ව්‍යවසායකත්ව වැඩසටහන සඳහා රු.මි. 50.00 වෙන් කර ඇත. තවද, විදේශ ණය යටතේ සිදු කරනු ලබන ව්‍යාපෘති සඳහා සිදුකර ඇති සමස්ත ආයෝජනය රු.මි. 11,705.00 ක්වේ.

එමෙන්ම, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය මඟින් සිදුකරනු ලබන කෘෂිකාර්මික අංශයේ සමාජ ආර්ථික පර්යේෂණ සඳහා රු.මි. 20.00 ක්ද, විශ්ව විද්‍යාල සමඟ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා රු.මි. 20.00 ක් ද, වී අළෙවි මණ්ඩලයේ වී මිලදී ගැනීම් කටයුතු සඳහා රු.මි 3,150.00 ක් ද, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් සිදුකරනු ලබන ගොවි ප්‍රජාවගේ සමාජ ආරක්ෂණ කටයුතු සඳහා රු.මි. 610.00 ක් ද ලබා දී ඇත.

ii.) පශු සම්පත් අංශය

පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමෙහිලා ප්‍රමුඛතම වන කෘෂිකර්ම අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය, දේශීය නැවුම් කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීමේ ඉලක්කය ප්‍රමුඛව දේශීය කිරි නිෂ්පාදකයා ශක්තිමත් කරමින් දේශීය කිරි කර්මාන්තය නැංවීම මෙන්ම එළු, කුකුළු, සූකර ඇතුළු අනෙකුත් උප අංශ සංවර්ධනය කර තත්ත්වයෙන් උසස් ගුණාත්මක සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධනය හා පරිසර හිතකාමී ලෙස සත්ත්ව පාලනයේ යෙදීම දිරිගැන්වීම උදෙසා දේශීය සහ විදේශීය අරමුදලින් මූල්‍යනය වන විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

පශු සම්පත් අංශයේ දැක්ම වන්නේ තිරසර පශු සම්පත් සංවර්ධනයක් තුළින් ස්වයංපෝෂිත දැයක් යන්නයි. එසේම එම අංශයේ මෙහෙවර ලෙස මනා සම්පත් කළමනාකරණයක් මගින් දේශීය ඉල්ලුමට සරිලන පරිදි ඉහළ ගුණත්වයකින් යුත් පශු සම්පත් නිෂ්පාදන වර්ධනය සහ දේශීය මෙන්ම අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ තරහකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැලෙන දේශීය ව්‍යවසායකයින් බිහිකිරීම හඳුනාගෙන ඇත. ඉහළ නිෂ්පාදන ඵලදායීතාවයක් සහිත නීරෝගීමත් සත්ත්ව ගහණයක් පවත්වාගෙන යාම සඳහා කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් වෙනුවෙන් තාක්ෂණික මගපෙන්වීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලබන අතර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු හා දිවයින පුරා විසිරී පවතින ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල හරහා ක්ෂේත්‍ර මට්ටමේ පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම අංශයේ අරමුණු වන්නේ රටෙහි කිරි අවශ්‍යතාවය දේශීය නිෂ්පාදනය තුළින් ළඟා කර ගැනීම, දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය තුළින් කුකුල් මස් හා බිත්තර ඇතුළු අනෙකුත් සත්ත්ව නිෂ්පාදනයන් ඉහළ නැංවීම, පරිසර හිතකාමී සත්ත්ව පාලන ක්‍රම ප්‍රවර්ධනය, පශු සම්පත් සංවර්ධනය තුළින් තිරසර හා සමානාත්මක ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ සත්ත්ව පාලන ගොවීන්ට ලබාදීම හා සත්ත්ව ආහාර නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය දේශීය වශයෙන් සුලභ කිරීම යි.

iii.) පොහොර අංශය

කෘෂිකර්ම අමාත්‍යාංශයේ පොහොර අංශය විසින්, තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යායපත්‍රය අනුව ගෝලීය සංවර්ධන අභිමතාර්ථ (තිරසර සංවර්ධන අරමුණු) සාක්ෂාත් කර ගැනීම සහ නිසි ප්‍රමිතියෙන් යුතු පොහොර භාවිතය දිරි ගැන්වීම, ඒවා නිසි කලට බෙදාහැරීමට ක්‍රමවේද සැකසීම හා පරිසර හිතකාමී ශාක පෝෂක නිෂ්පාදනය දිරි ගැන්වීම හා ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා 2022 වසර තුළ සිය සංවර්ධන අරමුණු මෙහෙයවා ඇත.

2022 වර්ෂය තුළදී පොහොර අංශය විසින් ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 04 ක් දියත් කර ඇත. ඒවා නම්, ජාතික පොහොර කළමනාකරණ තොරතුරු පද්ධතිය (National Fertilizer Management Information System) නිර්මාණය කිරීම, ලංකා පොහොර සමාගමේ පොහොර පරීක්ෂණාගාරය වැඩිදියුණු කිරීම, ආහාර සුරක්ෂිතතා වැඩසටහන හා ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම් ඒකාබද්ධ කිරීම යන වැඩසටහන් වේ. මීට අමතරව, ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමේ හා තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ පොහොර සහනාධාරය ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර එමගින් වී සඳහා අවශ්‍ය පොහොර ගොවියාට නොමිලේ ලබා දීම සහ අනෙකුත් බෝග සඳහා අවශ්‍ය පොහොර සහන මිලකට ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව, 2022 වසරේදී ගොවීන් වෙත සහනාධාර පොහොර බෙදා දීමද සිදු කොට ඇත. 2022 වසරේ යල කන්නය තුළ කාබනික සණ පොහොර (කොම්පෝස්ට්) මෙ.ටො. 164,335.11 ක්ද, කාබනික දියර පොහොර ලීටර 6,098,290.43 ක්ද, පෙව දියර පොහොර ලීටර 6,339,084.48 ක්ද, විශේෂිත දියර පොහොර ලීටර 5,372.93 ක්ද සපයා ඇත. එමෙන්ම, 2022 වසරේදී රසායනික පොහොර මෙ.ටො. 224,419 ක් ආනයනය කර ඇති අතර ඉන් බෙදාහැර ඇති මුළු රසායනික පොහොර ප්‍රමාණය මෙ.ටො. 160,972 ක් වේ.

2022 වර්ෂයේදී පොහොර අංශය සඳහා, රසායනික හා කාබනික පොහොර සඳහා වන පොහොර සහනාධාර වැඩසටහන වෙනුවෙන් පුනරාවර්තන වියදම් ලෙස රු.මි. 98,400.00 ක් වෙන් කර ඇති අතර ප්‍රාග්ධන වියදම් ලෙස ජාතික පොහොර ලේකම් කාර්යාලයේ කළමණාකරණ තොරතුරු පද්ධතිය සඳහා රු.මි. 20.00 ක්ද, ලංකා පොහොර සමාගමේ පොහොර පර්යේෂණාගාරය වැඩිදියුණු කිරීම සඳහා රු. මි. 20.00 ක්ද, ආහාර සුරක්ෂිතතා වැඩසටහන සඳහා රු.මි. 500.00 ක්ද වෙන් කර ඇත. මීට අමතරව රාජ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් වන ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස රු.මි. 05.00 ක මුදලක් හා පසු අස්වනු තාක්ෂණ ආයතනය සඳහා රු.මි. 30.00 ක මුදලක් වෙන් කොට ඇත. එමෙන්ම, පෙර අමාත්‍යාංශය සතුව පැවති පසුව වෙළඳ අමාත්‍යාංශය වෙත පවරන ලද ආර්ථික මධ්‍යස්ථාන සඳහා රු.මි. 25.00 ක් වෙන් කොට ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ පොහොර අංශය යටතේ ක්‍රියාත්මක වන සියළු ආයතන ආහාර සුරක්ෂිතතාව, නිසි ප්‍රමිතියෙන් යුත් ගුණාත්මක පොහොර ගොවීන්ට ලබාදීම සහතික කිරීම තුළින් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා කටයුතු කිරීමට අමාත්‍යාංශය හා ඒකාබද්ධ වී 2022 වර්ෂය තුළ සිය වැඩසටහන් දියත් කර ඇත.

iv.) ග්‍රාමීය ආර්ථික අංශය

පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය නමින් අංක 2196/27 දරණ 2020.10.06 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව කෘෂිකර්ම රේඛීය අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද මෙම අංශය, පසුව අංක 2277/53 දරණ 2022.04.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ලෙස සංශෝධනය විය. වර්තමානයේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය ආර්ථික අංශය ලෙස ක්‍රියාත්මක වේ.

සංවිධාන සටහන - කෘෂිකර්ම අංශය



සංවිධාන සටහන - පශු සම්පත් අංශය



සංවිධාන සටහන - පොහොර අංශය



පරි.නි.-පරිපාලන නිලධාරී මා.ස.- මාණ්ඩලික සහකාර සං.සහ.- සංවර්ධන සහකාර කෘෂි.උප.-කෘෂිකර්ම උපදේශක කළ.සහ-කළමණාකරණ සහකාරකා.කා.ඝකාර්යාල කාර්ය සහයක

ශ්‍රී.ලං.ප.සේ - ශ්‍රී ලංකා පරිපාලන සේවය
ශ්‍රී.ලං.කෘ.සේ. - ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය
ශ්‍රී.ලං.සැ.සේ. - ශ්‍රී ලංකා සැලසුම් සේවය
ශ්‍රී.ලං.ගණ.සේ. - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය

සංවිධාන සටහන : ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය



(2022.12.31 දිනට අනුමත සංවිධාන සටහන දක්වා ඇත**)**

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

01. කෘෂිකර්ම අංශය

2022 වර්ෂයේ කෘෂිකර්ම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

1. කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

1.1. **හැඳින්වීම**

රැකියා වියුක්ත තරුණ ප්‍රජාව සහ සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් ඈත් වෙමින් සමාජයේ හුදෙකලා වන විවිධ අධ්‍යාපන මට්ටම්වලින් යුත් තරුණ ප්‍රජාව වෙත වාණිජ කෘෂි ව්‍යාපාර සඳහා ඇති අවස්ථාව හඳුන්වා දීමත්, ප්‍රාදේශීය මට්ටමින් තරුණ ව්‍යවසායකයින් කෘෂි සංවර්ධන වැඩසටහන් සඳහා සම්බන්ධ කරගැනීම මගින් තවදුරටත් දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය ඉහළ නැංවීමත් කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ අවධානය යොමු කර ඇත.

1.2. කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

මෙම වැඩසටහන සඳහා වැය ශීර්ෂ අංක 118-02-03-062-2509 යටතේ රු.මි. 45.00ක් වෙන් කර ඇති අතර ඉන් රු.මි. 37.01 ක් වියදම් කර ඇත. මූල්‍ය ප්‍රගතිය 82.25% කි.

1.3. කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

1.3.1. "ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය" සකස් කිරීම

සෞභාග්‍යයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයේ අරමුණුවලට අනුකූලව යැපුම් ආර්ථිකය වෙනුවට නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීම සඳහා කෘෂි අංශයේ දායකත්වය ඉහළ නැංවීම සඳහා ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කර ඇත. තවද, ආහාර පද්ධති තිරසාර ලෙස සුරක්ෂිත කිරීම, හරිත කෘෂිකර්මාන්තය ප්‍රවලිත කිරීම රසායනික පොහොර භාවිතය අවම කිරීම, වගා සහ අස්වැන්න ආරක්ෂා කරගැනීම ප්‍රමුඛව දේශීයව ස්වයංපෝෂිත වෙමින් අපනයනය ප්‍රමුඛ කරගන්නා කෘෂි ව්‍යවසායකයන් ගොඩනැගීම සඳහා තරුණ ප්‍රජාව කෘෂිකර්මයේ විවිධ අංශයන් වෙත ආකර්ශණය කරගැනීම විශේෂයෙන් අවධානයට යොමු කර ඇත.

- **භෞතික ප්‍රගතිය (2022.12.31 දිනට)**

ප්‍රධාන තේමා 10ක් යටතේ ප්‍රධාන ඉලක්ක 13ක් සපුරාගැනීම සඳහා සකස් කරන ලද "ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය" 2022.12.31 දින වන විට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

1.3.2. පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්

මෙම වැඩසටහන සඳහා රු.මි. 28.60 ක මුදලක් 2022 වසරේදී වෙන් කොට ඇති අතර ඉන් රු.මි. 2.90 ක් 2021 වර්ෂය සඳහා වූ බැඳීම් වේ. ඒ යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

i.) තරුණ ව්‍යවසායක සංවර්ධන වැඩසටහන - 2022

- හැඳින්වීම සහ අරමුණ

මෙම ව්‍යාපෘතිය මගින් දිවයින පුරා විසිරී සිටින තරුණ කෘෂි ව්‍යවසායකයින් නගාසිටුවීමත් එමගින් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමත් අපේක්ෂා කරනු ලබන අතර මෙහි අරමුණ වන්නේ දිස්ත්‍රික් මට්ටමින් තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් තරුණ කෘෂි ව්‍යවසායකයින් බිහි කිරීම හා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි.

- මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 22.14 ක් වෙන් කළ අතර එම සම්පූර්ණ මුදලම වියදම් කර ඇත.

- භෞතික ප්‍රගතිය

අ/අ	ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරා ගත යුතු ඉලක්ක	අත් කරගත් භෞතික ප්‍රගතිය
1.	අගය එකතුකළ කෘෂි නිෂ්පාදන හා ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව ප්‍රවර්ධනය තුළින් තරුණ කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘතිය (කළුතර දිස්ත්‍රික්කය)	තෝරාගන්නා ලද ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන් සහ උපාංග මෙවලම් ලබා දීම	ප්‍රතිලාභීන් 11 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 1ක් ක්‍රියාත්මක කිරීම. ආරක්ෂිත ගෘහ 6ක් සහ අගය එකතුකළ නිෂ්පාදන ආශ්‍රිත ඒකක 5ක් ලබා දීම.
2.	සුළු වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීම තුළින් ග්‍රාමීය ආර්ථිකය දිරිමත් කිරීම සහ අතහැර දැමූ කුඹුරු සඳහා ‘‘සෝජන් වගා ක්‍රමය’’ හඳුන්වා දීම (කළුතර දිස්ත්‍රික්කය).	ප්‍රතිලාභීන් 28දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 2ක් ක්‍රියාත්මක කිරීම සහ ක්ෂේත්‍ර චාරිකා ක්‍රියාත්මක කිරීම.	ප්‍රතිලාභීන් 28 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 2ක් සහ ක්ෂේත්‍ර චාරිකා දෙකක් සිදු කරන ලදී.
3.	යහපත් කෘෂිකාර්මික පිළිවෙත් යටතේ කිරින්ද පුහුල්වැල්ල කොට්ඨාසය තුළ ඇම්බුන් කෙසෙල් වගාවට තරුණ ප්‍රජාව දායක කර ගැනීම (මාතර දිස්ත්‍රික්කය).	ගොවීන් 80 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 4ක් ක්‍රියාත්මක කිරීම.	ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා ඇම්බුන් කෙසෙල් පැල 50ක් සිටුවීමෙන් පසු එක් අයෙකුට රු.7,500 බැගින් ලබාදෙන ලදී.
4.	බිහු පාලන ගම්මාන පිහිටුවීම මඟින් තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම (බදුල්ල දිස්ත්‍රික්කය)	පුහුණු වැඩසටහන් 20ක් ක්‍රියාත්මක කිරීම සහ මී මැසි පෙට්ටි 20ක් බෙදා දීම.	බණ්ඩාරවෙල, වැලිමඩ, ඇල්ල, හල්දුම්මුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සිදු කරන ලදී.
5.	කෘෂිකාර්මික වෘත්තිකයන් හා ගොවීන් සඳහා ඩිජිටල් සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම පිණිස ඊ - කෘෂිකාර්මික තාක්ෂණය හඳුන්වා දීම (කොළඹ දිස්ත්‍රික්කය).	දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.
6.	කුඩා පරිමාණ තරුණ කෘෂි ව්‍යවසායකත්වය දේශීය හා අපනයන වෙළෙඳපොළ වෙත ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැලසීම (කළුතර දිස්ත්‍රික්කය).	ප්‍රතිලාභීන් 30 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 2ක්, ආරක්ෂිත ගෘහ 10ක් සහ අගය එකතු කිරීමේ ඒකක 20ක් බෙදා දීම.	ප්‍රතිලාභීන් තෝරා ගැනීම අවසන් කර ඇත. ක්ෂේත්‍ර පරීක්ෂාවන් සමඟ ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදු කර ඇත. තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා

අ/අ	ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරා ගත යුතු ඉලක්ක	අත් කරගත් භෞතික ප්‍රගතිය
			ව්‍යාපෘතියේ මූල්‍ය දායකත්වය අනුමත අදාළ මූල්‍ය ලේඛන සහ අදාළ නිලධාරීන්ගේ නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසුව ලබා දෙනු ලැබේ. ව්‍යාපෘති කමිටුවේ නියමයන් සහ කොන්දේසි යටතේ යන්ත්‍රෝපකරණ, උපකරණ සහ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වන වියදම්වලින් 50% ප්‍රතිපූරණය කරනු ලැබේ.
7.	ආහාර සුරක්ෂිතතාව සඳහා ආන්තික සහ ඌන භාවිත ඉඩම් තුළ දේශීය අල බෝග වගාව ව්‍යාප්ත කිරීම (කළුතර දිස්ත්‍රික්කය).	නිලධාරීන් 180 ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ අක්කර 280ක් සඳහා ගොවීන්ට රෝපණ ද්‍රව්‍ය වෙනුවෙන් සහනාධාර ලබා දීම.	කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ සංවර්ධන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් (TOT) පවත්වා ඇත. ප්‍රතිලාභීන් 280 දෙනෙකුට මූල්‍ය ආධාර ලැබී ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13ක ක්ෂේත්‍ර දින 13ක් පවත්වා ඇත. දිස්ත්‍රික් මට්ටමේ ක්ෂේත්‍ර දිනයක් පවත්වා ඇත.
8.	කාබනික කෘෂිකාර්මික පිළිවෙත් යටතේ කෙසෙල් වගාව ප්‍රචලිත කිරීමට තරුණ ව්‍යවසායකයින් දිරිගැන්වීම (මාතර දිස්ත්‍රික්කය).	ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා කෙසෙල් පැල 1000ක් ලබා දීම.	ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා, ඇම්බුන් කෙසෙල් පැල 50ක් සිටුවීමෙන් පසු එක් අයෙකුට රු.7500 බැගින් ලබාදෙන ලදී.
9.	තරුණ ව්‍යවසායකත්වයෙන් සෝජාන් ක්‍රමය යටතේ පුරන් කුඹුරුවල කෘෂි බෝග ව්‍යාප්ත කිරීමේ වැඩසටහන (කොළඹ දිස්ත්‍රික්කය)	දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් අක්කර 2ක් සඳහා රෝපණ ද්‍රව්‍ය හා පොහොර සැපයීම
10.	ගෙවතු නයි මිරිස් (*Capsicum chinense)* වගාව හඳුන්වාදීම.	ගොවීන් 48 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 1ක් ක්‍රියාත්මක කිරීම සහ නයි මිරිස් පැල 4800ක් බෙදා දීම.	ගොවින් 50 දෙනෙකු තෝරා ගන්නා ලදී.2022 නොවැම්බර් මස දී පුහුණු වැඩසටහන පැවැත්වූ අතර, බීජ (ස්කොච් බොනට්) 5000ක් සහ පොලි බෑග් 5000ක් බෙදා දෙන ලදී
11.	පවතින පළතුරු වගාව මඟින් අකුරැස්ස කොට්ඨාසයේ තරුණ ප්‍රජාවට අතිරේක අදායමක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය.	ගොවීන් 30 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ කප්පාදු කට්ටල 30ක් බෙදා දීම.	ගොවින් 25 දෙනෙකු දායක වන ලදී. 2022 නොවැම්බර් මස පුහුණු වැඩසටහන පවත්වන ලදී. කප්පාදු කියත් 25ක්, සේකටියර්, ආරක්ෂක බඳ පටි, හෙල්මට් හා බද්ද පිහි ලබා දෙන ලදී. මීටර 42ක් දිග කඹ 11ක් ලබාදෙන ලදී.
12.	පෙයාර්ස් වගාව ප්‍රවර්ධනය	පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ පෙයාර්ස් පැල බෙදා දීම.	ඌවපරණගම, වැලිමඩ, හපුතලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සිදු කරන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ගොවි පුහුණුව සිදු කෙරේ. ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලංසුකරුවන් කැඳවීම සිදු කෙරෙමින් පවතී. අක්මුදල්

අ/අ	ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරා ගත යුතු ඉලක්ක	අත් කරගත් භෞතික ප්‍රගතිය
			ලබාගැනීම සඳහා භාණ්ඩාගාරය දැනුවත් කර ඇත
13.	බිහු පාලන ගම්මාන පිහිටුවීම මඟින් තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය හා ජීවන තත්ත්වය ඉහල නැංවීම (බදුල්ල දිස්ත්‍රික්කය).	පුහුණු වැඩසටහන් 10ක් ක්‍රියාත්මක කරමින් 50% දායකත්වය යටතේ මී මැසි පෙට්ටි 500ක්, ආරක්ෂිත ඇඳුම් කට්ටල හා උපකරණ බෙදා දීම	බණ්ඩාරවෙල, වැලිමඩ, ඇල්ල, හල්දුම්මුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සිදු කරන ලදී.
14.	බිම්මල් ව්‍යාපෘතිය (රත්නපුර දිස්ත්‍රික්කය).	බිම්මල් ගෘහ 13ක් ලබා දීම.	බිම්මල් ගෘහ 12ක් ලබා දෙන ලදී.
15.	කීර වගාව ව්‍යාපෘතිය (කෑගල්ල දිස්ත්‍රික්කය).	දැල් රෝල් 100, උදලු, මුල්ලු, රබර් නල, ප්ලාස්ටික් කූඩ මිලදී ගැනීම හා බෙදා දීම. පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ තාක්ෂණික පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ කොම්පෝස්ට් පොහොර කිලෝග්‍රෑම් 200 සැපයීම.	වසම් මට්ටමින් ප්‍රතිලාභීන් 10 දෙනෙකු හඳුනාගෙන අවසන් වී ඇත. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට බිම් සකස් කිරීම අරඹා ඇත. දැල් රෝල් 100, උදලු, මුල්ලු, රබර් නල, ප්ලාස්ටික් කූඩ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඇත.
16.	ගන්නෝරුව, සේවාස්ථාන පුහුණු ආයතනයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේ මාර්ගගත පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම.	ශ්‍රවණාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.	ගන්නෝරුව ශ්‍රවණාගාරයේ අදාළ ප්‍රතිසංස්කරණ සිදු කිරීම.
17.	තරුණ ගොවි සමාජවල සාමාජිකයන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබා දීම (කෘෂිකර්ම අමාත්‍යාංශය).	පොලිතින්, තවාන් තැටි සහ වගා මලු ලබාදීම. මී මැසි පෙට්ටි 50ක් බෙදා හැරීම. පාසල් තරුණ ගොවි සමාජ සංවර්ධනය කිරීම සඳහා මී මැසි පෙට්ටි 50ක් සහ බීජ කට්ටල ලබා දීම.	පොලිතින් කිලෝග්‍රෑම් 1000ක්, තවාන් තැටි 1000ක් සහ වගා මලු 3000ක් ලබාදීම. මී මැසි පෙට්ටි 50ක් බෙදා හැරීම. පාසල් තරුණ ගොවි සමාජ 25ක් සංවර්ධනය කිරීම සඳහා මී මැසි පෙට්ටි 50ක් සහ බීජ කට්ටල ලබා දීම.

ii.) සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන -2022

- අරමුණ

කෘෂිකර්ම අමාත්‍යාංශය හා අනුයුක්තව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන් වල සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන්ගේ කෘෂිකර්ම දැනුම වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 0.94 ක් වෙන් කළ අතර එම සම්පූර්ණ මුදලම වියදම් කර ඇත.

- භෞතික ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරා ගත යුතු ඉලක්ක	අත් කරගත් භෞතික ප්‍රගතිය	සටහන
සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.	සංවර්ධන නිලධාරීන් 1000ක් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	සංවර්ධන නිලධාරීන්ගේ දනුම කුසලතා සංවර්ධනය. පුහුණු වැඩසටහන ලබාදුන් සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව - 57 සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රදේශය - කොළඹ, ගම්පහ, කළුතර, මාතලේ, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, වවුනියාව, මඩකලපුව, අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මොණරාගල, රත්නපුර, කෑගල්ල දිස්ත්‍රික්කයන් තුළ	දිවයින පුරා පැවති වසංගත තත්වයන් හේතුවෙන් සියලුම දිස්ත්‍රික්කයන්හි අපේක්ෂිත සියලුම නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සිදු කිරීමට අපහසු විය.

iii.) වාර්ෂික බෝග නිෂ්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම

- හැඳින්වීම

සියළුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් සහ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්ගේ මූලිකත්වයෙන් කෘෂිකාර්මික දත්ත ආශ්‍රයෙන් වාර්ෂික බෝග නිෂ්පාදන සැලැස්ම සකස් කරනු ලැබේ. මෙම වාර්තාව මගින් වර්ෂයට අදාළව සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි බෝග නිෂ්පාදන තොරතුරු එනම්; බෝගයන්හි ඉලක්කගත වගා වපසරිය, අපේක්ෂිත අස්වැන්න, බීජ අවශ්‍යතාවය, පොහොර අවශ්‍යතාවය සහ වෙනත් කර්යයන්හි ඉලක්ක, ගොවිජන සේවා බල ප්‍රදේශ මට්ටමින් සකස් කර අදාළ කෘෂිකර්ම බලධාරීන් හා පාර්ශවකරුවන් වෙත ඉලක්ක ලෙස ලබා දෙනු ලබයි.

- අරමුණ

2023 යල සහ 2023 මහා කන්නයට අදාළව දිස්ත්‍රික් මට්ටමින් වගා කිරීමට අපේක්ෂිත බෝග වගා වපසරිය පිළිබඳව දත්ත ලබා ගැනීම.

- මූල්‍ය හා භෞතික ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 0.30 ක් වෙන් කළ අතර එම සම්පූර්ණ මුදලම වියදම් කර ඇත. එමෙන්ම, මේ යටතේ වාර්ෂික බෝග සැලසුමේ පිටපත් 250ක් මුද්‍රණය කිරීම සහ බෙදාහැරීම අවසන් කර ඇත.

ඡායාරූපය අංක 01 - පිටු අංක 73

iv.) මාතලේ අළු විහාර රජමහ විහාරස්ථාන භූමිය ආශ්‍රිත හෙළ බොජුන්හල ආරම්භ කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීම

- හැඳින්වීම සහ අරමුණ

මාතලේ අළුවිහාරය රජමහා විහාර පූජා භූමිය ආශ්‍රිතව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ඉදිකිරීම් කටයුතු අවසන්කළ හෙළ බොජුන්හල මහජනතාව වෙත විවෘත කිරීම සඳහා ලබා ගත යුතුව පැවති ප්ලාස්ටික් මේස 10 හා පුටු 50 ක් මිලදී ගැනීම සඳහා රු.මි. 0.35 ක ප්‍රතිපාදන ලබා දීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදී. තවද, අළුවිහාර විහාරස්ථානය වෙත

පැමිණෙන බැතිමතුන් මෙන්ම ප්‍රදේශවාසීන් වෙත සෞඛ්‍ය සම්පන්න අහාර පාන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මේ තුළින් මහඟු අවස්ථාවක් හිමි වේ. එසේම, තෝරාගන්නා ලද ගොවි කණ්ඩායම් ආශ්‍රිතව ජීවනෝපාය සංවර්ධනය ඇති කිරීම පිණිසද ඉහළ දායකත්වයක් ලබා දීම මෙම ව්‍යාපෘතිය මගින් අවස්ථාව උදාකර ඇත.

- මූල්‍ය හා භෞතික ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 0.35 ක් වෙන් කළ අතර එම සම්පූර්ණ මුදලම වියදම් කර ඇත. මේ යටතේ හෙළ බොජුන්හල ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මේස 10ක් හා පුටු 50ක් මිල දී ගෙන ඇත.

v.) දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු

- හැඳින්වීම හා අරමුණ

මෙම රැස්වීම දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අදාළ දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම අංශයට සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් දිස්ත්‍රික්ක මට්ටමේ කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් සිදු කරන කාර්යභාරයන්, ව්‍යාපෘතීන් හා ගැටළු ආදී කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මාසිකව පවත්වනු ලැබේ.

- මූල්‍ය හා භෞතික ප්‍රගතිය

දිස්ත්‍රික් මට්ටමින් මාසිකව අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආශ්‍රිතව පවත්වනු ලබන කෘෂිකර්ම කමිටු රැස්වීම සඳහා අවශ්‍ය වූ රු. මි. 2.00 ක ප්‍රතිපාදන නිදහස් කිරීම සිදු කළ අතර එම සම්පූර්ණ මුදලම වියදම් කර ඇත. මෙම රැස්වීම දිවයිනේ සියළුම දිස්ත්‍රික්කවල පැවැත්වීම සම්බන්ධීකරණය කර ඇත.

1.3.3. විවිධ පාර්ශවයන්ගේ සහයෝගය ඇතිව නව නිපැයුම්කරුවන් සාර්ථක ව්‍යවසායකයන් බවට බලගැන්වීමේ ව්‍යාපෘතිය

- හැඳින්වීම

කෘෂිකර්මාන්තය වෙත නව මුහුණුවරකින් බැලීමේ සන්ධිස්ථානයක් ලෙස මෙම ව්‍යාපෘතිය හැඳින්විය හැක. එයින් ඇතිවන කෘෂි ගැටලු වලට කෘෂිකර්මාන්තය තුළින්ම පිළිතුරු සෙවීමට විකල්ප භාවිතය මඟින් නවෝත්පාදන හඳුන්වාදීම, එම නිර්මාණ ඇගයීම හා වාණිජකරණය කිරීම.

- අරමුණ

නව නිපැයුම්කරුවාටද දේශීය වෙළඳපලක් ඇති වී කෘෂි ක්ෂේත්‍රයේ තිබෙන ගැටළුවලට නව පිළියම් ලබාදීම මඟින් දෙපාර්ශවයටම වාසි සහගත තත්වයක් ඇති කරන ප්‍රායෝගික ප්‍රවේශයක් නිර්මාණය කිරීම

- මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන් කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)
විවිධ පාර්ශවයන්ගේ සහයෝගය ඇතිව නව නිපැයුම්කරුවන් සාර්ථක ව්‍යවසායකයන් බවට බලගැන්වීමේ ව්‍යාපෘතිය	4.01	3.10

- සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
1. පසුගිය වර්ෂයේ සඳහා බැරකම් (2021) පියවීම.	-	100% 2021 වර්ෂයේ බැරකම් සම්පූර්ණයෙන්ම ගෙවා නිම කිරීම.
2. අයදුම් පත්‍ර කැඳවීම හා මූලික වටයේ විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.	මූලික වටයේ විශ්ලේෂණ කටයුතු සිදු කිරීම සඳහා අයදුම්පත්‍ර කැඳවීම හා එවන ලද අයදුම්පත්‍රවලින් 150 ක පමණ ඇගයුම් කටයුතු සිදු කිරීම	100% සිළුමිණ, Sunday observer, තිනකරන් යන පුවත්පත්වල අදාළ නිර්නායක සමඟ පුවත්පත් දැන්වීම් පළ කිරීම. අයදුම් පත් එවීම සඳහා අවසන් දිනය 2022.03.31 දක්වා දීර්ඝ කරන ලදී. අයදුම් පත්‍ර 144 ක් ලැබී තිබුණි.
3. තෝරාගන්නා ලද අයදුම්පත්‍රවල සඳහන් නිෂ්පාදන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් යුතු කමිටුවක් මඟින් ඇගයීමට ලක් කිරීම.	නවෝත්පාදනකරුවන් 125 ක් පමණ තෝරාගැනීම	90% • ලැබී ඇති අයදුම්පත්‍ර 144 න් සුදුසුකම් සම්පූර්ණ කර තිබූ අයදුම්පත්‍ර 121 ක ඇගයුම් කටයුතු සිදු කිරීම. • එයින් නවෝත්පාදන 109 ක් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විසින් වාණිජකරණය වූ වාණිජකරණය සඳහා විභවයක් පවතින සහ තවදුරටත් සංවර්ධනය කළ යුතු යන අංශ යටතේ වර්ගීකරණය සිදු කර ඇගයීමට ලක් කිරීම. • බොහෝ නිර්මාණ සඳහා පිළියෙල කරන ලද සංවර්ධන සැලැසුම් මත පදනම්ව වැඩිදුර සංවර්ධන කටයුතු සඳහා යොමු කිරීම.
4. කමිටු නිර්දේශ මත නවෝත්පාදන ආයතනික සංවර්ධන කටයුතු සඳහා යෙදවීම	සාර්ථක නවෝත්පාදන 45 ක් වැඩිදුර සංවර්ධන කටයුතු සඳහා තෝරාගැනීම	7% ඇගයුම් කමිටුව විසින් සංවර්ධන කටයුතු සඳහා නවෝත්පාදන 09 ක් තෝරාගන්නා ලද අතර නවෝත්පාදන 04 කට අදාළව නවෝත්පාදනකරුවන් වැඩිදුර සංවර්ධන කටයුතු සඳහා යොමු නොවුණු අතර නවොත්පාදන 02කට අදාළව තවමත් සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී. නවෝත්පාදන 03කට අදාළව සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශය හා ගොවිපළ යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය වෙත පැවරීම.
5. කමිටු නිර්දේශ මත නිපැයුම්හි පරීක්ෂණ කටයුතු සිදුකිරීම සඳහා ආයතන වෙත යොමු කිරීම.	ඇගයුම් කමිටු මඟින් නිර්දේශ කරනු ලබන නවෝත්පාදන පරීක්ෂණ කටයුතු සඳහා යොමු කිරීම.	විදුලි එනර්ජයිසරය හා ආහාර නිෂ්පාදනයට අදාළ නවෝත්පාදන වන Green Tea with water, Green Tea wine, Green Tea powder with Bee honey, නිල් කටරොළු බීම , සහල් පිටි කේක් හා සහල් පිටි බිස්කට් සම්බන්ධ පරීක්ෂණ කටයුතු කාර්මික තාක්ෂණ ආයතනය මඟින් සිදු කිරීම.
6. තෝරාගන්නා ලද නවෝත්පාදන පෞද්ගලික හෝ විදේශ ආධාර ව්‍යාපෘති වෙත යොමු කිරීම.	තෝරාගන්නා ලද සාර්ථක නවෝත්පාදනයන්ගෙන් 20ක් පෞද්ගලික හෝ විදේශ ආධාර ව්‍යාපෘති වෙත යොමු කිරීම.	55% තෝරාගන්නා ලද නවොත්පාදන අතුරින් වාණිජකරණය වූ නවෝත්පාදන 11 ක් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන වෙත හා කෘෂි අංශ නව්‍යකරණ ව්‍යාපෘතිය වෙත යොමු කිරීම.
7. පුහුණු වැඩමුළු හා දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම	පුහුණු වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පැවැත්වීම	70% • 2022.02.12 දින නවෝත්පාදන ඇගයුම් කිරීමට අදාළ නිර්ණායක සකස් කිරීම සම්බන්ධ රැස්වීමක් පැවැත්වීම.

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
		• නවෝත්පාදකයින් සඳහා මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මඟින් කාබනික පොහොර නිෂ්පාදනය හා ඒ සඳහා යොදා ගන්නා යන්ත්‍ර පිළිබඳවත්, ගොවිපළ යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය මඟින් කෘෂි ඉංජිනේරු විද්‍යාව හඳුන්වාදීම හා කෘෂි යන්ත්‍රෝපකරණ ප්‍රායෝගික භාවිතය සම්බන්ධයෙන් ආදර්ශනය කිරීම සඳහා පුහුණු වැඩමුළුවක්ද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් විජලන යන්ත්‍ර හා ආහාර තාක්ෂණය පිළිබඳවත් ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මඟින් පිරිවැය අවම කරගනිමින් වැඩි කාර්යක්ෂමතාවයකින් යුතු කෘෂි යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය සම්බන්ධ පුහුණු වැඩමුළුවක්ද හා ආතර් ශ්‍රී ක්ලාර්ක් ආයතනය ඉලෙක්ට්‍රොනික පුහුණු වැඩමුළුවක්ද පැවැත්වීම. • මාර්ගගත ක්‍රමය ඔස්සේ නව නිපැයුම් කරුවන්ගේ කොමිසම මඟින් නවෝත්පාදනකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම. • මුළු පුහුණු වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව 07 කි.
8.නවෝත්පාදනකරුවන් හා ඇගයුම් කමිටු සමාජිකයින් සඳහා සහතිකපත්‍ර මුද්‍රණය හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම	-	100% සහතිකපත්‍ර 165 ක් මුද්‍රණය කරන ලදී. ප්‍රගති සමාලෝචන රැස්වීම හා නිෂ්පාදන ප්‍රදර්ශනය 2022.12.19 දින කෘෂිකර්ම අමාත්‍යාංශයේදී පවත්වන ලදී.
9. ක්ෂේත්‍ර ආදර්ශන හා ක්ෂේත්‍ර චාරිකා සිදුකිරීම.	සියළු තෝරාගත් අයදුම්කරුවන්ගේ නව නිපැයුම් ක්ෂේත්‍රයේ පරීක්ෂා කිරීම	ක්ෂේත්‍ර චාරිකා 03ක් සිදු කරන ලදී. මොරටුව විශ්ව විද්‍යාලය සැහැල්ලු අත් ට්‍රැක්ට්‍රරය, බතලේගොඩ සහල් පර්යේෂණ හා සංවර්ධන ආයතනය Multipurpose agriculture drone හා ගාල්ල ප්‍රදේශයේ වගුරුබිම් සී සෑම සඳහා යොදාගන්නා සැහැල්ලු ඉපිලුම් යන්ත්‍රය යන නවෝත්පාදන වල ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂා සිදුකිරීම.
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රදේශය (දිස්ත්‍රික්කය/ග්‍රාම නිලධාරී වසම)	දිවයින පුරා	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව	109	
සිදුකරන ලද පුහුණු වැඩමුළු ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව	පුහුණු වැඩමුළු - 07 ක්ෂේත්‍ර පරීක්ෂණ - 03	
ක්ෂේත්‍ර නිරීක්ෂණ සහිත ඡායාරූප	ඡායාරූපය අංක 02 සහ 03 - පිටු අංක 73	

1.3.4. කෘෂිකාර්මික ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම

- අරමුණ

කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම.

- කාර්යයන්

කෘෂිකර්ම අමාත්‍යාංශ නිලධාරීන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව කටයුතු කරන කෘෂි සංවර්ධන නිලධාරීන් යොදවා, විදේශාධාර ව්‍යාපෘති අධීක්ෂණය කිරීම හා විවිධ පාර්ශවයන්ගේ සහයෝගය ඇතිව නව නිපැයුම්කරුවන් සාර්ථක ව්‍යවසායකයින් බවට බලගැන්වීමේ ව්‍යාපෘතියෙහි නව නිපැයුම්කරුවන් 50කගේ නව නිපැයුම් පිළිබඳ ස්ථානීය අධීක්ෂණයන් සිදුකර අදාළ අංශ වෙත ප්‍රගතිය වාර්තා කිරීම.

- මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන් කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)
කෘෂිකාර්මික ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම	2.45	1.31

- සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති ක්ෂේත්‍ර අධීක්ෂණය සහ ඇගයීම	කෘෂි සංවර්ධන නිලධාරීන් යොදවා ක්ෂේත්‍ර අධීක්ෂණ කර වාර්තා කැඳවීම	ප්‍රගතිය 70%
අමාත්‍යාංශ නිලධාරීන් විසින් ක්ෂේත්‍ර අධීක්ෂණය කිරීම	දිස්ත්‍රික්ක 11ක ක්ෂේත්‍ර චාරිකා 11	ප්‍රගතිය 73% ක්ෂේත්‍ර චාරිකා 08
තිරසාර කෘෂිකර්ම කමිටුවට අදාළ සියළුම වියදම්	කමිටු රැස්වීම් 09	ප්‍රගතිය 22% කමිටු රැස්වීම් 02ක් පැවැත්වීම
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රදේශය (දිස්ත්‍රික්කය/ග්‍රාම නිලධාරී වසම)	අනුරාධපුරය, මඩකලපුව, ත්‍රිකුණාමලය,කළුතර, පුත්තලම,මහනුවර,කුරුණෑගල,යාපනය	
සිදුකරන ලද පුහුණු වැඩමුළු ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව	ක්ෂේත්‍ර ආදර්ශන - 08	
ක්ෂේත්‍ර නිරීක්ෂණ ඡායාරූප	ඡායාරූපය අංක 04, 05, 06 - පිටු අංක 74	

1.3.5. විශ්ව විද්‍යාල සමග සිදුකරන ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති සැලැස්ම පිළිබඳ පර්යේෂණ (NARP/NUS)

මෙම ව්‍යාපෘතිය සඳහා 2022 වසරේදී රු.මි. 9.30 ක මුදලක් වෙන් කර ඇති අතර ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP) මගින් වන බැවින් එම ආයතනය යටතේ ව්‍යාපෘතිය පිළිබඳ විස්තර දක්වා ඇත.

2. නව තාක්ෂණය හඳුන්වා දීම

2.1. හැඳින්වීම

මෙම වැඩසටහන සඳහා වැය ශීර්ෂ අංක 118-02-03-068-2509 යටතේ රු.මි. 610.00 ක් වෙන් කර ඇති අතර ඉන් රු.මි. 483.78 ක් වියදම් කර ඇත. මූල්‍ය ප්‍රගතිය 79.31% කි.

2.2. නව තාක්ෂණය හඳුන්වා දීම සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සහ එම වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

2.2.1. ගොවිජනසේවා මධ්‍යස්ථාන මට්ටමින් පාංශු පරීක්ෂණ පහසුකම් ස්ථාපනය කිරීම

- අරමුණ

යාය මට්ටමින් පස් පරීක්ෂා කර පාංශු පෝෂක ප්‍රමාණය මත පොහොර ලබා දීම, එමඟින් පොහොර අවභාවිතය කළමනාකරණය කිරීම හා පොහොර භාවිතය විධිමත් කිරීම සහ අනවශ්‍ය ලෙස පොහොර ආනයනය අඩු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

- කාර්යයන් හා භෞතික ප්‍රගතිය

අ/අ	කාර්යය	භෞතික ප්‍රගතිය
1.	කොළඹ හා ගම්පහ දිස්ත්‍රික් වෙත බෙදාහැරීම සඳහා පාංශු පරීක්ෂණ කට්ටල 50 ක් මිලදී ගැනීම හා එම කට්ටල බෙදා හැරීම	පාංශු පරීක්ෂණ කට්ටල 50ක් මිලදී ගෙන ඇත.
2.	පාංශු සෞඛ්‍ය කාඩ්පත් බෙදා හැරීමේ වැඩසටහන	පාංශු සෞඛ්‍ය කාඩ්පත් 19,750 ක් අනුරාධපුර දිස්ත්‍රික්කය වෙත බෙදාහරින ලදි.
3.	පාංශු පරීක්ෂණ කට්ටල භාවිතය අධීක්ෂණය හා මෙහෙයවීම	අනුරාධපුරය මහනුවර හා අම්පාර දිස්ත්‍රික් මෙහෙයුම් හා අධික්ෂණ වැඩසටහන් සිදුකරන ලදි
4.	දිස්ත්‍රික් මට්ටමින් පස් සාම්පල පරීක්ෂා කිරීම	කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික් හැර අනෙකුත් දිස්ත්‍රික් සඳහා පාංශු පරීක්ෂණ කට්ටල 456 ක් ලබා දී ඇති අතර 2022.12.31 දින වන විට එමඟින් පස් සාම්පල14,950 ක් පරීක්ෂා කර ඇත.
5.	ජංගම පාංශු පරීක්ෂණ කට්ටල 562 නැවත පිරවීම සඳහා පිරවුම් ද්‍රාවණ මිලදී ගැනීම	ජංගම පාංශු පරීක්ෂණ කට්ටල 562 නැවත පිරවීම සඳහා පිරවුම් ද්‍රාවණ මිල දී ගෙන ඇත.

- මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන් කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)
ප්‍රාග්ධන	49.00	0*
පුනරාවර්තන	0.65	0.32
එකතුව	**49.65**	**0.32**

*** සටහන**

2022 වර්ෂය ආරම්භයේ දී ව්‍යාපෘතිය සඳහා රු.මි. 50.00 ක් වෙන් කළ ද පැවතුන ගැටළුකාරී තත්ව මත පළමුවන, දෙවන හා තුන්වන කාර්තුවල වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර හතරවන කාර්තුවේ දී අතුරු සම්මත ගිණුම් අයවැය සමඟ වෙන්කළ ප්‍රතිපාදන මත නැවත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ අතර අදාළ මිලදී ගැනීම්වල ප්‍රසම්පාදන කටයුතු අවසන් කර, පාංශු පරීක්ෂණ කට්ටල 50 ක් හා පිරවුම් ද්‍රාවණ 362 ක් මිලදී ගැනීම සඳහා ඇනලිටිකල් ඉන්ස්ට්‍රමන්ට් ආයතනය හා පිරවුම් ද්‍රාවණ 200 ක් මිලදී ගැනීම සඳහා ප්‍රොකෙයා ආයතනය වෙත 2022 ඔක්තොම්බර් මස 20 දින මිලදී ගැනීම් නියෝග නිකුත් කරන ලදි.

නමුත් සියළු මිලදී ගැනීම් ආනයනය මත පදනම් වී තිබුණ බැවින් ආනයනය සඳහා අවශ්‍ය ඩොලර් (USD) ප්‍රමාණ ලබා ගැනීමට අදාළ පෞද්ගලික ආයතන අපොහොසත් වීම හේතුවෙන් ආනයනය ප්‍රමාද විය.

ඇනලිටිකල් ඉන්ස්ට්‍රමන්ට් ආයතනය වෙත වගකීම් පවරන ලද භාණ්ඩ තොගය 2022 දෙසැම්බර් මස තුන්වන සතියේ අමාත්‍යාංශය වෙත භාර දී ඇති අතර බිල්පත් දෙසැම්බර් මස අවසන් සතියේ ඉදිරිපත් කරණු ලැබුවත් අදාළ අග්‍රිම නොමැති වීම හේතුවෙන් ගෙවීමට නොහැකි වී ඇත.

ප්‍රොකෙයා හෝල්ඩින් සමාගමෙන් භාණ්ඩ තොගය ලැබී ඇත්තේ 2023 ජනවාරි මස තුන්වන සතියේ දී බැවින් එම ගෙවීම් ද එම වර්ෂයේ බැඳීම් ලෙස ඉදිරියට ගෙන යා යුතුව ඇත. ඉහත තත්ව මත ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ලබා ගැනීමට හැකි වී ඇතත් මුදල් ගෙවීමට අපොහොසත් වීමෙන් මූල්‍ය ප්‍රගතිය ලබා ගැනීමට නොහැකි වී ඇත.

පාංශු පරීක්ෂණ වැඩසටහනෙහි මෙහෙයුම් කටයුතු සිදුකරන ආකාරයෙහි ඡායාරූප

ඡායාරූපය අංක 07 - පිටු අංක 74

2.2.2. අමාත්‍යාංශය මගින් වැය ශීර්ෂ අංක 118-02-03-068-2509 යටතේ ප්‍රතිපාදන ලබා දී ක්‍රියාත්මක කර ඇති වෙනත් ව්‍යාපෘති

අ/අ	ව්‍යාපෘතියේ නම		වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි.)	භෞතික ප්‍රගතිය
1.	නවීන තාක්ෂණය ස්ථාපිත කිරීම සහ තෝරාගත් ගොවිපලවල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම – 2022		182.28	163.03	93% ක්‍රියාකාරකම් 07ක් සම්පූර්ණ කර ඇත
2.	බෝග ස්ථාපනය සහ තෘණ කළමණාකරනය ආදී කටයුතු සඳහා යෝග්‍ය කෘෂි යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම		4.07	4.02	95% ක්‍රියාකාරකම් 03ක් සම්පූර්ණ කර ඇත
3.	කෘෂිකර්ම තොරතුරු කළමනාකරණ පද්ධතිය (AIMS)		0.11	0.11	100% සම්පූර්ණ කර ඇත
4.	ආදර්ශ කෘෂිකර්ම නිෂ්පාදන ගම්මාන සංවර්ධනය (Development of Model Agricultural Production Villages)		1.74	1.74	100% සම්පූර්ණ කර ඇත
5.	පරිසර හිතකාමී හරිත කෘෂිකාර්මික පද්ධති ප්‍රවර්ධනය කිරීම සඳහා බෝග වර්ග සහ යෙදවුම් කළමනාකරණ තාක්ෂණයන් සංවර්ධනය කිරීම		62.62	55.20	බෝග ප්‍රවර්ධනය සහ න්‍යෂ්ටික බීජ නිෂ්පාදනය 90% සම්පූර්ණ කර ඇත
	5.1	*නව කෘෂිකාර්මික තාක්ෂණය හඳුන්වාදීම*	*1.96*	*1.59*	*සියළුම වර්ගවල බීජ නිෂ්පාදනය කිරීම සඳහා එළවළු බෝග වැඩිදියුණු කිරීම, නව බෝග නිෂ්පාදනයේදී අවශ්‍ය වන මව් රෝපණ ද්‍රව්‍ය සංරක්ෂණය කිරීම (crop improvement of vegetables & nuclear seed, breeder seed and parental lines and hybrid seed production of vegetables and germplasm conservation 97% completed)*
	5.2	*බෝග ප්‍රභේද බිහිකිරීම සහ දේශීය බීජ නිෂ්පාදනය*	*7.85*	*6.10*	*95%* *ක්‍රියාකාරකම් 05ක් සම්පූර්ණ කර ඇත*
	5.3	*බඩඉරිඟු, රනිල බෝග, තෙල් බෝග, මීරිස් සහ ඌණුවල වැඩි දියුණු කල ලක්ෂණ සහිත ආර බිහිකිරීම*	*15.93*	*13.79*	*90%* *ක්‍රියාකාරකම් 04ක් සම්පූර්ණ කර ඇත*
	5.4	*පළතුරු බෝගවල ගහණ වර්ධනය ඇගයීම සහ වරණය*	*8.2*	*7.66*	*95%* *ක්‍රියාකාරකම් 04ක් සම්පූර්ණ කර ඇත*
	5.5	*තත්ත්වයෙන් උසස් මූලික බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම*	*0.81*	*0.81*	*100% සම්පූර්ණ කර ඇත*
	5.6	*බෝග ප්‍රභේද සහ බීජ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම*	*5.5*	*3.56*	*64%* *ක්‍රියාකාරකම් 04ක් සම්පූර්ණ කර ඇත*

අ/අ		ව්‍යාපෘතියේ නම	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි.)	භෞතික ප්‍රගතිය
	5.7	*කෘෂි රසායන ද්‍රව්‍ය අවම භාවිතය තුළින් ආහාර බෝග සඳහා පරිසර හිතකාමී තිරසාර ශාක ආරක්ෂණය සහ පෝෂණ කළමනාකරණ තාක්ෂණයන් ජනනය කිරීම*	*14.4*	*14.20*	*82%* *ක්‍රියාකාරකම් 03ක් සම්පූර්ණ කර ඇත*
	5.8	*කාබනික පොහොරවල තත්ත්වය ඉහළ නැංවීම සහ හරිත කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය*	*7.97*	*7.49*	*100% සම්පූර්ණ කර ඇත*
6.	යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහතිකකරණය සම්බන්ධ ව්‍යාපෘතිය -2022		15.47	12.90	85% ක්‍රියාකාරකම් 08ක් සම්පූර්ණ කර ඇත
7.	තිරසර කෘෂි බෝග නිෂ්පාදනයක් සඳහා පරිසර හිතකාමී පොහොර භාවිතය කළමණාකරණය කිරීම (Environmental friendly fertilizer management for input use efficiency and sustainable crop production)		27.17	27.00	85% ක්‍රියාකාරකම් 03ක් සම්පූර්ණ කර ඇත
9.	“සෞභාග්‍යා” ජාතික ගෙවතු වගා වැඩසටහන		107.31	107.31	තවාන්කරුවන් 10,149ක් පුහුණු කිරීම, ගෙවතුලාභීන් 1,030,000ක් සඳහා ගෙවතු බීජ කට්ටල සහ තවාන් පැළ ලබා දීම, අත්පත්‍රිකා 4,400,000ක් ද, බීජ කවර 2,200,000ක් සහ පෝස්ටර් 160,000ක් මුද්‍රණය කිරීම සහ දෙවන අදියර යටතේ ඉතිරි 1,170,000 ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය ගෙවතු වගා බීජ කට්ටල ලබාදීම කෘෂිකර්ම දෙපාර්තමේන්තු මගින් සිදු කිරීම.
10.	ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාම සහ කෘෂිකර්මාන්තයේ ආරක්ෂාව උදෙසා ශාක නිරෝධායන ක්‍රියාවලින් සඳහා පහසුකම් සැලසීම		22.82	16.10	60% ක්‍රියාකාරකම් 08ක් සම්පූර්ණ කර ඇත
11.	පරිසර හිතකාමී කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම		29.16	20.10	**1. කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම** කුඩා පරිමාණ කොම්පෝස්ට් නිෂ්පාදන ඒකක 2430ක් සහ ගැඩවිල් පොහොර නිෂ්පාදන ඒකක සඳහා ටැංකි 52ක් ලබාදී ඇත. **2. පරිසර හිතකාමී පළිබෝධනාශක සහ දියර පොහොර නිෂ්පාදනය** ආදර්ශන 327ක් ස්ථාපිත කර ඇත. **3. පේව පොහොර සහ කොළ පොහොර නිෂ්පාදනය**

අ/අ	ව්‍යාපෘතියේ නම		වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි.)	භෞතික ප්‍රගතිය
					ප්‍රවර්ධනය කිරීම හෙක්. 20ක් සඳහා පොහොර නිෂ්පාදනයට අවශ්‍ය වල් සූරියකාන්ත හා මුං බීජ ලබාදීම, ඇසොල්ලා ආදර්ශන 1570ක් සහ ග්ලිරිසීඩියා වගාව සඳහා ආදර්ශන 518ක් ස්ථාපිත කිරීම. **4. සාම්ප්‍රදායික ප්‍රභේද ගුණනය කිරීම** හෙක්. 2ක වපසරියක සාම්ප්‍රදායික වැල් අල ප්‍රභේද 30ක් ගුණනය කිරීම සිදු කර ඇත. **5. ප්‍රවර්ධන ක්‍රියාකාරකම්** කාබනික වී ගොවිතැන පිළිබඳ පත්‍රිකා 6000ක් මුද්‍රණය කර ගොවීන් 3810ක් පුහුණු කරන ලදි.
12.	අතරමැදි කන්නයේ මුං වගාව		21.83	21.83	100% සම්පූර්ණ කර ඇත
13.	ව්‍යාප්ති ආවරණය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා සමාජ ජාල පදනම් කරගත් කෘෂිකර්ම ව්‍යාප්ති ක්‍රමයක් ස්ථාපිත කිරීම		0.29	0.29	100% සම්පූර්ණ කර ඇත
14.	ඉදිකරන ලද GAP Mini Super Market හි අළෙවි කටයුතු ආරම්භ කිරීම (සබරගමුව පළාත)		10.00	10.00	100% සම්පූර්ණ කර ඇත
15.	තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	බඩ ඉරිහු සහ කව්පි බෝගවගා සඳහා යාන්ත්‍රිකකරණය ප්‍රවර්ධනය කිරීම	22.60	22.60	75% ක්‍රියාකාරකම් 02ක් සම්පූර්ණ කර ඇත
		අනුරාධපුර උඩමළුව ආශ්‍රිත නව හෙළ බොජුන් අලෙවි මධ්‍යස්ථානයේ අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු සිදු කිරීම - අදියර II	10.70	10.70	86% ක්‍රියාකාරකම් 02ක් සම්පූර්ණ කර ඇත
		පළතුරු බෝග අගය දාම සංවර්ධන - අදියර I - 2022	2.32	2.32	පළතුරු සැපයුම් දාමයේ හවුල්කරුවන්ගේ තොරතුරු රැස් කිරීම 90% සම්පූර්ණ කර ඇත
		දේශීය දෙමුහුන් බඩ ඉරිහු ප්‍රභේද ජනප්‍රිය කිරීමේ වැඩසටහන	23.17	23.17	80% ක්‍රියාකාරකම් 02ක් සම්පූර්ණ කර ඇත
		සනත්වය අධික ඉහළ අස්වැන්නක් ලබා දෙන බඩ ඉරිහු ආදර්ශන පිහිටු වීම.	7.21	7.21	80% ක්‍රියාකාරකම් 04ක් සම්පූර්ණ කර ඇත

අ/අ	ව්‍යාපෘතියේ නම		වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි.)	භෞතික ප්‍රගතිය
		සෝජන් යෝජනා ක්‍රමය (අදියර - II) යටතේ පුරන් කුඹුරුවල කෘෂිකාර්මික බෝග ව්‍යාප්ත කිරීමේ වැඩසටහන.	5.00	5.00	100% සම්පූර්ණ කර ඇත
		කෘෂිකාර්මික තරුණ නව ව්‍යවසායකයින් බිහි කිරීම සඳහා ව්‍යවසායකත්වය දිරිමත් කිරීම තුලින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීම- අදියර - II	0.46	0.46	100% සම්පූර්ණ කර ඇත

කෘෂිකර්ම අංශය මගින් ක්‍රියාත්මක කර ඇති විශේෂ ව්‍යාපෘති

1. ගොවීන් සඳහා ඉන්ධන ලබාදීම

2022 යල කන්නයේ වී වගාව සහ බඩඉරිඟු වගාව සඳහා අස්වනු නෙලා ගැනීමට සහ 2022/23 මහ කන්නයේ බිම් සකස් කිරීම සඳහා ඉන්ධන අවශ්‍යතාවය දිස්ත්‍රික් මට්ටමෙන් ලබා ගෙන එම අවශ්‍යතා විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශය වෙත ලබා දී ගොවීන් සඳහා අවශ්‍ය ඉන්ධන ලබා දීමට කටයුතු කර ඇත.

මහජන චීන සමූහාණ්ඩුව විසින් ශ්‍රී ලංකාව වෙත හදිසි ප්‍රදාන යටතේ ඩීසල් මෙ. ටො. 9000 ක් ලබා දෙන ලදි. එයින්, 2022 යල කන්නයේ වී වගාවේ අස්වනු නෙලීමේ කටයුතු සඳහා මෙ. ටො. 6800 ක් වෙන් කළ අතර, මෙම ඩීසල් තොගය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත තෝරාගන්නා ලද ගොවීන් වෙත නොමිලේ බෙදා දීමට සැලසුම් කර ඇත.

2022 වර්ෂයේ විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය

1. කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය (ASMP)

1.1. හැඳින්වීම
මෙම ව්‍යාපෘති ලෝක බැංකුව මඟින් 2016 ජූනි 29 දිනට අනුමැතිය ලබාදී ඇති අතර, ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) විසින් මුල්‍ය ප්‍රතිපාදනය ලබා දෙනු ඇත.

1.2. දැක්ම
නවීකරණය තුළින් ආහාර සුරක්ෂිතතාවය සහ ජාතික සමෘද්ධිය සඳහා විචිත්‍රවත්, ගතික සහ ඵලදායී කෘෂිකාර්මික අංශයක්

1.3. මෙහෙවර
ව්‍යාපෘති ක්ෂේත්‍රවල ස්වභාවික සම්පත් තිරසර කළමනාකරණය තුළින්, සාමාජීය වශයෙන් පිළිගත හැකි, නව්‍ය, වෙළඳපල - නැඹුරු සහ නවීනතම කෘෂිකර්මාන්ත තුළින් ගෝලීය වශයෙන් තරඟකාරී නිෂ්පාදන, සැකසුම් සහ අලෙවිකරණ ව්‍යවසායන් සාක්ෂාත් කර ගැනීම.

1.4. අරමුණු
- නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් තරඟකාරී සහ අලෙවි කළ හැකි භාණ්ඩ නිෂ්පාදනය කරීම (ඵලදායිතා වැඩි දියුණු කිරීම).
- වඩා හොඳ වෙළඳපල අවස්ථා වලට ප්‍රතිචාර දැක්වීම පිණිස ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම (නිෂ්පාදන සහ වෙළඳපල විවිධාංගීකරණය).
- කෘෂිකාර්මික වාණිජකරණය වෙත ගමන් කිරීම (කෘෂිකර්මය ව්‍යාපාරයක් ලෙස).

1.5. ව්‍යාපෘති තොරතුරු

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා පිරිවැය	ඇ.ඩො. මිලියන 64.23, රුපියල් මිලියන 9374.37 (මුදල් ඒකකය = ශ්‍රී ලංකා රුපියල් (LKR) ඇ.ඩො. 1 = රුපියල් 145.95)
ප්‍රායෝගික ක්ෂේත්‍රය (මූලික)	කෘෂිකර්මාන්තය
වගකිවයුතු ආයතනය	කෘෂිකර්ම අමාත්‍යාංශය
ඉලක්කගත ප්‍රදේශ	පළාත් සහා උතුරු - යාපනය,මුලතිව් නැගෙනහිර - මඩකලපුව උතුරු මැද - අනුරාධපුර, පොළොන්නරුව මධ්‍යම - මාතලේ ඌව - මොණරාගල
ප්‍රතිලාභීන්	ගොවි නිෂ්පාදන සංවිධාන, කුඩා ගොවිපලවල් කුටුම්භ සහ අනෙකුත් ගොවිපවල් කුටුම්භ, කෘෂිකර්ම අමාත්‍යාංශය (MOA), අදාළ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ 05 ක්. වක්‍ර: වාණිජ බැංකු
සංරචක	සංරචක නාමය වියදම (ඇ.ඩො. මිලියන) 2. ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ විවිධාංගීකරණ ආදර්ශන 57.73 3.ව්‍යාපෘති කළමනාකරණය මෙහෙයවීම සහ ඇගයීම 6.5
සංරචක 2 පහත උප-සංරචක සහ ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ අ). 2.1: ගොවි පුහුණු සහ ධාරිතා වර්ධනය - (ඇ.ඩො.මි. 3.20) ආ). 2.2: නව්‍ය කෘෂිකර්ම තාක්ෂණික උද්‍යාන - (ඇ.ඩො.මි. 38.39) ඇ).2.3: නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම් - (ඇ.ඩො.මි. 15.14) ඈ).2.4: විශ්ලේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන සහාය - (ඇ.ඩො.මි. 1.00)	

1.6. ක්‍රියාකාරකම්

සංරචකය	ක්‍රියාකාරකම්
2. ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ විවිධාංගීකරණ ආදර්ශන	2.1. ගොවි පුහුණු සහ ධාරිතා වර්ධනය
	2.2. නව්‍ය කෘෂිකර්ම තාක්ෂණික උද්‍යාන
	2.3. නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම්
	2.4. විශ්ලේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන සහාය
3. ව්‍යාපෘති කළමනාකරණය මෙහෙයවීම සහ ඇගයීම	

1.7. මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන් කිරීම් (රු.මි.)	වියදම (රු.මි.)
ප්‍රාග්ධන	4,190.00	3,746.20

ව්‍යාපෘතියේ මුළු ප්‍රතිපාදන රු. මි. 4190.00 ක් සහ 2022.12.31 දිනට මුළු වියදම රු. මි. 3,696.2 කි.

	ලෝක බැංකුව (රු. මි.)	යුරෝපා සංගමය (රු. මි.)	ශ්‍රී ලංකා රජය (රු. මි.)
ප්‍රතිපාදන	2,350.00	1,800.00	40.00
වියදම	2,253.19	1,443.01	

මෙම මූල්‍ය ප්‍රගතියත් සමග ව්‍යාපෘතිය විසින් යාපනය, මුලතිව්, මොනරාගල, මඩකලපුව, අනුරාධපුර, පොළොන්නරුව සහ මාතලේ යන ප්‍රදේශවල බෝග පොකුරු 16ක් ස්ථාපිත කර ඇති අතර, වවුනියාව, කිලිනොච්චිය, අම්පාර, බදුල්ල සහ මහනුවර යන ප්‍රදේශවල වෙනත් ඕනෑම බෝග පොකුරු 15ක් ස්ථාපිත කෙරේ. මෙම පොකුරු ආවරණය වන පරිදි ගොවි සංවිධාන 8ක් ගොවි සමාගම බවට පරිවර්තනය වෙමින් සමාගම් රෙජිස්ට්‍රාර් පනත යටතේ පොදු ලැයිස්තුගත නොකළ සමාගමක් (PUC) ලෙස ලියාපදිංචි වීමට අවශ්‍ය කටයුතු සිදු කරයි. වාරිමාර්ග ව්‍යුහයන්, ගොවිපල සහ වෙළඳපල යටිතල පහසුකම් සහ නිෂ්පාදන හැසිරවීමේ පහසුකම් ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය බැවින් ඉහත සඳහන් පොකුරු නිෂ්පාදන ගොවීන්ට තම වගාවන් සහ අලෙවිය සිදු කිරීම සඳහා යටිතල පහසුකම් ක්‍රියාකාරකම් 27 ක් පුනරුත්ථාපනය කර ඇත. ක්ෂේත්‍ර මට්ටමේ ක්‍රියාකාරකම් සිදු කිරීමේදී කාර්යයේ ගැටළු සහ බාධක හඳුනා ගනිමින් ප්‍රතිපත්ති මට්ටමේ පර්යේෂණ මාතෘකා 10ක් හඳුනාගෙන ඇති අතර ඒවා වැඩිදුරටත් අධ්‍යයනය කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය වෙනුවෙන් අවශ්‍ය කොන්දේසි (Terms of reference) හඳුනාගෙන ඇත.

උප සංරචක **2.1** ගොවි පුහුණු සහ ධාරිතා වර්ධනය		
ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	**ඉලක්ක**	**භෞතික ජයග්‍රහණ**
ජාත්‍යන්තර සේවා සපයන්නා (ISP) විසින් නියමු ව්‍යාපෘති සඳහා සකස් කරන ලද විෂයමාලා සංශෝධනය කිරීම.	ISP විසින් සංවර්ධනය කරන ලද නියමු ව්‍යාපෘති විෂය මාලාව සංශෝධනය කිරීම.	සම්පූර්ණ කර ඇත.
ICT වේදිකාවේ ප්‍රචාරණය - Farm Business School (FBS) පුහුණුව.	තනි ගොවීන්ගේ පුහුණුව සම්බන්ධ පුහුණුව ලබා දීම සඳහා ICT වේදිකාවක් සෑදීමට සේවා සපයන්නෙකු බඳවා ගැනීම.	සම්පූර්ණ කර ඇත. වෙන් වෙන් වශයෙන් ගොවීන් පුහුණු කිරීම හා ධාරිතා සංවර්ධනය සඳහා භාවිතා කිරීමට සූදානම් කර ඇත.

උප සංරචක 2.1 ගොවි පුහුණු සහ ධාරිතා වර්ධනය		
ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	**ඉලක්ක**	**භෞතික ජයග්‍රහණ**
නව සහ විශාලන ව්‍යාපෘතිවල FBS පුහුණුව	නව සහ විශාලන ව්‍යාපෘතිවල FBS පුහුණුව සම්පූර්ණ කිරීම.	සම්පූර්ණ කර ඇත
ගොවි නිරාවරණ සංචාරය	ගොවි නිරාවරණ සංචාරය	දේශීය සංචාර සම්පූර්ණ කර ඇත
නව සහ විශාලන ව්‍යාපෘතිවල Farmer Producer Organization (FPO) පුහුණුව	තිරසර ගොවි සංවිධාන සඳහා FPO පුහුණුව	සේවා සපයන්නා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන මූලික කටයුතු සිදුවෙමින් පවතී
නියමු ව්‍යාපෘති සඳහා FPOs පිහිටුවීම සහ ලියාපදිංචි කිරීම	නියමු ව්‍යාපෘතිවලින් FPOs 20ක්	උපදේශකයින් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන මූලික කටයුතු සිදුවෙමින් පවතී

උප සංරචක 2.2 නව්‍ය කෘෂිකර්ම තාක්ෂණික උද්‍යාන		
ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	**ඉලක්ක**	**භෞතික ජයග්‍රහණ**
ISP විසින් පොකුරු සංවර්ධන සැලසුම් (CDP) 09ක් ඉදිරිපත් කිරීම සහ පිළිගැනීම	පොකුරු සවර්ධන සැලසුම් (CDP) 09	පොකුරු සංවර්ධන සැලසුම් (CDP) 16ක් අනුමත කර ඇත
ISP විසින් ව්‍යාපෘති දිස්ත්‍රික්ක 7ක බෝග පොකුරු 16ක් ස්ථාපිත කිරීම	ISP පොකුරු 16ක බෝග පිහිටුවීම	ජාත්‍යන්තර සේවා සපයන්නා (ISP) විසින් ක්‍රියාත්මක කර ඇති පොකුරු 16ක බෝග සිටුවීම ආරම්භ කර ඇති අතර, යෙදවුම් ප්‍රසම්පාදනය බොහෝ දුරට අවසන් කර ඇත
නියමු ව්‍යාපෘති 13ක් අඛණ්ඩ ක්‍රියාත්මක කිරීම	පුහුණු කිරීම් සහ ගොවීන්ගේ නිරාවරණ චාරිකා	සැලසුම් කළ පරිදි සම්පූර්ණ කර ඇත
ව්‍යාපෘති දිස්ත්‍රික්ක 7ක නව සහ විශාලන ව්‍යාපෘති 12ක් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ සම්පූර්ණ කිරීම	පුහුණු කිරීම සහ ගොවීන්ගේ නිරාවරණ චාරිකා. යෙදවුම් බෙදා හැරීම	සැලසුම් කළ පරිදි සම්පූර්ණ කර ඇත
නව දිස්ත්‍රික්ක 5ක නියමු ව්‍යාපෘති 12ක් ක්‍රියාත්මක කිරීම	නියමු ව්‍යාපෘති 12	බොහෝ දුරට අවසන් කර ඇත
නව දිස්ත්‍රික්ක සඳහා වගා පොකුරු 20 ස්ථාපිත කිරීම	නියමු ව්‍යාපෘති 12	(i) ශක්‍යතා අධ්‍යනය සම්පූර්ණ කර ඇත. බදුල්ල, වව්නියා, අම්පාර දිස්ත්‍රික්ක වල බඩ ඉරිඟු නිෂ්පාදන පොකුරු 3ක් ස්ථාපිත කර ඇත (ii) සෑම දිස්ත්‍රික්කයකටම මිරිස් නිෂ්පාදන පොකුරක් ස්ථාපිත කිරීම (iii) අනෙකුත් බෝග සඳහා පොකුරු සවර්ධන සැලසුම් සකසමින් ඇත

උප සංරචක 2.3 නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම්		
ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	**ඉලක්ක**	**භෞතික ජයග්‍රහණ**
කුඩා පරිමාණ වාරිමාර්ග යටිතල පහසුකම් සහ පවතින ජල ටැංකි සහ වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම / වැඩි දියුණු කිරීම, නිෂ්පාදන හා වෙළඳපොළ ප්‍රවේශ මාර්ග සහ නව ක්ෂේත්‍ර ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, වියළන වේදිකා සහ මඩු, බෝග අපද්‍රව්‍ය කොම්පෝස්ට් කිරීමේ පහසුකම්, ගබඩා පහසුකම් සහ අනෙකුත් දෑ ඇතුළත් ගම් මට්ටමේ ගබඩා සහ නිෂ්පාදන හැසිරවීමේ පහසුකම්	-	ප්‍රදානය කරන ලද යටිතල පහසුකම් ක්‍රියාකාරකම් 114න් ක්‍රියාකාරකම් 14ක් සිදුවෙමින් පවතින අතර, අනෙකුත් ක්‍රියාකාරකම් 100ක් සම්පූර්ණ කර ඇත (2018 සිට 2021 දක්වා) ප්‍රදානය කරන ලද යටිතල පහසුකම් 27න් 01 ව්‍යාපෘතියක් සම්පූර්ණ කර ඇත. ඉදිකිරීම් කටයුතුවල මිල මට්ටම් ඉහළ යාම හේතුවෙන් ප්‍රමාදයන් පවතී.

උප සංරචක 2.4 විශ්ලේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන සහාය		
ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	**ඉලක්ක**	**භෞතික ජයග්‍රහණ**
තෝරාගත් ප්‍රදේශවල ප්‍රතිපත්ති පර්යේෂණ සඳහා ප්‍රදානයන් සහ පහසුකම් සැලසීම	පර්යේෂණ 2	ප්‍රදානය කරන ලද පර්යේෂණ 9 අවසන් කර ඇත මාර්ගගත ප්‍රතිපත්ති පර්යේෂණ 4ක් ඉදිරිපත් කර ඇත

1.8. ජාත්‍යන්තර සේවා සපයන්නා (ISP) විසින් ස්ථාපිත කර ඇති නිෂ්පාදන පොකුරු සහ ප්‍රගතිය

දිස්ත්‍රික්කය	පොකුරු නාමය	භෞතික ප්‍රගතිය
යාපනය	අර්ථාපල් සහ රතු ලූනු නිෂ්පාදනය	මෙම ව්‍යාපෘතිය මූලිකව ප්‍රතිලාභීන් 100 කගෙන් සහ ඔවුන් සතු ඉඩම් අක්කර 50 කින් ආරම්භ කරන ලද අතර එය ප්‍රතිලාභීන් 500 දක්වා පුළුල් කරන ලදි. ඒ යටතේ රතු ලූණු වගා කන්න 02ක් අර්තාපල් වගා කන්න 01ක් සාර්ථකව අවසන් කළ අතර දෙවැනි අර්තාපල් වගා කන්නය මේ වන විට ක්ෂේත්‍රගත කර ඇත.
	කුඩා කෙසෙල් නිෂ්පාදන පොකුර	ගොවීන් 400 දෙනෙකු වෙත පෙර අස්වනු තාක්ෂණ පැකේජය හඳුන්වා දෙන ලදි. එයින් ප්‍රතිලාභීන් 50 දෙනෙකු අතරින් 06 දෙනෙකු නව වගාවක් ආරම්භ කළ අතර, 34 දෙනෙකු පැළ තවාන් ආරම්භ කරන ලදි.
මුලතිව්	දෙළුම් නිෂ්පාදන පොකුර සමඟ වියළි මිරිස් අතුරු භෝග වගාව	ගොවීන් 50 දෙනෙකු තෝරා ගන්නා ලදි. මෙම ප්‍රතිලාභීන් වෙනුවෙන් වාරි පද්ධති 50ක් ස්ථාපිත කළ අතර මේ වන විට ප්‍රතිලාභීන් 24 දෙනෙකු වගා ආරම්භ කරඇත. ඉතිරි ප්‍රතිලාභීන් විසින් වගා කටයුතු සඳහා සූදානම් වෙමින් ඇත.
	කෝලිකුට්ටු කෙසෙල් නිෂ්පාදන පොකුර සමඟ වියළි මිරිස් අතුරු බෝග වගාව	අක්කර 50 සහිත ගොවීන් 100 දෙනෙකු තෝරාගැනීම අවසන් කර ඇත. ප්‍රතිලාභීන් 07 දෙනෙකු වෙත වගා ද්‍රව්‍ය ලබා දී ඇති අතර එක් ප්‍රදර්ශක වගාවක් සම්පූර්ණ කර ඇත.

දිස්ත්‍රික්කය	පොකුරු නාමය	භෞතික ප්‍රගතිය
	පැපොල් නිෂ්පාදන පොකුර	ප්‍රතිලාභීන් 434 දෙනෙකු තෝරාගෙන ඇති අතර ඔවුන් වෙත බීජ ලබා දී ඇත. ඔවුන් විසින් 2023 පෙබරවාරි මාසයේදී වගාව ආරම්භ කරනු ඇත.
මොණරාගල	කැවෙන්ඩිෂ් කෙසෙල් නිෂ්පාදන පොකුර සමඟ වියළි මිරිස් අතුරු බෝග වගාව	ගොවීන් 500 ක් තෝරා ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී. වගා ද්‍රව්‍ය ගොවීන් 92 දෙනෙකු වෙතද ජල පොම්ප ප්‍රතිලාභීන් 23ක් සහ ක්ෂුද්‍ර විසුරුම් පද්ධති 38ක් ස්ථාපිත කොට ඇත. ගොවීන් 200 දෙනෙකු වෙත අන්තර් වගා සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන උපාංග (Drip Tapes) ලබා දී ඇත.
	අඹ නිෂ්පාදන පොකුර සමඟ වියළි මිරිස් අතුරු බෝග වගාව	ගොවීන් 200 දෙනෙකු තෝරාගෙන ඇත. ඔවුන් සියළු දෙනා වෙනුවෙන් වගා ද්‍රව්‍ය ලබා දී ඇති අතර ජල පොම්ප 126ක්, කුඩා ජල විසුරුම් පද්ධති 40ක් ලබා දී ඇත. එක් ප්‍රදර්ශක වගාවක් ස්ථාපිත කර ඇති අතර අනෙකුත් උපකරණ ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී.
	MD2 අන්නාසි නිෂ්පාදන පොකුර	හෙක්ටයාර 01ක නියමු වගාවක් සැලසුම් කර ඇත. ඒ සඳහා අන්නාසි පැල 500ක් 2022 ජනවාරි මස මුලදී ලැබී ඇති අතර ඒවා CIC සමාගම මගින් පවත්වාගෙන යනු ලැබේ. 2023 වසරේදී යෝජිත අන්නාසි පොකුර ආරම්භ නිරීමට නියමිතය.
මඩකලපුව	දෙළුම් නිෂ්පාදන පොකුර සමඟ වියළි මිරිස් අතුරු භෝග වගාව - කලවන්චිකුඩි	ප්‍රතිලාභීන් 50 දෙනෙකු විසින් වගාව ස්ථාපිත කර ඇත.
	දෙළුම් නිෂ්පාදන පොකුර සමඟ වියළි මිරිස් අතුරු භෝග වගාව - වෙන්කලඩි	ප්‍රතිලාභීන් 50 දෙනෙකු විසින් වගාව ස්ථාපිත කර ඇත.
	කැවෙන්ඩිෂ් කෙසෙල් වගා පොකුර මිරිස් අතුරු භෝග වගාව සමඟ	ප්‍රතිලාභීන් තෝරාගැනීම සම්පූර්ණ කර ඇත. ඔවුන් අතුරින් ප්‍රතිලාභීන් 120 දෙනෙකු විසින් භූමිය සැකසීම අවසන් කර ඇති අතර ප්‍රතිලාභීන් 58 දෙනෙකු පැල සිටුවා ඇත. වාරි පද්ධති 40ක් ස්ථාපිත කර ඇත.
අනුරාධපුරය	කුඩා කෙසෙල් නිෂ්පාදන පොකුර	කෙසෙල් කි.ග්‍රෑ. 72,388ක් ඩුබායි රාජ්‍යය වෙත අපනයනය කර ඇති අතර කි.ග්‍රෑ. 128,600ක් දේශීය සුපිරි වෙළඳසැල් වෙත විකුණා ඇත. තෝරාගත් අක්කර 50කින් නව වගා අක්කර 38.5ක් සම්පූර්ණ කර ඇත.
	වියළි මිරිස් නිෂ්පාදන පොකුර	2021 වර්ෂයේදී ගොවීන් 100 දෙනෙකු විසින් වගාව ආරම්භ කරන ලද අතර වියළි මිරිස් කි.ග්‍රෑ. 5000ක් කි.ග්‍රෑ.1ක් රු.850 බැගින් අලෙවි කර ඇත. තවත් ගොවීන් 200ක් විසින් වගාව ආරම්භ කර ඇති අතර අස්වනු නෙලීමේ කටයුතු සිදුවෙමින් පවතී. නව වගා අක්කර 150ක් ගොවීන් 300 දෙනෙකු විසින් 2023 ජනවාරි මාසයේ ආරම්භ කිරීමට නියමිත අතර භූමිය සකස් කිරීම සිදුවෙමින් පවතී.
	පේර නිෂ්පාදන පොකුර	පළතුරු ආවරණ මලු 82500ක් ගොවීන් 45 දෙනෙකු අතර බෙදා දෙන ලදී. කසළ මලු1000ක් ලබා ගන්නා ලදී. අක්කර ½ ආදර්ශන බිම් කොටසක් ආරම්භ කරන ලද අතර, එය නව ගොවීන් 50 දෙනෙකු සමඟ අඛණ්ඩව සිදු කරනු ඇත. ජලවහන ගැටළුවක් ඇති වීම නිසා ප්‍රශස්ත ජලවහන පද්ධතියක් නිර්මාණය කිරීමේ කටයුතු ISP ආයතනය විසින් සිදුකරනු ලැබේ.
පොලොන්නරුව	වියළි මිරිස් නිෂ්පාදන පොකුර	පළමු වගාව 2021 මැයි මාසයේදී ගොවීන් 87 දෙනෙකු සමඟ ආරම්භ කරන ලද අතර, මේ වන විට ගොවීන් 300ක් වගා ආරම්භ ඇත.

දිස්ත්‍රික්කය	පොකුරු නාමය	භෞතික ප්‍රගතිය
	පැපොල් නිෂ්පාදන පොකුර	සංවර්ධන සැලැස්ම ISP ආයතනය මගින් ලබාදිය යුතු අතර 2023 වර්ෂයේදී වගාව ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.
	කාබනික එළවළු පොකුර	සංවර්ධන සැලැස්ම ISP ආයතනය මගින් ලබාදිය යුතු අතර 2023 වර්ෂයේදී වගාව ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.
මාතලේ	අඹ නිෂ්පාදන පොකුර සමඟ ලොකු ලුණු අතුරු බෝග වගාව	ගොවීන් 178 දෙනෙකු සඳහා අඹ පැල 53,020ක් ලබා දී ඇත.
	පේර නිෂ්පාදන පොකුර	අක්කර ½ ප්‍රදර්ශන බිම් කොටසක් ආරම්භ කර ඇත. පේර පැල 20,600ක් ලැබී ඇති අතර ගොවීන් 44 දෙනෙකු විසින් බෝග ස්ථාපනය කර ඇත.
	MD2 අන්නාසි නිෂ්පාදන පොකුර	හෙක්ටයාර 01ක නියමු වගාවක් සැලසුම් කර ඇත. ඒ සඳහා අන්නාසි පැල 500ක් 2022 ජනවාරි මස මුලදී ලැබී ඇති අතර ඒවා CIC සමාගම මගින් පවත්වාගෙන යනු ලැබේ. 2023 වසරේදී යෝජිත අන්නාසි පොකුර ආරම්භ නිරීමට නියමිතය.

- **කුඩා කෙසෙල් නිෂ්පාදන පොකුරු ගම්මානය (සුළු පරිමාණ ව්‍යාපෘති), අනුරාධපුරය**

ඡායාරූපය අංක 08 - පිටු අංක 75

- **අනුරාධපුර මිරිස් නිෂ්පාදන පොකුර**

ඡායාරූපය අංක 09 - පිටු අංක 75

2. දේශගුණ සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය (CSIAP)

2.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ තෝරාගන්නා ලද දේශගුණික අවදානම්වලට ලක්විය හැකි උණුසුම් කලාපවල කුඩා ඉඩම් හිමි ගොවි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ වාරි කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ ප්‍රධාන අරමුණින්, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලෝක බැංකු මූල්‍ය සහ තාක්ෂණික සහයෝගීතාව ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය ඇමරිකානු ඩොලර් මිලියන 125.00ක ආයෝජනයක් සහිතව සැලසුම් කර, 2019 අප්‍රියෙල් මස සිට ක්‍රියාත්මක කරනු ලබයි. දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකාර්මික ක්‍රම සහ තාක්ෂණය භාවිත කරමින් කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ ඉලක්කගත කුඩා ගොවි නිෂ්පාදන ප්‍රජාව සඳහා වෙළඳපල ප්‍රවේශය වැඩි දියුණු කිරීම තුළින් මෙම අරමුණ සාක්ෂාත් කරගනු ඇත. ශ්‍රී ලංකාවේ උතුරු පළාත (කිලිනොච්චිය සහ මුලතිව්), නැගෙනහිර පළාත (මඩකළපුව), අම්පාර සහ ත්‍රිකුණාමලය), උතුරුමැද පළාත (අනුරාධපුර සහ පොළොන්නරුව), වයඹ පළාත (කුරුණෑගල සහ පුත්තලම), දකුණු පළාත (හම්බන්තොට) සහ ඌව පළාත (මොණරාගල) යන පළාත් 6 ආවරණය වන පරිදි පරිපාලන දිස්ත්‍රික්ක 11ක දේශගුණික විපර්යාසයන්හි බලපෑම නිසා අවදානමට ලක්වන ප්‍රදේශ ආශ්‍රිතව කුඩා ගොවීන් 470,000කට අධික ප්‍රමාණයකට සහ ගොවි පවුල් 57,838කට සෘජු ප්‍රතිලාභ සලසමින් හෙක්ටයාර් 375,000ක පමණ වගා බිම් ප්‍රමාණයක් ආවරණය කිරීම ව්‍යාපෘතිය මගින් සහතික කෙරේ. ලෝක ආහාර වැඩසටහන (WFP), ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (IWMI) සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (DAD) විසින් ඒකාබද්ධව සිදු කරන ලද සහයෝගීතා අධ්‍යයනයන්ගෙන් ලබා ගන්නා ලද වඩාත් විශ්වාසනීය වූ දත්ත පද්ධතියක් පදනම් වූ ප්‍රවේශයක් හරහා දේශගුණ විපර්යාසයන්හි තීව්‍ර විචල්‍යයන්ට ලක්වන ප්‍රදේශ පදනම් කරගෙන මෙම දිස්ත්‍රික්ක තෝරාගෙන ඇත.

- **දැක්ම** දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්ම පිළිවෙත් අනුගමනය කිරීම තුළින් සහ කාර්යක්ෂම ජල ඵලදායිතාව තුළින් විශ්වාසනීයව වාරි ජල සැපයුම තහවුරු කිරීම මඟින් ජල නිෂ්පාදනාව වැඩි දියුණු කිරීම
- **මෙහෙවර** දේශගුණ විපර්යාසයන්හි අහිතකර බලපෑමට ලක්වන ප්‍රදේශවල කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ඉහළ දේශගුණික විචල්‍යතාවයේ බලපෑම අවම කිරීමට එල්ලංගා පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සහ දේශගුණික සුහුරු කෘෂිකාර්මික භාවිතයන් අනුගමනය කිරීම තුලින් කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා වාරි ජල සැපයුම සහතික කිරීම
- **අරමුණු** දේශගුණ විපර්යාසයන්හි බලපෑමට ලක්වන තෝරාගන්නා ලද උණුසුම් කලාපවල කුඩා ඉඩම්හිමි ගොවි ජනතාවගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම
- **සංරචක** ව්‍යාපෘති කාර්යයන් ප්‍රධාන සංරචක 04ක් යටතේ ක්‍රියාත්මක වේ.
  සංරචක - 1 : කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය
  සංරචක - 2 : කෘෂිකර්මාන්තය සඳහා ජලය
  සංරචක - 3 : ව්‍යාපෘති කළමනාකරණය
  සංරචක - 4 : හදිසි ප්‍රතිචාර සඳහා සංචිත

2.2. මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන්කළ මුදල (රු.මි.)	වියදම්කළ මුදල (රු.මි.)	ප්‍රගතිය (%)	වෙනත්
ප්‍රාග්ධන වියදම්	3,950 .00 (2500+1450)	3,852.00	97.46	2022 සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම රු. මි. 2500 ක් විය. අතිරේක ප්‍රතිපාදන රු. මි. 1450 ක් 2022 දෙසැම්බර් අගදී ලැබුණි.
පුනරාවර්තන වියදම්	-			

2.3. භෞතික ප්‍රගතිය (ක්‍රියාත්මක සැලැස්මට අනුව ප්‍රධාන සංරචක යටතේ)

සංරචකය	අරමුණ	ක්‍රියාකාරකම	2022 වසරේ ප්‍රගතිය
1. **කෘෂිකාර්මික නිෂ්පාදනය හා අලෙවිකරණය**	දේශගුණික සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් අනුගමනය කිරීම සහ ගොවිපල ජල කළමනාකරණය වැඩිදියුණු කිරීම තුළින් කෘෂිකාර්මික ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ විවිධාංගීකරණය	<u>**දේශගුණික සුහුරු වාරි කෘෂි තාක්ෂණ භාවිතයන්**</u> - කෘෂි උපදේශකවරුන් සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂි කර්මය සහ කෘෂිකර්ම තාක්ෂණය පිළිබඳ පුහුණු පැවැත්වීම - ව්‍යාපෘති ප්‍රතිලාභීන් සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂි කර්මය සහ කෘෂිකර්ම තාක්ෂණය පිළිබඳ පුහුණු පැවැත්වීම - ප්‍රතිලාභීන් සඳහා අත්දැකීම් ලබා ගැනීමේ චාරිකා - ආදර්ශ ගම්මාන සහ ආදර්ශන පිහිටුවීම - පොකුරු ගම්මාන සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම	- වසර තුළදී වැඩසටහන් 03ක් පවත්වා උපදේශකවරුන් පුහුණු කර ඇති අතර මේ දක්වා උපදේශකවරුන් 2614කට පුහුණුව ලබා දී ඇත. - සුහුරු වාරි කෘෂිකර්මය සහ තාක්ෂණය පිළිබඳ වැඩසටහන් 492ක් තුළින් ප්‍රතිලාභී ගොවීන් 17,451ක් සඳහා පුහුණුව ලබා දීම. - දැනට පවත්වා ඇති අත්දැකීම් ලබාගැනීමේ චාරිකා 33 අතරින් 22ක් 2022 වසරේ සිදු කර ඇති අතර ඒ තුළින් ප්‍රතිලාභී ගොවීන් 863ක් වෙත සුහුරු වාරි කෘෂිකර්මය සහ තාක්ෂණය පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට සැලැස්වීම. - ආදර්ශ ගම්මාන 03ක ආදර්ශන බිම් 35ක් පිහිටුවීම තුළින් ප්‍රතිලාභීන් 293ක් දේශගුණ සුහුරු වාරි කෘෂි අත්දැකීම් ලබා ඇති අතර මේ විට සමස්ත වශයෙන් ඇති ආදර්ශන බිම් ප්‍රමාණය 456කි. - යල කන්නය තුළ හෙක්ටයාර 883.8ක වී(හෙක්.44.8) සහ අතිරේක බෝග වර්ග(හෙක්.839) වගාකර අස්වනු මෙ.ටො.1095ක් ලබාගැනීම. (වී=මෙටො. 215 සහ අනෙකුත් බෝග

සංරචකය	අරමුණු	ක්‍රියාකාරකම	2022 වසරේ ප්‍රගතිය
		- දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ක්‍රම භාවිතයෙන් යල වැඩසටහන - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්මය භාවිතයන් තුළින් මැද කන්නය වැඩසටහන - ගෙවතු සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්මය යටතේ මහ කන්න වැඩසටහන - අනුරාධපුර තිරප්පනේ ගොවිපල පුහුණු පාසල පිහිටුවීම - කොම්පෝස්ට් නිෂ්පාදන වැඩසටහන	වර්ග= මෙටො.880) (ප්‍රතිලාභී ගොවීන් 2868) - මැද කන්නය සඳහා හෙක්ටයාර් 587ක් වගාකිරීම. මුංඇට හෙක්.413කින් අස්වනු මෙටො.136ක්, කව්පී හෙ.64කින් මෙටො. 8.5ක්, තල හෙ.47කින් මෙටො. 28ක්. - අනාගතයේ ඇතිවිය හැකි ආහාර අර්බුදයන්ට පිළියමක් ලෙස හා ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ අවශ්‍යතා සහතික කිරීමේ අරමුණින් ගෘහස්ත 66015ක් ඉලක්ක කර කෘෂි යෙදවුම් ලබා දී ක්‍රියාත්මක කරන ලද ගෙවතුවගා සංවර්ධන කඩිනම් වැඩ සටහන සඳහා ගෘහස්ත 58,378ක් සහභාගී වී හෙක්ටයාර 3652ක් වගාකර ඵළවළු සහ පළතුරු මෙටො. 839ක අස්වනු ලබා ඇත. - 2021/22 මහ කන්නය වෙනුවෙන් ගොවීන් 8084ක් සඳහා කිග්‍රෑ.166,569ක් බීජ ලබා දී අතිරේක බෝග හෙක්. 3723කින් අස්වනු මෙටො.5928ක් ලබා ඇත. හෙක්.262.8කින් වී අස්වනු මෙටො. 721.79ක්, හෙක්.381.54කින් මුංඇට මෙටො. 173.68ක්, බඩඉරිඟු හෙක්.2515කින් මෙටො. 4096 වශයෙන් මහ කන්නයේ අස්වනු ලබා ඇත. - අනුරාධපුර, තිරප්පනේ ගොවිපල පුහුණු පාසල 2022 දෙසැ.04 විවෘත කළ අතර, 2023 ජනවාරි 13 සිට ක්‍රියාත්මකවන පරිදි දේශගුණ සුහුරු වාරි කෘෂිකර්මයට අදාළ පුහුණුවීම් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. - ගොවීන්/ගොවිපවුල් 18,854ක් විසින් සන පොහොර මෙ.ටොන් 12184ක් සහ ගොවීන් 7661ක් විසිස් දියර පොහොර ලීටර් 24,697 ක් නිෂ්පාදනය කර එම සන පොහොර හා දියර පොහොර පිළිවෙලින් හෙක්ටයාර 3698ක් හෙක්ටයාර 2114ක් සඳහා භාවිත කර ඇත. - නිෂ්පාදන සමිති 139ක්, නිෂ්පාදන සමාගම් 7ක් වසරතුළ දී පිහිටුවා පුහුණුව ලබා දී ඇත. මේ වනවිට නිෂ්පාදන සමිති 575ක් සහ නිෂ්පාදන සමාගම් 25කි. - නිෂ්පාදන සමිති 30ක් වෙළඳපොල හා සම්බන්ධ කිරීම යටතේ කීල්ස්, කාර්ගිල්ස්, ගෝල්ඩන් ෆූඩ්, මැලිබන්, ප්‍රීමා ආදි ප්‍රධාන වෙළඳ ව්‍යාපාර 09ක් හා සම්බන්ධ කර ඇත. - පසු අස්වනු කළමනාකරණය, අලෙවිකරණය සම්බන්ධ පුහුණු වැඩ සටහන් 5ක් පවත්වා ඇත. - කෘෂි සේවා මධ්‍යස්ථාන 47න් 40ක් මේ වන විට ප්‍රතිසංස්කරණය කර ඇති අතර 05ක කටයුතු කෙරෙමින් පවතී.
		1.2: කෘෂි අලෙවිකරණය - නිෂ්පාදන සමිති සහ නිෂ්පාදන සංගම් පිහිටුවා ඒවායේ ධාරිතා සංවර්ධනය කිරීම - නිෂ්පාදන සමිති වෙළඳපොළ සමඟ සම්බන්ධ කිරීම - පසු අස්වනු තාක්ෂණ,	

සංරචකය	අරමුණ	ක්‍රියාකාරකම	2022 වසරේ ප්‍රගතිය
		අලෙවිකරණය පිළිබඳ පුහුණු පැවැත්වීම - කෘෂි සේවා මධ්‍යස්ථාන නවීකරණය/ප්‍රතිසංස්කරණය කිරීම - කෘෂි සේවා මධ්‍යස්ථාන තාක්ෂණිකව වැඩිදියුණු කිරීම - කෘෂි සේවා මධ්‍යස්ථාන සඳහා කෘෂි උපකරණ ලබාදීම - කෘෂි සේවා මධ්‍යස්ථාන සඳහා පාංශු පරීක්ෂණ කට්ටල ලබා දීම - කෘෂි සේවා මධ්‍යස්ථාන නිලධාරීන් සඳහා පුහුණුව - කෘෂිකාර්මික මාර්ග ප්‍රතිසංස්-කරණය - කෘෂි ළිං ප්‍රතිසංස්කරණය - කුඩා පරිමාණ ධාන්‍ය ගබඩා සහ මධ්‍යම පරිමාණ ධාන්‍ය ගබඩාවක් ඉදිකිරීම - වන සත්ව ආරක්ෂක වැට ඉදිකිරීම	- කෘෂි සේවා මධ්‍යස්ථාන තාක්ෂණික වැඩිදියණු කිරීම පිණිස උප ව්‍යාපෘති යෝජනාව සම්පූර්ණ කර අනුමැතිය ලද අතර, කෘෂි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනම මෘදුකාංගයක් සංවර්ධනය කරන නිසා එම වැඩිදියුණුවට අදාළ තාක්ෂණික මෙවලම් ලබා ගැනීම පිණිස ඉල්ලීමක් කර ඇත. - කෘෂි සේවා මධ්‍යස්ථාන 47 සඳහා කෘෂිඋපකරණ, කෘෂි උපදේශකවරුන් වෙනුවෙන් පාංශු පරීක්ෂණ කට්ටල ලබා දී ඇත. - කෘෂිකාර්මික මාර්ග 09ක් (කිලෝ මීටර 6.39ක්) ප්‍රතිසංස්කරණය කර ඇත. මාර්ග 300ක් සඳහා හඳුනාගෙන ඇති අතර, මාර්ග 55කට කොන්ත්‍රාත් ප්‍රදානය කර, 24ක් කොන්ත්‍රාත් ලබා දීමට සූදානම්ව සහ 89ක් සඳහා ඇස්තමේන්තු සකසා ඇත. - කෘෂි ළිං 377ක ප්‍රතිසංස්කරණ කටයුතු නිම කර ඇත. තවත් 124ක කටයුතු කරමින් පවතී. කෘෂි ළිං ඉදිකිරීම පිළිබඳව අදාළ ගොවි සංවිධාන බලමුළු ගන්වා ඇත. - කුඩා පරිමාණ ධාන්‍ය ගබඩා 11ක් ඉදි කිරීම් අවසන්කර මධ්‍යම ප්‍රමාණයේ ගබඩාව මුලතිව්හි ඉදි කිරීමේ කොන්ත්‍රාත් පිරිනමා ඇත. - ආරක්ෂිත-වැට ඒකක 275ක් (කිමී.1292ක්) ඉදිකිරීම් හඳුනාඇත. එමගින් හෙක්.4202ක කුඹුරු ආරක්ෂා වන අතර, ප්‍රතලාභීන් සංඛ්‍යාව 16724ක් වේ. (පුරුෂ 8929 හා ස්ත්‍රී 7795).
2. **කෘෂිකර්මාන්තය සඳහා ජලය**	- දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සහ වෙනත් යටිතල පහසුකම් සැලසුම් කිරීමට උදව් කිරීම. - සැලසුම් කළ යටිතල පහසුකම් ඉදි කිරීමට උදව් කිරීම. - ඉදිකරන ලද යටිතල පහසුකම් මධ්‍යම හා පළාත් ආණ්ඩු සමඟ පළාතේ ජනතාව ඒකාබද්ධව නඩත්තු හා මෙහෙයුම් සිදු කිරීමට උදව්	**2.1 වාරි පද්ධති ප්‍රතිසංස්කරණය:** - වැව් 932ක් සඳහා ජල විභව අධ්‍යයනයන් - සහභාගිත්ව ග්‍රාමීය ප්‍රවේශයන් තුළින් උණුසුම් කලාප කෘෂි සංවර්ධන සැලසුම් - වැව් සඳහා ඉංජිනේරු සමීක්ෂණ - වාරි පද්ධති ප්‍රතිසංස්කරණය **2.2 වාරි පද්ධති මෙහෙයුම් සහ නඩත්තුව:** - සමාජ විගණන කමිටු පිහිටුවා ඒවායේ ධාරිතා සංවර්ධනය - සියළු උණුසුම් කලාප තුළ එල්ලංගා කළමනාකරණ කමිටු පිහිටුවීම සහ පුහුණුව - ගොවි සංවිධානවල ධාරිතා සංවර්ධනය - ජල පෝෂක ප්‍රදේශවල	- මේ වන විට තනි වැව්වල ජල සමතුලිත අධ්‍යයන 786ක්, ජල විභව අධ්‍යයනයන් 14ක් සහ එල්ලංගා 154ක සහ ගංභාද්‍රෝණි 14ක ජල අධ්‍යයන අවසන් කිරීම - කෘෂි සේවා මධ්‍යස්ථාන 47ම ආවරණය වන පරිදි උණුසුම් කලාප කෘෂි සංවර්ධන සැලසුම් සකස්කර අවසන් කිරීම - වැව් 803ක් සඳහා ඉංජිනේරු සමීක්ෂණ සම්පූර්ණ කිරීම - වාරි පද්ධති 42ක භෞතික ප්‍රතිසංස්කරණ අවසන් කර ඇති අතර ප්‍රතිසංස්කරණ තත්වයේ පවතින 224කින් 38ක් අවසන් අදියරේ පවතී. - 2022 වසර තුළ සමාජ විගණන කමිටු 132ක් පිහිටුවා පුහුණුව ලබා දී ඇති අතර මේ වන විට මුළු කමිටු සංඛ්‍යාව 268ක් වේ. - එල්ලංගා කළමනාකරණ කමිටු 04ක් පිහිටුවා ඇත. - ගොවි සංවිධාන ධාරිතා සංවර්ධන වැඩසටහන් වැව් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියත් සමඟ ආරම්භ වේ.

සංරචකය	අරමුණු	ක්‍රියාකාරකම	2022 වසරේ ප්‍රගතිය
	කිරීම.	වෘක්ෂලතා ආරක්ෂා කිරීමට සහ පාංශු බාදනය හා වැව් රොන්මඩ වැලැක්වීම පිණිස එල්ලංගා කළමනාකරණ කමිටු හරහා උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - පාරිසරික, සමාජ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ද සම්බන්ධවූ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා පිරික්සුම් තක්සේරු වාර්තා සැකසීම	- ජලපෝෂක ප්‍රදේශවල වෘක්ෂලතා සුරක්ෂිත කිරීමට සහ පාංශු බාදනය වැලැක්වීමට ගස් වැවීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මකවේ. මේ වන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක එම ප්‍රදේශවල ගස් 800කට වඩා වගා කර ඇත. - වැව්, කෘෂිකාර්මික පාරවල්, කෘෂි ළිං හා වගාවන් පදනම් වූ සහ පාරිසරික, සමාජ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආවරණයවන පරිදි ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා පිරික්සුම් තක්සේරුව තාක්ෂණික නිලධාරීන් විසින් සිදුකර, මේ වන විට වාර්තා 69ක් සකස් කර ඉදිරිපත් කර ඇත.
3. ව්‍යාපෘති කළමනාකරණය	ජාතික හා පළාත් මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් කාර්යක්ෂම ලෙස සම්බන්ධීකරණය කරමින් සමස්ත ව්‍යාපෘති කළමනාකරණයේ ගුණාත්මක බව සහතික කිරීම	- තොරතුරු, අධ්‍යාපන, සංනිවේදන වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම - ව්‍යාපෘතිය හඳුන්වාදීමේ වැඩසටහන්, විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් (දේශගුණ සුහුරු කෘෂිකර්මාන්තය, නියාමනය සහ අගැයීම, සමාජ හා පාරිසරික, ජලවිද්‍යාත්මක, මිළදී ගැනීම්, භූගොලීය තොරතුරු පද්ධති) පැවැත්වීම - ජාතික, පළාත් සහ දිස්ත්‍රික්ක මට්මටමේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් (ඇස්තමේන්තු සමඟ) සැකසීම සහ ප්‍රගතිය වාර්තා කිරීම - ව්‍යාපෘතිය සඳහා මූලික සමීක්ෂණයක් පැවැත්වීම - ප්‍රතිලාභී දත්ත සමුදාය සැකසීම - කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කිරීම - ව්‍යාපෘති ප්‍රතිඵල දර්ශක අගයයන් තක්සේරු කිරීමේ අධ්‍යයනයන් - මධ්‍යකාලීන සමාලෝචනය මෙහෙයවීම	- මේ දක්වා වැඩසටහන් 735ක් නිමවා ඇති අතර ප්‍රතිලාභීන් 26731ක් සහභාගි වී ඇත. - ජාතික හා පළාත් මට්ටමෙන් ව්‍යාපෘතිය හඳුන්වාදීමේ වැඩසටහන්, සමාජ ආරක්ෂණ, පාරිසරික, ආදී විෂය ආශ්‍රිත පුහුණු වැඩසටහන්ද, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ පුහුණු වැඩසටහන් 99ක් සමාජ විගණන කමිටු සඳහා පුහුණු වැඩසටහන් 76ක් ද පවත්වා ඇත. - 2022 වසර මැදදී ඉතිරි ව්‍යාපෘති කාල සීමාව සඳහා වැඩසටහන් පෙළගැස්වීම පිණිස දින 02ක වැඩමුළුවක් ද, වසර අගදී 2023 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේ වැඩමුළුවක් ද පවත්වා සැලැස්ම අනුමැතිය පිණිස අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. මාසික හා කාර්තු ප්‍රගති වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කර ඇත. - මූලික සමීක්ෂණය පවත්වා වාර්තාව ඉදිරිපත් කර ඇත. - ව්‍යාපෘති ප්‍රතිලාභීන් 65,000කගේ දත්ත රැස් කර ඇත. - කළමනාකරණ දත්ත පද්ධතිය සකස් කර අවසන් වී ඇති අතර, දකුණු පළාතේ ව්‍යාපෘති නිලධාරීන් සඳහා දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ පුහුණුව පවත්වා ඉතිරි පළාත් සඳහා 2023 මුල් සතියේ පැවැත්වීමට කටයුතු යොදා ඇත. පුහුණුව අවසන්කිරීමත් සමඟම දත්ත ඇතුළත් කිරීම ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. - ව්‍යාපෘති ප්‍රතිඵල දර්ශක අගයයන් තක්සේරු කිරීම පිණිස උපදේශක කණ්ඩායමක් විසින් මධ්‍යකාලීන සමාලෝචනයක් සිදු කර වාර්තා කර ඇත. - ලෝක බැංකු මධ්‍යකාලීන සමාලෝචනය සිදු කර වාර්තාව ඉදිරිපත් කර ඇත.

ඡායාරූප අංක 10,11,12 සහ 13 - පිටු අංක 76

3. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන (SAPP)

3.1. හැඳින්වීම

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) සඳහා අරමුදල් සපයනු ලබන්නේ කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) සහ ශ්‍රී ලංකා රජය (GOSL) ඒකාබද්ධවය. මෙම වැඩසටහන 4P ප්‍රවේශය (රාජ්‍ය, පුද්ගලික, නිෂ්පාදක හා හවුල්කාරිත්වය) හරහා තෝරාගත් කෘෂිකාර්මික අංශයන්හි වටිනාකම් දාමය ශක්තිමත් කිරීමට පාර්ශවකරුවන්ට (පුද්ගලික සමාගම්, ගොවි සංවිධාන සහ කුඩා පරිමාණ කෘෂිකාර්මික ප්‍රතිලාභීන්) සහනදායී පොලී අනුපාත යටතේ ප්‍රදාන සහ ණය ලබා දීම සිදුකෙරේ. ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීමට සහ වාණිජ හවුල්කාරිත්වය ඇති කිරීමටත්, සහතික වෙළඳපල සඳහා වෙළඳපල සම්බන්ධතා ඇති කිරීමටත් සහය වේ. තවද SAPP මගින් කුඩා පරිමාණ ගොවීන්ට ඔවුන්ගේ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා පුහුණුව සහ තාක්ෂණික දැනුම ලබා දීම සහ කෘෂිකර්ම මාර්ග, අමුණු ආදි යටිතල පහසුකම් ව්‍යුහය වැඩිදියුණු කිරීම හා හිතකර ප්‍රතිපත්තිමය පරිසරයක් ඇති කිරීම සඳහා ද සහාය වේ.

3.2. සංක්ෂිප්ත ප්‍රගතිය

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ ලෙස සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ප්‍රදාන සහ ණය හරහා කුඩා පරිමාණ කෘෂිකාර්මික ප්‍රතිලාභීන් 57,500 ක් වෙත ළඟා වීමට අපේක්ෂා කරයි. 2022 දෙසැම්බර් 31 දිනට; SAPP වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 32,774 ක් ප්‍රතිලාභ ලබා ඇත (4P, තරුණ සහ ආදායම් උත්පාදන ණය යටතේ ප්‍රතිලාභීන්). මෙය සමස්ත ව්‍යාපෘති ඉලක්කයෙන් 57% කි.

මෙම වැඩසටහන මගින් 4P ආකෘතිය යටතේ උප ව්‍යාපෘති 36ක් ක්‍රියාත්මක කර ඇති අතර, දැනට ඉලක්ක කර ඇති ප්‍රතිලාභීන් 37,445 කින් 27,207 දෙනෙකුට ප්‍රතිලාභ ලැබී ඇත. උප ව්‍යාපෘති වශයෙන් කිරි, තේ, කුළුබඩු, ධාන්‍ය සහ රනිල කුලයට අයත් බෝග, මල් වගාව සහ එළවළු වැනි ප්‍රධාන කෘෂිකාර්මික අංශ ආවරණය කරයි.

ණය සහ ප්‍රදාන යන දෙකම ඇතුළුව මේ වන විට මුළු ආයෝජනය රු. මි. 6,715 ක් 4P යටතේ සැලසුම් කර ඇති අතර, ඉන් රු. මි. 2,896 ප්‍රධානය කර ඇත. මෙම වැඩසටහනට අමතරව තරුණ තරුණියන් 2500ක් ඉලක්ක කර ගනිමින් තරුණ ව්‍යවසායකත්ව වැඩසටහන ක්‍රියාත්මක වන අතර ඉන් 1600ක් ළඟා වී ඇති අතර, ඒ සඳහා රු. මි. 1,120ක් ණය සහ ප්‍රදානයන් යටතේ ආයෝජනය කර ඇත. ආදායම් උත්පාදන ණය (Income Generation Loans) කාණ්ඩය යටතේ SAPP විසින් ප්‍රතිලාභීන් 3,967ක් සඳහා රුපියල් මිලියන 467.1ක් වටිනා ණය මේ වනවිට ලබා දී ඇත. එමෙන්ම, මෙම වැඩසටහන යටතේ ගොවිපළෙන් බැහැර සංවර්ධන කටයුතු (ප්‍රවේශ මාර්ග, වාරි ඇල ප්‍රතිසංස්කරණය) මෑතකදී ආරම්භ කර ඇති අතර, එමඟින් ව්‍යාපෘති 21ක් සඳහා රුපියල් මිලියන 105ක් වැය කිරීමට සැලසුම් කර ඇත. මේ වන විට රුපියල් මිලියන 39ක් වැය කර ඇත.

2022 දෙසැම්බර් 31 වන දිනට 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ඉලක්කයෙන් 76%ක් (රු.මි. 2,000) සපුරා ඇත. වැඩසටහන් සැලසුම් අයවැයට අනුව (එනම් රුපියල් මිලියන 12,056), 2022 දෙසැම්බර් 31 දිනට 45%ක සමුච්චිත මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත.

3.3. දැක්ම

කුඩා පරිමාණ ගොවීන්ගේ දරිද්‍රතාවය අඩු කිරීම සහ තරඟකාරිත්වය සඳහා දායක වීම

3.4. මෙහෙවර

වාණිජමය වශයෙන් අරමුණු කරගත් නිෂ්පාදන සහ අලෙවිකරණ පද්ධතිවලට සම්බන්ධ කුඩා පරිමාණ ගොවීන්ගේ (ගොවින් 57,000 කගේ) ආදායම 20% - 30% කින් සහ ආහාරවල ගුණාත්මකභාවය තිරසාර ලෙස වැඩි කිරීම.

3.5. අරමුණු

i.) කුඩා පරිමාණ ගොවීන්ගේ සහ ඔවුන්ගේ සංවිධානවලට පුද්ගලික අංශය සමඟ හවුල්ව වෙළඳපොළ වෙත ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීම.

ii.) කුඩා පරිමාණ ගොවීන්ට ග්‍රාමීය මූල්‍ය සේවා සඳහා තිරසාර ආකාරයකින් සහ දැරිය හැකි මිලකට ප්‍රවේශය වැඩිදියුණු කිරීම.

iii.) කුඩා පරිමාණ ගොවීන්ගේ කෘෂි ව්‍යාපාර සංවර්ධනය වැඩිදියුණු කිරීමට තිරසාර සහ සාධාරණ ප්‍රතිපත්ති පරිසරයක් සකස් කිරීමට දායක වීම.

3.6. ව්‍යාපෘතියේ විස්තර

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දිනය	2017 ජුනි 26	
අපේක්ෂිත ව්‍යාපෘති කාලසීමාව	අවුරුදු 06	
මෙහෙයුම ආරම්භ කළ දිනය	2017 ජුනි 26	
ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කිරීම	වසර 2 (IFAD අනුමැතිය ලැබීමට ඇත / කැබිනට් අනුමැතිය ලබා දී ඇත)	
මූල්‍ය ප්‍රභවය (විදේශ අරමුදල්)	කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) (ඇ.ඩො. මිලියන 54.4)	
මූල්‍ය ප්‍රභවය (ශ්‍රී ලංකා ජනරජ අරමුදල) (Counter Part Fund)	භාණ්ඩාගාර GoSL (ඇ.ඩො. මිලියන 19.3)	ඒකාබද්ධ අරමුදල (බදු සහ සේවක වැටුප් සඳහා)
		Revolving fund (for Credit) වක්‍රීය අරමුදල (ණය සඳහා)
අදාළ ක්ෂේත්‍රය	කෘෂිකාර්මික සංවර්ධනය	
වගකිවයුතු ආයතනය	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - MOA යටතේ SAPP	

3.7. ව්‍යාපෘති සංරචක

සංරචකය	පිරිවැය ඇස්තමේන්තුව (රු.මි)
සංරචක 1 වාණිජ හවුල්කාරිත්වය සඳහා ප්‍රවේශය.	5,966.00
සංරචකය 2 ග්‍රාමීය මූල්‍ය වෙත ප්‍රවේශය	5,086.00
සංරචකය 3 වැඩසටහන් කළමනාකරණය සහ ප්‍රතිපත්ති සකස් කිරීමේ ප්‍රවේශය	1,004.00

3.8. සංරචක අනුව ප්‍රගතිය 2022

සංරචකය	වෙන් කළ ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)
සංරචකය-1	1,006.20	625.67
සංරචකය-2	750.40	737.42
සංරචකය-3	243.40	159.90
එකතුව	**2000.00**	**1,522.99**

4. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අභිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)

4.1. හැඳින්වීම

දේශගුණික විපර්යාස වර්තමානයේ ශ්‍රී ලංකාවට ප්‍රධාන අභියෝගයක් වන අතර, අධික හා කෙටිකාලීන වර්ෂාව, විටින් විට පැමිණෙන උෂ්ණාධික කාලසීමාවන් සහ දීර්ඝ වියළි කාලසීමාවන් කෙරෙහි වැඩි ප්‍රවණතාවක් පවතී.

තිරසාර නොවන ඉඩම් පරිහරණ පිළිවෙත් මගින් ඇති වී ඇති පාරිසරික හා ගොවිබිම්වල හායනය දේශගුණික විපර්යාසවල බලපෑම් මගින් ඇතිවන අධික වර්ෂාව, ගංවතුර සහ නියඟ හේතුවෙන් තව දුරටත් උග්‍ර කරයි. එම තත්වය වියලි කලාපයේ ප්‍රධාන වාරිමාර්ග ක්‍රම යටතේ වගා කරන ගොවීන්ට වඩා ග්‍රාමීය සුළු වාරිමාර්ග ක්‍රම යටතේ වගා කරන සහ වර්ෂා පෝෂිත වගා ක්‍රම මත අධික ලෙස යැපෙන කුඩා පරිමාණ ගොවීන්ට දැඩි ලෙස බලපායි.

තවද, ආන්තික සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ඵලදායිතාව සහ බෝග අස්වැන්න පහත වැටීම නිසා, කුඩා පරිමාණ ගොවීන් ආහාර හිඟයකට මුහුණ පා සිටිති. එය ණයගැතිභාවයට මග පාදයි. එය ඔවුන් දරිද්‍රතාවයේ ගැඹුරට ඇද දමනු ලබන අතර දේශගුණික අවදානම් සමඟ සාර්ථකව කටයුතු කිරීමට ඔවුන්ගේ හැකියාව තවදුරටත් අවම කරයි.

එබැවින්, ශ්‍රී ලංකාවේ පුත්තලම, කුරුණෑගල, මාතලේ, අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම යන වියළි කලාපීය දිස්ත්‍රික්ක හය තුළ ගොවිපළ වාණිජකරණය ප්‍රවර්ධනය කරන අතරම, කුඩා පරිමාණ ගොවි පවුල් 40,000ක් හෝ පුද්ගලයන් 180,000ක් සඳහා දේශගුණික විපර්යාස මගින් ඇති කරන ලද අභියෝගවලට විසඳුම් සෙවීම ව්‍යාපෘතියේ අරමුණයි.

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD), ශ්‍රී ලංකා රජය මෙන්ම අනෙකුත් සංවර්ධන ආයතන විසින් අරමුදල් සපයනු ලබන මෙම ව්‍යාපෘතිය මගින් රුපියල් මිලියන 30,000ක් පමණ ආයෝජය කිරීමට සැලසුම් කර ඇති අතර ව්‍යාපෘති කාලසීමාව 2021 වසරේ සිට 2026 වසර වේ.

4.2. දැක්ම

ශ්‍රී ලංකාවේ වියළි කලාපීය කුඩා පරිමාණ ඉඩම් හිමියන්ගේ දිළිඳුකම අවම කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය සඳහා දායක වීම

4.3. මෙහෙවර

දේශගුණ විපර්යාස මගින් නිර්මාණය වී ඇති **අභිතකර බලපෑම් අවම කිරීම වෙනුවෙන්** වියළි කලාපීය කුඩා පරිමාණ කෘෂි ඉඩම් හිමියන්, අගය දාම ක්‍රියාකරුවන් හා ඔවුන් වෙත සේවා සපයනු ලබන ආයතනවල ධාරිතා සංවර්ධනය සහ ව්‍යාපෘති ප්‍රතිලාභීන්හට දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තු දීමේ හැකියාව ඉහළ දැමීම සඳහා සහ අගය දාම සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් ආයෝජනය කිරීම.

4.4. අරමුණු

වියලි කළාපීය කුඩා පරිමාණ ඉඩම් හිමි පවුල් 40,000 ක (පුද්ගලයින් 180,000) සඳහා දේශගුණ විපර්යාස මගින් නිර්මාණය වී ඇති **අභිතකර බලපෑම් සඳහා** ඔරොත්තු දීමේ හැකියාව සහ අගය දාම සංවර්ධනය මගින් වෙළඳපල සහභාගීත්වය ගොඩනැංවීම හා තෝරාගත් පවුල් 28,000ක පමණ ආදායම 30% ඉහළ නැංවීම.

4.5. ව්‍යාපෘතියේ විස්තර

අයිතමය	ව්‍යාපෘතියේ විස්තර	
ව්‍යාපෘතියේ ආරම්භක දිනය	2021 ජුනි 10	
අපේක්ෂිත කාල සීමාව	2021-2026	
මෙහෙයුම් ආරම්භකර දිනය	2022 සැප්තැම්බර් 30 ව්‍යාපෘතිය නිල වශයෙන් ආරම්භ කරන ලදි.	
ව්‍යාපෘති දිගුව	අදාළ නොවේ	
මූල්‍ය සැපයුම් මූලාශ්‍ර	**මූලාශ්‍රය**	**ඇ.එ.ජ.ඩොලර් මිලියන**
	කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD)	42.7
	ශ්‍රී ලංකා රජය	12.7
	ප්‍රතිලාභීන්	13.2
	පෞද්ගලික අංශය	1.7
	UNDP, UNOPS, WFP	11.7
	එකතුව	**82.0**
අදාළ ක්ෂේත්‍රය	කෘෂිකර්ම අංශය	
වගකිවයුතු ආයතනය	ව්‍යාපෘති කළමණාකරණ ඒකකය, කෘෂිකර්ම අමාත්‍යාංශය	

4.6. ව්‍යාපෘති සංරචක

සංරචකය	පිරිවැය ඇත්තමේන්තුව (රු.මි.)
ව්‍යාපෘතිය තාක්ෂණික සංරචක 02 සහ කළමනාකරණ සංරචකයක් ක්‍රියාත්මක කිරීම තුළින් එහි සංවර්ධන අරමුණ සාක්ෂාත් කරගනු ඇත. මුළු ව්‍යාපෘති පිරිවැය අවිනිශ්චිත පිරිවැය ද ඇතුළත්ව රු මි. 29,923.07 කි.	
සංරචක 1 දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ඇතුළත් අගය දාමයන් සහ දේශගුණ සංවේදී ආයෝජන සඳහා ධාරිතා ගොඩනැංවීම.	3,846.74
සංරචකය 2 දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ දැමීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ අගය දාම පහසුකම් සැපයීම වෙනුවෙන් ආයෝජනය කිරීම	21,274.39
සංරචකය 3 ව්‍යාපෘති කළමනාකරණ හා සම්බන්ධීකරණය.	1,612.21

4.7. සංරචක අනුව ප්‍රගතිය/2021

සංරචකය	වෙන් කළ ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි.)
සංරචකය-1	ප්‍රතිපාදන වාර්තා නොවේ.	වියදම් වාර්තා නොවේ*.
සංරචකය-2		
සංරචකය-3	34.45	8.11**
එකතුව	**34.45**	**8.11**

සටහන්-
*මෙම ව්‍යාපෘතිය 2022 සැප්තැම්බර් 30 දින ව්‍යාපෘතිය නිල වශයෙන් ආරම්භ කරන ලද හෙයින් සංරචකය-1 හා 2 යටතේ වියදම් වියදම් වාර්තා නොවේ.
**රු.මි. 8.11 වියදම වාර්තා වන්නේ වැටුප්, මෙහෙයුම්, කාර්යාල උපකරණ මිලට ගැනීම හා ප්‍රසම්පාදන ආදී කටයුතු සඳහා වේ.

5. ශ්‍රී ලංකාවේ ජාතික ශාක නිරෝධායන සේවාව නවීකරණය කිරීම (Modernization of Plant National Plant Quarantine Service (KOICA))

5.1. හැඳින්වීම

ආනයනික සහ අපනයනික ශාක සහ ශාක නිෂ්පාදන වල ගුණාත්මක බව සහතික කිරීමේ තත්ව වඩාත් දියුණු කර ගැනීම සඳහා කටුනායක ශාක නිරෝධායන මූලස්ථානය (National Plant Quarantine Service Headquarter), බන්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ශාක නිරෝධායන මධ්‍යස්ථානය (Bandaranayaka International Airport) සහ කොළඹ වරාය ශාක නිරෝධායන මධ්‍යස්ථානය (Seaport Quarantine Station) දියුණු කිරීම සඳහා කොරියා රජයේ අධාර ලෙස ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 6.00 ක් ලැබී ඇත. 2009 සිට 2022 දක්වා අවුරුදු 13 ක ව්‍යාපෘති කාලයක් තුල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. ශාක නිරෝධායන ධාරිතාවය වැඩි කිරීම මෙහි මූලික අරමුණ වී ඇත.

ශාක නිරෝධායනය පිළිබඳ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය අනුව ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදීම හා නියාමනය, ජාතික ශාක නිරෝධායන සේවයේ විශේෂඥයින් සහ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධනය, කොළඹ වරාය ශාක නිරෝධායන මධ්‍යස්ථානයේ අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම, රසායනාගාර උපකරණ ලබාදීම, GAP (Good Agricultural Practices) සඳහා සහාය ලබාදීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්ක වේ.

5.2. මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන්කළ මුදල (රු.මී.)	වියදම් කළ මුදල (රු.මී.)
KOICA අධාර යටතේ ජාතික ශාක නිරෝධායන සේවය වැඩි දියුණු කිරීම	KOICA ආයතනය මගින් ජාතික ශාක නිරෝධායන සේවය වැඩි දියුණු කිරීම සඳහා වෙන් කරන ලද මුළු ආධාර මුදල ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 6.00 USD ක් වන අතර, 2022 වර්ෂය සඳහා KOICA ආයතනයේ ආධාර (FF) රු.මී. 15.00 ක් සහ දේශීය අරමුදල් රු.මී. 15.00 (CF) ලෙස 2022 වර්ෂය සඳහා මුළු මුදල රු.මී. 30 ක් අයවැය අස්තමේන්තුවෙන් වැය විෂය 118-2-3-046-2509-17 සහ 118-2-3-046-2509-13 යටතේ වෙන් වී ඇත.	2022 දෙසැම්බර් මස අවසානයට (CF) වියදම් වූ මුදල රු.මී. 0.12 කි. අතැති බිල්පත් වල වටිනාකම රු.මී. 3.76 වේ. ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු කොරියා රජයේ අධීක්ෂණය යටතේ සිදුවේ.

5.3. භෞතික ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරා ගත යුතු ඉලක්ක	අත් කරගත් භෞතික ප්‍රගතිය
i.VAT for construction	ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය නෛතික පසුබිම සකස් කර දීම.	ගෙවීම් කටයුතු කර ඇත.
ii.VAT for Procurement of Equipment		ගෙවීම් කටයුතු කර ඇත.
iii. Payment for UDA Approval		අනුමැතිය ලබාගෙන ඇත.
iv. Miscellaneous		ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ අනිකුත් කාර්යය සඳහා ගෙවීම් කටයුතු කර ඇත.

6. ජාතික ශාක නිරෝධායන සේවාව (JICA) සඳහා උපකරණ අලුත්වැඩියා කිරීම සහ ප්‍රසම්පාදනය සඳහා සැලැස්ම (Plan for Repairing and Procurement of Equipment for National Plant Quarantine Service (JICA)

6.1. හැඳින්වීම

ආනයනික සහ අපනයනික ශාක සහ ශාක නිෂ්පාදනවල ගුණාත්මක බව (Phytosanitary) සහතික කිරීමේ වගකීම දරන ආයතනය ජාතික ශාක නිරෝධයන සේවය (NPQS) යයි. ඒ අනුව NPQS ආයතනය රටේ අපනයන ආර්ථිකය ඉහළ නැංවීමට සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන අත්‍යාවශ්‍ය කාර්යයභාරයක් ඉටුකරයි.

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ශාක ආරක්ෂණ සම්මුතියට (IPPC) සම්බන්ධ වන පාර්ශ්වයක් බැවින්, එකී සම්මුතියට අනුව IPPC නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම ශ්‍රී ලංකා රජයේ වගකීම වේ. එබැවින්, ශ්‍රී ලංකා රජය ආනයනය කරන ශාක හා ශාක නිෂ්පාදනවල ප්‍රමිතිය (Phytosanitary Standards) පිළිබඳ අනෙකුත් රටවල සහතික කිරීමේ අවශ්‍යතා අවබෝධ කර ගත යුතු අතර ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ අපනයනය කිරීමට පෙර එම ප්‍රමිතීන් සපුරා ඇති බවට සහතික විය යුතුය. ඒ අනුව NPQS යනු අනෙකුත් රටවල ආනයනික අවශ්‍යතාද අනුව භාණ්ඩවල ශාක සනීපාරක්ෂක තත්ත්ව ප්‍රමිතීන් සහතික කිරීමේ වගකීම් දරණ ආයතනයක්වේ.

මෙම වගකීම් ඉටුකිරීම සඳහා ජපන් රජයේ අධාර යටතේ NPQS ආයතනය 1994 වර්ෂයේ ස්ථාපිත කර ඇති අතර, මෙම සේවාව දියුනු කිරීම සඳහාද තාක්ෂණ උපරණ මිලදී ගැනීමට JICA ආයතනය මගින් නැවත ශ්‍රී ලංකා මුදලින් රු.මි. 259.60 අධාර ලෙස පිරිනමන ලදී.

6.2. මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන්කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)
ජාතික ශාක නිරෝධායන සේවයට තාක්ෂණ උපකරණ මිලදී ගැනීම (JICA ආයතනය මගින් අධාර මුදල් ලබාදී ඇත)	JICA ආයතනය මගින් තාක්ෂණ උපකරණ මිලදී ගැනීම සඳහා ආධාර ලෙස පිරිනමන ලද මුළු මුදල රු.මි. 259.60 වේ. 2022 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන් නොවූ අතර, 2021 වර්ෂයේ ඇනවුම් කරන ලද උපකරණ මිලදී ගැනීම සඳහා රු.මි. 5.94 මුදල අදාළ වැය විෂයට මාරුකර ගන්නා ලදී.	2022 දෙසැම්බර් අවසන් වන විට වියදම් වී ඇති සමුච්ච මුදල රු.මි. 225.40 කි. 2022 වර්ෂයේ දෙසැම්බර් අවසන් වන විට වියදම් කල මුදල රු.මි. 5.94 වේ.

6.3. භෞතික ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරා ගත යුතු ඉලක්ක	අත් කරගත් භෞතික ප්‍රගතිය
1.කාර්ය සාධන බැඳුම්කර ලබා ගැනීම සහ ජාතික තරඟකාරී ලංසු පටිපාටිය යටතේ සපයනු ලබන සැපයුම්කරුවන් සමඟ ටෙන්ඩර් ගිවිසුම (Obtaining performance bond and the Agreement with Tender offered suppliers under National competitive Bidding Procedure)	රසායනාගාර උපකරණ 17 ක් මිලදී ගැනීම	ඉල්ලුම් කරන ලද රසායනාගාර උපකරණ මිලදී ගෙන ස්ථාපිත කිරීම (උපකරණ - 17)
2. රසායනාගාර උපකරණ සැපයීම ස්ථාපනය කිරීම සහ කොමිස් කිරීම (Supply Instaliation & Commisioning of Laboratory equipments)		

7. බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම

7.1. හැඳින්වීම

මිල්කෝ සමාගමට අයත් කොළඹ නාරාහේන්පිට පිහිටි කිරි සැකසුම් කර්මාන්තශාලාව, බඩල්ගම පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් සිරිංගපාත ගොවිපොළෙහි ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ඩෙන්මාර්ක් රජයේ සහයෝගීතාව මත ක්‍රියාත්මක වන අතර එහි පළමු අදියර යටතේ කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා 2016.05.18 දින මුල්ගල තැබීම සිදු කරන ලදී. සමාලෝචිත කාල සීමාව අවසන් වනවිට සමස්ත භෞතික ප්‍රගතිය සියයට 97 ක් වන අතර එක් එක් කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

කාර්යය	භෞතික ප්‍රගතිය (%)	ආයෝජනය
කිරි කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු	99	
පරිපාලන හා කාර්යාල ගොඩනැගිල්ල	99	
ආපන ශාලා ගොඩනැගිල්ල, සේවක පහසුකම් ඇතිකිරීම	99	
කාර්යමණ්ඩල නිල නිවාස සහ ආරක්ෂක කුටි ඉදිකිරීම	99	
විදුලි ජනන ඒකකය ස්ථාපිත කිරීම	100	
යාන්ත්‍රික සහ විදුලි ආශ්‍රිත සවිකිරීම් කටයුතු	96	
යන්ත්‍රෝපකරණ කොටස් සහ ඉදිකිරීම් ද්‍රව්‍ය බහාලුම් 55 ක් ආනයනය කිරීම		යුරෝ මිලියන 69.41
ආනයනික යන්ත්‍රෝපකරණ සඳහා දේශීය අරමුදලින් බදු ගෙවීම		රු.මි. 3.41

ඡායාරූපය අංක 14,15 සහ 16 - පිටු අංක 76

8. කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම

8.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය නහාසිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ අගය එකතු කරන ලද කිරි නිෂ්පාදන අදාළ ප්‍රදේශවලම නිෂ්පාදනය කර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම මගින් ප්‍රජාවේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමය. මේ යටතේ තෝරාගත් ප්‍රදේශවල කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 ක් ස්ථාපනය කර සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන අතර, මේ සඳහා අපේක්ෂිත ආයෝජනය යුරෝ මිලියන 13.90 කි.

ව්‍යාපෘතියට අදාළ සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුම 2019.02.27 දින අත්සන් තබා ඇත. ඒ අනුව, තෝරාගත් ප්‍රතිලාභී කිරි සමිති 06ක දෛනික නිෂ්පාදන ධාරිතාවය ලීටර් 5,000 ක් බැගින් වන කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 ක් ස්ථාපනය කෙරේ. මේ වන විට වාරියපොළ කුඩා පරිමාණ කිරි පට්ටි සංවර්ධන පදනම සහ අත්තනගල්ල කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය යන ප්‍රතිලාභී ආයතනයන්ට අයත් කර්මාන්තශාලාවන්හි පූර්ව පරීක්ෂා කිරීම් කටයුතු (Commissioning) ආරම්භ කොට ඇති අතර 2023 වර්ෂයේ මුල් කාර්තුව තුළදී මෙම කර්මාන්තශාලාවෙහි නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිත ය. මෙම ව්‍යාපෘතියෙහි කාර්යයන් 2023 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට නියමිත අතර, මේ වන විට අත්කරගෙන ඇති භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

කිරි සැකසුම් මධ්‍යස්ථානය		භෞතික ප්‍රගතිය (%)	විශේෂ කරුණු
01.	කුඩා පරිමාණ කිරි පට්ටි සංවර්ධන පදනම, වාරියපොළ	98	පූර්ව පරීක්ෂා කිරීම් කටයුතු ආරම්භ කොට ඇත
02.	අත්තනගල්ල කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය	98	
03.	සී/ස දිස්ත්‍රික් කිරි සැපයුම්කරුවන්ගේ සමූපකාර සමිතිය, පොළොන්නරුව	97	යන්ත්‍රෝපකරණ සවිකිරීම් කටයුතු සම්පූර්ණ කර ඇත
04.	සක්සීඩ් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම, වෙන්නප්පුව	95	
05.	සී/ස නාවලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය	95	
06.	හෙරිටේජ් හෙළ ගොවි සංවර්ධන සමිතිය, බණ්ඩාරගම	50	යන්ත්‍රෝපකරණ සවි කිරීම් මේ වන විට ආරම්භ කර ඇත
ව්‍යාපෘතියට අදාළ යන්ත්‍රෝපකරණ ආනයනය වෙනුවෙන් සමුච්ඡිත වියදම			රු. මි. 2,627.85

ඡායාරූපය අංක 17,18, 19, 20, 21 සහ 22 - පිටු අංක 77

කෘෂිකර්ම අංශය යටතේ ඇති ආයතන හා එහි ප්‍රගතිය

1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA)

1.1. දැක්ම

ජාතික සෞභාග්‍ය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම.

1.2. මෙහෙවර සහ අරමුණු

නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාළ සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශවකරුවන් වෙත ලබාදීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්පත්කර ගැනීම.

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වන්නේ ආහාර බෝග වගාවේ නිෂ්පාදන විභවයන් වැඩිදියුණු කිරීම, තිරසාර ගොවිතැන සුරක්ෂිත කරලීම, ශ්‍රම සහ ඉඩම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, කෘෂිකර්මාන්තයේ නියැලි සියළු පාර්ශව බලගැන්වීම, කෘෂිකර්මාන්තය තුළ මානව සම්පතෙහි ශක්‍යතාවය වර්ධනය කිරීම, පාර්ශවකරුවන් සඳහා ගුණාත්මක තත්ත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍යවල සුලභතාවය සහතික කරලීම, ඉඩම් සහ ජල සම්පත ප්‍රශස්ත මට්ටමෙන් භාවිත කිරීම, සැලසුම්, ප්‍රතිපත්ති තීරණ සහ ප්‍රතිපත්ති මඟපෙන්වීම් සැපයීම, බීජ සහ රෝපණ ද්‍රව්‍ය මෙන්ම කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිතීන් සුරක්ෂිත කරලීම, හානිකර විදේශීය විශේෂවලින් දේශීය ශාක විශේෂ ආරක්ෂා කිරීමට කටයුතු කිරීම, කෘෂි නිෂ්පාදන තුළින් විදේශ විනිමය වැඩිකිරීම සඳහා නීරෝගී ශාක සහ ශාක නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැපයීම, පළිබෝධනාශකවල අයහපත් බලපෑම්වලින් මහජනයා සහ පරිසරය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම හා පැළෑටි ජාන සම්පත් තිරසාර ලෙස භාවිතයට ගැනීම පිළිබඳ සහතික වීම ආදියයි.

එසේම, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ලෙස පර්යේෂණ මඟින් උචිත නව ප්‍රභේද හා කෘෂි තාක්ෂණයන් ජනනය කිරීම, නව දියුණු කෘෂි තාක්ෂණය ගොවි ප්‍රජාව අතර ව්‍යාප්ත කිරීම, උසස් ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම, පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය කිරීම, බීජ පනත, පැළෑටි සංරක්ෂණ පනත, පළිබෝධ නාශක පාලන පනත සහ පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම , කෘෂිකාර්මික අධ්‍යාපනය තුලින් කෘෂිකර්මය පිළිබඳ ජාතික වෘත්තීය පුහුණු (NVQ) 5 හා 6 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා පවත්වා ගෙන යාම, ගොවීන් සහ නිලධාරීන්ගේ හැකියා වර්ධනයට අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදිය හඳුනාගෙන ඇත.

1.3. මූල්‍ය ප්‍රගතිය

- 2022 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලද ප්‍රතිපාදන සහ 2022 දෙසැම්බර් 31 දක්වා වියදම්

ව්‍යාපෘතිය	පුනරාවර්තන		මූලධන	
	ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි.)	ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි.)
1. පරිපාලන හා ආයතනික සේවා	563.30	530.52	61.50	28.68
2. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන	1,850.00	1,757.59	300.00	238.02
3. ව්‍යාප්ති හා පුහුණු	1,539.50	1,475.33	358.50	197.38

ව්‍යාපෘතිය	පුනරාවර්තන		මූලධන	
	ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි.)	ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි.)
4. බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ	1,415.00	1,373.30	900.00	801.11
එකතුව	**5,367.80**	**5,136.75**	**1,620.00**	**1,265.18**

1.4. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ සාරාංශය

i.) කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධනය

- 2022 වර්ෂයේදී නව වී ප්‍රභේද 4ක්, එළවළු ප්‍රභේද 9ක්, බිම්මල් ප්‍රභේදයක් හා මඤ්ඤොක්කා ප්‍රභේදයක් හඳුන්වා දී ඇත. ඉන් එළවළු ප්‍රභේද 6ක් දෙමුහුම් ප්‍රභේද (Hybrid) වේ.
- වී වගාවේ දුඹුරු පැල කීඩැවාගේ හානිය පාලනය සඳහා පෙව පාලන කාරකයක් හඳුනා ගන්නා ලදී.
- බඩ ඉරිහුවල ජානමය පාරිශුද්ධතාවය ක්ෂණිකව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී (Developing SSR Markers).
- මුං හා කව්පි වගාවන්ගේ වර්ධනය හා අස්වනු වැඩිකිරීම සඳහා නව වසුන් ක්‍රම හඳුන්වා දෙන ලදී.
- කුඩා බීජ සඳහා නව බීජ ආස්තරණ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.
- රටකජු බීජවල සුප්තතාවය කෙටිකලකින් ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.
- එළවළු වගාවේ කුඩිත්තන් මර්ධනය සඳහා කුඩිත්තාගේ පරපෝෂිතයකු 'කුඩිති මරුවා' ලෙස කාඩ් පත් ආකාරයෙන් ගොවි ක්ෂේත්‍ර වෙත ලබා දීම මඟින් අධික කෘමිනාශක භාවිතය වළක්වා ගැනීමට හැකිවී ඇත.
- බඩ ඉරිහු වගාවේ සේනා දළඹුවා, එළවළු හා වෙනත් වගාවල දළඹු හානිය පෙව විද්‍යාත්මක පාලනය සඳහා පරපෝෂිතයින් ගුණනය කොට මහනුවර, හම්බන්තොට, බදුල්ල, කුරුණෑගල හා අනුරාධපුර යන දිස්ත්‍රික්කවල ගොවි ක්ෂේත්‍ර වලට නිදහස් කර ඇත.
- එළවළු බෝගයන්හි කෘමිනාශක අවශිෂ්ඨ පරීක්ෂා කිරීම සඳහා එන්සයිම උපයෝගී කර සිදු කරන තාක්ෂණය (Rapid Bioassay Technology) හඳුන්වා දෙන ලදී.
- අඹ පසු අස්වනු රෝග (දිලීර රෝග) මර්දනය සඳහා ලැක්ටික් ඇසිඩ් පැසවීමෙන් නිපදවන ස්වභාවික අතුරු නිෂ්පාදන යොදාගැනීමේ තාක්ෂණය හඳුන්වා දෙන ලදී.
- වඩාත් සාර්ථකව කොස් බද්ධ කිරීමේ නව ක්‍රමවේදයක් හා පටක රෝපිත ක්‍රමයෙන් දෙල්පැල නිෂ්පාදනය කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගන්නා ලදී.
- ක්ෂේත්‍රවල පවතින වෙල් අනෝදා ශාක මූල ග්‍රාහකයන් ලෙස භාවිතා කිරීමෙන් කටු අනෝදා සාර්ථකව බද්ධ කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.
- කාබනික අන්නාසි නිෂ්පාදනය සඳහා පාංශු පෝෂක කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.
- රසායනාගාර තත්ව යටතේදී 5% $CaCl_2$ යෙදීම මගින් අනෝදා වගාවේ ඇන්ත්‍රැක්නොස් රෝගය සාර්ථකව පාලනය කළ හැකි බව හා රසායනාගාර තත්ව යටතේදී කුරුඳු කොළ, කරාබු නැටි නිස්සාරකය යෙදීම මගින් පැනමා රෝගයේ රෝග කාරකයා වන *Fusarium oxysporum* මර්ධනය වන බව හඳුනා ගන්නා ලදී.
- දෙළුම් වගාවේ පල කුණු වීම සාදන දිලීර රෝගකාරකයන් සහ ට්‍රයිකොඩෝමා දිලීරය ගුණනය කිරීමේ ක්‍රමවේදයක් හඳුනා ගන්නා ලදී.

- පේර තවාන් බඳුන් වල වටපණු භානිය, ප්ලූවොෆයිරාම් වටපණු නාශකය මිලි ලීටර් 1ක් යෙදීමෙන් සාර්ථකව පාලනය කල හැකි බව හඳුනා ගන්නා ලදී.
- අධිඝනත්ව අන්නාසි පැල සිටුවීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන ඇත. (60x20cm)
- කොස් මදුළු පිටි 30% හා තිරිඟු පිටි 70% යොදා ගනිමින් නූඩිල්ස් නිපදවීමේ හැකියාවක් ඇති බව හඳුනා ගන්නා ලදී.
- සැලිසිලික් අම්ලය (400 ppm) ශාකයේ පත්‍ර වලට ඉසීමෙන් අනෝදා වල මල් උත්තේජනය සාර්ථකව සිදු කර ගත හැකි බව හඳුනා ගන්නා ලදී.
- අනෝදා ඵලයේ ඉතා දිගු වූ සුප්ත කාලය කෙටි කර ගැනීම සඳහා නැප්තලීන් ඇසිටික් ඇසිඩ් (5000ppm) ඉසීම කළ හැකි බව හඳුනා ගන්නා ලදී.
- කොත්මලේ කොස් වර්ගයේ මදුළු වල පිටි හා උළු පිටි වර්ගයේ දෙල් පිටි අගය එකතු කිරීමේ නිෂ්පාදන සඳහා සාර්ථකව යොදා ගැනීමට හැකි බව හඳුනා ගන්නා ලදී.
- කැවෙන්ඩිෂ් කෙසෙල් අපනයනය සඳහා තාක්ෂණය ලබාදෙන ලදී.
- 2022 වර්ෂයේ "පාංශු හා ජල සංරක්ෂණ තාක්ෂණික සංග්‍රහය" ප්‍රකාශයට පත් කරන ලදී.
- ජාතික කෘෂි කාලගුණ දත්ත නිරීක්ෂණ ජාලය සාර්ථකව පවත්වාගෙන යන ලද අතර නව කෘෂි කාලගුණ ඒකකයක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය ආශ්‍රිතව ස්ථාපනය කරන ලදී.
- මොරගහකන්ද නව විශේෂිත කාබනික කලාපය (හෙක්. 3410) සඳහා පාංශු විශ්ලේෂණ පදනම් භූමි යෝග්‍යතාවය ඇගයීම සිදුකරන ලද අතර සිතියම්කරණය සහ කලාපයට උචිත බෝග නිර්දේශ වාර්තා සැකසීම සිදුකරන ලදී.
- අඹ, දෙළුම්, රඹුටන්, මැංගුස්ටීන්, දුරියන් සහ කෙසෙල් යන පළතුරු සඳහා ශ්‍රී ලංකාවේ පවතින විභවය සිතියම්ගත කරන ලදී.
- පාංශු සංරක්ෂණ පනත මගින් ආවරණය වන සංවේදී කලාප තුල සිදු කෙරෙන සංවර්ධන කාර්යයන් සඳහා පාංශු සංරක්ෂණ සැලසුම්, වැසි ජල අපහරණය සැලසුම් සකස් කිරීම, ඉඩම් සංවර්ධන සිතියම් සකස් කිරීම, ඉංජිනේරුමය සිතියම් සැකසීම සහ කෘෂි උපදේශන කලාප වෙන්කිරීම සඳහා සිතියම් සැකසීම සිදුකරන ලදී.
- එළවළු පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය (Vegetable early warning system) හඳුන්වා දීම මඟින් වගාව සඳහා එළවළු තෝරා ගැනීමට ගොවි ජනතාවට සේවා සැපයීමට හැකි විය.
- අස්වැන්න නෙළීමට පෙර ආහාර බෝග නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම මඟින් බෝග නිෂ්පාදනය පුරෝකථනය (Forecasting crop production) කිරීමට හැකි විය.
- බෝග පුරෝකථන ප්‍රකාශන 10ක් නිකුත් කරන ලදී.
- ආහාර භෝගවල වගා කිරීමේ පිරිවැය (Cost of cultivation) ප්‍රකාශයට පත් කරන ලද අතර කන්න මත පදනම්ව බෝග නිෂ්පාදන පිරිවැය (Cost of production) සහ ආහාර බෝග වගාවේ ආදායම් (Food crop income) ගණනය කරන ලදී.

ii.) බීජ නිෂ්පාදනය හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම

- 2022 වසරේ ජාතික සහතික බීජ වී අවශ්‍යතාවය බුසල් මිලියන 6.5 කි. එම බීජ ප්‍රමාණය නිපදවා ගැනීම සඳහා ලියාපදිංචි බීජ වී බුසල් 162,500 අවශ්‍ය වේ. 2022 වසරේ පැවැති විවිධ බාධක මධ්‍යයේ වුවද රජයේ බීජ නිෂ්පාදන ගොවිපලවල්වල නිපදවන ලද ලියාපදිංචි බිත්තර වී බුසල් 142,500ක් එම වසර තුළ නිකුත් කිරීමට හැකි වූ අතර එම ප්‍රමාණය සහතික වී බුසල් මිලියන 5.7ක් නිපදවීමට ප්‍රමාණවත් වේ. එය ජාතික බීජ අවශ්‍යතාවයෙන් 88% කි. කෙසේ වෙතත් මෙලෙස නිකුත් කරන ලද ලියාපදිංචි බීජ වී වලින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ වැඩසටහන යටතේ බුසල් මිලියන 1.25ක් පමණ නිපදවීම සඳහා ඇතුළත්ව තිබිණි. ඉතිරි බීජ ප්‍රමාණය ගුණාත්මක ස්වයං සහතික කිරීමේ සහ ස්වයං බීජ නිපදවීමේ වැඩසටහන් යටතේ

බීජ නිපදවීමට යොදා ගන්නට හැකි වූ බැවින් එම වසර තුළ බීජ හිගයකින් තොරව ගොවීන්ගේ බීජ වී අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකිවිය.

- ගොවි ජනතාව අතර සහතික බීජ සුලභ කිරීමේ අරමුණින් රු.මි. 650ක වටිනාකමකින් යුත් කොන්ත්‍රාත් බීජ වැඩසටහන් සාර්ථකව නිම කිරීමට හැකි විය. විශේෂයෙන්ම මෙම වැඩසටහන යටතේ මුං, රටකජු, සෝයා, මිරිස්, කව්පි, උඳු, තල සහ කුරක්කන් යන අතිරේක ආහාර බෝග කාණ්ඩයේ බීජ දළ වශයෙන් මෙ.ටො. 650ක් පමණ නිපදවීමට හැකි වූ අතර බොහෝ බෝග වල එය රටේ අවශ්‍යතාවයෙන් 25% ඉක්ම වූ අගයක් ගනී.
- දෙමුහුම් බඩඉරිහු මෙ.ටො. 20ක් නිෂ්පාදනය කරන ලද අතර මේ වන විටත් මෙ.ටො. 12ක ප්‍රමාණයක් ගොවි ජනතාව අතර ප්‍රචලිත කරන ලදී.
- 2022 වර්ෂය තුළදී බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවිය මගින් (බීජ වී, එළවළු බීජ, අතිරේක ආහාර බෝග බීජ, අර්තාපල් බීජ සහ පළතුරු පැළ) රු. බි. 1.65ක ආදායමක් ලබාගන්නා ලදී.
- සෞභාග්‍යා හරිත දැයක් ගෙවතු වගා වැඩසටහන සඳහා ගෙවතු ඇසුරුම් ලක්ෂ 10ක් සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, පළාත් පාලන ආයතන හා පෞද්ගලික ආයතන සඳහා ලක්ෂ 5 ක ගෙවතු ඇසුරුම් ප්‍රමාණයක් ලබා දෙන ලදී.
- නව ආරක්ෂිත ගෘහ ඉදිකිරීම මඟින් මෙරටට ආනයනය කරන එළවළු බීජ ප්‍රමාණයන් අඩුකරලීම සඳහා දේශීය දෙමුහුම් එළවළු බීජ නිෂ්පාදනය ඉහළ නංවන ලදී.
- තෝරාගත් බීජ ගොවිපලවල්වල (අලුත්තරම, පොළොන්නරුව, කරදියන්ආරු හා බටඅත) බීජ සැකසීම හා වියලීම කාර්යක්ෂම කිරීමට හැකි විය.
- කොළඹ වරාය පිවිසුම්පොළ නිරෝධායන කටයුතු වඩාත් පුළුල් අන්දමින් ඉටු කිරීම සඳහා කොරියානු ආධාර යටතේ තුන්මහල් නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට 2022.07.19 දින මුල්ගල තබා ඉදිකිරීම් කටයුතු කරගෙන යන ලදී.
- කොළඹ අන්තර්ජාතික ගුවන්තොටුපළෙහි (රත්මලාන) ශාක නිරෝධායන ඒකකයක් පිහිටුවන ලදී.
- ශාක හා ශාකමය ද්‍රව්‍ය තැපැල් මගින් හුවමාරු වීමේදී ඇති විය හැකි පළිබෝධ අවදානම අවම කිරීම සඳහා කොළඹ මධ්‍යම තැපැල් හුවමාරුවෙහි ශාක නිරෝධායන ඒකකයක් පිහිටු වීමට පහසුකම් සැලසීමට අමතරව යාපනය, ගාල්ල, ත්‍රිකුණාමලය හා නුවර තැපැල් කාර්යාලවලද ශාක නිරෝධායන ඒකක පිහිටුවීම සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත.
- යුරෝපා සංගමයේ රටවල් 27 සඳහා නිරෝධායන ව්‍යාධි ජනකයෙකු වන *Xylella fastidiosa* හි ධාරක ශාක අපනයනය සඳහා පනවා තිබූ සම්බාධක ඉවත් කරවා ගැනීම සඳහා කටයුතු සිදුකරන ලදී.
- ඉලෙක්ට්‍රොනික ශාක ස්වස්ථතා සහතිකය මඟින් ආනයන අපනයන කටයුතු රටවල් 12ක් සමඟ සාර්ථකව සිදු කිරීම සහ යුරෝපා සංගමයේ රටවල් 27 සමඟ සිදු කළ අත්හදා බැලීම සාර්ථකව නිමකර ක්‍රියාත්මක කිරීමට සියලු කටයුතු සුදානම් කර අනුමැතියට යොමු කර ඇත.
- වී, අතිරේක ආහාර බෝග, එළවළු හා පලතුරු, ප්‍රභේද 101 ක අභිජනන බීජ මෙට්‍රික් ටොන් 10.17 සහතික කරන ලදී, අනෙකුත් පරම්පරාවල සහතික බිත්තර වී මෙට්‍රික් ටොන් 6500ක්, අතිරේක ආහාර බෝග මෙට්‍රික් ටොන් 666 හා එළවළු බීජ මෙට්‍රික් ටොන් 32 ක් හා අර්තාපල් මෙට්‍රික් ටොන් 589 ක් සහතික කර ඇති අතර ක්ෂුද්‍ර බීජ අර්තාපල් (minitubers) මෙට්‍රික් ටොන් 20 ක් සහතික කරන ලදී.
- බහුවාර්ෂික පලතුරු පැළ සහතික කිරීම යටතේ පැල 684,185 ක් සහතික කරන ලදී.
- බීජ සහතික කිරීම යටතේ බීජ පරීක්ෂණ නියැදි 11,325 ක් හා බීජ ස්වස්ථතා පරීක්ෂණ 886 ක්, පශ්චාත් පාලන පරීක්ෂණ නියැදි 1229 ක් පරීක්ෂා කරන ලදි.
- බීජ පනත යටතේ බීජ හසුරුවන්නන් 1,266 ක් ලියාපදිංචි කර ඇති අතර ලියාපදිංචිය අලුත් කිරීම් 1,227 ක් සහ පරිශ්‍රී බීජ 1,469 ක් පරීක්ෂා කරන ලදී.

- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) යටතේ නව ගොවිපල් 710 ක් සහතික කරන ලද අතර ගොවිපල විගණන 808 ක් සිදුකරන ලදී.
- පැළැටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ සංරක්ෂණය කළ හොඩරවාලු සම්ප්‍රදායික වී ප්‍රභේදයේ අනුක්‍රමික රූපිය ලක්ෂණ අනුව සහ අනුක දර්ශීය ලක්ෂණ භාවිතයෙන් ලාක්ෂණීකරණය කර වඩාත් සමාන ලක්ෂණ අනුව කාණ්ඩ කිරීම පිළිබඳ පර්යේෂණ නිම කරන ලදී.
- පළිබෝධ අවේක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර අදාළ දත්ත සපයා ගැනීම සිදුකරන ලදී.

iii.) කෘෂිකර්ම ව්‍යාප්තිය සහ සන්නිවේදනය

- 2022 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය සහ පොහොර පිළිබඳ වූ ප්‍රතිපත්තිමය තීරණ හමුවේ වුවද ක්ෂේත්‍ර මට්ටමේ මහ පෙන්වීම හා තාක්ෂණික දැනුම ලබාදීම මඟින් වී වගාව හෙක්. 1,300,798 සිදු කර වී මෙ.ටො. 3,564,000ක් නිෂ්පාදනය කර ඇත. මෙය ජාතික අවශ්‍යතාවයෙන් 83.3% ක් පමණ වේ.
- 2022 වර්ෂයේ පැවති ආර්ථික අර්බුධයෙන් ගොවීන්ගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමටත්, බඩඉරිඟු නිෂ්පාදනය ඉහළ නංවා කුකුළ් මස් සහ බිත්තර නිෂ්පාදන පිරිවැය අවම කිරීමටත් JICA ආයතනයේ හා තායිලන්ත තානාපති කාර්යාලයේ ආධාර යටතේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ සෘජු මැදිහත්වීමෙන් බඩඉරිඟු හෙක්. 67,000 ක් වගා කිරීමට හැකි වූ අතර එමඟින් මෙ.ටො. 220,000 ක් ලබා දීමට හැකියාව ලැබී ඇත. මෙහිදී ගොවීන් 34,000 කට බඩඉරිඟු අක්කර 34,000ක් වගා කිරීමට අවශ්‍ය බීජ නොමිලේ බෙදා දෙන ලදී.
- පැවති විදේශ විනිමය හිඟතාවය යටතේ අභියෝගයක්ව පැවති බීජ ආනයනයට විසඳුමක් ලෙස 2022 යල කන්නයේ බීජ නිෂ්පාදන වැඩසටහනක් ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කළ අතර, එමඟින් දේශීය MI Maize HY 05 දෙමුහුම් බඩඉරිඟු බීජ මෙ.ටො. 35 ක් නිෂ්පාදනය කිරීමට හැකිවිය. එම බීජ මඟින් ගොවීන්ට අත්හදා බැලීම සඳහා අක්කර 01 ආදර්ශන 1,700 ක් පිහිටුවීමට හැකිවිය. එසේම දේශීය විවෘත පරාගිත බඩඉරිඟු ප්‍රභේද කිරි කරල් සඳහා ගොවීන් අතර ප්‍රචලිත කිරීමට අක්කර 01 ආදර්ශන 1,300 ක් පිහිටුවන ලදී.
- බඩඉරිඟු වගාව යාන්ත්‍රීකරණය කර ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මඟින් ලේසර් තාක්ෂණයෙන් මට්ටම් ගැනීමේ යන්ත්‍ර 04 ක් මිලදී ගෙන අනුරාධපුර, අම්පාර, හසලක සහ මොනරාගල යන ප්‍රදේශවල ආදර්ශන 40ක් පිහිටුවා අදාළ තාක්ෂණය ගොවීන් වෙත ලබාදෙන ලදී.
- බඩඉරිඟු නිෂ්පාදනයේදී 2022/23 මහ කන්නයේ වසංගතයක් ලෙස පැමිණි සේනා දළඹු හානිය ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ මැදිහත්වීමෙන් ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම ගොවීන් අතර ප්‍රචලිත කිරීමෙන් එම හානිය 3% කට අඩු මට්ටමක පවත්වා ගැනීමට හැකි විය.
- 2022 යල කන්නයේ මිරිස් හෙක්. 4,958 ක් වගා කිරීමට හැකි වූ අතර එමඟින් අමු මිරිස් මෙ.ටො. 49,578ක් නිෂ්පාදනය කිරීමට හැකි විය. මෙහිදී දේශීය දෙමුහුම් MI CH 01 ප්‍රභේදය වගා කිරීම ඇතුළු අනෙකුත් තාක්ෂණික කට්ටලයන් ගොවීන් අතරට ගෙන යාමට හැකිවීමෙන් ඒකක අස්වැන්න හෙක්ටයාරටය මෙ.ටො. 10 ක් දක්වා ඉහළ නැංවීමට හැකි විය.
- පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය, ආර්ථික අවපාතය හා පොහොර හිඟතාවය මත 2022 වර්ෂයේ ජාතික අවශ්‍යතාවය සැපිරීම සඳහා අවශ්‍ය වන අනෙකුත් අතිරේක ආහාර බෝගවල යල සහ මහ කන්නවල වගා වපසරිය; මිරිස් හෙක්. 8,824 කුත්, ලොකුළූණු හෙක්. 2,365 කුත්, රතුළූණු හෙක්. 2,995 කුත්, සෝයා බෝංචි හෙක්. 6,046 කුත්, මුං හෙක්, 10,577 කුත්, කවුපි හෙක්. 9,206 කුත්, තල හෙක්. 10,547 කුත්, හා රටකජු හෙක්, 15,906 කුත් අර්තාපල් හෙක්. 2,388 කුත් ලෙස පවත්වා ගැනීමටත් එම වගාව නිසි පරිදි නඩත්තු කිරීමට අවශ්‍ය තාක්ෂණය ලබා දෙන ලදී.

- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ගොවීන් අතර ප්‍රචලිත කිරීමට මෙන්ම ගුණාත්මයෙන් ඉහළ සෞඛ්‍යාරක්ෂිත එළවළු හා පළතුරු ඇතුළු කෘෂිකාර්මික නිෂ්පාදන වෙළඳපොළට නිකුත් කිරීම සඳහා GAP සහතිකය ලබාගත් ගෙවිපලවල් 710ක් ලියාපදිංචි කිරීමට හැකි විය. එසේම සෞඛ්‍ය ආරක්ෂිත සහල් නිෂ්පාදනය සඳහා අක්කර 400 ක GAP සහතික කරන ලද වී ගොවිපල් ලියාපදිංචි කරන ලදී.
- කෘෂි තාක්ෂණය තාරුණ්‍ය වෙත ගෙන යාම සඳහාත් නව කෘෂි ව්‍යවසායකයින් ඇති කිරීම සඳහාත් 2022 වර්ෂයේ කෘෂිකර්ම විද්‍යාල තුළින් NVQ 05 ජාතික ඩිප්ලෝමාධාරීන් 203 ක්ද, NVQ 06 උසස් ජාතික ඩිප්ලෝමාධාරීන් 351ක්ද බිහි කරන ලදී.
- මධ්‍යම හා ඌව පළාත් ආවරණය කරමින් රජයේ පාසල් 400 ක ව්‍යවසායකත්ව පාසල් උද්‍යාන වැඩසටහන් 400ක් පවත්වන ලදී.
- සබරගමුව පළාත තුළ තරුණ ගොවි කණ්ඩායම් කණ්ඩායම් 50 ක සහභාගීත්වයෙන් ගොවි පැන විසඳුම් තරඟ පවත්වන ලදි.
- කෘෂි තාක්ෂණය හා පෝෂ්‍යදායී ආහාර පාරිභෝගිකයන් වෙත ලබා දීමට අළුවිහාරය හා තෙළුල්ල ප්‍රදේශ ආවරණය කරමින් හෙළ බොජුන් හල් පිහිටුවා ඇත.
- 2022 අප්‍රේල් 26 දින පවත්වන ලද ජාතික ඵලදායිතා සම්මාන උළෙලේදී බටඅත කෘෂි තාක්ෂණ උද්‍යානය සඳහා ප්‍රශංසනීය සහතිකයක් ලබා ගැනීමට හැකි විය.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය සඳහා Best web. lk domain වෙබ් අඩවිය විසින් පවත්වන ලද 2022 හොඳම වෙබ් අඩවිය තේරීමේ තරඟයේ කුසලතා සහතිකයක් ලබා ගැනීමට හැකි විය.
- ගුවන් විදුලි ගොවි සේවාව කොළඹ ඒකකය සඳහා 2022 අප්‍රේල් 26 පවත්වන ලද ජාතික ඵලදායිතා සම්මානය උළෙලේදී ප්‍රශංසනීය සහතිකයක් ලබා ගැනීමට හැකි විය.
- ගොවි ප්‍රජාව හා අදාළ වෙනත් පාර්ශ්වකරුවන් වෙත නව කෘෂිකාර්මික තාක්ෂණය බෙදා හැරීම සඳහා රූපවාහිනී වැඩසටහන් 225ක් ද, කෙටි විඩියෝ පණිවුඩ 13ක් ද වසර තුළදී විකාශය කරන ලද අතර යූ ටියුබ් කෙටි විඩියෝ පට 281ක් අන්තර්ජාලයට ඇතුළත් කරන ලදී. ගුවන් විදුලි වැඩසටහන් 2,509ක් සහ කෙටි පණිවුඩ 756ක් වසර තුළ දී විකාශය කෙරිණි.
- කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් නව පොත් පිටපත් 259,394ක් ද පත්‍රිකා පිටපත් 78,000ක් ද පෝස්ටර් පිටපත් 1,280ක් ද නිමකර බෙදා හරින ලදී.
- ගන්නෝරුව හා බටඅත කෘෂි උද්‍යාන නැරඹූ පිරිස මගින් ලද ආදායම රුපියල් මිලියන 7.24ක් වූ අතර කෘෂිකාර්මික ප්‍රකාශන අලෙවියෙන් ඉපැයූ ආදායම රුපියල් 389,989 කි.

සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

2. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (AAIB)

2.1. දැක්ම

දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා වීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීම.

2.2. මෙහෙවර

කෘෂි අවදානම් කළමනාකරණය සහ ආර්ථික හා සමාජමය වශයෙන් තෘප්තිමත් ගොවි හා ධීවර ප්‍රජාවක් ගොඩනැගීම සඳහා දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පිළිගත හැකි විශිෂ්ට කෘෂිකාර්මික රක්ෂණ හා සමාජ ආරක්ෂණ සේවාවක් සැපයීම.

2.3. අරමුණු

කෘෂිකාර්මික වගාවන්ට අදාළ අවදානම් කළමණාකරණය, ගොවීන් සතු අනෙකුත් නිශ්චල හා චංචල දේපල සඳහා වන අවදානම් කළමණාකරණය, ගොවීන් සතු පශු සම්පත්වලට අදාළ අවදානම් කළමණාකරණය, සමාජ ආරක්ෂණ, හා ජීවිත රක්ෂණ ක්‍රමවේද තුළින් ගොවි හා ධීවර ප්‍රජාව සුරක්ෂිත කිරීම, ආයතනයට අදාළ වන දේශීය හා ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාගැනීම සංවර්ධන, මෙහෙයුම් හා අලෙවි ප්‍රවර්ධනය, දිස්ත්‍රික් පරිපාලනය, කළමනාකරණය හා බාහිර ආයතන සම්බන්ධීකරණය, ආයතනික මානව හා භෞතික සම්පත් සැලසුම්කරණය හා සංවර්ධනය ප්‍රසම්පාදන හා සැපයුම් කළමණාකරණය, පනත් ක්‍රියාත්මක කිරීමට අදාළ නෛතික සහාය ලබාදීම ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා සැලසුම්කරණය, අධීක්ෂණය හා ඇගයීම් සිදුකිරීම, විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ගොඩනැගීම හා පරිපාලන ක්‍රියාවලියේ දුර්වලතා අවම කිරීම, ලාභදායී වර්ධනයක් තුළින් තිරසාර මූල්‍ය ශක්තියක් සහතික කිරීම හා ආයතනික ක්‍රියාවලින් විධිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද හා GIS ක්‍රමවේද භාවිතය යි.

2.4. පනතට අනුව ආයතනය

හදිසි ආපදා තත්ත්වයන් හමුවේ දේශීය කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමෙහිලා රජය වෙත පැවරී ඇති වගකීම ඉටුකිරීම සඳහා 1973 අංක 27 දරණ කෘෂිකර්ම රක්ෂණ පනත මඟින් කෘෂිකාර්මික රක්ෂණය වෙනුවෙන්ම වූ එකම රාජ්‍ය රක්ෂණ ආයතනය වශයෙන් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇත. 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත මඟින් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ලෙස නැවත ස්ථාපිත කරන ලදී.

2.5. කාර්යයන්

i.) කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට බෝග, පශු, හා සාමාන්‍ය රක්ෂණ යන අංශ යටතේ කෘෂි රක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම මඟින් කෘෂිකාර්මික අවදානම් කළමනාකරණ සඳහා දායක වීම, හදිසි ආපදාවකදී ගොවි ජනතාවට සිදුවන ආර්ථික බිඳවැටීම් අවමකර ගැනීම සඳහා සහය වීම හා කෘෂිකාර්මික ණය ලබාදෙන මූල්‍ය ආයතනවලට සිය මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කර ගැනීම සඳහා උපකාරී වීම සිදු කරන අතර වගා රක්ෂණ යෝජනා ක්‍රම (වී හා අනෙකුත් බෝග), පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රම, ජීවිත රක්ෂණ යෝජනා ක්‍රම, කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රමය, ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමය හා රෝද 2, රෝද 4 ට්‍රැක්ටර් සහ අනෙකුත් තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දී ඇත.

ii.) සමාජ සුභසාධනය

සමාජ ආරක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම මඟින්, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධව සිටින ගොවීන්ගේ විශ්‍රාමික දිවිය සුරක්ෂිත කිරීමට දායක වීම හා වෛද්‍යාධාර යෝජනා ක්‍රම හරහා

රෝහල් ගත වීමකදී ගොවීන් හට මුල්‍යමය සහනයක් ලබා දීම සිදු කරන අතර ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය මේ යටතේ හඳුන්වා දී ඇත.

2.6. මූල්‍ය හා භෞතික ප්‍රගතිය

- **මූල්‍ය ප්‍රගතිය - 118 වැය ශීර්ෂය - සාරාංශය (2022 දෙසැම්බර් 31 දක්වා අයවැය ප්‍රතිපාදන)**

2022.12.31 දක්වා අතුරු සම්මත ගිණුම් මත සංවර්ධන වැඩසටහන් ඇතුලත් මූල්‍ය ඉලක්කය හා ප්‍රගතිය - පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ඇතුලත් වියදම් වාර්තාවේ සාරාංශය

අ/ආ	ව්‍යාපෘතිය /වැඩසටහන	2022 වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.මි.)	2022 වර්ෂයේ වියදම් කල මුදල (රු.මි.)
පුනරාවර්තන			
01.	ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා (118-02-03-049-1509)	4220.00	4220.00
ප්‍රාග්ධන			
02.	ප්‍රාග්ධන වියදම (2201-049-03-02-118)	10.00	10.00
03.	අනිවාර්ය රක්ෂණ* (118-02-03-43-2202)	600.00	600.00

සටහන - *2020 වර්ෂය සඳහා අනිවාර්ය බෝග රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රු. මිලියන 1,950ක මුදලක් ඉල්ලුම් කර ඇත. ඒ වෙනුවෙන් 2021 වර්ෂයේදි ද රු. මිලියන 1000ක් පමණක් වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුළ ඇතුලක් කර ඇත. නමුත් 2021 වර්ෂය සඳහා වන්දි ගෙවීමට රු. මිලියන 1950ක් පමණ අවශ්‍ය වේ. ඒ අනුව අමතර ප්‍රතිපාදන වශයෙන් රු. මිලියන 2900ක් 2022 වර්ෂය සඳහා අවශ්‍ය වේ.

- **භෞතික ප්‍රගතිය**

a.) ගොවි/ධීවර විශ්‍රාම වැටුප් හා සාමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

ආර්ථික හා සමාජයීය වශයෙන් තෘප්තිමත් ගොවි හා ධීවර ප්‍රජාවක් ගොඩනැගීම යන අරමුණින් ගොවි/ධිවර විශ්‍රාම වැටුප් හා සාමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවේදය ක්‍රියාත්මක වේ. ඒ අනුව 2022 වර්ෂයේ අවසානය වන විට ධීවර හා ගොවි විශ්‍රාම වැටුප් ලාභීන් 174,982 ක් සඳහා විශ්‍රාම වැටුප් රු.මි. 4,299 ක් ගෙවා ඇත.

ඡායාරූප අංක 23 - පිටු අංක 78

b.) බෝග 6ක් සඳහා ගොවීන් හට නොමිලේ ක්‍රියාත්මක අනිවාර්ය වගා රක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම

රාජ්‍ය දායකත්වය යටතේ බෝග 6ක් සඳහා ගොවීන් හට නොමිලේ ක්‍රියාත්මක අනිවාර්ය වගා රක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම යන වැඩසටහනේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාව තුළ ප්‍රශස්ත කෘෂි අවදානම් කළමණාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමයි. ඒ අනුව, 2022 වර්ෂයේ, මුළු දිවයිනම ආවරණය වන පරිදි, 2020/21 මහ හා 2022 යල යන කන්නයන්හි වගා හානි සඳහා හා 2018 යල, 2018/19 මහ, 2019 යල, 2019/20 මහ, 2020 යල කන්නවලට අදාළ අභියාචනා සඳහා ගොවීන් 67,555ක ගේ අක්කර 98,952ක් සඳහා රු. මි. 1,578ක් වන්දි මුදලක් ලබා දෙන ලදී.

සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

3. වී අලෙවි මණ්ඩලය

3.1. දැක්ම හා මෙහෙවර

“ වී සහ සහල් මිලට ගැනීම, ගබඩා කිරීම, සැකසීම හා අලෙවි කිරීම පිළිබඳ ප්‍රමුඛ රාජ්‍ය මැදිහත්කරු වශයෙන් කටයුතු කිරීම ” ආයතනයේ දැක්ම වන අතර “නිෂ්පාදකයා හා පාරිභෝගිකයා යන දෙපාර්ශවයම තෘප්තිමත් වන අයුරින් වී සහ සහල් මිලට ගැනීමේ, ගබඩා කිරීමේ, සැකසීමේ හා අලෙවි කිරීමේ ක්‍රියාවලිය දැනුමෙන් හා කුසලතාවයෙන් පරිපූර්ණ වූ කාර්යය මණ්ඩලයක් තුළින් සාර්ථකව ඉටු කිරීම” මෙහෙවර වේ

එසේම, ආයතනයේ අරමුණු අතර වී සඳහා වෙළඳපොළෙහි ස්ථාවර ඉහළ මිලක් ලබා දීම, සහල් කෙටීම හා ගබඩා කිරීම විධිමත් කිරීම, සාධාරණ මිලකට සහල් ලබාදීම, ගබඩා ධාරිතාව වැඩි කිරීම හා ආරක්ෂිත තොගය සුරක්ෂිතව තැන්පත් කිරීමට සුදුසු ගබඩා බවට පත් කිරීම, විද්‍යාත්මකව වී ගබඩා කළ හැකි නවීන තාක්ෂණයෙන් යුත් ගබඩා ඉදි කර ගැනීම ප්‍රමුඛ වේ. එසේම කාර්යයන් අතර වී ගොවීන්ගේ අලෙවි මිල සහතික කිරීම සඳහා සහතික මිලට වී මිලදී ගැනීම, වී සහ සහල් වෙළෙඳපොළ මිල ස්ථාවරව පවත්වා ගැනීම, වී තොග හා සහල් තොග පවත්වා ගැනීම මෙන්ම ශ්‍රී ලාංකිකයන් සඳහා ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම ප්‍රධාන වේ.

3.2. මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන්කළ මුදල (රු. මී.) (අනුමත)	වියදම් කළ මුදල (රු. මී.) (සත්‍ය වශයෙන්)
ප්‍රාග්ධන	250.00	0.00*
පුනරාවර්තන	140.00	144.90
හිමිකම් දායකත්වය	2,900.00	2,929.00**

* රටේ පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් වී අලෙවි මණ්ඩලයට ප්‍රාග්ධනය යටතේ අනුමතව තිබූ රු.මී. 250.00 ක මුදල නොලැබිණි.

** හිමිකම් දායකත්වය සඳහා රු.මී.2,900.0ක මුදලක් වෙන් කර තිබුණ ද ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදනය රු.මී.2,929.0 කි. මෙම හිඟ රු.මී.29.0ක ප්‍රතිපාදනය 2022 වර්ෂයේ ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ අනුමත මුදලින් ලබා දී ඇත.

3.3. විශේෂිත ක්ෂේත්‍රය

සංවර්ධන වැඩසටහන 1	වී මිලදී ගැනීම.
වෙන්කළ මුදල :- 2021/22 මහ කන්නයේ වී මිල දී ගැනීම - - රු. මී. 21,950.00 මෙහෙයුම් වියදම් (2021/22 මහ කන්නය) - රු.මී.705.00 2022 යල කන්නයේ වී මිල දී ගැනීම - රු.මී.7,350.00 මෙහෙයුම් වියදම් (2022 යල කන්නය) - රු.මී.235.00 ලද මුදල රු.මී. 6500.00* (*අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලද ණය මුදල)	වියදම් කළ මුදල රු. මී. 6,443.10

සංවර්ධන වැඩසටහන 1	වී මිලදී ගැනීම.	
අරමුණු	නිෂ්පාදකයා හා පාරිභෝගිකයා යන දෙපර්ශවයම තෘප්තිමත් වන අයුරින් වී සහ සහල් මිලට ගැනීමේ, ගබඩා කිරීමේ, සැකසීමේ හා අලෙවි කිරීම.	
ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්පත් කර ගත් භෞතික ප්‍රගතිය
1. 2021/22 මහ කන්නයේ වී මිලදී ගැනීම.		
2. මෙහෙයුම් වියදම් දැරීම.	2021/22 මහ කන්නයේ සමස්ත වී අස්වැන්නෙන් මෙ. ටො. 300,000 ක් මිලදී ගැනීම.	2021/22 මහ කන්නයේදී නාඩු වී මෙ.ටො. 63,375.91 ක්, සම්බා වී මෙ.ටො. 7,598.57 ක් කීරි සම්බා වී මෙ.ටො. 303.60 ක් ලෙස මුලු වී මෙ. ටො. 71,278.08 ක් මිලදී ගෙන ඇත. භෞතික ප්‍රගතිය 23.75% *වී අලෙවි මණ්ඩලය විසින් වී මිලදී ගැනීම ආරම්භ කිරීමත් සමඟ බොාහොමයක් නිෂ්පාදන ප්‍රදේශයන්හි වී සඳහා පැවති පාලන මිල ඉක්මවා මිල ඉහළ යාම නිසා ඉලක්කගත වී ප්‍රමාණය මිල දී ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව වී ගොවියා සඳහා සාධාරණ මිලක් ලබා දීමේ අරමුණ ඉටු වී ඇත.
3. 2022 යල කන්නයේ වී මිලදී ගැනීම.		
4. මෙහෙයුම් වියදම් දැරීම.	2022 යල කන්නයේ සමස්ත වී අස්වැන්නෙන් මෙ.ටො. 100,000 ක් මිලදී ගැනීම.	2022 යල කන්නයේදී නාඩු වී මෙ.ටො. 4,632.09 ක්, සම්බා වී මෙ.ටො. 406.18 ක් හා කීරි සම්බා වී මෙ.ටො. 2044.34 ක් ලෙස මුලු වී මෙ.ටො. 7,082.61 ක් මිලදී ගෙන ඇත. භෞතික ප්‍රගතිය 7% *රජයේ වාණිජ බැංකු හරහා ලබා ගැනීමට අපේක්ෂිත කරන ණය මුදල ලබා ගත නොහැකි වීම නිසා වී මිල දී ගැනීම අතරමඟ නවතා දැමීමට සිදු විය.
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රදේශය (දිස්ත්‍රික්කය / ග්‍රාම නිලධාරී වසම)	අම්පාර, අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, මඩකලපුව, පුත්තලම, ත්‍රිකුණාමලය, මුලතිව්, වවුනියා, කිලිනොච්චිය, මන්නාරම, යාපනය, බදුල්ල, ගම්පහ, මාතලේ, හම්බන්තොට, මොණරාගල, රත්නපුර සහ මාතර දිස්ත්‍රික්ක වල	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව	දිවයින පුරා ගොවීන්	
ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව	07	

<table>
<tr><th>සංවර්ධන වැඩසටහන 2</th><th colspan="2">හිමිකම් දායකත්වය</th></tr>
<tr><td>වෙන්කළ මුදල රු. මි. 2,900.00

අතිරේක මුදල රු.මි. 29.00*

(*2022 වර්ෂයේ ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ අනුමත මුදලින් රු.මි. 29.0ක් ලබා දී ඇත.)</td><td colspan="2">වියදම් කළ මුදල රු. මි. 2,929.00</td></tr>
<tr><td>අරමුණු</td><td colspan="2">2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වී මිලදී ගැනීම සඳහා ලංකා බැංකුව හා මහජන බැංකුව මඟින් ලබාගත් පැරණි ඔඩපන ණය කාලීන ණයක් ලෙස වාරික වශයෙන් ගෙවීම</td></tr>
<tr><td>ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්

1. ලංකා බැංකුව වෙත වාරික ගෙවීම
2. මහජන බැංකුව වෙත වාරික ගෙවීම</td><td>සපුරාගත යුතු ඉලක්කය

වී මිලදී ගැනීම සඳහා ලබාගත් ඔඩපණ ණය පියවා ගැනීම</td><td>අත්පත් කර ගත් භෞතික ප්‍රගතිය

100%</td></tr>
<tr><td>ප්‍රතිලාභීන් සංඛ්‍යාව</td><td colspan="2">දිවයින පුරා ගොවීන්</td></tr>
</table>

4. හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI)

4.1. දැක්ම හා මෙහෙවර

තිරසාර ගොවිජන හා ග්‍රාමීය සංවර්ධනය සඳහා දැනුම ජනනය කර බෙදාහැරීමේ ප්‍රමුඛයා වීම ආයතනයේ දැක්ම වන අතර පර්යේෂණ හා පුහුණු කටයුතු ඇසුරින් ගොවිජන හා ග්‍රාමීය ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම මෙහෙවර වේ.

4.2. මූල්‍ය හා භෞතික ප්‍රගතිය

ආයතනය විසින් 95% භෞතික ප්‍රගතියක් හා 92% මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම්	අපේක්ෂිත ඉලක්කය	ළඟා කරගත් ඉලක්කය	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)		
			වෙන් වූ	ප්‍රගතිය	%
<u>පර්යේෂණ</u> 01. පොහොර සහ අනෙකුත් කෘෂි රසායන සම්බන්ධ මෑතකාලීන ප්‍රතිපත්ති විවලතා කෘෂිකාර්මික ක්ෂේත්‍රය කෙරෙහි බලපා ඇති ආකාරය.	ප්‍රතිපත්ති පත්‍රිකාව හා අවසාන කෙටුම්පත් වාර්තාව	කෙටුම්පත් වාර්තාව ප්‍රතිපත්ති පත්‍රිකාව	3.59	2.86	80
02. ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාම ගෘහ ඒකකවල ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ඇති කරන බලපෑම	අවසාන කෙටුම්පත් වාර්තාව	කෙටුම්පත් වාර්තාව ප්‍රතිපත්ති පත්‍රිකාව	2.77	2.88	103
03. ග්‍රාමීය සංවර්ධනය සඳහා තිරසාර ජීවනෝපාය මාර්ගයක් ලෙස ආදායම විවිධාංගීකරණය: ප්‍රශස්ත තත්වයන් හඳුනාගැනීම	අවසාන කෙටුම්පත් වාර්තාව	කෙටුම්පත් වාර්තාව	0.76	1.60	210
04. මානව-වනසත්ත්ව ගැටුමේ ස්වභාවය සහ ගොවිජන ප්‍රජාවන්ට එයින් සිදුවන බලපෑම හඳුනා ගැනීම: මූලික දත්ත රැස් කිරීම සහ තොරතුරු බෙදා හැරීම	අවසාන වාර්තාව	අවසාන වාර්තාව	0.42	0.49	115
05.ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික අවදානම් කණ්ඩායම්වල දේශගුණික අනුහුරුතාව සහ දේශගුණික අනුහුරු ගොවිතැන් පිළිවෙත් පිළිබඳ අධ්‍යයනය	World Vision Lanka ආධාර වැඩසටහනකි. පළමු අදියරේ දත්ත (යල කන්නයට) රැස්කිරීම 2023 වර්ෂයේද ක්‍රියාත්මකවේ		5.00	4.98	99
06. දේශගුණික කම්පනවලට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ අවදානම අවම කිරීම සඳහා ඒකාබද්ධ ඊ-ව්‍යාප්ති සේවාවන් භාවිතා කිරීම පිළිබඳ අධ්‍යයනය	FAO ආධාර වැඩසටහනකි. පාදක සමීක්ෂණය අවසන් කරන ලදි		24.00	23.78	99
07. වෙළඳපල ක්‍රියාකාරීත්ව දර්ශකය සකස් කිරීම	WFP ආධාර වැඩසටහනකි. මාසිකව දත්ත රැස්කිරීම (2023 වසර තුළ ද ක්‍රියාත්මක වේ)		7.55	3.11	41
08. කෘෂිකාර්මික ව්‍යාප්ති පද්ධතියේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය වැඩි කිරීම ජාතික කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය	FAO ආධාර වැඩසටහනකි. කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් නිලධාරීන් සඳහා TOT වැඩසටහන් ක්‍රියාත්මක කිරීම		5.50	2.59	47
<u>පුහුණු</u> **01**. ගෘහ ඒකකයන්හි ආහාර	වැඩසටහන් 30	වැඩසටහන් 30	1.48	1.87	126

සුරක්ෂිතතාවය පවත්වාගෙන යාම සඳහා අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අර්ධ නාගරික ප්‍රදේශයන්හි වෙසෙන ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන		දිස්ත්‍රික්ක 03			
02. කෘෂි ව්‍යවසායකයින් ලෙස ගොඩනැගීම සඳහා පවතින අවස්ථා සම්බන්ධයෙන් ග්‍රාමීය ගොවි කාන්තා සහ තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන	වැඩසටහන් 30	වැඩසටහන් 30 ක් පවත්වා ඇත. දිස්ත්‍රික්ක 3 සඳහා	1.52	1.57	100
<u>වෙනත්</u> **01**. සම්මන්ත්‍රණ, දේශණ,ප්‍රසිද්ධ දේශණ	-	Zoom තාක්ෂණය ඔස්සේ ප්‍රසිද්ධ දේශන 7 පවත්වන ලදි	0.34	0.26	76
02. ආයතන ප්‍රකාශන	-	ශාස්ත්‍රීය ප්‍රකාශන	2.00	0.47	23
03. මාධ්‍ය වැඩසටහන්	-	විඩියෝ වැඩසටහන් හා ඡායාරූප පුස්තකාලය	1.35	1.48	109

4.3. ළඟා කර ගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක හා ළඟා කර ගත් ප්‍රමාණය

වෙළඳපොළ තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදාහැරීමේ ව්‍යාපෘතිය යටතේ දෛනික, සතිපතා සහ මාසික තොරතුරු බෙදාහැරීම් අඛණ්ඩව සිදු වූ අතර එහි 100%ක භෞතික ප්‍රගතියක් අදාළ කාලය තුළ වාර්තා විය. සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකා 52 (සිංහල හා ඉංග්‍රීසි) මාසික තොරතුරු විවරණිකා දහයක් (ඉංග්‍රීසි) ප්‍රකාශයට පත් විය. මෙම වසර තුල අධ්‍යාපන හා පුහුණු අංශය ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රජාවන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් 30ක් පවත්වා නිම කළ අතර ඒ සඳහා පුද්ගලයින් 770 දෙනෙකු සහභාගී විය. ග්‍රාමීය ගොවි කාන්තා සහ තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන 30ක් සම්පූර්ණ කරන ලදී.

2022 වර්ෂය තුළ පර්යේෂණ වාර්තා 18 (ඉංග්‍රීසි 16 සහ සිංහල 2) ප්‍රකාශයට පත්කර ඇත. තවද කාර්ය පත්‍රිකා 10 (ඉංග්‍රීසි 9, සිංහල 1) සහ වාර ප්‍රකාශන 06 ක් (ඉංග්‍රීසි) ප්‍රකාශයට පත් කිරීමට ආයතනය සමත්විය. ආයතනයේ ශාස්ත්‍රීය ගණයට අයත් වන ගොවිකටයුතු අධ්‍යයනය කලාප එක බැගින් 2022 වසර තුළ ප්‍රකාශයට පත්විය. ගොවි ජනතාව, නාගරික සහ ග්‍රාමීය ප්‍රජාවන් ඉලක්ක කර ගනිමින් ගොවි ජනතා සඟරාවෙහි කලාප 2 ක්, ගොවිමිණ කෘෂිකාර්මික ජාතික පුවත්පතෙහි කලාප 6 ක් සහ හදබිම අධිකාරිය සමඟ එක්ව හදබිම පුවත්පතෙහි කලාප 01 ක් ප්‍රකාශයට පත්කරනු ලැබීය.

ආයතනය සතු පැරණි ඡායාරූප මෙන්ම ක්ෂේත්‍රය තුළින් ලබාගන්නා ඡායාරූප සහ විඩියෝ ඇතුළත් ඡායාරූප පුස්තකාලයක් සකස් කිරීම, කෙටිකාලීන වාර්තා 15 යුක්ත විඩියෝපට සමාජ මාධ්‍ය වෙත මුදාහැරීම මඟින් පුළුල් ප්‍රචාරයක් ලබා දීම 2022 වසර තුළ ආයතනය ඉටුකළ කාර්යන් අතරට වැටේ. ශ්‍රී ලාංකික විශ්ව විද්‍යාල පද්ධතියට අයත් කෘෂි විද්‍යාපීඨ සහ සමාජීය විද්‍යාපීඨ සමඟ ඒකාබද්ධ වැඩසටහන් සඳහා අවබෝධතා ගිවිසුම්වලට එළැඹීමද 2022 වසර තුළ ආයතනය ලද තවත් එක් විජයග්‍රහණයකි.

4.4. සමස්ථ වැඩසටහනේ කාර්ය සාධනය පිළිබඳ නිරීක්ෂණ

2022 වසරේ පර්යේෂණ වාර්තා පුහුණු කටයුතු, වැඩමුළු හා ප්‍රසිද්ධ දේශණ, සඟරා හා පුවත් හසුන් ප්‍රසිද්ධියට පත් කිරීම සතුටුදායක මට්ටමක පවත්වා ගෙන ගොස් ඇති බව ප්‍රකාශ කළ හැකිය. මේ සියල්ලෙන්ම කෘෂිකර්ම හා ගොවි කටයුතු ක්ෂේත්‍රයේ නව දැනුම මෙම ක්ෂේත්‍රයේ ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා යොදා ගැනීමට අවස්ථාව උදාවේ.

සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

5. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP)

5.1. දැක්ම හා මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනය සහතික කරනු ලබන උද්දීප්ත සහ තිරසාර කෘෂිකාර්මික පර්යේෂණ සංවර්ධන සහ නව්‍යකරණ පද්ධතියක් ඇති කිරීම ආයතනයේ දැක්ම වන අතර ප්‍රතිපත්ති සම්පාදනය පහසුකම් සැපයීම සම්බන්ධීකරණය අධීක්ෂණය සහ ඇගයීම තුළින් කෘෂිකාර්මික පර්යේෂණ සංවර්ධන සහ නව්‍යකරණ ජාතික සංවර්ධන අභිමතාර්ථ කරා යොමු කිරීම සහතික කිරීම මෙහෙවර වේ.

ආයතනයේ ප්‍රධාන අරමුණු අතර කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධන සහ නව්‍යකරණ විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම, ජාතික සංවර්ධන වැඩසටහන සාක්ෂාත් කර ගැනීම උදෙසා කෘෂිකාර්මික පර්යේෂණ සහ නව්‍යකරණය දිශානත කිරීම, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සහ නව්‍යකරණ පද්ධතියෙහි (විද්‍යාත්මක සහ තාක්ෂණික) ධාරිතාවය වර්ධනය කිරීම, කෘෂිකාර්මික සංවර්ධනයන්ට සහාය දැක්වීම සඳහා උසස් තත්ත්වයේ ඉල්ලුම මත දිවෙන පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ලෝක තත්ත්වයේ පර්යේෂණ, සංවර්ධන සහ නව්‍යකරණය සාක්ෂාත් කර ගැනීම සඳහා අන්තර්ජාතික, කලාපීය සහ ජාතික මට්ටමේ සහයෝගීත්වය ප්‍රවර්ධනය කිරීම, ජාතික පර්යේෂණ, සංවර්ධන සහ නව්‍යකරණ වැඩසටහන්වල සහ ආයතනවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ඇගයීම, ජාතික පර්යේෂණ, සංවර්ධන සහ නව්‍යකරණ වැඩසටහන් ව්‍යාප්ත කිරීම සහ දැනුවත්භාවය ඇති කිරීම ප්‍රවර්ධනය කිරීම, හා ජාතික සංවර්ධන වැඩසටහන සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම වේ.

ප්‍රධාන කාර්යයන් ලෙස කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරණය, පර්යේෂණ පසුවිපරම හා පර්යේෂණ ප්‍රගතිය ඇගයීම, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය හා ප්‍රමුඛතා සකස් කිරීම, කෘෂිකාර්මික පර්යේෂකයන් අභිප්‍රේරණය කිරීම, කෘෂිකාර්මික පර්යේෂණ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීම හා කෘෂිකාර්මික මානව සම්පත් සංවර්ධනය වේ.

5.2. මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන්කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)
ප්‍රාග්ධන*	20.00	8.10
පර්යේෂණ සඳහා	12.00	5.60
පුනරාවර්ථන	200.00	126.16

*ආයතනය වෙත ලැබුණු මුළු ප්‍රාග්ධන මුදල රු.මි. 8.1 කි. එම මුළු මුදලම වියදම් කර ඇත.

5.3. විශේෂිත ක්ෂේත්‍රය

වෙන්කළ මුදල (රු.මි.)	8.1	වියදම් කළ මුදල (රු.මි.)	7.2
අරමුණු			
ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්		**සපුරාගත යුතු ඉලක්කය**	**අත්කරගත් භෞතික ප්‍රගතිය**
1. 2022 සඳහා NARS ආයතනවලින් පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එකතු කිරීම සහ කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රමුඛතා මත පදනම්ව ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීම		ආයතන 25 කින් පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එකතු කිරීම	ආයතන 24 කින් පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එකතු කරගන්නා ලදි. ශාක ආරක්ෂණ සේවාව ආයතනයෙහි සේවාවවන් සිදුකරන බැවින් පර්යේෂණ සැලසුමක් ලබා නොදුනි.
2. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (NARP) යටතේ ක්‍රියාත්මක කරගෙනයනු ලබන පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම		ප්‍රගතිය සමාලෝචනය කළ යුතු ව්‍යාපෘති සංඛ්‍යාව - 49	ප්‍රගතිය සමාලෝචනය කළ ව්‍යාපෘති සංඛ්‍යාව - 42
3. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතන (NARS) වල පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් වල 2021 වසර අවසාන ප්‍රගතිය සමාලෝචනය කිරීම		ආයතන 25ක පර්යේෂණ සැලැස්මෙහි ප්‍රගතිය ඇගයීම්	ආයතන 25ක පර්යේෂණ සැලැස්මෙහි ප්‍රගතිය ඇගයීම් කරන ලදී
4. අන්තර් ආයතනික පර්යේෂණ සඳහා අරමුදල් සම්පාදනය කිරීම තුළින් ජාතික කෘෂිකාර්මික පර්යේෂණවල තත්ත්වය හා වැදගත්කම වැඩිදියුණු කිරීම		කලමණාකරණය කළ යුතු ක්‍රියාත්මක වන ව්‍යාපෘති සංඛ්‍යාව - 5	ක්‍රියාත්මක වන ව්‍යාපෘති සංඛ්‍යාව - 5
5. 2022 වසරේදී අරමුදල් සැපයීමට නිර්දේශකිරීම සඳහා නව පර්යේෂණ සංකල්ප යෝජනා කැඳවීම		නව පර්යේෂණ සංකල්ප යෝජනා 100ක් කැඳවීම හා ඉන් 50ක් තෝරාගැනීම	නව පර්යේෂණ සංකල්ප යෝජනා නොලැබුනු අතර 2021 නව පර්යේෂණ 2023 වසර සඳහා 18 තෝරාගන්නා ලදී
6. පර්යේෂණ අවසන් වාර්තා (Terminal Reports) ඇගයීම		පර්යේෂණ අවසන් වාර්තා 20ක් එකතු කිරීම පර්යේෂණ අවසන් වාර්තා 20ක් ඇගයීම	පර්යේෂණ අවසන් වාර්තා 20න් බාහිර ඇගයීම සඳහා 19ක් යොමු කරන ලදි.
7. ජාත්‍යන්තර කෘෂිකාර්මික පර්යේෂණ ආයතන අතර සම්බන්ධීකරණය සිදුකරමින් කෙටිකාලීන පුහුණු හා පශ්චාත් උපාධි අවස්ථා සඳහා දේශීය කෘෂිකාර්මික පර්යේෂකයන්ට අවස්ථාව ලබා දීම		APAARI සාමාජික ගාස්තු ගෙවීම් හා පුහුණු කිරීම් සංඛ්‍යාව - 4 **ලබාදියයුතු පශ්චාත් උපාධි පුහුණු** පුහුණු සංඛ්‍යාව -79	APAARI සාමාජික ගාස්තු ගෙවීම රට තුළ පැවති මුදල් තත්වය පිළිබඳ ලේකම්/ අධ්‍යක්ෂ පැහැදිලි කිරීමෙන් අනතුරුව, සාමාජිකත්වය පවත්වා ගනිමින් 2021 සහ 2022 වසර සඳහා සාමාජික ගාස්තු (ඇ. ඩොලර් 12,000.00) ගෙවීමෙන් නිදහස් කරන ලදි. **ලබාදුන් පශ්චාත් උපාධි පුහුණු** පුහුණු සංඛ්‍යාව -79

වෙන්කළ මුදල (රු.මි.)	8.1	වියදම් කළ මුදල (රු.මි.)	7.2
අරමුණු			
ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්		**සපුරාගත යුතු ඉලක්කය**	**අත්කරගත් භෞතික ප්‍රගතිය**
			පුහුණුව නිමකළ සංඛ්‍යාව-12
8. NARS ආයතන බාහිර විමර්ශනය		NRMC ආයතන බාහිර විමර්ශණය කිරීම පසුගිය වසරවල බාහිර විමර්ශණය කළ ආයතන 2ක් පසු විපරම් කිරීම	NARS ආයතන බාහිර විමර්ශන මාර්ගෝපදේශය සැකසීම අවසන් කරන ලදී. SEPC හා NRMC ආයතන බාහිර විමර්ශණය කිරීම සඳහා කමිටු පත්කර ඇත. එම කමිටුවල ප්‍රථම රැස්වීම පවත්වා ඇත. ආයතන 1ක් තම විමර්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී
9. ශ්‍රී ලංකා ආහාර හා කෘෂිකර්මය සඳහා වූ ජර්නලය		2021 වසරේ දී නිකුත් කළ යුතු ජර්නල සංඛ්‍යාව - 2 (වෙළුම 6 නිකුතු 2 සහ වෙළුම 7 නිකුතු 1)	වෙළුම 6 නිකුතු 2 සහ වෙළුම 7.1 විද්‍යුත් මාධ්‍යයේ ප්‍රකාශයට පත් කර ඇත. 7.2 සඳහා පර්යේෂණ පත්‍ර ලබාගැනීම
10. NARS ආයතනවල මූල්‍ය, භෞතික, මානව හා පර්යේෂණ තොරතුරු ඇතුළත් INFORM තොරතුරු පද්ධතිය		තොරතුරු ලබාදිය යුතු NARS ආයතන සංඛ්‍යාව - 31 විශ්ලේෂණය කළ යුතු දත්ත ගබඩා සංඛ්‍යාව - 1	තොරතුරු ලබා දී ඇති NARS ආයතන සංඛ්‍යාව - 26 විශ්ලේෂණය කළ දත්ත ගබඩා සංඛ්‍යාව - 1
11. කෘෂිකාර්මික විශිෂ්ඨතාව සඳහා වූ SLCARP සම්මාන ප්‍රදානය		අපේක්ෂිත පර්යේෂණ පත්‍රිකා/අයදුම්පත් සංඛ්‍යාව - 20 පැවැත්විය යුතු සම්මාන ප්‍රධානෝත්සව සංඛ්‍යාව - 1	ලැබුනු පර්යේෂණ පත්‍රිකා/අයදුම්පත් සංඛ්‍යාව - 44, තෝරාගත් සංඛ්‍යාව 13 පැවැත්වූ සම්මාන ප්‍රධානෝත්සව සංඛ්‍යාව - 0 (රටතුළ පැවති අයහපත් සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් මෙම උළෙල කල්දමන ලදී)
12. ධාරිතා සංවර්ධන දේශණ තුළින් පර්යේෂකයන් උද්දීපනය කිරීම		ලබාදියයුතු **පශ්චාත් උපාධි පුහුණු** පුහුණු සංඛ්‍යාව 05	ලබාදුන් **පශ්චාත් උපාධි පුහුණු** පුහුණු සංඛ්‍යාව 02
13. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 2/2014 චක්‍රලේඛයට අනුකූලව		අපේක්ෂිත අයදුම්පත් සංඛ්‍යාව 65	අනුමැතිය ලබාදුන් අයදුම්පත් සංඛ්‍යා - 56

වෙන්කළ මුදල (රු.මි.)	8.1	වියදම් කළ මුදල (රු.මි.)	7.2
අරමුණු			
ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්		**සපුරාගත යුතු ඉලක්කය**	**අත්කරගත් භෞතික ප්‍රගතිය**
කෘෂිකාර්මික අංශයේ පර්යේෂකයින් සඳහා පර්යේෂණ දීමනාව අනුමත කිරීම			
14. කෘෂිකාර්මික අංශයේ නව ප්‍රමුඛතා පිළිබඳ දැනුවත් කිරීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම		සංවිධානය කළ යුතු සම්මන්ත්‍රණ/ වැඩමුළු සංඛ්‍යාව - 3	සංවිධානය කළ සම්මන්ත්‍රණ/ වැඩමුළු සංඛ්‍යාව - 1 (ජාතික මල්වගා පිළිබඳ සම්මන්ත්‍රණය)
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රදේශය		දීප ව්‍යාප්ත	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව		සෘජු ප්‍රතිලාභීන් 500 (පර්යේෂකයින්) වක්‍ර ප්‍රතිලාභීන් - ගොවි ප්‍රජාව	
සිදුකරන ලද වැඩමුළු, ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව		වැඩමුළු 02 ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව 42	

සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

6. ගොවීන්ගේ භාරකාර අරමුදල

6.1. ආරම්භය

ගොවීන්ගේ භාරකාර අරමුදල 1994 මාර්තු මස 09 වන දින රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා හා අරමුදල වෙනුවෙන් එවකට කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්, එම අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්, කෘෂිකර්ම නිෂ්පාදන හා අලෙවි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්, ගොවිජන සේවා කොමසාරිස් හා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගෙන් සමන්විත මණ්ඩලයක් අත්සන් තැබූ භාරකාර ඔප්පුවක් මඟින් ස්ථාපනය කර ඇත. ආයතනය අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් පාලනය වන අතර කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් සභාපති වන අතර සාමාජිකයන් වශයෙන් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ප්‍රධාන ගණකාධිකාරි (කෘෂිකර්ම අමාත්‍යාංශය) හා භාණ්ඩාගාර විශේෂ නියෝජිතවරයෙක් ක්‍රියාකරයි.

6.2. මෙහෙවර

සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය සඳහා අවශ්‍ය පසුබිම සකස් කර සුළු ගොවීන්ගේ සක්‍රීය දායකත්වය තුළින් කෘෂිකාර්මික වශයෙන් ස්වයංපෝෂිත ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීම.

6.3. අරමුණු

1994 දී ස්ථාපිත භාරකාර ඔප්පුවේ සඳහන් වන ආකාරයට හා 2002 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් අරමුණු පුළුල් කිරීම සිදු කළ අතර ඒ අනුව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය හා ගොවි ජනතාවගේ සුබසාධනය වැඩි දියුණු කිරීම, සුළු ගොවීන්ට කෙටිකාලීන කෘෂිකාර්මික ණය පහසුකම් සැලසීම, සුළු ගොවීන්ට කෘෂිකාර්මික යෙදවුම් සම්පාදනය, සුළු ගොවීන්ගේ මූල්‍ය දුෂ්කරතාවයන් මඟහරවා ගැනීම සඳහා සුළු ගොවියාට වෙළෙඳපල ණය පහසුකම් සැපයීම, සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, බෝග හා සත්ව නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම නිෂ්පාදනය පිරිසැකසුම සඳහා සුළු ගොවීන්ට අවශ්‍ය වෙනත් අනුග්‍රහයන් ලබා දීම හා කෘෂිකාර්මික සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා විශේෂ කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම ආයතනයේ අරමුණු වේ.

6.4. ක්‍රියාත්මක ක්‍රමවේදය

එක් එක් වර්ෂය සඳහා සියලු පළාත් සභා හා දිස්ත්‍රික් ලේකම්වරුන්, කෘෂිකාර්මික කටයුතු සඳහා අදාළ වන රජයේ දෙපාර්තමේන්තු හා ආයතන මඟින් ඉදිරිපත් කරන සංවර්ධන යෝජනා ගොවීන්ගේ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම සිදු කරන අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අදාළ ව්‍යාපෘති සලකා බලා අනුමැතිය ලබා දෙනු ලැබේ. එසේ අනුමැතිය ලබා දෙන ව්‍යාපෘති ගොවීන්ගේ භාරකාර අරමුදල් අයවැය වාර්තාවට ඇතුළත් කරනු ඇත.

6.5. අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය

අරමුදල සඳහා වන ප්‍රධාන ආදායම් ප්‍රභවය ගොවිසෙත ලොතරැයියේ විකුණුම් ආදායමෙන් යම් ප්‍රතිශතයක් හා අරමුදලේ අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොළී ආදායම් වේ.

ප්‍රදාන, අත්තිකාරම් හා ණය වශයෙන් මෙම අරමුදලේ වැඩ සටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.

i.) ප්‍රදානයන් යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

- **ජාතික අලුත් සහල් මංගල්‍යය - 2022**

මෙම සංස්කෘතික උත්සවය පැවැත්වීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත සෑම වර්ෂයකම මෙම අරමුදල මගින් මූල්‍යමය ප්‍රදානයක් ලබා දෙන අතර ජාතික අලුත් සහල් මංගල්‍යය - 2022 සඳහා රු. මිලියන 4.00 ක මුදලක් ගොවීන්ගේ භාරකාර අරමුදල මගින් ලබා දී ඇත. එහි මූල්‍ය ප්‍රගතිය 100% වේ.

- **වෙනත් කෘෂිකාර්මික ව්‍යාපෘති (ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව)**

ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	සත්‍ය මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය
මල්වරුෂා ඇල ප්‍රතිසංස්කරණය දෙහිඕවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ තිඹිරිපොල ග්‍රාම නිලධාරී වසමේ ගොවි පවුල් 12 කගේ කුඹුරු අක්කර 10ක ප්‍රමාණයක් හා ගොඩ ඉඩම් අක්කර 20 ආසන්න ප්‍රමාණයක් මල් වරුෂා ඇල මගින් පෝෂණය වේ.	1.08	0.22	20%
වේවැල්දෙණිය ඇල ප්‍රතිසංස්කරණය කැගල්ල දිස්ත්‍රික්කයේ කරඬුපන ග්‍රාම නිලධාරී වසමේ ගොවි පවුල් 40 කගේ කුඹුරු අක්කර 27 ක් පමණ වේවැල්දෙණිය ඇල මගින් පෝෂණය වේ.	0.70	0.14	20%
ජයවින්දාගම මුරුත ගහ පෑල අමුණ සකස් කිරීම යටියන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ජයවින්දාගම ග්‍රාම නිලධාරී වසමේ ගොවි පවුල් 14 කගේ කුඹුරු අක්කර 11 ක් පමණ ජයවින්දාගම මුරුතගහ පෑල අමුණ මගින් පෝෂණය වේ.	1.35	0.27	20%

ii.) අත්තිකාරම් යටතේ ක්‍රියාත්මක කරන වැඩසටහන්

- බීජ නිෂ්පාදන ව්‍යාපෘති

ව්‍යාපෘතිය	ඇස්තමේන්තු ගත මුදල (රු.මි.)	සත්‍ය මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය
a.) ජාතික බීජ නිෂ්පාදන වැඩසටහන (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)	120.00	120.00	100%
b.) 2022/23 මහ කන්නයේ බිත්තර වී මිලදී ගැනීමේ වැඩසටහන (ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව)	50.00	13.34	26%

a.) ජාතික බීජ නිෂ්පාදන වැඩසටහන

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ජාතික බීජ නිෂ්පාදන හා බීජ මිලදී ගැනීමේ වැඩසටහන මගින් ගොවීන්ගේ බීජ අවශ්‍යතාවය සපුරා ගැනීමට කටයුතු කරනු ලබයි. 2022 වර්ෂය සඳහා බීජ අවශ්‍යතාවය මෙ. ටො. 2,490 දක්වා වූ අතර ඒ සඳහා රු මි. 574.00 ක මුදල් ප්‍රතිපාදන අවශ්‍යව විය. ඉන් රු. මි. 120.00 ක් ගොවීන්ගේ භාරකාර අරමුදල මගින් ලබා දෙන ලදි. එමගින් වී, ධාන්‍ය, මිරිස්, බඩ ඉරිඟු, සෝයා හා එළවළු බීජ වර්ග කි. ග්‍රෑ. 204,297.00ක් මිල දී ගෙන ඇත.

b.) 2022-23 මහ කන්නයේ බිත්තර වී මිලදී ගැනීමේ වැඩසටහන

2022-23 මහ කන්නයේ ජාතික බීජ වී අවශ්‍යතාවය කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය රු. මි. 24.6 ක ප්‍රතිපාදන ගොවීන්ගේ භාරකාර අරමුදල මගින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. එම ව්‍යාපෘතිය මගින් බීජ වී කි.ග්‍රෑ 123,033.00ක් මිල දී ගෙන හම්බන්තොට, බදුල්ල, කෑගල්ල, මන්නාරම යන දිස්ත්‍රික්කවල ගොවීන් වෙත නිකුත් කොට ඇත.

- **වෙනත් කෘෂිකාර්මික ව්‍යාපෘති**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බිඳුණුවැව මී මැසි සංවර්ධන ඒකකය විසින් ක්‍රියාත්මක කරන මී මැසි පෙට්ටි හා උපාංග නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා වාර්ෂිකව ලබා දෙන රු.මි. 1.00 ක අත්තිකාරම් මුදල මේ වර්ෂයේදී රු.මි. 2.00 ක් දක්වා වැඩිකර දීමට කටයුතු කරන ලදි. මෙම ව්‍යාපෘතිය මගින් මී මැසි පෙට්ටි 750 ක්, දුම් විසිරුම් යන්ත්‍ර 500 ක් හා මී මැසි පෙට්ටි සඳහා ගේට්ටු තහඩු 5000 ක් නිෂ්පාදනය කර ඇත. එම උපාංග ගොවීන්ට අලෙවි කෙරේ.

ව්‍යාපෘතිය	ඇස්තමේන්තු ගත මුදල (රු.මි.)	සත්‍ය මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය
මී මැසි පෙට්ටි හා උපාංග නිෂ්පාදන ව්‍යාපෘතිය (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)	2.00	0.44	22.18%

iii.) කෘෂිකාර්මික ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- **දේශීය දෙමුහුම් බඩ ඉරිඟු බීජ නිෂ්පාදන ණය වැඩසටහන**

දේශීය දෙමුහුම් බඩ ඉරිඟු බීජ නිෂ්පාදනය සඳහා රු.මි. 9.37 ණය ලබා දී ඇත.

ව්‍යාපෘතිය	ඇස්තමේන්තු ගත මුදල (රු.)	සත්‍ය මුදල (රු.)	මූල්‍ය ප්‍රගතිය
පොළොන්නරුව බකමූණ ගොවිජන සේවා මධ්‍යස්ථානය (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)	6.68	6.68	නැවත පියවීමේ සහන කාලයේ පවති.
මොනරාගල ඔක්කම් පිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)	2.70	2.70	නැවත පියවීමේ සහන කාලයේ පවති.

ශ්‍රී ලංකාවේ වාර්ෂික බඩ ඉරිඟු වගාව සඳහා දෙමුහුම් බඩ ඉරිඟු බීජ මෙ.ටො 1,350.00 ක් පමණ ආනයනය කිරීමට සිදුවේ. මේ සඳහා වියදම් දළ වශයෙන් රු. මි. 3,780.00 කි. මේ වන විට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිෂ්පාදනය කර ඇති දේශීය දෙමුහුම් බඩ ඉරිඟු ප්‍රභේදයක් (MI Maize Hybrid 4 හා 5) 2022/23 මහ කන්නයේ බීජ අවශ්‍යතාවය සඳහා මෙම බීජ නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

පොළොන්නරුව බකමූණ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගොවීන් 52 දෙනකුගේ අක්කර 44.75 ක් සඳහා රු.මි. 6.67 ක මුදලක් හා මොනරාගල දිස්ත්‍රික්කයේ ඔක්කම්පිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගොවීන් 15 දෙනකුගේ අක්කර 25ක් සඳහා රු.මි. 2.70 ක ප්‍රාග්ධන මුදල් ලබා දෙන ලදි. මින් ලබාගත් අස්වැන්න මෙ. ටො. 36.2 ක් වේ.

ඡායාරූප අංක 24, 25 සහ 26 - පිටු අංක 78
ඡායාරූප අංක 27 සහ 28 – පිටු අංක 79

සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

7. ලංකා පොස්පේට් සමාගම

7.1. සමාගම පිහිටුවීම සහ නෛතික ආකෘතිය

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම 1992 ජූලි මස 10 වැනි දින සීමිත පොදු සමාගමක් ලෙස 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද්දේ රාජ්‍ය පතල් කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවෙහි එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම පිණිස වූ 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේය. කෙසේ වෙතත්, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ මෙකී සමාගම නැවත ලියාපදිංචි කරකු ලැබ ඇත. එසේම සමාගමෙහි නිකුත් කරන ලද කොටස්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්වරයාට සම්පූර්ණයෙන්ම හිමි වේ.

7.2. දැක්ම හා මෙහෙවර

"එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ත ලෙස භාවිතා කර ගනිමින් පෝෂ්‍යදායී පොස්පරස් මගින් අපගේ මාතෘ භූමිය සාරවත් පසකින් සාරවත් කිරීම" ආයතනයේ දැක්ම වන අතර "පරිසර හිතකාමී සහ නව ක්‍රමවේදයන් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වෙමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සැපිරීම" මෙහෙවර වේ.

7.3. සමාගමේ කාර්යයන්

සමාගමේ මූලික කටයුතු ලෙස කෘෂි බෝග සඳහා පොස්පේට් පාෂාණ කැනීම් කිරීම, සැකසීම සහ අලෙවිය සිදුකරයි.

7.4. මූල්‍යමය සහ භෞතික තත්ත්වයන්

2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා ආයතනයේ ERP සහ HERP පොහොරවල නිෂ්පාදනය, අලෙවිය සහ ආදායම සම්බන්ධ දත්ත :

පොහොර වර්ගය	නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො)	අලෙවිය (මෙ.ටො)	ආදායම (රු.මි.)
ERP	31,158	29,102	447.46
HERP	3,638	3,281	72.32
එකතුව	**34,796**	**32,383**	**519.78**

සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

කෘෂිකර්ම අංශයේ වැඩසටහන්වලට අදාළ ඡායාරූප

- **වාර්ෂික බෝග නිෂ්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම**



ඡායාරූපය 01 : වාර්ෂික බෝග නිෂ්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම

- **විවිධ පාර්ශවයන්ගේ සහයෝගය ඇතිව නව නිපැයුම්කරුවන් සාර්ථක ව්‍යවසායකයන් බවට බලගැන්වීමේ ව්‍යාපෘතිය**





ඡායාරූපය 02 : ක්ෂේත්‍ර නිරීක්ෂණ

සහභාගී වූ නිලධාරියා - අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයුම්,කෘෂිකර්ම අමාත්‍යාංශය)
අධ්‍යක්ෂ (ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය)
සංවර්ධන නිලධාරීන්(ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයුම් ,කෘෂිකර්ම අමාත්‍යාංශය)
නිරීක්ෂණ - ආර්. ගුණසේන මයා විසින් නිෂ්පාදිත සැහැල්ලු අත් ට්‍රැක්ටරයෙහි එන්ජිමෙහි ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම
ප්‍රදේශය - මොරටුව විශ්වවිද්‍යාලය,කොළඹ දිස්ත්‍රික්කය
දිනය - 2022.11.01





ඡායාරූපය 03 : ක්ෂේත්‍ර නිරීක්ෂණ

සහභාගී වූ නිලධාරියා - අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයුම්-කෘෂිකර්ම අමාත්‍යාංශය)
අධ්‍යක්ෂ (ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය)
යාන්ත්‍රික ඉංජිනේරු (ඉංජිනේරු අංශය -කෘෂිකර්ම අමාත්‍යාංශය)
සංවර්ධන නිලධාරීන් (ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයුම්-කෘෂිකර්ම

අමාත්‍යාංශය)

නිරීක්ෂණ - අයි.ජී රවීන්ද්‍ර සුදර්ශන මයාගේ විසින් නිෂ්පාදිත වගුරුබිම් සී සෑම සඳහා යොදාගන්නා සැහැල්ලු ඉපිලුම් යන්ත්‍රයෙහි ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම

ප්‍රදේශය - ඉගල, ඇල්පිටිය (ගාල්ල දිස්ත්‍රික්කය)

දිනය - 2022.11.25

- **කෘෂිකාර්මික ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම**



ඡායාරූපය 04 : නිරීක්ෂණය - ASMP මිරිස් වගාවක් (2022.11.12 දින මහනුවර දිස්ත්‍රික්කයේදී)



ඡායාරූපය 05 : කෝපායි SAPP කීල්ස් ව්‍යාපෘතියේ වම්බටු වගාවක් නිරීක්ෂණය කිරීම (2022.11.23 දින යාපනය දිස්ත්‍රික්කයේදී)





ඡායාරූපය 06 : 2022.11.02 දින කුරුණෑගල දිස්ත්‍රික්කයේදී දියර කිරි නිෂ්පාදනය නිරීක්ෂණය කිරීම (SAPP වොන්ට්ව් පුද්ගලික ආයතන සමඟ අනුබද්ධිත ව්‍යාපෘතිය)

- **ගොවිජනසේවා මධ්‍යස්ථාන මට්ටමින් පාංශු පරීක්ෂණ පහසුකම් ස්ථාපනය කිරීම**









ඡායාරූපය 07 : පාංශු පරීක්ෂණ වැඩසටහනෙහි මෙහෙයුම් කටයුතු සිදුකරන ආකාරය

- **කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය (ASMP)**



ඡායාරූපය 08 : ASMP ව්‍යාපෘතිය මඟින් ඇඹුල් කෙසෙල් අපනයනය කිරීම



ඡායාරූපය 09 : අනුරාධපුර මිරිස් නිෂ්පාදන පොකුර

- **දේශගුණ සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය**



ඡායාරූපය 10 : මහකන්නය 2022 - වී වගාවේ යාන්ත්‍රික පැල සිටුවීම - ගෙනහිර පළාතනෑ



ඡායාරූපය 11 : ලෝකබැංකු නිරීක්ෂණ කණ්ඩායම කල්ලිප්කුලම වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු නිරීක්ෂණය කිරීම - උතුරු පළාත



ඡායාරූපය 12 : පළාත් කෘෂිකර්ම නිලධාරීන් ගෙවතු වගා නිරීක්ෂණය කිරීම - දකුණු පළාත



ඡායාරූපය 13 : දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රමවේද පිලිබඳ අත්දැකීම් හුවමාරුව - උතුරුමැද පළාත

- **බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම**



ඡායාරූපය 14 : කර්මාන්තශාලා ගොඩනැඟිල්ල



ඡායාරූපය 15 : පරිපාලන ගොඩනැඟිල්ල





ඡායාරූපය 16 : කිරි සැකසීමේ යන්ත්‍රෝපකරණ

- **කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම**




ඡායාරූපය 17 : කුඩා පරිමාණ කිරි පට්ටි සංවර්ධන පදනම, වාරියපොළ




*ඡායාරූපය 18 : සක්සීඩ් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම, **වෙන්නප්පුව***




ඡායාරූපය 19 : අත්තනගල්ල කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය

ඡායාරූපය 20 : සී/ස දිස්ත්‍රික් කිරි සැපයුම්කරුවන්ගේ සමූපකාර සමිතිය, පොළොන්නරුව




ඡායාරූපය 21 : සී/ස නාවලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය

ඡායාරූපය 22 : හෙරිටේජ් හෙළ ගොවි සංවර්ධන සමිතිය, බණ්ඩාරගම

- **කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (AAIB)**



ඡායාරූපය 23 : නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සමාරම්භක උළෙල 2022/10/31 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනදී පවත්වන ලදී.

- **ගොවීන්ගේ භාරකාර අරමුදල**





ඡායාරූපය 24 : පොළොන්නරුව බකමූණ ගොවිජන සේවා බල ප්‍රදේශයේ බඩ ඉරිඟු වගා බිම් හා අස්වැන්න



ඡායාරූපය 25 : මල්වරුෂාව ඇල ප්‍රතිසංස්කරණය



ඡායාරූපය 26 : වේවැල්දෙනිය ඇල මාර්ගය පිළිසකර කිරීම



ඡායාරූපය 27 : ජයවින්දාගම මුරුතගහ පෑල අමුණ සකස් කිරීම



ඡායාරූපය 28 : බිදුණුවැව මී මැසි සංවර්ධන ඒකකය විසින් ක්‍රියාත්මක කරන මී මැසි පෙට්ටි හා උපාංග නිෂ්පාදන ව්‍යාපෘතිය

02. පශු සම්පත් අංශය

2022 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය - සාරාංශය

#	වැඩසටහන / ව්‍යාපෘතිය	2022 ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	විශේෂ කරුණු
1.	දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන	25.00	80	14.29	2021 බිල්පත් සඳහා රු. 989,600 ක් පමණක් ගෙවා ඇත
2.	සත්ත්ව අභිජනනය සහ ගොවිපොළ සංවර්ධනය	25.00	47	4.37	2021 බිල්පත් සඳහා රු. 2,309,491.85ක් පමණක් ගෙවා ඇත
3.	කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවි ව්‍යවසායකයන් සංවර්ධනය සහ කිරි පොකුරු ගම්මාන සංවර්ධනය	32.00	93	29.73	2022 අයවැය යෝජනා යටතේ මේ සඳහා රු.මි. 1,000.00 ක ප්‍රතිපාදන වෙන් වී තිබුණි*
4.	පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන	40.00	55	13.21	
5.	කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධනය	37.00	84	12.94	2021 බිල්පත් සඳහා රු. 549,800 ක් පමණක් ගෙවා ඇත
6.	සූකර කර්මාන්ත සංවර්ධන වැඩසටහන	30.00	45	4.72	
7.	ඵලදායිතා වැඩිදියුණු කිරීම තුළින් මධ්‍යම හා කුඩා පරිමාණ කිරි ගොවිපොළ ප්‍රවර්ධනය කිරීම	98.00	70	48.73	2021 බිල්පත් සඳහා රු. 3,485,838.33 ක් පමණක් ගෙවා ඇත
8.	එළු පොකුරු ගම්මාන සංවර්ධන වැඩසටහන	15.00	80	4.99	
එකතුව		**302.00**	**69**	**132.98**	

**2022.04.26 දිනැතිව රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් නිකුත් කළ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව මෙම අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී. එසේ වුවද 2022 ප්‍රතිශෝධිත අයවැය මඟින් වෙන් වූ මුදලින් මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 32 ක් වෙන් කරන ලදී.*

2022 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්

1. දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සහ පාරිභෝගික ප්‍රජාව අතර නැවුම් කිරි පරිභෝජනය වැඩි කිරීම හා ප්‍රචලිත කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණයි. සමාලෝචිත වර්ෂය සඳහා රු.මි. 25.00 ක ප්‍රතිපාදන මෙම වැඩසටහන සඳහා ලබා දී ඇති අතර, ඒ යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- පාසැල් ළමුන් හා ගර්භනී කාන්තාවන් අතර දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම
- දියර කිරි පරිභෝජනයේ වැදගත්කම ඇතුළත් තොරතුරු පත්‍රිකා පාසැල් ළමුන් හා ගර්භනී කාන්තාවන් අතර බෙදාදීම
- කිරි එකතු කිරීම හා කිරි සැකසුම් සඳහා උපකරණ ලබාදීම
- කිරි ගොවීන් අතර කිරි ශීත කිරීමේ ටැංකි බෙදාදීම
- විද්‍යුත් මාධ්‍ය හා සමාජ මාධ්‍ය හරහා දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීමේ වැඩසටහන් සිදුකිරීම

2022.04.26 දිනැතිව රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් නිකුත් කළ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී.

එලෙස අත්හිටවූ ව්‍යාපෘතිය 2022 ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන්වීමත් සමඟ 2022 සැප්තැම්බර් මාසයේ දී නැවතත් ආරම්භ කරන ලදී. එහිදී පළාත්වලින් කරන ලද විමසීම් හා ඉල්ලීම් අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් සීමා කර, පාසැල් ළමුන් හා ගර්භනී කාන්තාවන් අතර දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම පමණක් ක්‍රියාත්මක කරන ලද අතර, උතුරු මැද හා නැගෙනහිර පළාත් හැර සෙසු සියලුම පළාත්වල සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි.

2021 වර්ෂයේ ඇතිකරගත් මූල්‍ය බැඳීම් සඳහා රු.මි. 1.00 ක මුදලක් 2022 වර්ෂයේ ප්‍රතිපාදන හරහා ගෙවා ඇත. සමාලෝචිත කාලසීමාව අවසන් වන විට රු.මි. 13.30 ක මුදලක් ගෙවා ඇති අතර මීට අමතරව රු.මි. 4.67 ක බැඳීම් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇත

ඡායාරූපය අංක 29 - පිටු අංක 95

2. සත්ත්ව අභිජනනය සහ ගොවිපොළ සංවර්ධනය

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උසස් ආරයේ කිරි දෙනුන්ගේ හිඟකම මගහරවා ගැනීම සඳහා දීපව්‍යාප්තව අභිජනන ගොවිපොළ සංවර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය උප ව්‍යාපෘතීන් 02 කින් සමන්විතවේ. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 25.00 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 2022 දෙවන කාර්තුවේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, 2022.04.26 දිනැතිව රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් නිකුත් කළ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටවන ලදී.

එලෙස අත්හිටවූ ව්‍යාපෘතිය 2022 ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන්වීමත් සමඟ 2022 සැප්තැම්බර් මාසයේ දී නැවතත් ආරම්භ කරන ලද අතර, 2021 වර්ෂයේ මූල්‍ය බැඳීම් සඳහා රු.මි. 2.30 ක මුදලක් 2022 වර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදන මුදලින් අදාළ පාර්ශවයන් වෙත ගෙවා ඇත.

2.1. පෞද්ගලික අභිජනන ගොවිපොළ සංවර්ධන උප ව්‍යාපෘතිය

මේ යටතේ එක් දිස්ත්‍රික්කයකට එක් ගොවිපොළක් බැගින් පෞද්ගලික අභිජනන ගොවිපොළ 25 ක් සංවර්ධනය කිරීමට ඉලක්ක කරන ලදී. මේ සඳහා අපේක්ෂිත ආයෝජනය රු.මි. 6.25 ක් විය. සමාලෝචිත කාලසීමාව අවසන් වනවිට පෞද්ගලික අභිජනන ගොවිපළ 28 ක් සංවර්ධනය කර ඇත. මේ සඳහා රු. මි. 2.06 ක මුදලක් ගෙවා අවසන් කර ඇති අතර රු. මි. 4.82 ක බැඳීම් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇත.

2.2. රජයේ අභිජනන ගොවිපොළ සංවර්ධන උප ව්‍යාපෘතිය

මේ යටතේ පළාත් මට්ටමින් රජයේ අභිජනන ගොවිපොළ 09 ක් සංවර්ධනය කිරීමට සැලසුම් කරන ලද අතර, අපේක්ෂිත ආයෝජනය රු.මි. 15.90 ක් විය. 2021 වර්ෂයේ වඩාත් සාර්ථක ලෙස රජයේ අභිජනන ගොවිපොළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද උතුරු හා නැගෙනහිර පළාත් වෙත රු.මි. 2.00 ක උපරිමයකට යටත්ව ද, අනෙකුත් පළාත් සඳහා රු. මි. 1.70 ක උපරිමයකට යටත්ව ද අවශ්‍ය යෙදවුම් ලබා දීමට කටයුතු කරන ලදි.

සමාලෝචිත කාල සීමාව අවසන් වනවිට උතුර සහ වයඹ පළාත්වල අභිජනන ගොවිපොළ 02 ක සංවර්ධන කටයුතු සිදුකර ඇති අතර, රු.මි. 2.60 ක බැඳීම් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇත.

3. පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන

පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා උතුරු පළාතෙහි පවතින විශාල විභවය තුළ පශු වෛද්‍ය කාර්යාල හා අනෙකුත් යටිතල පහසුකම් ස්ථාපනය කිරීම මඟින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සේවා සැපයුම වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත. සමාලෝචිත කාල සීමාව තුළ මෙම වැඩසටහනට අදාළ ප්‍රගතිය පහත පරිදිවේ.

විස්තරය	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	ආයෝජනය කළ මුදල (රු.මි.)	විශේෂ කරුණු
පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීම් කටයුතු	21.21	6.32	ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇත.
යාපනය (තිරුනෙල්වේලි) බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු	14.89	6.89	පසුගිය කාලයේ පැවති ගොඩනැගිලි අමුද්‍රව්‍ය හිඟය හා මිල ඉහළයාම හේතුවෙන් සහ 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත.

ඡායාරූපය අංක 30 - පිටු අංක 95

4. කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධනය

කුකුළු නිෂ්පාදනයන්ගෙන් රට ස්වයංපෝෂිත කිරීම සඳහා කුකුළු ගොවිපොළ ඇති කිරීම, කුකුළු නිෂ්පාදන පරිභෝජනය ප්‍රචලිත කිරීම සහ නව ව්‍යවසායකයින් කුකුළු පාලන ක්ෂේත්‍රය සඳහා යොමුකිරීම මෙම වැඩසටහනෙහි අරමුණු වේ. මේ යටතේ, රජයේ කුකුළු ගොවිපොළ බිත්තර රක්කනාගාර හා කුඩා පරිමාණ කුකුළු ආහාර මිශ්‍රණාගාර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වේ. මේ සඳහා අපේක්ෂිත ආයෝජනය රු.මි. 15.00 ක් විය. එහෙත් ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවන ලද අතර, 2021 වර්ෂයේ මුල්‍ය බැඳීම් වෙනුවෙන් රු.මි. 0.55 ක් ගෙවා ඇත.

එලෙස අත්හිටවූ ව්‍යාපෘතිය 2022 ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන්වීමත් සමඟ 2022 සැප්තැම්බර් මාසයේ දී නැවතත් ආරම්භ කරන ලදී. ඒ අනුව රටේ පවතින මන්දපෝෂණය තත්ත්වය තුරන් කිරීමේ අරමුණින් පළාත් අධ්‍යක්ෂකවරුන්ගේ ඉල්ලීම් පරිදි රු.මි. 37.00ක ප්‍රතිපාදන මේ සඳහා වෙන්කරන ලද අතර, දිනක් වයසැති කිකිළි පැටවුන් 15ක් ලබාදීම යටතේ ගොවිපොළ 1,501 ක් ද, මසක් වයසැති කිකිළි පැටවුන් 10ක් ලබාදීම යටතේ ගොවිපොළ 2,605ක්ද, රජයේ කුකුළු ගොවිපොළ බිත්තර රක්කනාගාර සංවර්ධනය යටතේ ගොවිපොළ 02ක් ද, ස්ථාපනය කිරීම සඳහා රු.මි. 12.94 ක මුදලක් ගෙවා අවසන් කර ඇති අතර රු.මි. 11.58 ක බැඳීම් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇත.

ඡායාරූපය අංක 31 - පිටු අංක 95

5. සූකර කර්මාන්තය සංවර්ධන වැඩසටහන

පාරිසරික ගැටළු අවම කර සූකර කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් සැපයීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී. මේ යටතේ පරිසර හිතකාමී සූකර ගොවිපොළ 85ක් ස්ථාපනය කිරීමට හා සූකර අභිජනන ගොවිපොළ 2ක් සංවර්ධනය කිරීමට අපේක්ෂිත ආයෝජනය රු.මි. 30.00 ක් විය. මෙම වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුව තුළ සබරගමුව පළාතෙහි ජීව වායු ඒකකයක් ඉදිකිරීම මඟින් පරිසර හිතකාමී සූකර ගොවිපොළක් සංවර්ධනය කර ඇති අතර මධ්‍යම පළාතේ පුහුණු වැඩසටහනක් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද ලබා දී ඇත. ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි උපදෙස් ප්‍රකාරව මෙම ව්‍යාපෘතියේ ඉදිරි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී.

2022 ප්‍රතිශෝධිත අයවැය මඟින් වෙන් වූ මුදලින් රු.මි. 30.00 ක ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා යොදවන ලද අතර, ඒ යටතේ පරිසර හිතකාමී සූකර ගොවිපොළ 110ක් සඳහා රු.මි. 22.00ක්ද කොටදෙණියාව සූකර අභිජනන ගොවිපොළ සංවර්ධනය සඳහා රු.මි. 5.00ක්ද පුහුණු වැඩසටහන් සඳහා රු.මි. 2.10 ක්ද පරිපාලන වියදම් සඳහා රු.මි. 0.90 ක්ද වෙන් කරන ලදී. සමාලෝචිත කාලසීමාව තුළ පරිසර හිතකාමී සූකර ගොවිපොළ 49 ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි. 4.72 ක් ලබාදී ඇති අතර, රු.මි. 3.42 ක මූල්‍ය බැඳීම් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇත.

6. ඵලදායිතාව වැඩිදියුණු කිරීම තුළින් මධ්‍යම හා කුඩා පරිමාණ කිරි ගොවිපොළ ප්‍රවර්ධනය කිරීම

කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළවල ඵලදායිතාව ඉහළ නැංවීම තුළින් දේශීය දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වේ. මේ යටතේ දිවයින පුරා පළාත් මට්ටමින් සත්ත්ව පෝෂණ තත්ත්වය සහ සත්ත්ව අභිජනන හැකියාව ඉහළ නැංවීම සඳහා ප්‍රධාන වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කිරීමට නියමිත වූ අතර මේ සඳහා අපේක්ෂිත ආයෝජනය රු.මි. 120.00 ක් විය. ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටවන ලදී. සමාලෝචිත කාල සීමාව අවසන් වනවිට 2021 වර්ෂයේ මූල්‍ය බැඳීම් සඳහා රු.මි. 3.49 ක මුදලක් ගෙවා ඇත. "කිරෙන් සපිරි රටක්" ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි. 0.46 ක මුදලක් ගෙවීම මෙම ව්‍යාපෘතිය හරහා සිදු කරන ලදී.

එලෙස අත්හිටවූ ව්‍යාපෘතිය 2022 ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන්වීමත් සමඟ 2022 සැප්තැම්බර් මාසයේ දී නැවතත් ආරම්භ කරන ලදී. සමාලෝචිත කාල සීමාව අවසානය වනවිට මෙම වැඩසටහනට අදාළ ප්‍රගතිය පහත පරිදි වේ.

විස්තරය	ගෙවූ මුදල (රු.මි.)	විශේෂ කරුණු
අභිජනන ක්‍රියාකාරකම් යටතේ	9.91	රු. මි. 6.20 ක බැඳීම් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇත
සත්ත්ව ආහාර ක්‍රියාකාරකම් යටතේ	4.76	රු. මි. 10.67 ක බැඳීම් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇත
උතුරු හා නැගෙනහිර පළාත්වල අයහපත් කාලගුණ තත්වය මත මිය ගිය සතුන් වෙනුවෙන් වන්දි ලබාදීම	30.57	

ඡායාරූප අංක 32 සහ 33 - පිටු අංක 96

7. එළු පොකුරු ගම්මාන සංවර්ධන වැඩසටහන

එළු කිරි හා එළු මස් පරිභෝජනය සුලභ කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය මධ්‍යම, උතුරු මැද, නැගෙනහිර සහ උතුරු යන පළාත් කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ අතර, අපේක්ෂිත ආයෝජනය රු.මි. 15.00 ක් විය. අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව මෙම ව්‍යාපෘතියද ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී

එලෙස අත්හිටවූ ව්‍යාපෘතිය 2022 ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන්වීමත් සමඟ 2022 සැප්තැම්බර් මාසයේ දී නැවතත් ආරම්භ කරන ලදී. මේ යටතේ උතුරු හා වයඹ පළාත් වල එළු පොකුරු ගම්මාන 4ක් ඉදි කිරීමට කටයුතු කර ඇත. සමාලෝචිත කාල සීමාව අවසාන වනවිට රු. මි. 4.99 ක මුදලක් ගෙවා ඇති අතර රු.මි. 6.54 ක බැඳීම් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇත.

ඡායාරූපය අංක 34 - පිටු අංක 96

2022 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

i.) කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවි ව්‍යවසායකයන් සංවර්ධනය සහ කිරි පොකුරු ගම්මාන සංවර්ධනය (“කිරෙන් සපිරි රටක්” සංවර්ධන වැඩසටහන)

2022 අයවැය යෝජනා යටතේ මේ සඳහා රු.මි. 1,000.00 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ සඳහා නව තාත්ෂණය හඳුන්වා දෙමින් විධිමත්ව කළමණාකරණය කිරීම තුළින් දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සතුන්ට ආහාර සැපයීම, සත්ත්ව පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම, විධිමත් නිවාස සැපයීම, අභිජනන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හා ඒ අශ්‍රිත කටයුතු මුළු දිවයිනම ආවරණය වන පරිදි පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී. දිවයින පුරා පශු වෛද්‍ය කොට්ඨාශ 338 ම ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකිරීමට සැලසුම් කරන ලද අතර පළමු කාර්තුව සඳහා සියලුම පළාත්වලින් ප්‍රතිලාභීන් තෝරාගෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. 2022.04.26 දිනැතිව රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් නිකුත් කළ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව මෙම අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී. එසේ වුවද 2022 ප්‍රතිශෝධිත අයවැය මඟින් වෙන් වූ මුදලින් මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 32.00 ක් වෙන් කරන ලදී.

සමාලෝචිත කාල සීමාව අවසන් වන විට ප්‍රගතිය පහත පරිදිවේ.

#	ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද කාර්යයන්	භෞතික ප්‍රගතිය	ආයෝජනය (2022.12.31 දිනට) (රු.මි.)
1.	කිරි ලබා ගතහැකි දෙනුන් 5-10 ක් දක්වා සිටින හෝ දෛනිකව කිරි ලීටර 30 කට වැඩියෙන් ලබා ගන්නා ගොවිපොළ සඳහා රු.100,000 ක ප්‍රතිපාදනයක් යටතේ අවශ්‍ය යෙදවුම් ලබාදීම	මුළු දිවයිනම ආවරණය වන පරිදි ගොවිපොළ 162 ක් සඳහා අවශ්‍ය යෙදවුම් සහ පහසුකම් ලබා දී ඇත	13.44
2.	කිරි ලබා ගත හැකි දෙනුන් 11-25 ක් දක්වා සිටින හෝ දෛනිකව කිරි ලීටර 50 කට වැඩියෙන් ලබා ගන්නා ගොවිපොළ සඳහා රු. 150,000 ක ප්‍රතිපාදනයක් යටතේ අවශ්‍ය යෙදවුම් ලබාදීම	මුළු දිවයිනම ආවරණය වන පරිදි ගොවිපොළ 71ක් සඳහා අවශ්‍ය යෙදවුම් සහ පහසුකම් ලබා දී ඇත	7.83
3.	කිරි පොකුරු ගම්මාන සංවර්ධනය යටතේ එක් කිරි පොකුරු ගම්මානයකට අවශ්‍ය යෙදවුම් සඳහා රු. 500,000 ක ප්‍රතිපාදනයක් ලබාදීම	කිරි පොකුරු ගම්මාන 02ක් සඳහාද අවශ්‍ය යෙදවුම් හා පහසුකම් ලබා දී ඇත	0.71
4.	පුහුණු වැඩසටහන් සඳහා එක් වැඩසටහනකට රු.25,000 ක ප්‍රතිපාදනයක් ලබා දී ගොවි ව්‍යවසායකයින් පුහුණු කිරීම	පුහුණු වැඩසටහන් 60 ක් පවත්වා ඇත	0.75
5.	කිරි ගවයින් (එළ සහ මී ගව) අභිජනනය සඳහා වන ජාතික වැඩසටහන රු.මි. 91.5ක ප්‍රතිපාදන යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හරහා සිදුකිරීම	කිරි ගවයින් (එළ සහ මී ගව) අභිජනනය සඳහා වන ජාතික වැඩසටහන සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන ලබා දී ඇත	5.70
6.	මෙහෙයුම් ඇගයුම් හා පරිපාලන වියදම්		1.32
	එකතුව		**29.73**

ඡායාරූපය අංක 35 සහ 36 - පිටු අංක 97

2022 ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මඟින් කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා ලබාදුන් ප්‍රතිපාදන

2022 ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මඟින් දේශීය කිරි නිෂ්පාදනය නංවාලීම සඳහා ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.මි. 200.00 ක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. 2022 වර්ෂය අවසාන වන විට පහත දැක්වෙන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලද අතර රු.මි. 39.55 ක මුදලක් ගෙවා අවසන් කර ඇත. තවද රු. මි. 115.87ක බැඳීම් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇත.

i.) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය හරහා ක්‍රියාත්මක කරනු ලබන බඩඉරිඟු ව්‍යාපෘතිය

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන බඩඉරිඟු ව්‍යාපෘතිය සඳහා කන්දකාඩු සිංහපුර අක්කර 200ක බිම් ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට රු.මි. 39.55 ක ප්‍රතිපාදන අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ලබාදී ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබා ඇත. මෙමඟින් ලැබෙන බඩඉරිඟු අස්වැන්න සහන මිලට කිරි ගොවීන් සඳහා අලෙවි කර ලැබෙන ආදායම මහා භාණ්ඩාගාරය වෙත බැර කිරීමට එකඟ වී ඇත.

ii.) රීදියගම ගොවිපොළෙහි සත්ත්ව ආහාර සඳහා බඩඉරිඟු නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම් ලබාදීම

රට තුළ පවතින උග්‍ර සත්ත්ව ආහාර හිඟය නිසා කිරි නිෂ්පාදනයට ඇති වී ඇති බලපෑමට පිළියමක් ලෙස බඩඉරිඟු අස්වැන්න කිරි ගොවීන්ට ලබාදීම හා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළවල සතුන්ට අවශ්‍ය ආහාර නිපදවීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවේ.මේ සඳහා ආයෝජිත මුදල රු.මි. 106.73කි. මෙමඟින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ රීදියගම ගොවිපොළේ බිම් සංවර්ධනය කර අක්කර 700ක බඩඉරිඟු වගාකර ඇති අතර, ලැබෙන අස්වැන්නෙන් 50% ක කොටසක් කිරි ගොවීන් අතර සහන මිලට අලෙවි කිරීමෙන් ලැබෙන මුදල භාණ්ඩාගාරය වෙත යොමු කිරීමටත්, මෙම ව්‍යාපෘතියෙන් ලැබෙන සත්ත්ව ආහාර පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළවල් වලට ලබා දීමටත් නියමිතය. මෙමඟින් කිරි නිෂ්පාදනය ඉහළ නංවා ජාතික කිරි නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් ලබා දීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. මීට අමතරව දියර කිරි පානය ප්‍රචලිත කිරීමේ අරමුණින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් පාරිභෝගිකයින් වෙත දියර කිරි බෙදාහැරීමේ කටයුතු සඳහා ‘‘කිරි ශීත කිරීමේ ටැංකි’’ (Milk Dispenser Chilling Tank) මිල දී ගැනීමට රු.මි. 3.96 ක මුදලක් ලබා දී ඇත.

iii.) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක පෝෂ්‍ය තෘණ හා බඩඉරිඟු වගා ව්‍යාපෘතිය

කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවීන් හට පවතින සත්ත්ව ආහාර හිඟය මග හරවා ගැනීම සඳහා පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක පෝෂ්‍ය තෘණ හා බඩඉරිඟු වගා ව්‍යාපෘතීන් සඳහා රු.මි. 5.18ක ප්‍රතිපාදන ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය මධ්‍යම, ඌව සහ දකුණ යන පළාත් කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක විය.

පශු සම්පත් අංශය යටතේ ඇති ආයතනවල ප්‍රගතිය

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පශු සම්පත් ක්ෂේත්‍රයට අයත් ආයතන පහත පරිදි වේ.

1. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

- **හැඳින්වීම**

1978 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනයයි. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර; සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නහාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරිණි.

ජාතික සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ නායකත්වය, විශේෂඥ සේවා සහ සහාය සේවා, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත ලබාදීමෙන් පශු සම්පත් කර්මාන්තය වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි. පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 338 මඟින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- **දැක්ම**

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා පශු සම්පත් ක්ෂේත්‍රය මෙහෙයවන ප්‍රමුඛතම ආයතනය වීම.

- **මෙහෙවර**

නිරෝගිමත් සත්ත්ව ගහනයකින් හා ඉහළ නිෂ්පාදන ඵලදායිතාවයකින් යුක්තව ආහාර සුරක්ෂිතතාවයට දායකවීමෙන් හා ආහාරවල සෞඛ්‍යාරක්ෂිතභාවයද තහවුරු කරමින් පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් අත්පත්කර ගැනීම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා සහාය ලබාදීම.

- **ප්‍රධාන ක්ෂේත්‍ර**

i.) ගොවිපොළ සතුන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීම
ii.) සත්ත්ව සෞඛ්‍යය සහ පශු මහජන සෞඛ්‍යය ඉහළ නැංවීම
iii.) අන්තර්ජාතික වෙළෙඳාම සහ තත්ත්ව ආරක්ෂණය
iv.) පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම
v.) පශු සම්පත් ක්ෂේත්‍රයේ මනා කළමනාකරණය

- **අරමුණු**

i.) සත්ත්ව රෝග වලක්වාලන සහ මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම
ii.) සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම
iii.) ගුණාත්මක සත්ත්ව ආහාර සහ ආහාර සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම
iv.) සත්ත්ව ආහාර කර්මාන්තයේ වර්ධනය සහ සංවර්ධනය ප්‍රවලිත කිරීම
v.) තිරසාර පශු සම්පත් සංවර්ධනයක් උදෙසා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් පවත්වාගෙන යාම
vi.) තාක්ෂණිකව සවිබල ගැන්වූ මානව සම්පත් සංවර්ධනය
vii.) කාර්යක්ෂමව හා ඵලදායි ලෙස තොරතුරු බෙදාහැරීම සහ තාක්ෂණික සේවා සැපයීම තහවුරු කිරීම
viii.) ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ඇගයීම
ix.) සත්ත්ව නිෂ්පාදනවල ආරක්ෂිතභාවය තහවුරු කිරීම
x.) විධිමත් සත්ත්ව පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාළව පහසුකම් සැපයීම
xi.) සතුන්ගේ සුභසාධනය සහ යහපැවැත්ම තහවුරු කිරීම
xii.) දෙපාර්තමේන්තු කාර්යයන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම

- **ප්‍රධාන කාර්යයන්**

i.) ඉහළ නිෂ්පාදන හැකියාවක් සහිත උසස් ආරයේ ගව හා එළු ශුක්‍ර නිෂ්පාදනය කිරීම ඇතුළු ජාතික කෘත්‍රිම සිංචන වැඩසටහන මෙහෙයවීම
ii.) අභිජනන කටයුතු සඳහා සතුන්ගේ පෙළපත හා කාර්යසාධන වාර්තාකරණය
iii.) සත්ත්ව ජාන සම්පත් ආරක්ෂණය
iv.) එළුවන්ගේ ආරය නැංවීම
v.) වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
vi.) පෝෂ තෘණ හා සයිලේජ් නිෂ්පාදනය සහ තෘණ අලෙවිකරණය ප්‍රවලිත කිරීම
vii.) රෝග වැලැක්වීමේ එන්නත්කරණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම
viii.) දේශීයව එන්නත්සාර (කුර හා මුඛ, කාලගාත්‍රා, ගව රක්තාශ්‍රව, රැනිකට්) සහ අනෙකුත් ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
ix.) බුරුළු ප්‍රදාහය වැලැක්වීම, සුව කිරීම සහ බුරුළු නික්ෂේපණ නිෂ්පාදනය
x.) සැල්මොනෙල්ලෝසිස් හා රැනිකට් රෝග පාලනය
xi.) අති ව්‍යාධිජනක කුරුළු උණ රෝගයට එරෙහිව කාර්යක්ෂම පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ඇති කිරීම
xii.) සත්ත්ව රෝග හඳුනාගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා පශු විමර්ශණ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම
xiii.) කිරි ගොවිපොළවල සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීම
xiv.) පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම සහ අවශ්‍යතාවයන් සැපිරීම
xv.) කිරි තාක්ෂණ පරීක්ෂණාගාර පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම
xvi.) පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා විශ්ලේෂණ සහ උපදේශන සේවා සැපයීම
xvii.) ක්ෂේත්‍ර මට්ටමේ සතුන් හඳුනාගැනීමේ කටයුතු සිදුකිරීම
xviii.) දේශීය වෙළෙඳපොළ තුළ උසස් තත්ත්වයේ සත්ත්ව ආහාර සුලභ කිරීම තහවුරු කිරීම
xix.) පශු නිෂ්පාදන හා ජෛවී ද්‍රව්‍ය නියාමනය
xx.) කුකුළු පාලන ක්ෂේත්‍රයට අදාළ නියාමන කටයුතු
xxi.) සත්ත්ව නිරෝධායන හා ආවේක්ෂණ කටයුතු
xxii.) අන්තර්ජාතික වෙළඳාම පහසුකරණය

xxiii.) නිරෝධායන ඒකකවල යටිතල පහසුකම් ඉහළ නැංවීම සහ පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම

xxiv.) පශු සම්පත් පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

xxv.) පශු සම්පත් ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම සඳහා කරඳගොල්ල හා සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාල පවත්වාගෙන යාම

xxvi.) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම

xxvii.) ඉලෙක්ට්‍රොනික්, මුද්‍රිත මාධ්‍ය හා ප්‍රදර්ශන මඟින් තොරතුරු බෙදාහැරීම

xxviii.) ආදර්ශ ගොවිපොළ ඒකක ප්‍රදර්ශන

xxix.) පශු තාක්ෂණ උද්‍යානයේ විවිධ ගොවිපොළ ඒකක සංවර්ධනය හා නඩත්තු කිරීම

xxx.) පශු සම්පත් ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම

xxxi.) පශු සම්පත් සංඛ්‍යාන ප්‍රකාශන සැකසීම හා බෙදාහැරීම

xxxii.) පශු වෛද්‍ය සේවාව පුළුල් කිරීම සඳහා පශු වෛද්‍ය කාර්යාල ස්ථාපනය

2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

#	වැඩසටහන / ව්‍යාපෘතිය	2022 අයවැය ප්‍රතිපාදන (රු.මි.)	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	විශේෂ කරුණු
1.	සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන	165.00	95	161.00	
2.	කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය		95		
3.	බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන		59		
4.	උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම		99		
5.	පශු විමර්ෂණ මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම		68		
6.	පශු සම්පත් පර්යේෂණ වැඩසටහන	40.00	85	35.90	
7.	සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය	55.00	64	54.95	
8.	වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ ව්‍යාපෘතිය	30.00	38	29.89	2022 මැයි මාසයේ සිට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.
9.	පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම	40.00	70	31.33	
10.	සතුන් හඳුනාගැනීමේ වැඩසටහන	05.00	68	5.00	
11.	සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය	04.00	50	3.90	03/2022 ජාතික අයවැය චක්‍රලේඛයට අනුව ක්‍රියාකාරකම් අත්හිටුවා ඇති අතර නිරෝධායන මධ්‍යස්ථාන සඳහා

#	වැඩසටහන / ව්‍යාපෘතිය	2022 අයවැය ප්‍රතිපාදන (රු.මි.)	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	විශේෂ කරුණු
					කාර්යාලීය ද්‍රව්‍ය මිලදී ගැනීම සහ සතුන් හඳුනාගැනීමේ වැඩසටහන සඳහා ගෙවීම් සිදුකර ඇත. පෙර වසරේ හිඟ බිල්පත් සඳහා ගෙවීම් සිදුකර ඇත.
12.	කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම	10.00	84	9.40	
13.	වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන	06.00	30	5.07	රජයේ මෑතකාලීන චක්‍රලේඛ හේතුවෙන් VIC වලට අදාළ නව උපකරණ / යන්ත්‍රෝපකරණ / ගෘහ භාණ්ඩ මිලදී ගැනීම මෙන්ම යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු අනතර විය.
14.	ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු සඳහා පහසුකරණය සඳහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම	30.00	97	28.13	
15.	සත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම	20.00	-	16.08	2021 වසරේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම නිසා එම වසරේ නොපියවූ (commitments) බිල්පත් සඳහා ගෙවීම් කිරීමට සිදුවිය.
16.	සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන	05.00	88	3.84	
17.	තත්ත්ව ආරක්ෂණ වැඩසටහන		63		
18.	පශු සම්පත් ප්‍රවලිත කිරීමේ වැඩසටහන		94		
19.	පොත් හා වාර ප්‍රකාශන		-		ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් අත්හිටුවා ඇත
එකතුව		**410.00**		**384.49**	

<u>සටහන</u> - මෙම ආයතනය වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

2. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

- **හැඳින්වීම**

1972 අංක 11 දරණ කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 1973 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. එහි ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කරන ලද්දේ 1974 වර්ෂයේදීය.

- **දැක්ම**

පශු සම්පත් තුළින් ඉසුරුමත් දිවිපෙවෙතක් උදෙසා ගුණාත්මක සත්ත්ව හා කෘෂි නිෂ්පාදන දැයට දායාද කරන දේශයේ පශු සම්පත් නිපැයුම්කරු වීම

- **මෙහෙවර**

පශු සම්පත් හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයෙන් දේශය ස්වයංපෝෂිත කරලීමේ ජාතික මෙහෙවරට උරදෙනු වස්, නවීන තාක්ෂණ හා නවෝත්පාදන ක්‍රම තුළින් ගුණාත්මක සත්ත්ව, කෘෂිකාර්මික හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය කැපවී සිටී

- **ප්‍රධාන ක්ෂේත්‍ර**

i.) සත්ත්ව පාලන ව්‍යාපෘතිය යටතේ ගොවිපොළ සත්ත්ව විශේෂයන්හි නුමුහුම් සහ දෙමුහුන් කාණ්ඩ වලට අදාළ අභිජනන සත්ත්ව කණ්ඩායම් ගොවිපොළ 32ක් තුළ පවත්වාගෙන යනු ලබන අතර බිහිවන පැටවුන් දේශීය ගොවීන් වෙත නිකුත් කිරීම

ii.) ගොවිපොළවල නිපදවනු ලබන පශු සම්පත් නිෂ්පාදන සහ සකස්කළ සත්ත්ව ආහාර මණ්ඩලය සතු අලෙවිසැල් ජාලය හරහා සාධාරණ මිලකට මහජනතාව වෙත ලබාදීම

iii.) පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන දේශීය ගැනුම්කරුවන් සහ පාරිභෝගිකයන් වෙත නිකුත් කිරීම

- **අරමුණු**

i.) පොල් මූලාශ්‍රිත කර්මාන්තවලින් ලැබෙන අතිරික්ත මුදල් උපයෝගී කරගනිමින් එහි පැවැත්ම සඳහා ගොවිපොළවල සියළු ක්‍රියාකාරකම් ප්‍රශස්ත මට්ටමකින් පවත්වා ගැනීම

ii.) වෙළෙඳපොළ තරඟයට සාර්ථකව මුහුණදීම සඳහා පිරිවැය අවම කිරීමට හා නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා උචිත කළමනාකරණ ප්‍රතිපත්ති, නව තාක්ෂණය, විශේෂඥ දැනුම සහ ප්‍රාග්ධනය හඳුන්වාදීම

iii.) පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් මෙම ගොවිපොළ ඒකක ලාභදායී ව්‍යාපාර බවට පත්කිරීම සඳහා මනා අලෙවි උපාය මාර්ග සමඟ නව වෙළෙඳපොළක් ඇති කිරීමේ විභවතාවයන් පිළිබඳ අවධානය යොමු කිරීම

- **ක්‍රියාකාරකම්**

i.) පශු සම්පත් අභිජනනය හා වර්ධනය

ii.) බෝ කිරීම සඳහා උසස් තත්ත්වයේ සතුන් සාධාරණ මිලකට ගොවීන්ට නිකුත් කිරීම

iii.) උපරිම ලාභයක් ඉපයීම සඳහා පොල් වගාව ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම

iv.) විභවතාවයක් සහිත ස්ථානවල පශු සම්පත් හා භෝග ඒකාබද්ධ ගොවිපොළවල් ක්‍රියාත්මක කිරීම

v.) ගොවීන්, පාසැල් සිසුන්, කෘෂි කර්මාන්තයේ නියැලි නිලධාරීන් සහ විශේෂයෙන් සුළු පරිමාණ මට්ටමෙන් සතුන් ඇති කරන්නන්හට පුහුණු වැඩසටහන් හා ප්‍රදර්ශන පැවැත්වීම

vi.) ගුණාත්මක ගොවිපොළ නිෂ්පාදන සාධාරණ මිලකට සැපයීම සඳහා අලෙවිසැල් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම.

vii.) ඉහළ ලාභාන්තිකයක් ලබා ගැනීම සඳහා ගොවිපොළවල නිෂ්පාදිත අමු ද්‍රව්‍ය භාවිතා කරමින් වටිනාකම එකතු කරන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම

viii.) ජනතාව අතර නැවුම් එළකිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා දීපව්‍යාප්තව අලෙවිසැල් ජාලයක් පවත්වාගෙන යාම

<u>සටහන</u> - මෙම ආයතනය වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

3. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්

- **දැක්ම**

ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම පෝෂ්‍යදායී ආහාරපාන සපයන සමාගම බවට පත්වීම

- **මෙහෙවර**

දේශීය කිරි ගොවියා ශක්තිමත් කරමින් නැවුම් කිරි නිෂ්පාදනයේ ඉලක්කගත වර්ධනය සාක්ෂාත් කරගැනීමෙහිලා ක්‍රියාකාරී පාර්ශවකරුවකු වීම සහ පාරිභෝගිකයන්හට දැරිය හැකි මිලකට පෝෂ්‍යදායී ආහාරපාන සපයනු වස් නවීන තාක්ෂණයෙන් හෙබි අඛණ්ඩ අභිවෘද්ධි ප්‍රවේශයන් අනුගමනය කිරීම

- **අරමුණු**

i.) ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු කිරි හා ඒ ආශ්‍රිත ආහාරපාන සැපයීම
ii.) නැවුම් කිරි වලින් රට ස්වයංපෝෂිත කිරීම සඳහා දායකවීම
iii.) දේශීය කිරි ගොවීන් ශක්තිමත් කිරීම
iv.) දේශීය කිරි කර්මාන්තයේ සහ ආයතනයේ පැවැත්ම හා වර්ධනය සහතික කිරීම
v.) මෙහෙවරට දායකවන්නන්ගේ තෘප්තිමත්භාවය සහතික කිරීම

- **කාර්යයන්**

ආයතනය ප්‍රධාන ක්ෂේත්‍ර 03 ක් ඔස්සේ සිය මෙහෙයුම් ක්‍රියාවලිය දියත් කරනු ලබයි.

i.) දේශීය කිරි ගොවීන්ගේ කිරි අස්වනු එකතු කිරීම
ii.) කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරීම
iii.) එකී නිෂ්පාදන "හයිලන්ඩ්" වෙළෙඳ නාමය යටතේ දිවයින පුරා බෙදාහැරීම

<u>සටහන</u> - මෙම ආයතනය වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

4. සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම

- **දැක්ම**

දිනක් වයසැති උසස් තත්ත්වයේ බ්‍රොයිලර් කුකුළු පැටවුන් සහ බ්‍රොයිලර් කුකුළු මස් දේශීය වෙළෙඳපොළේ සාධාරණ මිලට සපයන ප්‍රමුඛ නිෂ්පාදකයෙකු වීම.

- **මෙහෙවර**

අන්තර්ජාතික තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූලව නවීන තාක්ෂණය භාවිතා කර දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් සහ බ්‍රොයිලර් කුකුළු මස් ගුණාත්මක තත්ත්වයෙන් වැඩිදියුණු කිරීම

- **අරමුණු**

i.) වෙළෙඳපොළ මිල සමතුලිතතාව පවත්වාගෙන යාම අරමුණු කරගෙන මිනිස් පරිභෝජනය සඳහා අවශ්‍ය කරන කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය කිරීම සහ දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් අභිජනනය කිරීම

ii.) මහවැලි ''එච්'' කලාපයේ ගොවීන් කෘෂිකාර්මික හා සත්ත්ව පාලන කටයුතු සඳහා උනන්දු කරවීම මගින් ඔවුන්ගේ ආදායම් ඉහළ නැංවීම, රැකියා අවස්ථා ඇතිකිරීම සහ සුභසාධනය ඇතිකිරීම

- **ප්‍රධාන ක්ෂේත්‍ර**

උසස් තත්ත්වයේ දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් නිෂ්පාදනය සහ බ්‍රොයිලර් කුකුළු මස් නිෂ්පාදනය

- **කාර්යයන්**

i.) ආනයනය කරන ලද හෝ දේශීයව මිල දී ගත් සතුන්ගෙන් සමන්විත මව් කුකුළු ඒකකයක් පවත්වාගෙන යාම

ii.) අර්ධ ස්වයංක්‍රීය බිත්තර රක්කනාගාරයක් පවත්වාගෙන යාම

iii.) වාණිජ බ්‍රොයිලර් ඒකකයක් පවත්වාගෙන යාම

iv.) මහවැලි ''එච්'' කලාපයට අයත් කුකුළු පාලනයේ නියැලෙන ගොවීන් සම්බන්ධීකරණය සඳහා ව්‍යාප්ති අංශයක් පවත්වාගෙන යාම

v.) සෞඛ්‍යාරක්ෂිතව හා ප්‍රමිතිගතව කුකුළු මස් නිෂ්පාදනය කිරීම සඳහා අර්ධ ස්වයංක්‍රීය මස් සැකසුම්හලක් පවත්වාගෙන යාම

vi.) කුකුළු ආහාර නිෂ්පාදනය කිරීම

vii.) සමාගමේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි සැල් පවත්වාගෙන යාම

5. සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම

- **දැක්ම**

ශ්‍රී ලංකාව තුළ ප්‍රමුඛ කුකුළු පාලන සංවර්ධන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීම තුළින් ග්‍රාමීය ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය නගාසිටුවීම

- **මෙහෙවර**

කුකුළු සම්පත ග්‍රාමීයව ව්‍යාප්ත කරලමින් තිරසාර සංවර්ධනයක් උදෙසා පවත්නා සීමිත සම්පත් උපරිම අයුරින් කළමනාකරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම

- **ප්‍රධාන ක්ෂේත්‍ර**

i.) සත්ත්ව පාලනයේ නියැලීම

ii.) පොල් වගා කළමනාකරණය

iii.) අතුරු භෝග වගා කිරීම

iv.) අලෙවිකරණය

- **අරමුණු**

i.) කුකුළු පාලන කර්මාන්තයේ සංවර්ධනය සඳහා ආශ්‍රිත වෙනත් ව්‍යාපෘති හඳුනාගැනීම හා ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම යොදාගැනීම

ii.) කුකුළු ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය සම්පත් දායකයින් හා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන දේශීය හා විදේශීය වශයෙන් ලබාගැනීම

iii.) කුකුළු සංවර්ධන කර්මාන්තය දියුණු කිරීම සඳහා නිෂ්පාදකයින්, පාරිභෝගිකයන් හා ගැණුම්කරුවන් හඳුනාගැනීම සහ එම කර්මාන්තයට අවශ්‍ය කරන ආහාර, ඖෂධ වර්ග ඇතුළු සියළුම ආයතනික සම්බන්ධීකරණයන් සිදුකිරීම

iv.) රජයේ අභිජනන කුකුළු ගොවිපොළවල් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම

v.) දිවයින පුරා විසිරී සිටින කුකුළු පාලනයට අදාළ ප්‍රජා මූල සංවිධාන ඒකරාශී කිරීම හා සවිබල ගැන්වීම

vi.) කාබනික පොහොර නිෂ්පාදනය

- **කාර්යයන්**

i.) පුද්ගලික අංශයේ ගොවීන්, රජයේ ආයතන හා අදාළ අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණ ආයතනයක් ලෙසට කටයුතු කිරීම

ii.) කුකුළු පාලනය සම්බන්ධව සියළුම අභිජනන කටයුතු සහ ලේයර් හා බ්‍රොයිලර් නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම

iii.) ගොවිපොළ සියළු නිෂ්පාදන, ආයතනයට අයත් අලෙවිසැල් හරහා සාධාරණ මිල ගණන් යටතේ පාරිභෝගිකයන් වෙත ලබාදීම

iv.) ආයතනයට අවශ්‍ය කුකුළු ආහාර නිෂ්පාදන කටයුතු සහ ගබඩා පහසුකම් ගොවිපොළ භූමියෙහි ප්‍රවර්ධනය කිරීම

v.) ග්‍රාමීය ප්‍රජාවගේ පෝෂණ වර්ධනයට දායක වන බිත්තර සහ කුකුළු මස් සාධාරණ මිලට ප්‍රජාව වෙත නිකුත් කිරීම

vi.) සුළු පරිමාණ කුකුළු ගොවිපොළවල් වලට අවශ්‍ය කරන කුකුළු පැටවුන් ගොවීන් වෙත ලබාදීම

vii.) ගොවිපොළ භූමියෙහි ඇති පොල් වගාව නිසි ලෙස නඩත්තු කොට ආදායම් උත්පාදනය සහ කුකුළු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා එම අරමුදල් යොදා ගැනීම

viii.) ගොවිපොළ භූමිය තුළ ආදායම් භෝග හා අතුරු භෝග ව්‍යාප්ත කිරීම මඟින් උපරිම ආර්ථික ඵලදායීතාවයක් ලබා ගැනීමට කටයුතු කිරීම

ix.) ප්‍රාථමික හා ද්විතීය අධ්‍යාපනය හදාරන සිසු දරුවන් ඇතුළු කුකුළු ව්‍යාපාරය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ගොවිපොළ තුළදීම ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුව ලබාදීම

x.) ආයතනයේ සේවකයන්ගේ සුභසාධනය සඳහා කටයුතු කිරීම

පශු සම්පත් අංශයේ වැඩසටහන්වල ඡායාරූප

- **දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන**




ඡායාරූපය 29 : පාසැල් ළමුන්ට දියර කිරි ලබාදීම - උතුරු පළාත

- **පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන**



ඡායාරූපය 30 : ඉදිකිරීම් නිම කළ යාපනය (තිරුනෙල්වේලි) බහුකාර්ය ගොඩනැගිල්ල

- **කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධනය**




ඡායාරූපය 31 : කිකිළි පැටවුන් ලබා දීම - උතුරු පළාත

- **ඵලදායිතාව වැඩිදියුණු කිරීම තුළින් මධ්‍යම හා කුඩා පරිමාණ කිරි ගොවිපොළ ප්‍රවර්ධනය කිරීම**



ඡායාරූපය 32 : තෘණ වගාව සඳහා උපකරණ ලබාදීම - උතුරු පළාත



ඡායාරූපය 33 : තෘණ වගාව සඳහා රෝපණ ද්‍රව්‍ය ලබාදීම - උතුරු පළාත

- **එළු පොකුරු ගම්මාන සංවර්ධන වැඩසටහන**







ඡායාරූපය 34: එළු පොකුරු ගම්මාන ඉදිකිරීම - උතුරු පළාත

- **කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවි ව්‍යවසායකයන් සංවර්ධනය සහ කිරි පොකුරු ගම්මාන සංවර්ධනය (“කිරෙන් සපිරි රටක්” සංවර්ධන වැඩසටහන)**




ඡායාරූපය 35 : පුහුණු වැඩසටහන් - උතුරු පළාත




ඡායාරූපය 36 : ගව ගාල් සෑදීම-උතුරු පළාත

03. පොහොර අංශය

පොහොර අංශයේ 2022 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය - සාරාංශය

සංවර්ධන වැඩසටහන	වෙන් කළ මුදල (රු.මී.)	මූල්‍ය ප්‍රගතිය (රු.මී.)	භෞතික ප්‍රගතිය
ජාතික පොහොර කළමනාකරණ තොරතුරු පද්ධතිය (National Fertilizer Management Information System)	20.00	7.06	80%
ලංකා පොහොර සමාගමේ පොහොර පර්යේෂණාගාරය වැඩිදියුණු කිරීම	20.00	-	60% (විද්‍යාගාර උපකරණ 6ක් මිල දී ගෙන ඇත)
ආහාර සුරක්ෂිතතා වැඩසටහන	500.00	414.31 (2021 වසරේ අතැති බිල් ගෙවීම)	ව්‍යාපෘති 9ක් අනුමත කර ඇති අතර 70%ක පමණ ප්‍රගතියක් අත් කරගෙන ඇත.
ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය (ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය)	5.00		භාණ්ඩාගාරය විසින් අක්මුදල් ලබා දී නොමැත.
පසු අස්වනු තාක්ෂණ ආයතනය	30.00	5.00	ආයතනය යටතේ දක්වා ඇත.
ආර්ථික මධ්‍යස්ථාන (වෙළඳ අමාත්‍යාංශය වෙත පවරා ඇත)	25.00	-	-
එකතුව	**600.00**	**426.37**	

පොහොර අංශය යටතේ ඇති ආයතන හා එහි ප්‍රගතිය

1. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

1.1. දැක්ම
ශ්‍රී ලාංකීය ගොවි ජන සමාජයේ සහ සියලු කෘෂිකාර්මික ඉඩම්වල තිරසාර සංවර්ධනය

1.2. මෙහෙවර
ශ්‍රී ලාංකීය ගොවි ජන සමාජයේ තිරසාර සංවර්ධනය සහ සියලුම කෘෂිකාර්මික ඉඩම්වලින් ප්‍රශස්ථ ඵලදායිතාව ලබා ගත හැකි වන පරිදි වන ආයතනික, සහායක, නෛතික හා කළමනාකරණ සේවාවන් සැකසීම හා කාලානුරූපව පවත්වාගෙන යාම.

1.3. අරමුණු
- රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති වලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීමට අදාළ විධි විධාන සැලැස්වීම.
- කෘෂිකාර්මික ඉඩම් හිමියන්, කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන් සහ භුක්තිකරුවන්ද / අඳ ගොවීන්ගේ වගා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන විධිවිධාන ක්‍රියාත්මක කිරීම.
- ගොවි සංවිධාන ලියා පදිංචි කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධ නියෝග සෑදීම සහ එම විධි විධාන ක්‍රියාත්මක වීම තහවුරු කිරීම.
- ගොවිජන සංවර්ධන සභා ස්ථාපිත කිරීම සහ ඒවායේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම සහ අධීක්ෂණය.

1.4. කාර්යයන්
- දිවයින පුරා පවත්නා සෑම ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයකටම අදාළව කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුළත් කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන පිළියෙල කර සංශෝධනය හා ප්‍රතිශෝධනය කර පවත්වාගෙන යාම.
- කෘෂිකාර්මික ඉඩම්වලට අදාළ අඳ ගොවි ගැටළු සහ වෙනත් ගොවි ආරවුල් විසඳීම සඳහා කටයුතු කිරීම.
- සුළු වාරි කර්මාන්ත සහ ජල ප්‍රභවයන්ගේ ඵලදායිතාවය, ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණයට අදාළ වන විධි විධාන ක්‍රියාත්මක කිරීම.
- ගොවිජන සංවර්ධන පනත හා රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති උල්ලංඝනය කරමින් ක්‍රියාත්මක වන පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම.

1.5. මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන්කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල (රු.මි.)
ප්‍රාග්ධන	1,213.50	525.73
පුනරාවර්ථන	8,819.20	8,686.59

1.6. සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය (භෞතික ප්‍රගතිය ඇතුළත් කෙටි සාරාංශය)

i.) ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල අළුත්වැඩියාව

ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ හා සේවාලාභීන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් මෙම වැය ශීර්ෂයෙන් වෙන් කරන ලද රු.මි. 20.00 ක ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් කාර්යාල 15ක් අළුත්වැඩියා කටයුතු සඳහා සැලසුම් කර තිබුණද 3/2022 චක්‍රලේඛයේ උපදෙස් අනුව ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා දමන ලද බැවින් දිස්ත්‍රික් කාර්යාල

9ක පමණක් වැඩ අවසන් කරන ලදී. 2022.12.31 දිනට වැය කළ මුදල රු.මි. 11.21කි. භෞතික ප්‍රගතිය 60% කි.
ඡායාරූප අංක 37 - පිටු අංක 114

ii.) ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල වාහන අළුත්වැඩියාව

ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල පවතින වාහන කාර්යක්ෂමව භාවිතයට ගත හැකි වන පරිදි අළුත්වැඩියාව සඳහා මෙම වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල රු.මි. 25.00 කි. 2022.12.31 දිනට වැය කළ මුදල රු.මි. 24.82 කි. භෞතික ප්‍රගතිය 100% කි.

iii.) පුහුණු හා හැකියා වර්ධනය

ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීම හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් මෙම වැය ශීර්ෂයෙන් වෙන් කරන ලද රු.මි. 3.00 ක ප්‍රතිපාදන යටතේ පුහුණු වැඩසටහන් 15 ක් ක්‍රියාත්මක කරන ලද 2022.12.31 දිනට වැය කළ මුදල රු.මි. 2.62 කි. භෞතික ප්‍රගතිය 100% කි.

iv.) යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියාව හා අත්පත් කර ගැනීම.

භාවිතයට ගත හැකි කෘෂි යන්ත්‍රෝපකරණ නඩත්තුව හා නව කෘෂි යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා මෙම වැය ශීර්ෂයයන් යටතේ වෙන් කරන ලද රු.මි. 29.00 ක ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් කෘෂි යන්ත්‍රෝපකරණ (එක්ස්කැවේටර් යන්ත්‍ර 14ක් හා බුල්ඩෝසර් 1ක්) අළුත්වැඩියාව කරන ලද අතර නව මිල දී ගැනීම් යටතේ කුඩා එක්ස්කැවේටර් යන්ත්‍රයක්, Concrete Mixture එකක්, Poker Machine එකක් සහ Vibrating Hammer එකක් මිලදී ගන්නා ලදී. 2022.12.31 දිනට වැය කළ මුදල රු.මි. 24.02 කි. භෞතික ප්‍රගතිය 84% කි.

v.) නව පොහොර ගබඩා ඉදිකිරීම

පොහොර ගබඩා ධාරිතාවය වැඩි කිරීමේ අරමුණින් මෙම වැය ශීර්ෂය යටතේ 2022 වර්ෂය ආරම්භයේ රු.මි. 180.00 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර ඒ යටතේ ව්‍යාපෘති 43ක් සැලසුම් කර තිබුණද 3/2022 චක්‍රලේඛයේ උපදෙස් අනුව ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා දමන ලද බැවින් සහ තුන්වන කාර්තුවේදී මෙම වැය ශීර්ෂයේ ප්‍රතිපාදන රු.මි. 50.00 දක්වා අඩු කිරීම හේතුවෙන් සැලසුම් කල ව්‍යාපෘති සිදු කිරීමට නොහැකි වූ අතර 2021 වර්ෂයේ අතැති බිල් පියවීම හා 2021 වර්ෂයේ බැඳීම් ව්‍යාපෘති 17ක වැඩ අවසන් කරන ලදී. 2022.12.31 දිනට වැය කළ මුදල රු.මි. 49.35 කි. භෞතික ප්‍රගතිය 94% කි.

vi.) ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා අළුත්වැඩියාව

ගොවිජන සේවා මධ්‍යස්ථානවල සේවය කරන නිලධාරීන්ගේ හා සේවාලාභීන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් සහ පොහොර ගබඩා ධාරිතාවය වැඩි කිරීමේ අරමුණින් මෙම වැය ශීර්ෂයෙන් වෙන් කරන ලද රු.මි. 300.00 ක ප්‍රතිපාදන යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා 127ක් අළුත්වැඩියා කටයුතු සඳහා සැලසුම් කර තිබුණද 3/2022 චක්‍රලේඛයේ උපදෙස් අනුව ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා දමන ලද බැවින් ව්‍යාපෘති 9ක පමණක් වැඩ අවසන් කරන ලදී. 2022.12.31 දිනට වැය කළ මුදල රු.මි. 11.21කි. භෞතික ප්‍රගතිය 24% කි.

ඡායාරූප අංක 38 සහ 39 - පිටු අංක 114

vii.) සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය හා පුරන් කුඹුරු අස්වැද්දීම

කුඹුරු ඉඩම් කාර්යක්ෂමව වගා කිරීම තුළින් භූමියේ ඵලදායිතාවය හා වී අස්වැන්න වැඩි කිරීමේ අරමුණින් මෙම වැය ශීර්ෂය යටතේ රු.මි. 735.00 ක් වෙන් කරන ලද අතර 2021 වර්ෂයේ අතැති බිල්

ගෙවීම ඇතුළුව කාණ්ඩ 9ක් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කළද 3/2022 චක්‍ර ක්‍රලේඛයේ උපදෙස් අනුව ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා දමන ලද බැවින් සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එසේ වුවද, පුරන් කුඹුරු අක්කර 10,000න් අක්කර 1,539.27ක් හා සුළු වාරි ව්‍යාපෘති 25න් ව්‍යාපෘති 4ක් ක්‍රියාත්මක කරන ලදී. 2022.12.31 දිනට වැය කළ මුදල රු.මි. 326.40 කි. භෞතික ප්‍රගතිය 40% කි.

ඡායාරූප අංක 40 සහ 41 - පිටු අංක 114

<u>සටහන</u> - මෙම ආයතනය වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

2. ජාතික පොහොර ලේකම් කාර්යාලය

2.1. හැඳින්වීම

1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 1988 දෙසැම්බර් මස 23 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අනුව ජාතික පොහොර ලේකම් කාර්යාලය ආරම්භ කරනු ලැබීය.

2.2. දැක්ම හා මෙහෙවර

ශ්‍රී ලංකාවේ වගා කරන සියලු බෝගවල නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අකාබනික හා කාබනික පොහොර නියමිත ප්‍රමිතියෙන් යුක්තව සම්පාදනය හා භාවිතය තහවුරු කිරීම ආයතනයේ දැක්ම වන අතර පොහොර විධිමත් කිරීමේ පනතේ විධිවිධාන අනුව අදාළ සියලු පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් විද්‍යානුකූල නිර්දේශයන් මත පොහොර අවශ්‍යතාවය තක්සේරු කිරීම, පොහොර ආනයනය හා තොග පාලනය, නිසි ගුණත්වයෙන් යුතු පොහොර බෙදා හැරීම හා අලෙවිය තහවුරු කිරීම, කාබනික හා අකාබනික පොහොර භාවිතයේ දී පරිසර හිතකාමී ලෙස පොහොර භාවිතය වැඩිදියුණු කිරීම, ගොවි ප්‍රජාවගේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් යුතුව පොහොර සහනාධාර යෝජනා ක්‍රමය මෙහෙයවීම හා පොහොර භාවිත ක්ෂේත්‍රයේ අක්‍රමිකතාවයන් වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම මෙහෙවර වේ.

2.3. කාර්යභාරය

- 1988 අංක 68 දරණ පොහොර පනත විධිමත්ව ක්‍රියාත්මක කිරීම.
- රජයේ පොහොර සමාගම් මගින් (ලක් පොහොර, කොළඹ කොමර්ෂල් පොහොර) පොහොර ආනයනය, මිශ්‍ර කිරීම, බෙදාහැරීම සහ වෙළඳාමේ හා ස්වාරක්ෂක පොහොර තොග තත්ත්වයන් පවත්වාගෙන යාම.

ආයතනයේ කාර්යභාරය මූලික අංශ 10 යටතේ සංවිධානය වී ඇති අතර 2022 වර්ෂයේ දී එම අංශ සියල්ලම ඉහළ ප්‍රගතියක් අත් කර ගෙන ඇත. කාබනික පොහොර ප්‍රවර්ධන අංශය එහි පළමු අංශය වන අතර කාබනික පොහොර නිෂ්පාදනය ශක්තිමත් කිරීම සඳහා වැඩසටහන් 45ක් සම්පූර්ණ කර ඇත. එසේම, පොහොර ආනයන අංශය විසින් රසායනික පොහොර ආනයනය සම්බන්ධ ලිපි ගොනු සැකසීම්, රේගු නිෂ්කාශන සඳහා නිර්දේශ ලබා දීම්, රසායනාගාර වාර්තා පරීක්ෂා කොට පොහොර වර්ගයන් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම හා පොහොර උපදේශන කමිටු යන කාර්යයන් 1995 ක් සම්පූර්ණ කර ඇත. පොහොර බෙදා හැරීමේ අංශය යටතේ වී සඳහා පොහොර බෙදා හැරීමේ වැඩසටහන 2022 යල කන්නය සඳහා හෙක්. 433,225 ආවරණය කර ඇති අතර පොහොර බෙදා හැරීමේ වැඩසටහන 2021/22 මහ කන්නය සඳහා හෙක්. 789,832 ආවරණය කර ඇත. විමර්ශන අංශය මගින් පොහොරවල ප්‍රමිති පාලනය සම්බන්ධව විමර්ශන 115 ක් සම්පූර්ණ කර ඇත.

තාක්ෂණික අංශය මගින් ආනයනික රසායනික පොහොරවල තත්ත්ව පරීක්ෂාව සඳහා හා දේශීය නිෂ්පාදන සඳහා නියැදි ලබා ගැනීම් 2,462 ක් සම්පූර්ණ කර ඇත. බලපත්‍ර අංශය මගින් පොහොර නිෂ්පාදනය, ආනයනය සඳහා නව බලපත්‍ර ලබා දීම, පැරණි බලපත්‍ර අළුත් කිරීම ආදි කටයුතු 314 සම්පූර්ණ කර ඇත. එසේම, දත්ත කළමණාකරණ අංශය,මගින් අංශය සම්බන්ධ සියළුම දත්ත සකස් කිරීම් වාර්තා කිරීම් හා බෙදාහැරීම සිදුකළ අතර අනෙකුත් අංශ වන ගිණුම් අංශය, ප්‍රගති සමාලෝචන අංශය හා ආයතන අංශය විසින් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ කාර්යභාරය සාර්ථක කර ගැනීම වෙනුවෙන් සුවිශේෂ වගකීමක් ඉටු කර ඇත.

ආයතනයේ දිස්ත්‍රික් කාර්යාල විසින් කාබනික පොහොර නව නිෂ්පාදකයින්ට බලපත්‍ර ලබා දීම, කාබනික පොහොර පැරණි නිෂ්පාදකයින්ගේ බලපත්‍ර අලුත් කිරීම, තොග සත්‍යාපනය හා ගබඩා පරීක්ෂා කටයුතු, පොහොර අලෙවිසැල් ලියාපදිංචිය, පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර මට්ටමින් නියැදි පරීක්ෂාව හා පොහොරෙවල ගුණාත්මකභාවය තහවුරු කිරීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් පොහොර කමිටු ආදී වගකීම් ඉටුකර ඇති අතර එම කාර්යයන්ගේ භෞතික ප්‍රගතිය 64% ලබාගෙන ඇත.

මානව සම්පත් සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය දේශීය පුහුණු යටතේ සහකාර අධ්‍යක්ෂවරුන්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය හා පුහුණු වැඩමුළුවක් පවත්වා නිලධාරීන් 52ක් පුහුණු කර ඇත. මේ සඳහා රු.මි. 0.47ක් වියදම් කර ඇත.

3. සීමාසහිත ලංකා පොහොර සමාගම

3.1 පනතට අනුව ආයතනය

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 ජනවාරි මස 29 වන දින "ලංකා පොහොර සංස්ථාව" පිහිටුවන ලදී. එම සංස්ථාව 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා සහ රජයට පවරාගත් ආයතන සීමිත සමාගම් බවට පත් කිරීමේ පනත අනුව 1992 සැප්තැම්බර් මස 15 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි සීමාසහිත ලංකා පොහොර සමාගම නමින් නැවත ස්ථාපිත විය. එය වර්තමානයේ 2007 අංක 07 දරණ නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි වී ඇත.

3.2 දැක්ම හා මෙහෙවර

ශ්‍රී ලාංකික පොහොර වෙළඳපොල නියමුවා ලෙස කෘෂි ක්ෂේත්‍රය හා ඒ ආශ්‍රිත නව නිපැයුම් සේවා හා යෙදවුම් සපයන විවිධාංගීකරණය වූ නව ලොවට ගැළපෙන ප්‍රමුඛතම ආයතනය වීම දැක්ම වන අතර රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ලක් පොහොර පවුලේ උපරිම දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා ගොවිජන සේවා ක්ෂේත්‍රයේ නිෂ්පාදනය, ආදායම හා ලාභදායීත්වය වැඩිකිරීම සඳහා බහුවිධ වෙළඳපොල ඉල්ලුමට සරිලන පොහොර නිෂ්පාදනය හා අලෙවිය තුළින් සමාගමේ ලාභදායී තිරසර පැවැත්ම තහවුරු කිරීම මෙහෙවර වේ.

3.3. අරමුණු :-

රජයෙන් වෙන්කරන ලද වී සහනාධාර පොහොර (60%) ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවීන් වෙත ලබාදීම, රසායනික පොහොර නැවත ආනයනය කර නවීන තාක්ෂණික ක්‍රමවේද අනුව වැඩිදියුණු කර වී හැර අනෙකුත් භෝග සඳහා මිශ්‍රණ පොහොර සකස් කිරීම, දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ගබඩා ජාලය පවත්වාගෙන යමින් වැවිලිකරුවන් වෙත අවශ්‍ය පොහොර අවශ්‍ය විටෙක අලෙවි කිරීම සඳහා තොග රැස්කර තබා ගැනීම, පරිසර හිතකාමී හරිත කෘෂිකර්මාන්ත ප්‍රතිපත්තිය යටතේ කාබනික පොහොර මිල දී ගැනීම හා අලෙවිය, අප සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන ගෙවතු වගා පොහොර නිෂ්පාදන ජංගම අලෙවි රථ යොදා ගනිමින් බෙදාහැරීම.

3.4. කාර්යයන්

- උසස් ප්‍රමිතියෙන් යුතු පොහොර ආනයනය කිරීම හා දේශීය වශයෙන් මිල දී ගැනීම.
- උසස් ප්‍රමිතියෙන් යුතු කොම්පෝස්ට් පොහොර සහ කාබනික නිෂ්පාදන දේශීය වශයෙන් මිල දී ගැනීම.
- ජාතික පොහොර ලේකම් කාර්යාලය මඟින් ලබාදෙන නිර්දේශිත අනුපාත වලට අනුකූලව සියළුම බෝගයන් සඳහා රසායනික පොහොර මිශ්‍රණ සැකසීම.
- තත්වයෙන් උසස් සෘජු හා මිශ්‍රණ පොහොර ප්‍රාදේශීය ගබඩා, අලෙවි නියෝජිත, බෙදාහැරීම් නියෝජිත හරහා ලංකාව පුරා බෙදාහැරීම හා අලෙවි කිරීම (කාබනික හා රසායනික).
- පොහොර භාවිතය පිළිබඳව ගොවි ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පැන නඟින ගැටළු විසඳීම.
- අප ආයතනයේ රසායනාගාරය වැඩිදියුණු කර පොහොර ඇසුරුම් ද්‍රව්‍ය හා පොහොර සාම්පල පරීක්ෂා කර සහතික කිරීම.

<u>සටහන</u> - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

04. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම වර්ෂ 150 ක දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ආයතනයකි. මෙම ආයතනය යුරෝපීයයන් විසින් 1872 වර්ෂයේදී ආරම්භ කොට ඇති අතර දැනට 100% රජය සතු සමාගමක් වශයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වේ.

4.1. දැක්ම හා මෙහෙවර

කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නොපමාව නිෂ්පාදනය කොට බෙදාහැරීම මගින් ශ්‍රී ලාංකීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ධනාත්මකව දායකත්වය සපයමින් රාජ්‍ය අංශය සතු ආදර්ශමත් ආයතනයක් වශයෙන් ක්‍රියා කිරීම ආයතනයේ දැක්ම වන අතර ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පොහොර නිෂ්පාදකයා හා බෙදාහරින්නා බවට පත්වීමෙන් රජයේ කෘෂිකර්මාන්තය සඳහා වූ දැක්මේ සාධම්බර හිමිකරුවෙක් වෙමින් නිෂ්පාදන විවිධාංගීකරණය, උසස් තත්ත්වයේ නිෂ්පාදන එළිදැක්වීම සහ ආයතනයේ පාර්ශවකරුවන්ගේ සියළු අවශ්‍යතාවන්ට විවෘතව කටයුතු කරමින් ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට අවස්ථාව උදා කරගැනීම මෙහෙවර වේ.

4.2. කාර්යයන්

දිවයිනේ වී වගාව සඳහා අවශ්‍ය කරන පොහොර ප්‍රමාණයෙන් 40% ක ප්‍රමාණයක් ආනයනය කොට දිවයිනේ පිහිටි ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවිජනතාව වෙත සහනාධාර යෝජනා ක්‍රමය යටතේ සහන මිලට භිඟයකින් තොරව නියමිත වේලාවට පොහොර ලබාදීම සහ වෙනත් බෝග සඳහා අවශ්‍ය කරන පොහොර ප්‍රමාණයන් ආනයනය කර දිවයින පුරා ගොවිජන මධ්‍යස්ථාන හා අලෙවි නියෝජිතයන් මගින් ගොවිජනතාව වෙත සහන මිලට අලෙවි කිරීම.

4.3. අරමුණු

රජයේ කෘෂිකර්ම ප්‍රතිපත්ති වලට අනුකූලව වර්ෂය තුළ රටට අවශ්‍ය කරන පොහොර ප්‍රමාණය කෘෂිකර්ම අමාත්‍යාංශය හා ජාතික පොහොර ලේකම් කාර්යාලය හා එක්ව කාර්යක්ෂමව ආනයනය කිරීම සහ උසස් ප්‍රමිතියෙන් යුතු කාබනික පොහොර දේශීය වශයෙන් මිල දී ගෙන එය තවදුරටත්

වැඩිදියුණු කර වගාවන් සඳහා අවශ්‍ය කාලය වන විට හිඟයකින් තොරව නියමිත කාලයට, නියමිත ප්‍රමාණයෙන්, ගොවිජන මධ්‍යස්ථාන හරහා ගොවීන් වෙත පොහොර බෙදා හැරීම.

<u>සටහන</u> - මෙම ආයතනය වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

5. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)

5.1. හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය හෙවත් ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය 1973 අංක 15 දරණ ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ පනත අනුව ස්ථාපිත කර ඇත.

5.2. දැක්ම හා හෙහෙවර

ගොවි ජනතාවගේ සහ අඩු වරප්‍රසාද ඇති ජනතාවගේ අභිමානය නැවතත් ඇති කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ආර්ථික ස්වාධීනත්වය සහ ස්ව විශ්වාසය ඇති කිරීම දැක්ම වන අතර ප්‍රතිලාභීන්ගේ ආර්ථික ස්වාධීනත්වය ඇති කිරීමටත් අනුන් මත යැපීමේ සංස්කෘතිය මග හැරවීම සඳහාත් කෘෂිකර්ම, පශු සම්පත් සහ වෙනත් ක්ෂේත්‍රවල නිපුණතා සංවර්ධනය සඳහාත් සහභාගීත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙහෙවර වේ.

5.3. අරමුණු

- රජය විසින් සකස් කරන ලද සංවර්ධන වැඩපිළිවෙලට අනුකූලව සාමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා විදේශීය, දේශීය නියෝජ්‍යත්ව වල ආධාර ලබා ගැනීම.
- මහජනෝපකාර, සාමාජීය හා ආර්ථික සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතන වලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම.
- කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය කෙරෙහි යොමු වූ නිශ්චිත යෝජනා ක්‍රමවලට ආධාර කිරීම, එම යෝජනා ක්‍රම දියුණු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ යෝජනා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යත්ව උනන්දු කිරීම.
- ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාරය සහ වෙනත් ඒ හා සමාන පිටරට ආයතන, සංගම් හෝ සමිති සමග සහයෝගී වීම.

<u>සටහන</u> - මෙම ආයතනය වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.

6. ජාතික පසු අස්වනු කළමණාකරණ ආයතනය

6.1. හැඳින්වීම

වර්ෂ 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික ව්‍යවස්ථා පනතෙහි ප්‍රතිපාදනයන් යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1137/10 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් 2000 වර්ෂයේ ජූනි 19 වැනි දින පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය පිහිටුවන ලදී. 2018.10.27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2093/26 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ආයතනයේ නම ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය ලෙස වෙනස් කරන ලදී.

ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ කෘෂිකාර්මික බෝගයන්ගේ පසු අස්වනු හානිය අවම කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු, පුහුණු, ව්‍යාප්ති, තාක්ෂණික උපදේශක සේවා හා රසායනාගාර සේවා සිදු කිරීමයි.

6.2. දැක්ම

ජාතික ආහාර සුරක්ෂිතතාව සඳහා තිරසාර පසු අස්වනු සංවර්ධනයේ විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය වීම

6.4. මෙහෙවර

කාර්යක්ෂම හා ඵලදායී පසු අස්වනු තාක්ෂණික මැදිහත්වීම තුළින් ජාතික ආහාර සුරක්ෂිතතාවයෙහි තිරසාර සංවර්ධනය ඇති කිරීම සඳහා තරඟකාරී මිලක් යටතේ දේශීය හා විදේශීය වෙළඳපලට උසස් තත්ත්වයෙන් යුත් සුරක්ෂිත ආහාර නිෂ්පාදන සැපයීමට සැපයුම් හා අගයදාමයන් ශක්තිමත් කිරීම

6.5. අරමුණු

ප්‍රධාන අරමුණු 03ක් ඔස්සේ ආයතනයේ සියළු කාර්යයන් දියත් කෙරෙයි.

- වසර 2025 වන විට කෘෂි බෝගවල පසු අස්වනු හානිය, කල් තබා ගත හැකි බෝගවල 5% දක්වාත් කල් තබා ගත නොහැකි බෝගවල 25% දක්වාත් අවම කිරීම.
- කෘෂි ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම.
- ආයතනයේ යහ පාලනය සවිමත් කිරීම.

6.6. ප්‍රධාන කාර්යයන්

විධි නියෝග අනුව කාර්ය භාරයන්

- ශ්‍රී ලංකාවේ පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණය වැඩිදියුණු කිරීමට අවශ්‍ය වන පර්යේෂණ හදුනාගෙන ප්‍රමුඛතා සකස් කර ඒවා දියත් කිරීම. ඒ යටතේ වී, සහල් අනෙකුත් ධාන්‍ය වර්ග එළවළු හා පළතුරු, ක්ෂේත්‍ර බෝග, කුළුබඩු බෝග, හා කැපූ මල් වල අස්වනු නෙලීම, පරිහරණය හා ප්‍රවාහනය, ගබඩා කිරීම සහ කල්තබා ගැනීම, ප්‍රාථමික සහ ද්විතීයික සැකසුම් ක්‍රම, අතුරුඵල භාවිතය, තත්ව සහතිකකරණය ආදියට අදාල තාක්ෂණයන් හදුනා ගැනීම හා ප්‍රචාරණය
- කෘෂි බෝගයන්හි ප්‍රාථමික සහ ද්විතීයික සැකසුම් පිරිවැය අඩු කිරීම සඳහා පසු අස්වනු තාක්ෂණික ක්‍රම යාන්ත්‍රීකරණය කිරීම සහ විධිමත් පසු අස්වනු තාක්ෂණික ක්‍රමවේදයන් හරහා කෘෂිකාර්මික බෝගයන්ගේ පෝෂණීය තත්වය ඉහළ නැංවීම හා ඒ තුළින් ජනතාවගේ පෝෂණීය මට්ටම නහා සිටුවීම
- ගොවීන්ගේ ආදායම් සහ රැකියා අවස්ථා වැඩිකිරීම සහ ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කිරීම සඳහා ග්‍රාමීය මට්ටමින් තිරසාර කෘෂි ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීම
- නිෂ්පාදන අලෙවියේ ගුණාත්මකභාවය, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ නව ශිල්පීය ක්‍රම භාවිතය ඇතුළුව පසු අස්වනු තාක්ෂණ ක්ෂේත්‍රයේ වැඩිදියුණු කළ ශිල්පීය ක්‍රම පිළිබඳ ඵලදායී තාක්ෂණ

හුවමාරුව හා ඒවා ගොවීන්, ගොවි සංවිධාන හා අනෙකුත් පාර්ශ්වකරුවන් හා වෙනත් අදාළ ඉලක්ක කණ්ඩායම් අතර ප්‍රචලිත කිරීම.

ඉහත දක්වා ඇති අරමුණු කරා ළඟා වීම සඳහා ආයතනය විසින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යභාරය විෂය පථ කිහිපයක් ඔස්සේ බෙදී යයි. ඒ පසු අස්වනු තාක්ෂණයට අදාළව සිදු කෙරෙන, පර්යේෂණ ව්‍යාපෘතින්, තාක්ෂණ ප්‍රචාරණ කටයුතු (පුහුණුපාඨමාලා, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්), සංවර්ධන ව්‍යාපෘතින් (නව සහ යෝග්‍ය තාක්ෂණයන් ක්ෂේත්‍රයේ භාවිතය සඳහා), උපදේශක සේවා සහ ඉංජිනේරු සේවා හා රසායනාගාර සේවා ලෙසය.

මෙම ප්‍රධාන ක්ෂේත්‍රයන් හරහා සිදුවන සියළු වැඩසටහන් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට ඉවහල් වෙයි. එසේම නිවැරදි තාක්ෂණික ක්‍රමවේදයන් පසු අස්වනු පරිහරණයට යොදා ගැනීම තුළින් ආහාර වල පෝෂණීය ගුණාත්මය සුරැකෙන අතර ගොවීන්ගේ හා සැපයුම්දාමයේ පාර්ශ්වකරුවන්ගේ ආදායම ඉහළ යාමක්ද නව රැකියා උත්පාදනය වීමක්ද සිදු වේ.

පසුගිය කාලය මුළුල්ලේම හා වර්තමානයේදීත් ගොවිපොලේ සිට පාරිභෝගිකයා දක්වාම කෘෂිබෝගයන්ගේ සැපයුම් හා අගය දාමය තුළ සිදුවන පසු අස්වනු හානිය අවම කරමින් ජාතික ආහාර සුරක්ෂිතාව ඇති කරලීමෙහිලා විශාල මෙහෙයක් ජාතික පසු අස්වනු කළමණාකරණ ආයතනය විසින් ඉටු කරමින් සිටී.

2022 වර්ෂයේ ක්‍රියාත්මක සැළසුමට අනුව අප විසින් සිදුකරන ලද කාර්යයන්හි ප්‍රගතිය ඒ ඒ ක්ෂේත්‍රයන් යටතේ සැකෙවින් පහත දක්වා ඇත.

6.7. පර්යේෂණ ව්‍යාපෘතින්

පර්යේෂණ ව්‍යාපෘතින් ප්‍රධාන ක්ෂේත්‍ර 03ක් ඔස්සේ ක්‍රියාත්මක විය.

1. කෘෂි බෝගයන්ගේ පසු අස්වනු හානිය අවම කිරීම හා පසු අස්වනු ජීව කාලය ඉහළ නැංවීම
2. අස්වැන්න සඳහා අගය එකතු කිරීම හා ආහාර තාක්ෂණය
3. සුරක්ෂිත ආහාර සහ පෝෂණය

මෙම ක්ෂේත්‍රයන්ට අදාළව පවතින ගැටළු සඳහා විසඳුම් පර්යේෂණ ව්‍යාපෘතින් තුළින් හඳුනාගෙන ඇත.

6.8. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදනය		තත්‍ය වියදම (රු.මි.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ %ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.මි.)	අවසාන ප්‍රතිපාදනය (රු.මි.)		
පුනරාවර්තන	149.82	149.82	131.38	87.69
1401 ප්‍රචාරණ			28,829,000	-	(2,381,494)	26,447,506	17,400,243	5,998,387	23,398,630	3,048,876		
1402 කැපැල් හා සන්නිවේදන			19,416,000	-	825,894	20,241,894	16,354,501	1,488,715	17,843,215	2,398,679	12%	
1403 විදුලිය හා ජලය			28,181,000	-	(500,000)	27,681,000	19,271,061	311,909	19,582,971	8,098,029	29%	
1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු			16,500,000	-	1,600,000	18,100,000	15,245,682	-	15,245,682	2,854,318	16%	
1406 කල්බදු වාහන සඳහා පොලී ගෙවීම්			-	-	-	-	-	-	-	-	-	
1408 මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රශ්පාදිත වාහන සඳහා වාරික ගෙවීම්			864,000	-	-	864,000	864,000	-	864,000	-	0%	
1409 වෙනත්			47,938,000	-	6,890,984	54,828,984	48,104,030	4,371,583	52,475,613	2,353,371	4%	ඒක් ඒක් අංශ අනුව වෙන් වෙන් වශයෙන් දන්වා ඇත
එකතුව (ඈ)			**141,728,000**	-	**6,435,384**	**148,163,384**	**117,239,516**	**12,170,594**	**129,410,110**	**18,753,274**	**13%**	
අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම් (අ+ආ+ඇ+ඈ)			**316,516,000**	**300,339**	**22,244,014**	**339,060,353**	**273,188,467**	**31,061,200**	**304,249,667**	**34,810,686**	**10%**	
වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද මාරුකිරීම්, ප්‍රදානයන් සහ සහනාධාර	7											
<u>මාරුකිරීම්</u>												
1505 සමිතිවාදම් සහ දායක මුදල්			61,500,000	-	(27,381,844)	34,118,156	53,680	-	53,680	34,064,476	100%	
1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී			8,800,000	-	(376,500)	8,423,500	4,288,333	1,905,380	6,193,714	2,229,786	26%	
1507 පළාත් සභා සඳහා ප්‍රදානයන්			-	-	-	-	-	-	-	-	-	
1508 වෙනත්			500,000	-	-	500,000	494,136	-	494,136	5,864	0%	
1509 රාජ්‍ය ආයතන (වෙනත් මෙහෙයුම් වියදම්)			-	-	-	-	-	-	-	-	-	
එකතුව			**70,800,000**	-	**(27,758,344)**	**43,041,656**	**4,836,150**	**1,905,380**	**6,741,530**	**36,300,126**	**84%**	

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 118 අමාත්‍යාංශයේ නම : කෘෂිකර්ම අමාත්‍යාංශය

රු.

වැය විෂයය	සටහන	ප්‍රතිපාදනය					වියදම			ඉදිරිය වෙනස්කම්		වෙනස්කම්වලට හේතු
		මූල්‍යකරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරු කිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන	මුදල් පොතට අනුව වියදම	මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව)	මුළු වියදම	ඉතිරිය / (ඉක්මවීම්)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස	
			(1)	(2)	(3) (-)/+	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)= (5)+(6)	(8)=(4)-(7)	(9)=(8)/(4)*100	
වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම්	9											ඒක් ඒක් අංශ අනුව වෙන් වෙන් වශයෙන් දන්වා ඇත
1703 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම			520,000	-	(100,000)	420,000	193,511	-	193,511	226,490	54%	
එකතුව			**520,000**	**-**	**(100,000)**	**420,000**	**193,511**	**-**	**193,511**	**226,490**	**54%**	
වැඩසටහන (1)												
මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (සටහන 5-9)			**1,946,102,000**	**9,889,875**	**(7,630,585)**	**1,948,361,290**	**1,275,101,882**	**542,807,770**	**1,817,909,652**	**130,451,638**	**7%**	
මූලධන වියදම්												
වැඩසටහන (1)												
වැය විෂය අනුව රාජ්‍ය ආයෝජන වියදම් වර්ගීකරණය												
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10											
2001 ගොඩනැගිලි සහ ඉදිනිරිම්			26,700,000	100,000	4,272,000	31,072,000	13,240,666	-	13,240,666	17,831,334	57%	
2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ			4,345,000	-	-	4,345,000	576,557	258,601	835,157	3,509,843	81%	
2003 වාහන			16,443,000	125	-	16,443,125	8,403,410	556,500	8,959,910	7,483,215	46%	
එකතුව (අ)			**47,488,000**	**100,125**	**4,272,000**	**51,860,125**	**22,220,633**	**815,101**	**23,035,734**	**28,824,391**	**56%**	
මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11											
2101 වාහන			7,500,000	-	(2,000,000)	5,500,000	1,263,588	49,250	1,312,838	4,187,162	76%	
2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ			10,795,000	-	(1,200,000)	9,595,000	804,319	174,500	978,819	8,616,181	90%	
2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ			**18,295,000**	**-**	**(3,200,000)**	**15,095,000**	**2,067,907**	**223,750**	**2,291,657**	**12,803,343**	**85%**	
එකතුව (ආ)												

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 118

අමාත්‍යාංශයේ නම : කෘෂිකර්ම අමාත්‍යාංශය

රු.

වැය විෂයය	සටහන	ප්‍රතිපාදනය					වියදම			ඉද්ධ බලපෑම		
		මූල්‍යකරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරු කිරීම්	මුළු ඉද්ධ ප්‍රතිපාදන	මුදල් පොතට අනුව වියදම්	මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව)	මුළු වියදම	ඉතිරිය / (ඉක්මවීම)	ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තු වේ % ලෙස	වෙනස්කම්වලට හේතු
			(1)	(2)	(3) (-)/+	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)= (5)+(6)	(8)=(4)-(7)	(9)=(8)/(4)*100	
හැකියා වර්ධනය	14		7,500,000	-	572,125	8,072,125	4,181,317	-	4,181,317	3,890,808	48%	ඒක් ඒක් අංශ අනුව වෙන් වෙන් වශයෙන් දන්වා ඇත
2401 කාර්ය මණ්ඩල පුහුණු			7,500,000	-	572,125	8,072,125	4,181,317	-	4,181,317	3,890,808	48%	
එකතුව (ඉ)												
වෙනත් මූලධන වියදම්	15		2,000,000	-	-	2,000,000	-	-	-	2,000,000	100%	
2509 වෙනත්			2,000,000	-	-	2,000,000	-	-	-	2,000,000	100%	
එකතුව (ඊ)												
වැඩසටහන (1)												
රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදම් (අ+ආ+ඇ+ඈ+ඉ+ඊ)			75,283,000	100,125	1,644,125	77,027,250	28,469,857	1,038,851	29,508,708	47,518,542	62%	
මුළු වියදම්වල එකතුව (සටහන 5-15)			2,021,385,000	9,990,000	(5,986,460)	2,025,388,540	1,303,571,739	543,846,621	1,847,418,360	177,970,180	9%	

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2023.02.27

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මූල්‍ය නිලධාරි
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය



මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය - 2022



සමුච්චිත මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය - මධ්‍යම රජය 2022

ඉඩම්-9153:	405,408,000	වගුව:	SA 82
ගොඩනැගිලි- 9151:	1,011,525,000	වර්ෂය:	2022
යන්ත්‍රෝපකරණ-9152:	1,533,779,934	වාර්තාවේ දිනය	2/10/2023 15:25
නොනිමි වැඩ -9160:	-	ශීර්ෂය	118
අස්පෘශ්‍ය-9154:	132,710		
කල්බදු-9180:	-		

ලෙජරය	කාණ්ඩය	අයිතමය	කේත අංකය	ආරම්භක ශේෂය	ආරම්භක ශේෂය ඒකතු කිරීම	හුවමාරු	මිළදී ගැනීම්	අපහරණය	ශේෂය
9151	1.2-නිවාස නොවන ගොඩනැගිලි		61112	1,011,525,000	-	-	-	-	1,011,525,000
		කාර්යාල ගොඩනැගිලි	****6111201	1,011,525,000	-	-	-	-	1,011,525,000
9152	2.1-ප්‍රවාහන උපකරණ		61121	1,241,262,040	2,157,470	-	-	67,000,000	1,176,419,510
		මගී වාහන	****6112101	1,240,137,820	2,157,470	-	-	67,000,000	1,175,295,290
		යතුරු පැදි	****6112109	1,124,220	-	-	-	-	1,124,220
9152	2.2-වෙනත් යන්ත්‍ර හා උපකරණ		61122	345,427,750	386,246	-	15,320,900	3,774,472	357,360,424
		කාර්යාලීය උපකරණ	****6112201	25,936,467	116,750	-	383,478	307,281	26,129,415
		පරිගණක උපකරණ	****6112202	99,594,645	244,678	-	6,568,418	2,291,722	104,116,020
		විද්‍යුත් උපකරණ	****6112203	17,981,769	-	-	2,917,991	964,587	19,935,174
		සන්නිවේදන උපකරණ	****6112204	36,796,329	-	-	4,166,977	2,000	40,961,305
		ගෘහභාණ්ඩ	****6112205	164,965,810	24,818	-	1,284,036	208,884	166,065,781
		චිත්‍ර මූර්ති හා වෙනත් ඉපැරණි භාණ්ඩ	****6112209	137,100	-	-	-	-	137,100
		ඉදිකිරීම් උපකරණ	****6112213	15,630	-	-	-	-	15,630
9154	5.3 අනෙකුත් මූල්‍ය නොවන - අස්පෘශ්‍ය		61133	132,710	-	-	-	-	132,710
		පරිගණක මෘදුකාංග	****6113301	132,710	-	-	-	-	132,710
9153	4.1-ඉඩම්		61410	405,408,000	-	-	-	-	405,408,000
		ඉඩම්	****614100	405,408,000	-	-	-	-	405,408,000

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ඒආර්අයි/ඒ/එම්ඕඒ/02/2022/49 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 මැයි දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය

ශීර්ෂය 118 - කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ,තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වනනමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සමඟ අනුරූපවන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

පසුගිය වර්ෂයේ පැවැති රාජ්‍ය අමාත්‍යාංශ 03 ක් සමාලෝචිත වර්ෂයේදී අහෝසි කර කෘෂිකර්ම අමාත්‍යාංශයට ඇතුළත් කර ඒවායේ එකතු වටිනාකම් අමාත්‍යාංශ මූල්‍ය තොරතුරුවල ඇතුළත් කර තිබුණි. පසුගිය වර්ෂයේ හෙළිදරව් කළ යුතු මූල්‍ය තොරතුරුවලට අහෝසි කළ අමාත්‍යාංශ 03 හි තොරතුරු හැර කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය තොරතුරු පමණක් ඇතුළත්කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ, සමාලෝචිත වර්ෂය අවසන් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සඳහන් සංසන්දනාත්මක තොරතුරු අනුරූප නොවන බව නිරීක්ෂණය විය.

1.6.1.1 ආදායම් ලැබීම්

(අ) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 01 දින සිට බල පැවැත්වෙන පරිදි සංශෝධිත අයවැය ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත්කිරීමෙන් මූලික අයවැයෙහි සඳහන් ආදායම් ඇස්තමේන්තුව සංශෝධනයකර ගැනීමේ හැකියාවක් පැවතියද සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ මූලික ආදායම් ඇස්තමේන්තුව වූ රු. මිලියන 310 වෙනස් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 219 ක ආදායමක් රැස්කරගෙන තිබූ අතර ඒ අනුව සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම අතර රු. මිලියන 91 ක වෙනසක් වූයෙන් එම වෙනස සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 29 ක් වී තිබීම හේතුවෙන් අමාත්‍යාංශයේ ආදායම් රැස්කිරීමේ කාර්යක්ෂමතාවය සඵලදායීතාවය දුර්වල මට්ටමක පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ආදායම් සංකේත අංක 2003.07.00 රජයේ වී මිලදී ගැනීමේ වැඩ සටහනේ සමාලෝචිත වර්ෂය අවසානයට පසුගිය වර්ෂයට පෙර වර්ෂවලට අදාළව රු. 12,827,927 ක්ද, පසුගිය වර්ෂයට අදාළව රු. 124,965,567 ක් හා සමාලෝචිත වර්ෂයට අදාළව රු. 299,292,219 ක්ද වශයෙන් එකතුව රු. 437,085,714 ක හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගැනීමට අමාත්‍යාංශය අසමත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රැස්කළ මුළු ආදායම රු. 219,195,185 කි. ඒ අනුව සමස්ත හිඟ ආදායම සමාලෝචිත වර්ෂයේදී රැස්කළ ආදායමෙන් සියයට 199 වීම හේතුවෙන් අමාත්‍යාංශයේ හිඟ ආදායම් රැස්කර ගැනීමේ කාර්යක්ෂමතාවය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ආදායම් සංකේත අංක 2003.07.00 රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයට අදාළ අයවිය යුතු සමස්ත හිඟ මුදල රු. 308,968,951 ක් වන අතර සමාලෝචිත වර්ෂයේදී සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ආදායමෙන් රු. 9,676,732 ක් පමණක් අයකරගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට සමාලෝචිත වර්ෂයට අදාළ තවදුරටත් හිඟ ආදායම් ශේෂය රු. 299,292,219 කි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළ අයවිය යුතු හිඟ ආදායමෙන් රැස්කළ ආදායම සියයට 3 ක වැනි කුඩා ප්‍රතිශතයක් වීම හේතුවෙන් අමාත්‍යාංශයේ හා තවදුරටත් හිඟ ආදායම සියයට 97 ක් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් රැස්කිරීමේ කාර්යක්ෂමතාවය ඉතාම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

1.6.1.2 පරිපූරක ඇස්තමේන්තු අධි ප්‍රතිපාදන

අමාත්‍යාංශය විසින් සංශෝධිත අයවැය ඇස්තමේන්තු වලින් වෙන්කළ ප්‍රතිපාදන වලට අමතරව පරිපූරක ඇස්තමේන්තු 05 ක් යටතේ ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර එම පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන වලින් සියයට 7 සිට 100 දක්වා පරාසයක රු.229,652,737 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබීම හේතුවෙන් අමාත්‍යාංශය විසින් අවශ්‍යතාවයට වඩා වැඩියෙන් පරිපූරක ඇස්තමේන්තු යටතේ ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට කටයුතුකර තිබුණු බව නිරීක්ෂණය විය.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

(අ) අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ ඇති මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කෘෂිකර්ම අමාත්‍යාංශයේ භාවිතයේ නොමැති වටිනාකම රු. 69,900,000 ක් වූ වාහන 06 ක් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.

(ii) අමාත්‍යාංශයේ භාවිතයේ පවතින KS - 6781 දරන වාහනයේ තක්සේරු වටිනාකම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එම වාහනය හා තක්සේරු වටිනාකම්වල එකතුව රු. 179,272,000 ක් වූ TP-4769 දරන යතුරු පැදිය හා මෝටර් වාහන 14 ක් වශයෙන් සමස්ත වාහන 16 ක වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. කෙසේ නමුත් එම වාහනවලින් 12 ක ලියාපදිංචි අයිතිය

කෘෂිකර්ම අමාත්‍යාංශය නමින් නොපවතින අතර එම වාහන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කිරීම හෝ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017 දෙසැම්බර් 21 දිනැති හා අංක 2/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අදාළ අමාත්‍යාංශය වෙත නැවත භාරදීමක් හෝ සිදුකර නොතිබුණි.

(iii) කෘෂිකර්ම අමාත්‍යාංශයට නීත්‍යානුකූල හිමිකාරීත්වය නොමැති වටිනාකම රු. 24,700,000 ක් වූ වාහන 07 ක හිමිකාරීත්වය පවරානොගෙන අමාත්‍යාංශයේ ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ පශු සම්පත් අංශයේ ඇති මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශය විසින් වෙනත් ආයතන වෙතින් ලබාගෙන තිබූ වටිනාකම රු. 6,390,000 ක් වූ PG-1773 අංක දරන වාහනයේ අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) අමාත්‍යාංශය සතු KO-4865, GF-9312, PD-8931, KX-7664 , KX-8136 , KO-0024 ,CAA-0024 ,CAH-1634 යන අංක දරන වාහන 08 ක් බාහිර ආයතන වෙත මුදාහැරීමේ පදනම සහ අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොවීය.

(iii) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පශු සම්පත් අංශයට හිමිකාරීත්වය ඇති එකතු වටිනාකම රු. 139,800,000 ක් වන ඉහත (ආ) හි සඳහන් වාහන 08 පශු සම්පත් අංශයේ හෝ කෘෂිකර්ම අමාත්‍යාංශයේ වෙනත් අංශයක හෝ භෞතිකව නොපවතින අතර එම වාහන දැනට භාවිතා කරන ආයතනයට පැවරීම හෝ පශු සම්පත් අංශය වෙත නැවත ලබා ගැනීම මෙම වාර්තාවේ දිනය වන විටත් සිදුකර නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 1645(අ) හා මුදල් රෙගුලාසි 1647(අ) අනුව වාහන ලොග් පොත් ක්‍රමවත් හා විධිමත් ලෙස තොරතුරු ඇතුළත් කර යාවත්කාලීන තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු වුවද දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳව තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

1.6.2.2 භාණ්ඩ සමීක්ෂණ වාර්තා

(අ) අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ ඇති භාණ්ඩ සමීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව භාණ්ඩ වර්ග 85 ක අයිතම 187 ක ඌනතාවයක් ද භාණ්ඩ වර්ග 45 ක අයිතම 83 ක අතිරික්තයක් ද නිරීක්ෂණය විය.

(ii) 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් නමුත් අමාත්‍ය කාර්යය මණ්ඩල කාමරයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් වී නොමැති භාණ්ඩ වර්ග 26 ක අයිතම 44 ක් නිරීක්ෂණය විය.

(iii) පසුගිය භාණ්ඩ සමීක්ෂණ වාර්තාව (2021) මගින් අලුත්වැඩියා කළයුතු (R) භාණ්ඩ 09 ක් ද විනාශ කළයුතු භාණ්ඩ (D) 12 ලෙස නිර්දේශ කර තිබූ ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ පවතින භාණ්ඩ සම්බන්ධයෙන් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය 2023 අප්‍රේල් මස 12 වන විටත් අවසන් කොට නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ පශු සම්පත් අංශයේ ඇති භාණ්ඩ සමීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව භාණ්ඩ වර්ග 40 ක අයිතම 90 ක අතිරික්තයක් ද භාණ්ඩ වර්ග 50 ක අයිතම 126 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ii) 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට ඇතුළත් නමුත් ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් වී නොමැති භාණ්ඩ වර්ග 06 ක අයිතම 11 ක් නිරීක්ෂණය විය.

(iii) පසුගිය භාණ්ඩ සමීක්ෂණ වාර්තාව (2021) මගින් අලුත්වැඩියා කළයුතු (R) භාණ්ඩ 21 ක් ද විනාශ කළයුතු භාණ්ඩ (D) 24 ලෙස නිර්දේශ කර තිබූ ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ පවතින භාණ්ඩ සම්බන්ධයෙන් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය 2023 අප්‍රේල් මස 06 වන විටත් අවසන් කොට නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

මු.රෙ.128 (2) (ඇ), මු.රෙ.176 (1) අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 08 ඡේදය පරිදි අංක 2003.07.00 දරන ආදායම් සංකේතය යටතේ අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා එකී කාලසීමාව අවසන් වී මාසයක් ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂවරයාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, 2022 වර්ෂයට අදාළව එම වාර්තා කිසිවක් පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 ඔක්තෝබර් 01 දින සිට අභෝසි වී ගිය, කෘෂිකර්ම අමාත්‍යාංශයට ඇතුළත් කළ රාජ්‍ය අමාත්‍යාංශ 03 කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය ආර්ථික අංශය, පොහොර අංශය හා පශු සම්පත් අංශය වශයෙන් ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය විය. එම අංශවල මූල්‍ය පාලනය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් බලතල පැවරීමක් සිදුකර තිබුණු බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවීය.

(ආ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හා 2022 දෙසැම්බර් 13 දිනැති මාර්ගෝපදේශයේ 3.4 ඡේදය ප්‍රකාරව එක් එක් වැය විෂය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනස හා එම වෙනසට හේතු එස්ඒ-2 (ii) ආකෘතියේ දැක්විය යුතුය. නමුත් අමාත්‍යාංශයේ එස්ඒ-2(ii) අකෘතියේ එක් එක් වැය විෂය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයයක් වෙනුවෙන්ම උක්ත පරිදි කටයුතු නොකර වැය විෂය සංකේතාංක දෙකක් එකතු කරමින් මුළු ශුද්ධ ප්‍රතිපාදනය, සත්‍ය වියදම හා වෙනස සඳහන් කර තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ ඇති බැරකම් හා බැඳීම්වලට එළඹීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 94(l) ප්‍රකාරව ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳිය නොහැකි වුවද, අමාත්‍යාංශය විසින් වැය විෂයයන් 18 ක ඉතිරිවීම් ඉක්මවා රු. 2,312,760,277 ක බැරකම් සඳහා බැඳී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා විසර්ජන පනතින් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු පුනරාවර්ථන වැය විෂයයන් 02 ක් හා මූලධන වැය විෂයයන් 01 ක් සඳහා එකතුව රු. 8,818,198 ක බැරකම්වලට බැඳී තිබුණි.

(iii) කෘෂිකර්ම අංශය වර්ෂයට අදාළ රු. 3,585,762 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල බැරකම් හා බැඳීම් ප්‍රකාශයේ සටහන් අංක (iii) යටතේ ඇතුළත් කර නොතිබුණි

(iv) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හා 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ මාර්ගෝපදේශයන්හි 6 ඡේදය ප්‍රකාරව එනම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කළයුතු ආකෘති පත්‍ර ලේඛනයට අනුව 2022.12.31 දිනට අමාත්‍යාංශයට අදාළ සියළුම බැඳීම් හා බැරකම් සටහන් (III) බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය මගින් හෙළිදරව් කළයුතු වුවද එසේ හෙළිකර නොතිබුණි.

(v) විගණනය වෙත ඉදිරිපත් කරන ලද බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (ඇමුණුම III) හි දක්වා තිබූ අගයන් හා භාණ්ඩාගාර සමුච්චිත බැඳීම් හා බැරකම් පිළිබඳ වාර්තාවෙහි (SA 92) සඳහන් අගයන් අතර රු. 25,030,734,894 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශයේ 2022 දෙසැම්බර් මාසයට අදාළ සනීපාරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් සමාකා ක්ලීනින් එන්ටර්ප්‍රයිසස් වෙත 2023 පෙබරවාරි 01 දින ගෙවන ලද රු.149,950 ක ගාස්තුව 2022 දෙසැම්බර් 31 දිනට බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති රීති රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
(i) මු.රෙ. 104	ග්‍රාමීය අංශයේ අනුකූල නොවීම • අංක KY – 5536 දරන වාහනය මිලදී ගත් දින සිට අනතුර සිදුවන අවස්ථාව දක්වා දිගින් දිගටම දේශීය නියෝජිත ආයතනය විසින් සේවා කිරීම සිදු කර තිබුණු අතර අනතුරට පත් වාහනය අලුත්වැඩියාව සඳහා දේශීය නියෝජිත ආයතනය වූ ඇසෝසියේටඩ් මෝටර් වේස් පුද්ගලික ආයතනය විසින් රු. 5,071,832 ක ඇස්තමේන්තුවක් ලබාදී තිබුණි. නමුත් අදාළ රථය අලුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් වාසිදායක නොවන බව සඳහන් කළ රක්ෂණ ආයතනය විසින් රු. 5,480,000 ක මුදලට වාහනයේ සම්පූර්ණ අයිතිය පවරා දෙන ලෙස ඉල්ලීම් කර තිබුණි. • නියෝජිත ආයතනය විසින් ලබාදුන් රු. 5,071,832 ක ඇස්තමේන්තුව රක්ෂණ සමාගම විසින් අනුමත නොකර මිල ගණන් කැඳවා ඉදිරිපත් කළ අවම මිල වූ රු. 1,700,000 ක මුදල අනුමත කර තිබුණි. රක්ෂණ සමාගම සමස්ත අලාභ (Total Loss) කළ බව සඳහන් කර තිබියදී මිල ගණන් කැඳවා ඉදිරිපත් කළ අවම මිල වූ රු. 1,700,000 රක්ෂණ සමාගම විසින් ලබාදීමට එකඟ වීමත් නියෝජිත ආයතනය විසින් ලබාදුන් රු. 5,071,832 ක ඇස්තමේන්තුව රක්ෂණ ආයතනය විසින් නොගෙවා වාහනය පවරා ගැනීමට කරන ලද ඉල්ලීමත් සලකා බැලීමේදී මෙම වාහනය ධාවනයට සුදුසු තත්ත්වයෙන් අලුත්වැඩියාව සිදු කළේද යන්න විගණනයේදී ගැටලු සහගත විය. • යාන්ත්‍රික ඉංජිනේරු විසින් වාහනයේ එක් එක් අයිතමවල යෝග්‍යතාවය වෙන වෙනම තහවුරු කර නොතිබුණු අතර 2023 අප්‍රේල් 25 දින රථය ධාවනයට සුදුසු පරිදි අලුත්වැඩියා කළ බවට ලිපියක් පමණක් ලබාදී තිබුණි. මෙම

	ඉංජිනේරුවරයාගේ ලිපියෙන්ද වාහනය ධාවනයට සුදුසු තත්ත්වයේ පවතීද යන්න විගණනයේදී ගැටලු සහගත විය.
(ii) මු.රෙ. 138(6) සහ (8)	වාහන අලුත්වැඩියා කිරීම සඳහා මුදල් ගෙවීමේදී අනුකාරක සාක්ෂි ලෙස අලුත්වැඩියා කටයුතු නිසි පරිදි ඉටුවී ඇති බවට යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශ නොමැතිව වාහන 09 ක් අලුත්වැඩියා කිරීම සඳහා රු. 984,827 ක් ගෙවීම් කර තිබුණි. මුදල් රෙගුලාසි අංක 138 ප්‍රකාරව ගෙවීම් සඳහා වෙනත් වවුචරයක් පසු අවස්ථාවක සහතික කිරීම වලක්වාලීම සඳහා බලය ලත් නිලධාරියා කටයුතු කළ යුතු වුවද නාමමාත්‍ර ඉන්වොයිසි සඳහා රු. 265,008 ක්ද, ඉන්වොයිසිවල ඡායා පිටපත් පදනම් කරගෙන රු. 288,484 ක්ද ගෙවීම් කර තිබුණි.
(iii) මු.රෙ 891(1)	ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.
(iv) 1645 (ආ), (ඇ) හා මු.රෙ.1646	වාහනවල ගමන් පිළිබඳ මාසික සාරාංශවල මුල් පිටපත් හා ධාවන සටහන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත් 2022 වර්ෂයට අදාළව නිල හා සංචිත වාහනවල ධාවන සටහන් හා මාසික සාරාංශ වාහන බාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.
(v) මු.රෙ. 1647	අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශයේ එක් නිලධාරියෙකුගෙන් තවත් නිලධාරියෙකුට වාහනයේ ආරක්ෂාව භාරදෙනු ලැබූ වහාම වාහන සහ උපකරණ පිළිබඳ සමීක්ෂණයක් කළ යුතුය. තවද වාහනයේ උපකරණවල සහ අමතර උපකරණවල ආරක්ෂාව සම්බන්ධයෙන් වෙනස්කම් ඇතිවන කවර අවස්ථාවලදී වුවද ඒවා එසේ භාරගනු ලැබූ බවට සටහනක් ලොග් පොතේ සටහන් කළ යුතුය. කෙසේ වුවද වාහන 07 ක් රියදුරන් වෙත භාරදීමේදී එම විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ)	2020.10.02 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අංක 5 / 2020 02 (අ) ඡේදය සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 1 කොටසහි 13.2 ඡේදයට අදාළ වන මාර්ගෝපදේශ අංක 03	පශු සම්පත් අංශයේ ධාවන තත්වයේ නොපවතින වාහන 2020.12.31 පෙර අපහරණය කළ යුතු බවත් අයවැය ප්‍රතිපාදන හෝ පළාත් සභා අරමුදල් භාවිත කරන ආයතන එම වාහන අපහරණය කිරීමෙන් උපයාගත් මුදල් අදාලව අරමුදලට බැර කළ යුතු බව දක්වා තිබුණ ද අපහරණ කමිටුව විසින් අපහරණය සඳහා නිර්දේශ කර තිබියදී 2022 මාර්තු 01 දින වන විටත් 65-6120 ලියාපදිංචි අංක දරන වාහන ධාවනයට නුසුදුසු තත්වයේ පැවති අතර 65-6120 අංක දරන වාහනය සඳහා ලිපිගොනුවක් නඩත්තු කර නොමැති බව දන්වා තිබුණි.

2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

(අ) මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව නියමිත කාර්යය අවසන් කළ වහාම ලබාගත් අත්තිකාරම් පියවීම කළයුතු වුවත් කෘෂිකර්ම අංශයේ නිලධාරීන් 06 දෙනෙකු වෙත නිකුත්කර තිබුණු එකතුව රු. 228,080 අතුරු අග්‍රිම පියවීමට දින 30 සිට දින 116 දක්වා කාල පරාසයක්ද පශු සම්පත් අංශයේ නිලධාරීන් 09 දෙනෙකු වෙත නිකුත්කර තිබුණු එකතුව රු. 156,024 ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 50 සිට දින 240 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

(ආ) පශු සම්පත් අංශයේ තත්කාර්යය අතුරු අග්‍රිම ලබාගැනීමෙදී එම මුදල් ලබාගත් අවශ්‍යතාවයට වියදම් නොකර එම ලබාගත් මුළු අත්තිකරම් මුදලම දින 07 සිට දින 55 දක්වා කාලයකින් නැවත මුදලින් පියවා ඇති අවස්ථා 04 ක් නිරීක්ෂණය විය. එම අත්තිකාරම් වල මුළු වටිනාකම රු. 67,740 විය.

2.6 පාඩු හා අත්හැරීම්

අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශයේ පාඩු හා අත්හැරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි අනුව වාහන අනතුරු සඳහා අයවිය යුතු රු. 114,343 ක අලාභය වගකිව යුතු රියදුරන් දෙදෙනෙකු වෙතින් අය කරගෙන නොතිබුණි. එම රියදුරන් අමාත්‍ය කාර්යය මණ්ඩලයෙන් ඉවත් වී තිබුණද අයකර ගත යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 – 10 ත් අතර කාලයට අයත් රු. 141,311 ක සහ වර්ෂ 10 ට වැඩි රු. 430,139 ක්ද ලෙස එකතු වටිනාකම රු. 571,450 ක් වූ ශේෂ තවදුරටත් අයකර ගැනීමට අමාත්‍යාංශය විසින් අපොහොසත් වී තිබුණි.

(ඇ) ලියාපදිංචි අංක KY - 5535 හා CAV – 5064 දරන වාහන 02 ට සිදුවූ අනතුරු හේතුවෙන් රු. 7,982,290 ක අලාභය තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය තුළ ඇතුළත් කර නොතිබුණි.

(ආ)	2020.10.02 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අංක 5 / 2020 02 (අ) ඡේදය සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 1 කොටසහි 13.2 ඡේදයට අදාළ වන මාර්ගෝපදේශ අංක 03	පශු සම්පත් අංශයේ ධාවන තත්වයේ නොපවතින වාහන 2020.12.31 පෙර අපහරණය කළ යුතු බවත් අයවැය ප්‍රතිපාදන හෝ පළාත් සභා අරමුදල් භාවිත කරන ආයතන එම වාහන අපහරණය කිරීමෙන් උපයාගත් මුදල් අදාලව අරමුදලට බැර කළ යුතු බව දක්වා තිබුණ ද අපහරණ කමිටුව විසින් අපහරණය සඳහා නිර්දේශ කර තිබියදී 2022 මාර්තු 01 දින වන විටත් 65-6120 ලියාපදිංචි අංක දරන වාහන ධාවනයට නුසුදුසු තත්වයේ පැවති අතර 65-6120 අංක දරන වාහනය සඳහා ලිපිගොනුවක් නඩත්තු කර නොමැති බව දන්වා තිබුණි.

2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

(අ) මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව නියමිත කාර්යය අවසන් කළ වහාම ලබාගත් අත්තිකාරම් පියවීම කළයුතු වුවත් කෘෂිකර්ම අංශයේ නිලධාරීන් 06 දෙනෙකු වෙත නිකුත්කර තිබුණු එකතුව රු. 228,080 අතුරු අග්‍රිම පියවීමට දින 30 සිට දින 116 දක්වා කාල පරාසයක්ද පශු සම්පත් අංශයේ නිලධාරීන් 09 දෙනෙකු වෙත නිකුත්කර තිබුණු එකතුව රු. 156,024 ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 50 සිට දින 240 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

(ආ) පශු සම්පත් අංශයේ තත්කාර්යය අතුරු අග්‍රිම ලබාගැනීමෙදී එම මුදල් ලබාගත් අවශ්‍යතාවයට වියදම් නොකර එම ලබාගත් මුළු අත්තිකරම් මුදලම දින 07 සිට දින 55 දක්වා කාලයකින් නැවත මුදලින් පියවා ඇති අවස්ථා 04 ක් නිරීක්ෂණය විය. එම අත්තිකාරම් වල මුළු වටිනාකම රු. 67,740 විය.

2.6 පාඩු හා අත්හැරීම්

අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශයේ පාඩු හා අත්හැරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි අනුව වාහන අනතුරු සඳහා අයවිය යුතු රු. 114,343 ක අලාභය වගකිව යුතු රියදුරන් දෙදෙනෙකු වෙතින් අය කරගෙන නොතිබුණි. එම රියදුරන් අමාත්‍ය කාර්යය මණ්ඩලයෙන් ඉවත් වී තිබුණද අයකර ගත යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 – 10 ත් අතර කාලයට අයත් රු. 141,311 ක සහ වර්ෂ 10 ට වැඩි රු. 430,139 ක්ද ලෙස එකතු වටිනාකම රු. 571,450 ක් වූ ශේෂ තවදුරටත් අයකර ගැනීමට අමාත්‍යාංශය විසින් අපොහොසත් වී තිබුණි.

(ඇ) ලියාපදිංචි අංක KY - 5535 හා CAV – 5064 දරන වාහන 02 ට සිදුවූ අනතුරු හේතුවෙන් රු. 7,982,290 ක අලාභය තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය තුළ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය විසින් කර්මාන්ත අමාත්‍යාංශයේ අංක KK - 5865 දරන වාහනය 2019 ජනවාරි 10 දින සිට භාවිතා කර ඇති නමුත් 2023 අප්‍රේල් 25 දින දක්වා එය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.7 පොදු තැන්පත්

(අ) පොහොර අංශයේ තැන්පත් ගිණුමකට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්මවූ රු. 126,000 ක තැන්පතුවක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) පශු සම්පත් අංශයේ තැන්පත් ගිණුමකට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්මවූ රු. 440,439 ක් වූ තැන්පතු 02 ක් සම්බන්ධයෙන් උක්ත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

භාණ්ඩාගාර ලේකම්ගේ අංක BDKBP/01/01/03-2023 හා 2022 දෙසැම්බර් 21 දිනැති අයවැය වක්‍රලේඛයේ 18 වැනි වගන්තිය ප්‍රකාරව අහෝසි වී ගිය වැය ශීර්ෂවලට අදාළ අක්‍රීය නිල බැංකු ගිණුම් සහ අනුමත අග්‍රිම ගිණුම් වසා දැමීමේ කාර්යයයේ වගකීම අහෝසි වූ අමාත්‍යාංශවල සේවය කළ ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී වෙත පවරා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ අහෝසි වූ වැය ශීර්ෂ 407,426 හා 427 වලට අදාළ නිල බැංකු ගිණුම් මෙම වාර්තාවේ දිනය දක්වාම වසා දැමීමට කටයුතුකර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

අනු අංකය	බැංකුවේ නම	ගිණුමේ නම	ගිණුම් අංකය	2022.12.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය(රු.)
01.	ලංකා බැංකුව යුනියන් පෙදෙස	ලේකම්, පශු සම්පත් ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය	7040733	43,741,749
02.	ලංකා බැංකුව බත්තරමුල්ල	ලේකම්,කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර එළවළු, පළතුරු, මිරිස්, ඵණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය	7040749	5,964,644
03.	ලංකා බැංකුව තැප්‍රෝබෙන්	ලේකම්, පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය සහ ගෘහාශ්‍රිත සත්ව පාලන හා සුළු ආර්ථික භෝග ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	7040184	2,110,851

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ දුර්වලතා

අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශයට වෙන්කල අංක CAV – 5064 දරන වාහනය රාජ්‍ය අමාත්‍යවරයාට අනුයුක්තව තිබියදී 2021 ජුනි 21 දින මඩකලපුවේ සිට කොළඹ රාජගිරිය ප්‍රදේශයේදී එය පණගැන්වීමට නොහැකි වී ඇත.එම දෝෂය විමර්ශනයට නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇතත් කාර්මික දැනුම ඇති නිලධාරියකු එහි නොවීය. එම කමිටු වාර්තාවේ රථයේ දෝෂය පිලිබඳව කිසිදු දර්ශකයක් ඉදිරි යතුරු පුවරුවේ පෙන්නුම් නොකළ බවට වූ රියදුරුගේ ප්‍රකාශය මත විමර්ශන කමිටුව විසින් රියදුරු නිදහස් කර තිබුණි. එහෙත් 2021 ජුනි 22 දින නියෝජිත ආයතනයෙන් කැඳවූ වාර්තාවේ වතුර අඩුවීම, කූලන් නොමැතිව එක දිගට ධාවනය සහා එන්ජිම අධික ලෙස රත්වීම ඉදිරි යතුරු පුවරුවේ දර්ශක (Indicators) මඟින් සන්නිවේදනය පිළිබඳව සැලකිලිමත් නොවීම යන රියදුරුගේ අපරික්ෂාකාරී ධාවනය හා එහි තිබෙන සිලින්ඩර් 06 න් 03 ක් හානි වීමට (Sized) රියදුරු සෘජුවම වගකිව යුතු බව දක්වා තිබුණි. 2021 ජූලි 28 දින නියෝජිත ආයතනය ඒ සඳහා රු.3,076,878 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. තැපැල් දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා 2021 ජූලි 31 දිනැති ලිපිය මගින් එය නිර්දේශ කර ඇතත් නියෝජිත ආයතනය විසින් 2021 නොවැම්බර් 10 දින රු. 3,490,517 ක නව ඇස්තමේන්තුවක් නැවත ඉදිරිපත් කර තිබුණි. ප්‍රතිපාදන නොමැති වීමෙන් රු. 101,412 ක මුදලක් දරා 2021 නොවැම්බර් 24 දින එම වාහනය අමාත්‍යාංශ පරිශ්‍රයට ආපසු ගෙන්වා තිබුණි. තවත් ආයතනයක් වෙත වාහනය ලබාදී නැවත ලංසු කැඳවීමකදී 2021 නොවැම්බර් 25 දින රු. 3,896,300 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් වී තිබුණද නැවත රු. 18,500 ක වියදමක් දරා වාහනය අමාත්‍යාංශ පරිශ්‍රයටම ගෙන්වා තිබුණි. මෙලෙස වරින් වර වියදම් දරා කිසිදු අළුත්වැඩියාවකින් තොරව විගණිත දිනය වන තෙක්ම වාහනය අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල්කර තිබුණි. නියෝජිත ආයතනයෙන් රියදුරුගෙන් වාහනයට සිදුවූ ගණනය නොකළ අලාභය අය කිරීමටද කටයුතු කර නොකිරීම මෙන්ම තාක්ෂණික දැනුමකින් තොර කමිටුවක් පත් කිරීමෙන් විමර්ෂණ කටයුතු නිසි ලෙස ඉටු නොවී ඇති බවද විගණනයේදී නිරීක්ෂණය විය.

3.1.1 අයනොවූ තැන්පතු

(අ) 2016 අප්‍රේල් 08 දින සිට 2021 අප්‍රේල් 07 දින දක්වා එනම් වර්ෂ 05 ක කාල සීමාවක් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලී පදනම මත සී/ස ඩී.සී.ජයසිංහ ටුවර්ස් ඇන්ඩ් ට්‍රාන්ස්පෝට් පෞද්ගලික සමාගම වෙතින් ලබාගත් ඩීසීජේ ටවර්ස් නැමැති ගොඩනැගිලි පරිශ්‍රය බදු දීමනාකරුට නැවත 2020 ජනවාරි 31 දින භාර දී ඇතත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් එම බදු දීමනාකරු වෙත ගෙවන ලද රු. 63,000,000 ක ආපසු ගෙවිය යුතු ආරම්භක තැන්පතු මුදල මේ දක්වා අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී ඇත. තවද බදු දීමනාකාර පාර්ශවය විසින් මෙම තැන්පතු මුදල නීති විරෝධී ලෙස රඳවා තබාගෙන මේ දක්වා වසර 02 ක කාලයක් ඉක්මවා ගොස් ඇති බවද නිරීක්ෂණය කෙරේ.

(ආ) බදු කුලී ගිවිසුම අවසානයේදී දෙපාර්ශවයේ එකඟත්වය ඇතිව අලාභ හානි පිළිබඳ වාර්තාවක් කැඳවිය යුතු බවට අදාළ බදු ගිවිසුම තුළ කොන්දේසියක් ඇතුළත් නොවීම හේතුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් එම බදු දේපලට සිදු වී ඇති හානිය රු. 12,710,236 කටත් බදු දීමනාකාර සමාගම විසින් එම හානිය රු. 28,250,056 කටත් තක්සේරු කර ඇත. අදාළ ගොඩනැගිල්ලට සිදු වී ඇති හානිය ගණනය කර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් වාර්තාවක් ලබා ගැනීම මේ දක්වා ප්‍රමාද වී ඇත.

3.1.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අය නොවූ ශේෂ

(අ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට එකතුව හා එදිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය අතර රු. 3,522 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මු.රෙ. 485(4) හා මු.රෙ. 113(6)(අ) පරිදි ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තුන් මසක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, ස්ථාන මාරු වී ගිය නමුත් 2022 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් නොකළ ණය ශේෂයේ වටිනාකම රු. 229,350 ක් විය.

(ඇ) සේවය හැරගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු වූ රු. 140,557 ක ණය ශේෂය වර්ෂ 05 කට වඩා පැරණි වූ අතර වර්ෂ 3-4 අතර කාලයට අයත් නිලධාරීන් 04 දෙනෙකුගේ රු. 443,148 ක හිඟ ණය ශේෂයක්ද විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) වැඩ තහනම් කළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 537,149 ක ණය ශේෂ එම ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට 2022 දෙසැම්බර් 31 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

(ඉ) විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂවල අගය රු. 603,099 ක් වූ අතර එම ණය ශේෂ මාස 03 සිට වර්ෂ 03 දක්වා වන කාල පරාසයකට අයත් ඒවා බවට නිරීක්ෂණය විය.

4. කාර්යසාධනය

(අ) මුදල් අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇතුළු සියලුම පාර්ශවයන්හි එකඟතාවය ඇතිව ජාතික පොහොර ලේකම් කාර්යාලයෙහි අධ්‍යක්ෂවරයා විසින් 2009 ජූනි 26 දින රසායනික පොහොර ගෙන්වීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් අංක 4/5/6 Quality දරන ලිපිය නිකුත් කර තිබුණි. එහෙත් 2020 මාර්තු 19 දින සිට උක්ත 4/5/6 Quality ලිපිය තුළ ඇතුළත් ක්‍රමවේදය හා එතෙක් රසායනික පොහොර පරීක්ෂා කර අනුමැතිය ලබාදුන් ක්‍රමවේදය වෙනස්කර රසායනික පොහොර අලෙවි කිරීම සඳහා වෙළඳ අනුමැතිය ලබාදී තිබුණි.එසේ වෙළඳ අනුමැතිය ලබාදුන් අවස්ථා සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ පොහොර අංශයේ සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට නිර්දේශිත ප්‍රමිතීන් වෙනස් කිරීමට හෝ පවතින ක්‍රමවේදයෙන් බැහැරව බ්‍රිතාන්‍ය හෝ යුරෝපීය ප්‍රමිතීන් භාවිතයෙන් රසායනාගාර පරීක්ෂාවන් සිදු කිරීමට, ජනාධිපතිතුමා හෝ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සභාපති හෝ අමාත්‍ය මණ්ඩලය හෝ වෙනයම් බල අධිකාරියක් මඟින් අනුමැතිය ලබාදී නොමැති තත්වයක් තුළ කොරෝනා වසංගත කාලය තුළ රසායනාගාර ක්‍රියාත්මක නොවන හෙයින් රසායනාගාර පරීක්ෂාවකින් තොරව පොහොර නැවට පටවන අවස්ථාවේ ලබාගත් රසායනාගාර විශ්ලේෂණ වාර්තා මත පදනම්ව වෙළඳපොලට පොහොර නිකුත් කිරීමට ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් ලිපිගොනු සටහන් මඟින් සිදු කර ඇති ඉල්ලීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා අනුමැතිය ලබාදී තිබුණි.

ඒ අනුව 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ ප්‍රතිපාදනයන් අභිබවා, අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව ආනයනික පොහොර ශ්‍රී ලංකාව තුළ බෙදා හැරීමට අනුමැතිය ලබාදෙන බව දන්වමින් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් සියලුම ආනයනික පොහොර සමාගම් වෙත උක්ත කාර්යාලයෙන් ක්‍රියා කරන ලෙස දන්වමින් 2020 මාර්තු 20 දිනැති අංක 7/1/2/3/4 NFP දරන ලිපිය නිකුත් කර තිබුණි.

(ii) තවද ඒ වන විට සිදුකර ඇති පරීක්ෂණයන් අනුව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිර්දේශිත ප්‍රමිතීන්ට අනුකූල වී නොමැති එහෙත් යුරෝපා ප්‍රමිතීන්ට අනුකූලවන TSP පොහොර වෙළඳපොළට නිකුත්කළ හැකි පොහොර ලෙස සලකන බවත් එවැනි තොග වෙළඳපොළට නිකුත් කිරීමට අනුමැතිය ලබාදෙන බවට සඳහන් කරමින් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් 2020 මාර්තු 20 වන දින අංක 7/1/2/3/4/NFP දරන "TSP පොහොර සඳහා අනුමැතිය" මැයෙන් සියලු පොහොර සමාගම් වෙත ලිපියක් නිකුත් කර තිබූ නමුත් පූර්වයෙන් අනුගමනය කළ ප්‍රමිතියෙන් බැහැරව වෙනත් ප්‍රමිතියක් භාවිතය සඳහා කිසිදු බලධාරී බලාධිකාරියකින් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(iii) තෝරාගත් TSP පොහොර නිෂ්පාදකයින් තිදෙනෙකුගෙන් පමණක් පොහොර ආනයනය කිරීමට හා වෙළඳ අනුමැතිය ලබාදීමේදී රසායනාගාර පරීක්ෂාවකින් තොරව නැවගත කිරීමේදී ලබා ගන්නා විශ්ලේෂණ වාර්තාව පමණක් පදනම් කරගෙන ආනයනික පොහොර තොග වෙළඳපොළට නිදහස් කිරීමට තීරණය කළ බව සඳහන් යතුරු ලියනය කරන ලද ලිපියක් ලිපිගොනුවට අමුණා එදින සිට රසායනාගාර පරීක්ෂාවකින් තොරව වෙළඳ අනුමැතිය ලබාදීමට කටයුතු කර තිබූ නමුත් එලෙස කටයුතු කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යවරයා, රාජ්‍ය අමාත්‍යවරයා හෝ වෙනත් බලධාරී බලාධිකාරියකින් විධිමත් අනුමැතියක් ලබාදී නොතිබුණි.

(iv) බැර ලෝහ සඳහා සිදුකරන පරීක්ෂණයන් අනුව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිතීන්ට අනුකූල නොවීම හේතුවෙන් වෙළඳ අනුමැතිය ලබාදිය නොහැකිව තිබූ 2019 වර්ෂයේ ආනයනය කරන ලද TSP පොහොර මෙ.ටොන් 2,905ක් හා SOA පොහොර මෙ.ටොන් 2,126 ක් ද ඇතුළුව එකතුව TSP පොහොර මෙ.ටොන් 4,830 ක්, MOP පොහොර මෙ.ටොන් 1,749ක්, SOA පොහොර මෙ.ටොන් 2,392ක් හා KIESERITE පොහොර මෙ.ටොන් 162ක් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ

අධ්‍යක්ෂවරයාගේ අංක 7/1/2/3/4/NFP හා 2020 මාර්තු 20 වන දිනැති ලිපිය මත පදනම්ව යුරෝපා ප්‍රමිතීන් අනුව ශ්‍රී ලංකාවේ භාවිතයට සුදුසු බව තීරණය කර වෙළඳපොළට නිකුත් කිරීමට කටයුතු කර තිබුණි.

(v) ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කර ඇති අංක 7/1/2/3/4/NFP හා 2020 මාර්තු 20 වන දිනැති ලිපිය පදනම්කර ගනිමින්, ශ්‍රී ලංකාවට පොහොර තොග ආනයනය කළ පසු නියැදි පරීක්ෂාවක් මඟින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් හඳුන්වාදී ඇති ප්‍රමිතීන්ට අනුකූල බව තහවුරු කර ගැනීමකින් තොරව, රසායනික පොහොර නැවිගත කිරීමේදී ලබා ගන්නා විශ්ලේෂණ වාර්තාව පමණක් සැළකිල්ලට ගෙන රසායනික පොහොර මෙට්‍රික් ටොන් 245,448 ක් ශ්‍රී ලංකාව තුළ භාවිතය සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

(ආ) 2020 නොවැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකා පොහොර සමාගම සතු රසායනාගාරය ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත වැඩි දියුණු කර පවරා ගැනීම සඳහා 2021 හා 2022 අයවැය මඟින් පිළිවෙලින් මිලියන 19 ක් හා මිලියන 20 ක් ලෙස එකතුව මිලියන 39 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණි. එහෙත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් එකී රසායනාගාරය පවරා ගැනීම හෝ වැඩි දියුණු කිරීම සිදු නොකිරීම හේතුවෙන් රු.මිලියන 39 ක ප්‍රතිපාදන නිෂ්කාර්යවී ඇති අතර 2021 හා 2022 වර්ෂයන්හිදී ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් සිදු කළ යුතු රසායනාගාර පරීක්ෂණ පෞද්ගලික රසායනාගාර වෙත යොමු කිරීමට සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ ග්‍රාමීය ආර්ථික අංශයේ කාර්යසාධනය පරීක්ෂාවේදී පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව සත්ව පාලනයට ප්‍රතිලාභීන් 808 ක්ද, භෝග වගාවට ප්‍රතිලාභීන් 15,414 ක්ද ලෙස සමස්ත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 16,222 ක් විය. ව්‍යාපෘතිය යටතේ හඳුනාගනු ලැබූ නිශ්චිත ප්‍රතිලාභීන් වෙතට ප්‍රතිලාභ ලැබුණේද යන්න තහවුරු කර නොගෙන ප්‍රතිලාභී නාම ලේඛන මත පදනම්ව පමණක් ව්‍යාපෘතියේ ප්‍රගතිය හඳුනා ගැනීම කර තිබුණද ,ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් ද්‍රව්‍ය ආධාර ලබාගත් බවට කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) අතිරේක ලේකම්ගේ 2022 ජූනි 10 දිනැති අංක RECC/DP/04/018 දරන 02/2022 චක්‍රලේඛ ලිපිය අනුව ප්‍රතිලාභියෙකු ලෙස තෝරාගත යුත්තේ යෝජිත වර්ෂයට ආසන්න වර්ෂ 02 තුළ රජයේ හෝ පෞද්ගලික ආයතනයකින් උදු හෝ මුං වගාව සඳහා සහනාධාර නොලැබූ පවුලක් විය යුතු බව දක්වා තිබියදී 2021 වර්ෂයේ තෝරාගත් ඇතැම් ප්‍රතිලාභීන් 2022 වර්ෂයේද තෝරාගෙන තිබුණු අවස්ථා 11 ක් නිරීක්ෂණය විය.

(iii) 2022 කාර්යසාධන වාර්තාව අනුව මෙම අංශයේ අරමුණු ලෙස "සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම මගින් නිරෝගිමත් ජනතාවක් ඇති කිරීමට පියවර ගැනීම" හඳුනාගෙන තිබුණි. 2021 අගෝස්තු 31 දිනට ඉදිරිපත් වූ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉන්දීය රජයේ ආධාර යටතේ ඇස්තමේන්තු වටිනාකම රු. 2,000,000,000 ක් වූ සනීපාරක්ෂක ඒකක 3,400 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද 2023 අප්‍රේල් 25 දින දක්වා ව්‍යාපෘති කටයුතු ආරම්භ කර නොතිබුණි. කාර්යසාධන වාර්තාව අනුව ව්‍යාපෘතිය සංශෝධනය කිරීමට අදාළ කාර්යයන් දක්වා තිබුණද ව්‍යාපෘතිය ඉටු කිරීමට අදාළ සැලසුම්ගත කාර්යයන් 2022 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

4.1 සැළසුම් කිරීම

අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 03 ඡේදය අනුව අමාත්‍යාංශයේ පශු සම්පත් අංශයේ 2022 මුදල් වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු අතර එයට ඇතුළත් කළ යුතු අදාළ වර්ෂය සඳහා සැළසුම්කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම හා අදාළ කාර්යසාධනය ළඟාකරගැනීම

(අ) අභිජනන ගොවිපලවල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ රජයේ අභිජනන ගොවිපලවල් 09ක් හා පෞද්ගලික අභිජනන ගොවිපලවල් 25ක් ඉදිකිරීම සඳහා 2022 වර්ෂය තුළ පිළිවෙලින් රු.මි 15.9ක් හා රු.මි.6.25ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණද වර්ෂය අවසාන වන විට පෞද්ගලික අභිජනන ගොවිපලවල් 28ක් ඉදිකර තිබුණු අතර රජයේ අභිජනන ගොවිපලවල් 02 ක් පමණක් ඉදිකර තිබිණි.

(ආ) කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවි ව්‍යවසායකයින් සංවර්ධනය හා කිරි පොකුරු ගම්මාන සංවර්ධන වැයාපෘතිය යටතේ ප්‍රතිශෝධිත අයවැය අනුව රු.මි.32 මූල්‍ය ප්‍රතිපාදනයක් ලබාදී තිබූ අතර සියයට 93ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන තිබුණද සැලසුම්ගත ක්‍රියාකාරකම් 05ක් සම්බන්ධයෙන් භෞතික ප්‍රගතිය අත්කර ගැනීම සියයට 2ත් 3ත් අතර වූ අවම මට්ටමක පැවතුණු අතර රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධ 2022.04.26 දිනැති හා අංක 03/ 2022 දරන ජාතික අය වැය චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණු අතර දරන ලද පිරිවැය නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

(ඇ) පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන යටතේ පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල නැවත ඉදිකිරීම සඳහා 2022 වර්ෂය තුළ රු.මි.21.21ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඉන් රු.මි.6.81ක් එනම් සියයට 32ක මූල්‍ය ප්‍රගතියක් ලබා තිබියදී ගොඩනැගිලි අමුද්‍රව්‍ය හිඟය හා මිල ඉහළ යාම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත මෙම කොන්ත්‍රාත්තුව නිම නොකර අතහැර දැමීමට කටයුතු කර තිබූ බව නිරීක්ෂණය විය .

(ඇ) කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තාරා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාකාරකම යටතේ ගොවිපළ 29ක් සංවර්ධනය කිරීම සඳහා රු.510,000ක් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන් කිසිදු ගොවිපළක් ඉදිකර නොතිබුණි.

(ඉ) හංස කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පරිසර හිතකාමී හංස ගොවිපලවල් ඉදිකිරීම යන ක්‍රියාකාරනම යටතේ ගොවිපලවල් 110ක් පිහිටුවීමට ඉලක්කගත වී තිබුණද ගොවිපලවල් 49ක් පමණක් ඉදිකර තිබූ අතර එම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 37කි. තවද ව්‍යාපෘතිය යටතේ පුහුණුවීම් සඳහා ඉලක්කගත වැඩසටහන් ප්‍රමාණය පිළිබඳව සඳහන් කිරීමෙන් තොරව ප්‍රගතිය සියයට 10ක් වශයෙන් දක්වා තිබුණි.

(ඊ) ඵලදායිතා වැඩිදියුණු කිරීම තුළින් මධ්‍යම හා කුඩා පරිමාණ කිරි ගොවිපොළ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ අභිජනන කළමනාකරණය හරහා සුළු හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළවල් ඇතිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ගොවිපලවල් 576 ක් ස්ථාපිත කිරීමට ඉලක්කගතව පැවතියද ඉන් ගොවිපොළවල් 100ක් එනම් සියයට 17ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

4.3 විදේශ ආධාර ව්‍යාපෘති

4.3.1 විදේශාධාර ව්‍යාපෘතියේ/ව්‍යාපෘතිවල කාර්යසාධනය

අමාත්‍යාංශය COVID -19 වසංගත තත්ත්වය හේතුවෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සිදු වී ඇති බලපෑම් සැළකිල්ලට ගෙන ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම හා භෝග අස්වනු සඳහා නිසි මිලක් ලබාදීමේ ජාතික වැඩපිළිවෙල යටතේ ගොවීන් සඳහා කෙටිකාලීනව ගබඩා පහසුකම් ලබාදීමේ අවශ්‍යතාවය පදනම් කරගනිමින් ලෝක බැංකුවේ CERCs ණය පහසුකම යටතේ රු.මිලියන 956 ක පිරිවැයක් දරා දිවයින පුරා ගබඩා 103 ක් ඉදිකිරීම සඳහා වූ වැඩසටහන සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අතිරික්ත භෝග ගබඩා කර පසු කාලීනව ඉහළ මිලක් ලබා ගැනීම හා පසු අස්වනු හානිය වලක්වාලීම ව්‍යාපෘතියේ අරමුණු වුවත් එක් එක් දිස්ත්‍රික්කයන්හි පසු අස්වනු හානිය, අතිරික්ත අස්වනු ප්‍රමාණය හා ගබඩා අවශ්‍යතාවය යන කරුණු පිළිබඳ කිසිදු අධ්‍යනයකින් තොරව හා කිසිදු තාර්කික පදනමකින් තොරව එක් එක් දිස්ත්‍රික්කයන් සඳහා වන ගබඩා අවශ්‍යතාවය හා එකී ගබඩාවල ධාරිතාවය තීරණය කර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ අරමුණු සැලකිල්ලට ගත් විට මෙම ව්‍යාපෘතිය මගින් ඉදිකරනු ලබන ගබඩා, ගොවිජන ජනපද හා ගොවිබිම් ආඥන්නයේ, පහසුවෙන් ගොවි නිෂ්පාදන ගබඩා කළ හැකි පරිදි ඉදි කළ යුතු වුවත් ඉලක්කගත ගොවිජනපද හෝ ගොවිබිම් හඳුනා ගැනීමකින් තොරව නගරාසන්නව ස්ථාපිතව ඇති පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු පරිශ්‍රයන්හි ගබඩා 32 ක් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තු පරිශ්‍රයන්හි ගබඩා 13 ක් ද ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිශ්‍රයන්හි ගබඩා 12 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයන්හි ගබඩා 09 ක් ඉදිකර ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ(වැ.බ) අංක WP/AG/PD/4/2/7 පොදු දරන 2020.10.05 දිනැති ලිපිය මගින් බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ආයතන පරිශ්‍රයන් තුළ ගබඩා ඉදිකිරීම සඳහා ඉඩ පහසුකම් නොපවතින බවත්, ගබඩා කිරීම සඳහා නිෂ්පාදනය කරන භෝගයන්හි අතිරික්තයක් නොමැති බවත් දන්වා තිබියදී බස්නාහිර පළාතේ කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන 05 ක රු.මිලියන 26.31 ක වියදමක් දරමින් ගබඩා 05 ක් ඉදිකර තිබුණි.

(ඈ) හොරණ දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයට බීජ පරීක්ෂණාගාරයක අවශ්‍යතාවය ඇති බව බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණ ද එම පුහුණු මධ්‍යස්ථාන තුළ රු.මිලියන 5.53 ක වියදමින් මෙට්‍රික්ටොන් 50 ක ධාරිතාවයකින් යුත් ගබඩාවක් ඉදිකර තිබුණි.

(ඉ) 2022 ඔක්තෝම්බර් 12 දින වන විට ගබඩා 29 ක වැඩ අවසන් කර කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත භාර දී ඇතත් එකී ගබඩා ගොවීන්ගේ අතිරික්ත නිෂ්පාදනයන් ගබඩා කර තැබීමට යොදා ගෙන නොතිබුණු අතර ඉදිරියේදී ලැබෙන අස්වනු එම ගබඩාවන්හි ගබඩා කිරීමට සැළසුමක් හෝ කෘෂිකර්ම අමාත්‍යාංශය සතු නොවීමෙන් උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද පිරිවැය එහි අරමුණු වෙනුවෙන් ඵලදායීව භාවිතාවී නොතිබුණි.

(ඊ) ව්‍යාපෘති ස්ථාන හඳුනා ගැනීම 2020 ජනවාරි මාසයේදී ආරම්භ කළ ද ව්‍යාපෘති ස්ථාන නිරන්තරයෙන් වෙනස් කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් නොවීම හේතුවෙන් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රු.මිලියන 7.5 ක් උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් මේ වන විට ගෙවා ඇති අතර ඉදිරි බිල්පත් වෙනුවෙන්ද එලෙස ඇස්තමේන්තුගත අගයන් ඉක්මවා ගෙවීම් කිරීමට සිදු වීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය.

(උ) ඉහළ ආදායමක් අපේක්ෂාවෙන් තම අතිරික්ත නිෂ්පාදන ගබඩා කර තැබීමට ගොවීන්ට සත්‍ය වශයෙන් ගබඩා අවශ්‍යතාවයක් තිබෙදැයි නිශ්චිතවම තහවුරු කර ගැනීමකින් තොරව කොවිඩ් 19 හදිසි තත්ත්වය මත ලෝක බැංකුව ලබා දුන් රු.මිලියන 956 ක ණය ආධාර මුදලින් පූර්වෝක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් විගණිත දින වන විට රු.මිලියන 557.85 ක වියදමක් දරා ගබඩා ස්ථාපිත කර ඇතත් එකී ගබඩා ඉදිකිරීමේ අරමුණු හා සැබෑ ගොවි අරමුණු අතර එකඟතාවයක් නොපැවතීම හා අවසන් කරන ලද ගබඩා ගොවීන්ගේ අතිරික්ත නිෂ්පාදන ගබඩා කිරීමට භාවිතා නොවීම ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රායෝගික වැඩ පිළිවෙලක් නිර්මාණය වී නොතිබීම හේතුවෙන් උක්ත වියදම් හා ඉදිකරන ලද ගොඩනැගිලි නිෂ්කාර්යවී ඇති බව නිරීක්ෂණය විය.

4.3.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

2018 ඔක්තෝබර් 22වන දින ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වන රු.මි.49.61කින් ආරම්භකරන ලද යාපනය තිරුනේල්වේලි බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම කටයුතු 2019 ජූනි 09 වන දින නිමකළ යුතු වුවද වසර 2 ½ ක ප්‍රමාදයක් සහිතවූ නිමකර තිබුණද අවසන් බිල්පත ගෙවීම් සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රගතිය රු. 13.8ක් පමණක් විය.

4.4 ප්‍රසම්පාදනයන්

අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශය සතු අංක KY – 5535 දරන වාහනයේ ජියර් බොක්ස් පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම අලුත්වැඩියා කිරීම සඳහා හාඩ් ඔටෝ වර්ක්ස් ආයතනය වෙතින් 2022 ජනවාරි 13 දින රු. 1,109,600 කට ඉදිරිපත් කළ ඇස්තමේන්තුව යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ කර තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) ප්‍රකාරව මිල ගණන් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කර නොතිබුණි.

4.5 විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා නොදීම

අමාත්‍යාංශය වෙත 2022.11.17 දින නිකුත් කරන ලද අංක ඒආර්අයි/ඒ/එන්එප්එස්/2022/46 දරන විගණන විමසුමක් සඳහා 2023 මාර්තු 28 දින දක්වා පිළිතුරු ලබා දී නොතිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

(අ) අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය 2019 ජනවාරි 12 දිනැති කළමනාකරණය විගණනය චක්‍රලේඛ අංක DMA/01-2019 හි 5.3 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණය කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් එනම් වර්ෂයකට 04 ක් වන පරිදි පැවැත්විය යුතු වුවද 2022 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණය කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශයට භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ සේවක සංඛ්‍යාව තුළ අභ්‍යන්තර විගණක තනතුරක් තිබියදී 2018අංක 19 දරන ජාතික විගණන පනතේ 40(2) (1) වන උප වගන්තිය ප්‍රකාරව පනත ක්‍රියාත්මක වීමේ දින සිට වර්ෂ 02 ක් නොඉක්මවන කාල සීමාවක් තුළ අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට කෘෂිකර්ම, පොහොර, පශු සම්පත් හා ග්‍රාමීය ආර්ථික යන අංශ ඇතුළු අමාත්‍යාංශයේ අනුමත තත්‍ය හා අතිරික්ත / ඌන සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

අංශය	මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)
කෘෂිකර්ම	ජ්‍යෙෂ්ඨ	73	61	12
	තෘතියික	9	03	06
	ද්විතියික	1017	1097	(80)
	ප්‍රාථමික	129	109	20
	එකතුව	1228	1270	38
පොහොර	ජ්‍යෙෂ්ඨ	31	12	19
	තෘතියික	03	0	03
	ද්විතියික	548	817	269
	ප්‍රාථමික	31	15 (අනියම් 06, බහු කාර්යය 09)	16
	එකතුව	613	844	

(අ) කෘෂිකර්ම අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 කද, තෘතියික අංශයේ තනතුරු 06 කද, ප්‍රාථමික අංශයේ තනතුරු 20 ක ඌනතාවයක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 80 ක අතිරික්තයක්ද නිරීක්ෂණය වේ.

(ආ) පොහොර අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 19 කද, තෘතියක මට්ටමේ තනතුරු 03 කද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 16 කද, ඌනතාවයන් නිරීක්ෂණය වූ අතර ද්විතියික මට්ටමේ තනතුරු 269 ක අතිරික්තයක්ද නිරීක්ෂණය විය.

පශු සම්පත්	ජ්‍යෙෂ්ඨ	**30**	**19**	**11**
	තෘතියික	**03**	**02**	**01**
	ද්විතියික	**523**	**502**	**21**
	ප්‍රාථමික	**35**	**33**	**02**
	වෙනත්	**03**	**03**	**-**
	එකතුව	**594**	**559**	**35**

(ඇ) අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 30 ක් අතුරෙන් ප්‍රධාන තනතුරු කීපයක් වන අධ්‍යක්ෂක (සැලසුම්) තනතුර හා සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ (ඉංජිනේරු) හා සහකාර ලේකම් යන තනතුරු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බඳවා ගැනීම්

සිදුකර නොතිබිණි. තවද අමාත්‍යාංශයේ තෘතියික මට්ටමේ තනතුරු වන පරිපාලන කටයුතු මනාව ඉටු කිරීම සඳහා අවශ්‍ය පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩු ව පැවතුණි. තවද ද්විතියික මට්ටමේ ඌන සේවක සංඛ්‍යාව 21 ක් ද විය.

(ඇ) අංක 2/ 2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම ඇතුළත් වන පරිදි මානව සම්පත් සැලැස්ම පිළියෙල කළයුතු වුවත් පුහුණු කාලපරිච්ඡේදය සහ අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබා දෙමින් එම මානව සම්පත් සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන	ජ්‍යෙෂ්ඨ	14	07	07
	තෘතියික	05	01	04
	ද්විතියික	42	166	124
	ප්‍රාථමික	22	14	08
	එකතුව	83	188	

(ඉ) ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශයේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 83 ක් වුවද තත්‍ය සේවක සංඛ්‍යාව 188 ක් විය. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවාගැනීම් සිදුකර තිබුණි.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ ඇතුලු ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු පැවතුණි.

(උ) ද්විතියක මට්ටමේ සංවර්ධන නිලධාරී තනතුරු සඳහා අනුමත සේවක සංඛ්‍යාව 28 ක් වුවත්, 2022 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛයාව 157 ක් විය. මේ අනුව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සංවර්ධන නිලධාරීන් 129 ක් බඳවාගෙන තිබුණි.

පී.කේ.එම්.පී.නෝනිස්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පී.කේ.එම්.පී. නෝනිස්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් % ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	89% - 75%	74% - 50%
කෘෂිකර්ම අංශය				
වී බෝගයේ ඵලදායීතාවය හා ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම.		√		
අනෙකුත් බෝගවල ඵලදායීතාවය ඉහළ නැංවීම.		√		
බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ගුණාත්මක බීජ සැපයුම සහතික කිරීම.		√		
ශාක ආරක්ෂණ භාවිතාවන් වැඩිදියුණු කිරීම.		√		
ඉහළ ගුණාත්මක භාවිතයන් සඳහා කෘෂි පුහුණු සහ ව්‍යාප්ති සේවා වැඩිදියුණු කිරීම.		√		
පශු සම්පත් අංශය				
දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන/වසරකට)		√		
වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර ගණන/වසරකට)				√
වාර්ෂික ඒක පුද්ගල කුකුළු මස් පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (කි.ග්‍රෑම් වසරකට)		√		
පොහොර අංශය				
පසු අස්වනු ක්ෂේත්‍රයේ පවතින ගැටළු සඳහා තාක්ෂණික විසඳුම් සොයාගැනීම සඳහා පර්යේෂණ සිදු කිරීම			√	
පර්යේෂණ ප්‍රකාශන 10ක් දේශීය/විදේශීය සඟරා වල පළ කිරීම		√		
එළවළු හා පලතුරු තෝරා ගත් සැපයුම් දාම කිහිපයක් තුළ නිවැරදි පසු අස්වනු තාක්ෂණයන් භාවිතය/ යෙදවීම		√		
එළවළු පලතුරු පසු අස්වනු හානිය අවම කිරීම සඳහා සුරක්ෂිත ඇසුරුම් හා ප්‍රවාහන ක්‍රම හඳුන්වා දීම		√		
පසු අස්වනු තාක්ෂණ ප්‍රචාරණය සඳහා පුහුණු පාඨමාලා 100ක් පැවැත්වීම හරහා ප්‍රතිලාභීන් 2000ක් පුහුණු කිරීම, පසු අස්වනු ක්ෂේත්‍රය සඳහා නව ව්‍යවසායකයින් බිහි කිරීම			√	
නිවැරදි පසු අස්වනු තාක්ෂණයන් ක්ෂේත්‍රයේ භාවිතය සඳහා උපදේශක සේවා, ඉංජිනේරු සේවා හා රසායනාගාර සේවා ලබා දීම		√		
ආයතනයේ මානව සම්පත් සංවර්ධනය කිරීම		√		
2022 යල කන්නය තුළ රසායනික පොහොර බෙදාහැරීම	වී	√		
	අනෙකුත් බෝග			
2022/23 මහ කන්නය තුළ වී සඳහා දේශීය නිෂ්පාදකයින්ගෙන් කාබනික පොහොර මිල දී ගැනීම		√		

විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් % ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	**89% - 75%**	**74% - 50%**
2022/23 මහ කන්නය තුළ වී සඳහා දේශීය නිෂ්පාදකයින්ගෙන් මිල දී ගත් කාබනික පොහොර බෙදාහැරීම		√		
2022 වර්ෂය තුළ රසායනික පොහොර ආනයනය කිරීම		√		
2022 වර්ෂය තුළ ආනයනය කරන ලද රසායනික පොහොර බෙදාහැරීම			√	
ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය				
ප්‍රතිපත්ති සම්පාදනය සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම	ප්‍රාග්ධන අරමුදල් 100% ප්‍රයෝජනයට ගැනීම		√	
ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදයම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම	1. එළුවන් ඇති කිරීමේ වැඩසටහන කාර්ය සාධන දර්ශක - • ප්‍රතිලාභී පවුල් ගණන • බෙදාදුන් එළුවන් ගණන	√		
	2. භෝග වගා ප්‍රවර්ධන වැඩසටහන කාර්ය සාධන දර්ශක • ප්‍රතිලාභී පවුල් ගණන • බෙදාදුන් බීජ ප්‍රමාණය (කි. ග්‍රෑ.) • වගා කළ භූමි ප්‍රමාණය (අක්කර) • අපේක්ෂිත අස්වැන්න	√		

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
කෘෂිකර්ම අංශය					
2	සාගිනි නිමවා ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්වයක් සාක්ෂාත් කර ගැනීම සහ තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	1. වී බෝගයේ ඵලදායීතාවය හා ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම.			√
		2. අනෙකුත් බෝගවල ඵලදායීතාවය ඉහළ නැංවීම.			√
		3. බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ගුණාත්මක බීජ සැපයුම සහතික කිරීම.			√
		4. ශාක ආරක්ෂණ භාවිතාවන් වැඩිදියුණු කිරීම.			√
		5. ඉහළ ගුණාත්මක භාවිතයන් සඳහා කෘෂි පුහුණු සහ ව්‍යාප්ති සේවා වැඩිදියුණු කිරීම.			√
පශු සම්පත් අංශය					
(i) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම (ii) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම (iii) සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ	වසර 2022 වන විට දියර කිරි නිෂ්පාදනය ලීටර මිලියන 493 දක්වා ඉහළ නැංවීම	1. දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන/වසරකට)			√
	වසර 2022 වන විට වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය 137 දක්වා ඉහළ නැංවීම	2. වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජන වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර ගණන/වසරකට)		√	
	වසර 2022 වනවිට වාර්ෂික ඒකපුද්ගල කුකුළු මස් පරිභෝජනය කි.ග්‍රෑ.10.9 දක්වා ඉහළ නැංවීම	3. වාර්ෂික ඒකපුද්ගල කුකුළු මස් පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (කුකුළු මස් කි.ග්‍රෑ./වසරකට)			√

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
තිරසර ආර්ථික වර්ධනය පුර්ණ ඵලදායි හා යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම (iv) තිරසර පරිභෝජනය හා නිෂ්පාදන රටා සුරක්ෂිත කිරීම					
පොහොර අංශය					
2	එළවළු හා පලතුරු බෝග වල පසු අස්වනු හානිය 25% දක්වාත් වී හා අනෙකුත් නෂ්‍ය නොවන බෝග වල පසු අස්වනු හානිය 5% දක්වාත් අවම කිරීම	තෝරාගත් පලතුරු වර්ග 15ක සහ එළවළු වර්ග 10ක ත් වී හා අනෙකුත් තෝරාගත් කල් තබා ගත හැකි බෝග වර්ග 9කත් පසු අස්වනු හානිය අවම කිරීම සඳහා නිපදවන ලද නවමු තාක්ෂණයන් ප්‍රමාණය, ක්ෂේත්‍රයට හඳුන්වා දුන් තාක්ෂණයන් ප්‍රමාණය, පසු අස්වනු හානිය අවම වූ ප්‍රමාණය	√	-	-
	සාගින්නි නිමවා ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්වයක් සාක්ෂාත් කර ගැනීම සහ තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	බැර ලෝහ මඟින් සිදුවන පාංශු දූෂණය අවම කිරීම	-	√	-
		පසේ ගුණාත්මක තත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම	-	√	-
		වනාන්තර හා තෙත්බිම් භාවිතා කරමින් උසස් තත්වයේ ජෛව පොහොර හා කාබනික පොහොර නිෂ්පාදනය කිරීම	√	-	-
12	එළවළු හා පලතුරු බෝග වල සැපයුම් හා අගයදාම කළමනාකරණ ක්‍රියාවලීන්	තෝරාගත් පලතුරු වර්ග 15ක සහ එළවළු වර්ග 10ක ත් වී හා අනෙකුත් තෝරාගත් කල් තබා ගත හැකි බෝග වර්ග 9කත් පසු අස්වනු හානිය අවම කිරීම සඳහා	√	-	-

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
	වැඩිදියුණු කිරීම	නිපදවන ලද නවමු තාක්ෂණයන් ප්‍රමාණය, ක්ෂේත්‍රයට හඳුන්වා දුන් තාක්ෂණයන් ප්‍රමාණය, පසු අස්වනු හානිය අවම වූ ප්‍රමාණය			
	තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන් සහතික කිරීම	පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම සහ මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදු වන්නා වූ අහිතකර බලපෑම අවම කිරීම සඳහා වාතයට, ජලයට සහ පසට ඒවා මුදා හැරීම අවම කිරීම.	-	-	√
		තවදුරටත් තිරසරවත් පාරිභෝජන සහ නිෂ්පාදන රටාවන්ට යොමු වීමට අවශ්‍ය විද්‍යාත්මක සහ තාක්ෂණික ධාරිතාවන් ලබා ගැනීම.	-	√	-
ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය					
01. සියළු තැන්හි පවතින දුගී බව අවසන් කිරීම	1.1 අඩු ආදායම් ලාභී ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම	**සංවර්ධන ව්‍යාපෘති** • ගෘහස්ථ කෘෂි භෝග වගා වැඩසටහන් • සත්ව පාලන ව්‍යාපෘති			√
	1.5 කාලගුණික තත්වයන්ගෙන් ඇතිවන්නාවූ හානිකර බලපෑම් අවම කිරීම	**පරිසර සංරක්ෂණය 1** • පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම • ජල මූලාශ්‍ර හා දිය කඳුරු සංරක්ෂණය			√
02. සාගින්න නැති කර, ආහාර සුරක්ෂිත තාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර	2.3 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාවය සහ ආදායම වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් මගින් දෙගුණ කිරීම	**තාක්ෂණික වැඩසටහන්** • ගොවි පුහුණු වැඩසටහන් • ගුවන් විදුලි වැඩසටහන් • භෝග වගා ක්‍රම හඳුන්වා දීම • උසස් බීජ හා පැල ලබා දීමේ අරමුණින් රජයේ අධීක්ෂණය සහිත ගොවිපොළ සංවර්ධනය			√

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	2.4 නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නාවූ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්වයන් වර්ධනය කරන්නාවූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම	**<u>පරිසර සංරක්ෂණය 2</u>** ● කාබනික පොහොර නිෂ්පාදනය			√

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

i.) ජයග්‍රහණ

පොහොර අංශය

- කාබනික පොහොර භාවිතය පිළිබඳව ගොවීන් පුහුණු කිරීම.
- ගුණාත්මක පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම හා නියාමනය.
- ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමේ හා තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ වී හා අනෙකුත් බෝග සඳහා පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- කාබනික පොහොර බෙදා හැරීමේ වැඩසටහන් දියත් කිරීම.
- වස විසෙන් තොර ආහාර ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- එළවළු පලතුරු ප්‍රවාහනය සඳහා සුරක්ෂිත ඇසුරුම් ලබා දීම, ධාන්‍ය ගබඩාකරණ පහසුකම් වැඩි දියුණු කිරීම, අගය එක්කළ නිෂ්පාදන සඳහා පාර්ශ්වකරුවන් යොමු කිරීම වැනි ක්‍රියාකාරකම් තුළින් කෘෂි බෝගයන්ගේ පසු අස්වනු හානිය සැළකියයුතු ලෙස අඩු වීම.

ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය

- රු.මි. 100.00 ක භෝග වගා ව්‍යාපෘතිය මගින් අඩු ආදායම් ලාභී පවුල් 15,888 ක් ආවරණය වන පරිදි 91% ක ප්‍රගතියක් ලබාගැනීම
- රු.මි. 40.00 ක ගෘහස්ථ එළු පාලන ව්‍යාපෘතිය මගින් අඩු ආදායම් ලාභී පවුල් 808 ක් ආවරණය වන පරිදි 97% ක ප්‍රගතියක් ලබාගැනීම

ii.) අභියෝග

කෘෂිකර්ම අංශය

- වෙළඳපොලේ මිල ඒකාධිකාරයක් පැවතීම.
- දියුණු කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති සංවර්ධිත රට වලට සාපේක්ෂව අධි තාක්ෂණික සම්පත් නොමැතිවීම.
- කුඩා පරිමාණ ගොවීන්ට ජාත්‍යන්තර වෙළඳපොළවල් සමඟ තරඟ කිරීමට අපහසු වීම.
- දළ දේශීය නිෂ්පාදනයෙන් කෘෂිකර්මයට වන දායකත්වය ඉහළ නැංවීම.
- දේශගුණික විපර්යාසයන් සඳහා වඩාත් ඔරොත්තු දෙන බීජ වල ආකාර බහුල කිරීම හා දේශීය බීජ සංරක්ෂණය.

පොහොර අංශය

- නෛතික ප්‍රතිපාදන යාවත්කාලීන නොවීම.
- කෘෂිකාර්මික වගා ඉඩම් ප්‍රමාණය පිළිබඳව නිවැරදි දත්ත නොපැවතීම.
- වගා බිම් සඳහා පොහොර අධිභාවිතය.
- පොහොර තොග පාලන ක්‍රමවේදයේ පවතින දුර්වලතා.
- පොහොර සාම්පල පරීක්ෂාවේදී රසායනාගාරවල සිදුවන ප්‍රමාදයන්.
- සහනාධාර පොහොර අවභාවිතය.
- සහනාධාර පොහොර නිර්දේශය හා භාවිතා කළ යුතු ආකාරය පිළිබඳව ගොවීන්ගේ දැනුවත්භාවය අවම වීම.
- තාක්ෂණික දැනුම ඇති නිලධාරින්ගේ හිඟය.

ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය

- 2022 වර්ෂය මුල් කාල පරිච්ඡේදය තුළ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් පසු විපරම් කටයුතු සීමාවීම.
- කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තාක්ෂණික දැනුම සහිත නිලධාරීන් මෙම අංශයේ රාජකාරී සඳහා ඍජුවම අනුයුක්තව නොසිටීම
- කෙටි කාල පරාසයක් තුල කීප අවස්ථාවක දී විෂය පථය වෙනස්වීම

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

අංශය		අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
කෘෂිකර්ම	ජ්‍යෙෂ්ඨ	73	61	12
	තෘතියික	9	3	6
	ද්විතියික	1017	1097	0
	ප්‍රාථමික	129	109	20
	එකතුව	**1228**	**1270**	**38**
පශු සම්පත් අංශය	ජ්‍යෙෂ්ඨ	31	17	14 (හිඟය)
	තෘතීයික	03	2	1(හිඟය)
	ද්විතීයික	523	526	3(අතිරික්තය)
	ප්‍රාථමික	37	31	6(හිඟය)
	එකතුව	**594**	**576**	
පොහොර	ජ්‍යෙෂ්ඨ	31	12	19
	තෘතියික	02	0	02
	ද්විතියික	548	817	269(අතිරික්ත)
	ප්‍රාථමික	31	15 (අනියම් 06,බහු කාර්ය 09)	16
	වෙනත්	03	-	03
	එකතුව	**615**	**844**	
ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන	ජ්‍යෙෂ්ඨ	14	07	07
	තෘතීයික	05	01	04
	ද්විතීයික	42	166	124
	ප්‍රාථමික	22	14	08
	එකතුව	**83**	**188**	

06.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

පශු සම්පත් අංශය

අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු පහතින් සඳහන් කර ඇත.

#	තනතුර	සේවය	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම			
1.	අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	01 (යටපත් කිරීමට නියමිත)
2.	ප්‍රධාන මූල්‍ය නිලධාරී	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	01
3.	අධ්‍යක්ෂ (සැලසුම්)	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය	01

#	තනතුර	සේවය	පුරප්පාඩු සංඛ්‍යාව
4.	අධ්‍යක්ෂ (ඉංජිනේරු)	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	01 (යටපත් කිරීමට නියමිත)
5.	අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය	02
6.	අභ්‍යන්තර විගණක	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	01 (යටපත් කිරීමට නියමිත)
7.	සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය	03
8.	සහකාර අධ්‍යක්ෂ/නියේජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය	01
9.	සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය	01
10.	සහකාර ලේකම්	ශ්‍රී ලංකා පරිපාලන සේවය	02
11.	රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්		01 (යටපත් කිරීමට නියමිත)
	තෘතීයික මට්ටම		
12.	පරිපාලන නිලධාරී	කළමනාකරණ සේවා නිලධාරී සේවය	01
13.	භාෂා පරිවර්තක	රජයේ භාෂා පරිවර්තක සේවය	01
	ද්විතීයික මට්ටම		
14.	කළමනාකරණ සේවා නිලධාරී	කළමනාකරණ සේවා නිලධාරී සේවය	12
15.	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය	01
16.	පිළිගැනීමේ නිලධාරී		01
	ප්‍රාථමික මට්ටම		
17.	රියදුරු	ඒකාබද්ධ රියදුරු සේවය	06
18.	කාර්යාල සේවක	කාර්යාල සේවක සේවය	01
19.	වීඩියෝ කැමරා ශිල්පී (තාවකාලික)		01 (යටපත් කිරීමට නියමිත)
20.	වීඩියෝ කැමරා සහයක (තාවකාලික)		01 (යටපත් කිරීමට නියමිත)

06.3. මානව සම්පත් සංවර්ධනය

කෘෂිකර්ම අංශය

- **දේශීය පුහුණු**

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	සහභාගි වූ නිලධාරීන්	ආයතනය	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය දේශීය (රු)	නිමැවුම / ලබා ගත් දැනුම
1	**ව්‍යාපෘති කළමනාකරණය** පිළිබඳ පුහුණු වැඩසටහන	1	සංවර්ධන නිලධාරීන්	SDFL	2 Days	7,500.00	විෂයට අදාළ දැනුම
2	**ලංසු කැඳවීමේ ලේඛන පිළියෙළ කිරීම** පිළිබඳ පුහුණු වැඩසටහන	2	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රසම්පාදන) සංවර්ධන නිලධාරීන්	SDFL	2 days	14,000.00	විෂයට අදාළ දැනුම
3	**ප්‍රවාහන කළමනාකරණය** පිළිබඳ පුහුණු වැඩසටහන	2	සංවර්ධන නිලධාරීන්	SDFL	2 days	14,000.00	විෂයට අදාළ දැනුම
4	රජයේ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන	2	සංවර්ධන නිලධාරීන්	SDFL	2 days	14,000.00	විෂයට අදාළ දැනුම
5	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් අපහරණය	1	සංවර්ධන නිලධාරීන්	SDFL	2 days	8,500.00	විෂයට අදාළ දැනුම
6	රජයේ වැටුප් පද්ධතිය **පිළිබඳ** පුහුණු වැඩසටහන	2	සංවර්ධන නිලධාරීන්	SDFL	3 days	30,000.00	විෂයට අදාළ දැනුම
7	ගොවිපල යන්ත්‍ර (තණකොළ කපන යන්ත්‍ර , දියර ඉසින යන්ත්‍ර හා චේන් ෂෝ යන්ත්‍ර) ක්‍රියා කිරීම හා නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන	14	උද්‍යාන කම්කරු , කෘෂිකර්ම උපදේශක	SDFL	2 days	20,520.00	විෂයට අදාළ දැනුම
						8,400.00	විෂයට අදාළ දැනුම
8	ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	2	සංවර්ධන නිලධාරීන්	SDFL	2 days	14,000.00	විෂයට අදාළ දැනුම
9	මූලික විමර්ෂන පුහුණුව **පිළිබඳ වැඩසටහන**	2	කළමනාකරණ සේවා නිලධාරීන්	SDFL	2 days	14,000.00	විෂයට අදාළ දැනුම
10	අලාභ වාර්තා කිරීම,හානි පූර්ණය හා කපා හැරීම පිළිබඳ පුහුණු වැඩසටහන	1	කළමනාකරණ සේවා නිලධාරීන්	SDFL	2 days	8,500.00	විෂයට අදාළ දැනුම
11	රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්	2	සංවර්ධන නිලධාරීන්	SDFL	2 Days		ප්‍රසම්පාදනය පිළිබඳ

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	සහභාගී වූ නිලධාරීන්	ආයතනය	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය දේශීය (රු)	නිමැවුම / ලබා ගත් දැනුම
	පරිපාලනය					14,000.00	දැනුම
12	Java Progrmme	1	සංවර්ධන නිලධාරීන්	SLIIT	6 month	30,000.00	තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුම
13	CISCO	1	සංවර්ධන නිලධාරීන්	Ternkey IT	2.5 month	24,750.00	තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුම
14	කළමනාකරන සහකාර තාක්ෂණික නොවන -ඛණ්ඩ 2-II ශ්‍රේණිය	4	කළමනාකරණ සේවා නිලධාරීන්	විභාග දෙපාර්තමේන්තුව	1 Days	194,959.19	කාර්යාල ක්‍රම/ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි සම්බන්ධ දැනුම
15	කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1	කළමනාකරණ සේවා නිලධාරීන්	NILT	1 Days	11,360.00 11,360.00	කාර්යාල ක්‍රම/ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි සම්බන්ධ දැනුම
16	කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1	විදුලි ශිල්පි	SLIDA	1 Days	11,780.63 11,780.62	කාර්යාල ක්‍රම/ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි සම්බන්ධ දැනුම
17	තෙදින සේවාරම්භක පුහුණු වැඩමුළුව	7	සංවර්ධන නිලධාරීන්	SDFL	3 days	105,000.00	කාර්යාල ක්‍රම/ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි සම්බන්ධ දැනුම
18	Salari Conversions	8	සංවර්ධන නිලධාරීන්/ කළමනාකරණ සේවා නිලධාරීන්	SDFL	2 days	60,000.00	විෂයට අදාළ දැනුම
19	බඳවා ගැනීමේ පටිපාටිය	8	සංවර්ධන නිලධාරීන් කළමනාකරණ සේවා නිලධාරීන්	SDFL	2 days	60,000.00	විෂයට අදාළ දැනුම
20	අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව	3	සංවර්ධන නිලධාරීන් කළමනාකරණ සේවා නිලධාරීන්	SDFL	2 days	25,500.00	විෂයට අදාළ දැනුම
21	සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම් හා ගෙවීම් පිළිබඳ දෙදින වැඩමුළුව	4	සංවර්ධන නිලධාරීන් කළමනාකරණ සේවා	SDFL	2 days	30,000.00	විෂයට අදාළ දැනුම

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	සහභාගී වූ නිලධාරීන්	ආයතනය	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය දේශීය (රු)	නිමැවුම / ලබා ගත් දැනුම
			නිලධාරින්				
22	විනයකාර්ය පටිපාටිය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව	6	සංවර්ධන නිලධාරීන් කළමනාකරණ සේවා නිලධාරින්	SDFL	2 days	45,000.00	විෂයට අදාළ දැනුම
23	කාර්යාල කාර්ය සහයකින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල නැංවීම	5	කාර්යාල කාර්ය සහයකින් සහ රියදුරන්	SDFL	2 days	42,500.00	විෂයට අදාළ දැනුම
24	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	6	සංවර්ධන නිලධාරීන් කළමනාකරණ සේවා නිලධාරින්	SDFL	2 days	45,000.00	විෂයට අදාළ දැනුම
25	Operation & Preventive Maintenance of Diesel Generator	1	විදුලි ශිල්පි	SDFL	1 Days	10,000.00	විෂයට අදාළ දැනුම
26	Essentials In Systems & Network Administration	1	සංවර්ධන නිලධාරීන්	DLC	5 Days	30,000.00	තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුම
27	අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලන ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන	3	සංවර්ධන නිලධාරීන්	SDFL	2 days	22,500.00	අභ්‍යන්තර විගණනයට අදාල දැනුම
28	රජයේ නිළධාරියෙකුට හිමි නිවාඩු සහ නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම පිළිබඳ දෙදින වැඩමුළුව	2	සංවර්ධන නිලධාරීන් කළමනාකරණ සේවා නිලධාරින්	SDFL	2 days	15,000.00	විෂයට අදාළ දැනුම
29	ජාතික පුස්තකාල පර්යේෂණ සම්මන්ත්‍රණය	2	සංවර්ධන නිලධාරීන්/කා.සේ.සේ	ජාතික පුස්තකාල	1 Days	6,000.00	පුස්තකාල විෂය සම්බන්ධ දැනුම
30	වාර්ෂික සමුළුව	3	ගණකාධිකාරි/ප්‍රධාන ගණකාධිකාරි	APFASL	1 Days	7,000.00	විෂයට අදාල දැනුම
31	ප්‍රාථමික නිලධාරීන්ගේ පුහුණු වැඩමුළුව	53	කාර්යාල කාර්ය සහයකින් සහ රියදුරන්	කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය-ගාල්ල	2 days	171,460.70	කාර්යාල ක්‍රම/ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි/පුද්ගල අන්තර්පුද්ගල සම්බන්ධතා වර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	සහභාගී වූ නිලධාරීන්	ආයතනය	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය දේශීය (රු)	නිමැවුම / ලබා ගත් දැනුම
32	ද්විතියික නිලධාරීන්ගේ පුහුණු වැඩමුළුව	54	සංවර්ධන නිලධාරීන් කළමනාකරණ සේවා නිලධාරීන්	කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය-ගාල්ල	2 days	189,398.30	කාර්යාල ක්‍රම/ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි/පුද්ගල අන්තර්පුද්ගල සම්බන්ධතා වර්ධනය
33	විධායක නිලධාරීන්ගේ පුහුණු වැඩමුළුව	20	මාණ්ඩලික නිලධාරීන්	Laya Leisure Kukulegan ga	2 days	156,625.00	අන්තර්පුද්ගල සම්බන්ධතා වර්ධනය/කණ්ඩායම් ක්‍රියාකාරකම්
34						133,652.34	
35	දෙමළ භාෂා පාඨමාලාව	1	සංවර්ධන නිලධාරීන් කළමනාකරණ සේවා නිලධාරීන්	අමාත්‍යාංශ ශ්‍රවනාගාරය	10 Days	45,000.00	විෂයට අදාළ දැනුම
36	ද්විතියික නිලධාරීන්ගේ පුහුණු වැඩමුළුව සම්පත් දායක දීමනාව-කේ.යූ.චන්ද්‍රලාල් මහතා	1	සංවර්ධන නිලධාරීන් කළමනාකරණ සේවා නිලධාරීන්	කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය-ගාල්ල	2 days	6,000.00	කාර්යාල ක්‍රම/ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි/පුද්ගල අන්තර්පුද්ගල සම්බන්ධතා වර්ධනය
37	ප්‍රාථමික නිලධාරීන්ගේ පුහුණු වැඩමුළුව සම්පත් දායක දීමනාව-කේ.යූ.චන්ද්‍රලාල් මහතා	1	කාර්යාල කාර්ය සහයකින් සහ රියදුරන්	කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය-ගාල්ල	2 days	12,000.00	කාර්යාල ක්‍රම/ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි/පුද්ගල අන්තර්පුද්ගල සම්බන්ධතා වර්ධනය
38	ද්විතියික නිලධාරීන්ගේ පුහුණු වැඩමුළුව සම්පත් දායක දීමනාව-කමල් ප්‍රියදර්ශන මහතා	1	සංවර්ධන නිලධාරීන් කළමනාකරණ සේවා නිලධාරීන්	කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය-ගාල්ල	2 days	2,700.00	කාර්යාල ක්‍රම/ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි/පුද්ගල අන්තර්පුද්ගල සම්බන්ධතා වර්ධනය
39	රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්	2	ප්‍රධාන	SLIDA	14 month	240,000.00	ප්‍රසම්පාදනය පිළිබඳ

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	සහභාගී වූ නිලධාරීන්	ආයතනය	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය දේශීය (රු)	නිමැවුම / ලබා ගත් දැනුම
	පරිපාලනය		ගණකාධිකාරී/සහකාර ලේකම්				දැනුම
40	මුදල් රෙගුලාසි හා කාර්යාල ක්‍රම	1	සංවර්ධන නිලධාරීන්	ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	1 Days	8,000.00	විෂයට අදාළ දැනුම
මුළු වියදම						**1,931,746.78**	

පශු සම්පත් අංශය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
නවක සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම	35	දින 06	-	-	දේශීය	ආයතනයේ කටයුතු සඳහා සෘජුවම දායකවේ
ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහන	63	දින 01	234.77			
රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා කොන්ත්‍රාත් ක්‍රමය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	01	දින 01	120			
රජයේ වාහන නඩත්තුව	01	දින 01	5			
ආයතනික කටයුතු පිළිබඳ පුහුණුව	35	දින 04	-			
රජයේ මුදල් රෙගුලාසි	01	දින 02	9			
ව්‍යාපෘති කළමනාකරණය	35	දින 10	-			
ක්ෂේත්‍රගත පුහුණු වැඩසටහන	56	දින 01	236.6			
ද්විතීක මට්ටමේ දෙමළ භාෂා පුහුණු වැඩසටහන	40	දින 01 (ඉදිරියට පැවැත්වේ)	4.5			

පොහොර අංශය

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩ සටහනේ ස්භාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායී ආකාරයට පවත්වාගෙන යාම	03	දින 01	15,000.00		දේශීය	පෞද්ගලික ලිපිගොනු භාවිතය

වැඩ සටහනේ නම		පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩ සටහනේ ස්භාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය යටතේ ද්විතියික ශ්‍රේණියේ නිලධාරීන් වෙනුවෙන් දෙමළ භාෂා පුහුණු පාඨමාලාව (මේ වන විටද පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි)	පළමු කණ්ඩායම	54	පැය 150	540,000.00 මෙම මුදලින් රු. 457,875.00 ක් පමණක් මේ වන විට ගෙවීම් සිදු කර ඇත.		දේශීය	දෙමළ භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම
	දෙවන කණ්ඩායම	44	පැය 150	440,000.00 (මේ වන විට ගෙවීම් සිදු කර නැත).		දේශීය	දෙමළ භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම

ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන

#	වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
1	ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි	01	දින 02	7,000.00	-	දේශීය	1. ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති 2. ආයතන සංග්‍රහයේ පරිච්ඡේදය VI,VII,VIII,XII, XIII,XIV,XVII, XXIV,XXV,XX VI,XXXII,XLV II,XLVIII සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 3. ඒකාබද්ධ අරමුදල ඇතුළු රජයේ අරමුදල් 4. රජයේ අයවැය ඇස්තමේන්තු සහ

#	වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
							ඇස්තමේන්තු වෙනස්වීම් 5. ලැබීම් පිළිබඳව 6. ගෙවීම් පිළිබඳව 7. අලාභහානි සම්බන්ධව කටයුතු කිරීම් 8. වත්කම් කලමනාකරණය හා භාණ්ඩ සමීක්ෂණය
2	ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (ආර්ථික විද්‍යාව) - 2021	01	අවුරුදු 01	127,500.00	-	දේශීය	• ආර්ථික විද්‍යාව
3	වැටුප් පරිවර්තනය පාඨමාලාව	30	දින 01	70,000.00	-	දේශීය	1. ආදාල ආයතනයන්ට අනුකූලව රාජ්‍ය සේවයේ වැටුප තීරණය වන ආකාරය 2. රාජ්‍ය සේවයේ දැනට පවතින වැටුප් ව්‍යුහය හඳුනා ගැනීම සහ මෙතෙක් පැවති වැටුප් ව්‍යුහයේ ස්වභාවය 3. මුදල් රෙගුලාසියෙහි හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්හි ඇති වැටුප් සම්බන්ධ ප්‍රතිපාදන 4. වැටුප් සංශෝධනයේදී හා වැටුප් වර්ධකයන්වලදී වැටුප් පරිවර්තනය 5. වැටුප් විෂමතා හඳුනා ගැනීම හා ඒවා නිවැරදි කිරීම සඳහා ගතයුතු පියවර
4	ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි	104	දින 02	150,000.00	-	දේශීය	1. ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති

#	වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
							2. මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 3. ආයතන සංග්‍රහයේ පරිච්ඡේදය VI,VII,VIII,XII, XIII,XIV,XVII, XXIV,XXV,XX VI,XXXII,XLV II,XLVIII සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 4. පරිච්ඡේද I,II,III,IV,V හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය
5	පැය 150 දෙමළ භාෂා පාඨමාලාව	27	පැය 96	72,000.00	-	දේශීය	• සරළ දෙමළ භාෂාව ලිවීම, කියවීම, කතා කිරීම හා තේරුම් ගැනීම
6	වෘත්තීය සංවර්ධනය	06	දින 02	45,000.00	-	දේශීය	• කාර්යාල කළමනාකරණය හා කාර්යය පටිපාටිය • විෂය භාර නිලධාරියා විසින් පවත්වාගත යුතු ලේඛන

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

සටහන - කෘෂිකර්ම අංශය 01, පශු සම්පත් අංශය 02, පොහොර අංශය 03, ග්‍රාමීය සංවර්ධන අංශය 04

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	(1,2,3,4) අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	(1,2,3,4) අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	(1,2) අදාළ නොවේ (3) අනුකූල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	(1,2,3) අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	(1,2,4) අදාළ නොවේ. (3) අනුකූල වේ.		
1.6	වෙනත්	(1,2,4) අදාළ නොවේ.		
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	(1,2,3,4) අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා තිබීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	(1,2,3,4) අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	(1,2,3,4) අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	(1,2,3,4) අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	(1,2,4) අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	(1,2,3,4) අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුමවලට පිළිතුරු ලබා දී තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. (134) (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	(1,2,3,4) අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	(1,2) අනුකූල නොවේ. (4) අනුකූල වේ.	1,2 - අනුකූල නොවේ මසකට වැඩි කාලයක් ගතවී ඇතැම් විගණන වාර්තා වලට පිළිතුරු ලැබී ඇත.	2- අභ්‍යන්තර විගණන වාර්තාවන්ට නොපමාව පිළිතුරු ලබා දෙන ලෙස අදාළ අංශ දැනුවත් කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA/1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	(2) අනුකූල නොවේ. (1,3,4) අනුකූල වේ.	2- අනුකූල නොවේ රජ්‍ය අමාත්‍යාංශය ඉවත් කිරීම නිසා රැස්වීම් පැවැත්වීම සඳහා කමිටු සභාපති කෙනෙකු නොමැති වීම.	2- දැනට කැබිනට් අමාත්‍යාංශය සමඟ එක්ව රැස්වීම් පැවැත්වීම සිදු කෙරේ.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම. සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	(1,2,4) අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	(1,2,4) අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම	(1,2,4) අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	(1,2,3,4) අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	(1,2,3) අනුකූල නොවේ (4) අනුකූල වේ.	1,3-ගර්හිත වාහන නොමැත 2-අදාළ වාහනය තක්සේරු කිරීමේදී පැන නැගුණු තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් (වාහනයේ වැසි අංකය ලියාපදිංචි සහතිකයේ සඳහන් වැසි අංකය සමඟ සැසඳීමට එහි අංක කිහිපයක් පැහැදිලිව නිරීක්ෂණය නොවීම.)	2- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්මික අංශයෙන් ලද උපදෙස් පරිදි වාහනයේ වැසි අංකය දේශීය මුද්‍රණය කර ගැනීමට කටයුතු කරමි.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	(1,2,3,4) අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	(1,2,3,4) අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	(1,2) අනුකූල නොවේ. (4)අනුකූල වේ.	1,2-2022 වර්ෂයේදී පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් හා QR ක්‍රමවේදය යටතේ වාහනවලට සීමාසහිතව ඉන්ධන සැපයීම හේතුවෙන් 2022 වර්ෂය සඳහා වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට නොහැකි වී ඇත. 3-වර්ෂයේ මූල මූලික කටයුතු සම්පාදනය කළද ඉන්ධන මිල සහ ඉන්ධන හිඟතාවය මත දැනට අත්හිටුවා ඇත.	2-ඉන්ධන සාමාන්‍ය පරිදි ලබා ගැනීමට අවස්ථාව ලද විගස රා.ප.ව.30/2016 හි 3.1 ප්‍රකාරව මෙම අංශය සතුව පවතින වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කරමි.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	(1) අනුකූල නොවේ (2,4) අනුකූල වේ.	1-කල්බදු වාහන නොමැත. 3-කල්බදු වාහනවල කාලසීමාව ඉක්මවා නැත.	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	(1,2,3,4) අනුකූල වේ.		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	(1,2,3,4) අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	(1,2,3,4) අනුකූල වේ.		
12.2	නිහඟිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	(1,2,4) අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන නිහඟිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	(1,2,3) අනුකූල නොවේ. (4) අනුකූල වේ.	2-.විදේශගතවීම මත නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යොමුව ඇත.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ. (1,2,4)		
15	**ආදායම් ගිණුම**	(3)		
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම	(1,2,4) අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිනුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	(1,2,4) අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	(2) අදාළ නොවේ. (1,4,3) අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	(1,2,3,4) අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	(1,3) අනුකූල වේ. (2) අනුකූල නොවේ.	2-පූර්වගාමී රාජ්‍ය අමාත්‍යාංශය දැනට ස්ථාපිත කර නොමැති බැවින් මෙම අංශය සම්බන්ධව පෙර පැවති අන්තර්ජාල වෙබ් පිටුව අත්හිටුවා ඇත.	කෘෂිකර්ම අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අංශය හා සම්බන්ධ වී අදාළ තොරතුරු යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	(1) අනුකූල වේ. (2) මහජනතාව සමඟ සෘජුව කටයුතු නොකරන බැවින් අදාළ නොවේ. (3) අමාත්‍යාංශය වරින් වර වෙනස් වීම් වලට භාජනය වීම හේතු කොට ගෙන පොහොර අංශය සඳහා අනන්‍ය වූ ප්‍රඥප්තියක් නොමැත. (4) අනුකූල නොවේ.	4-පැවරී ඇති රාජකාරි ස්වභාවය අනුව අනුකූල නොවේ	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක	(1) අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	(2) මහජනතාව සමඟ සෘජුව කටයුතු නොකරන බැවින් අදාළ නොවේ (3) අමාත්‍යාංශය වරින් වර වෙනස් වීම් වලට භාජනය වීම හේතු කොට ගෙන පොහොර අංශය සඳහා අනන්‍ය වූ ප්‍රඥප්තියක් නොමැත.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	(1,2,3) අනුකූල වේ. (4) අනුකූල නොවේ.	4-මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇතත් 02/2018 චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන නැත.	4-2023 වර්ෂය සඳහා සකස් කිරීම ආරම්භ කර ඇත.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	(1,2,3) අනුකූල වේ. (4) අනුකූල නොවේ.		2023 වර්ෂය සඳහා ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.4	ඉහත චක්‍රලේඛයේ (19.1 හි සඳහන්) 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	(1,2,3,4) අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම	(1,2,3,4) අනුකූල වේ.		